

# ඔකොඳපොල සන්නය

හෙවත්

# බාලාවතාර ලියන සන්නය.



# OKONDAPOLA SANNAYA

OR

# A PARAPHRASE OF BALAWATARA.

——*×*——

# ඔකොඳපොල සන්නය.

හෙවත්

# බාලාවතාර ලියන සන්නය.

——*0*——

දොන් අන්ද්‍රිස් ද සිල්වා බටුවන්තුඩාවේ පණ්ඩිතුමන් විසින්

ශුද්ධකොට ප්‍රකාශ කරණලදී.

දොන් ෆ්‍රෙඩ්රික් ඇඩ්වර්ඩ් ද සිල්වා අප්පුහාමි

සහ

ඩී. ජේ. සඳනායක අප්පුහාමිදූ

යන අපදෙදෙනා විසින්

මුද්‍රණය කරවනලදී.

නවගමුවගේ මර්තේලිස් පේරා

විසින්

ලඞ්කාභිනවවිශ්‍රැතයන්ත්‍රාලයෙහි මුද්‍රිතයි.

ශ්‍රී බුද්ධවර්ෂ. 2432

1888

## නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

---

බුද්ධං තිධාභිවන්දිත්වා බුද්ධබුද්ධවිලොචනං
බාලාවතාරං භාසිස්සං බාලානං බුද්ධිවුද්ධියා.

සත මේ ග්‍රන්ථප්‍රමුඛ බාලාවතාරනම්වූ ප්‍රකරණයාගේ "ලොකනාථා, බුද්ධො" යනාදී පදසිද්ධික්‍රමය බුද්ධශාසනාභිවෘද්ධිවර්ධනයෙහි තත්පර ශ්‍රද්ධාබුද්ධිසම්පන්නාශේෂ ශාස්ත්‍රාභිප්‍රායි කල්‍යාණජනයාට නිරායාසයෙන් දැනගන්නා පිණිස සර්වදෙශ දෙශාන්තර ප්‍රසිද්ධ ශීලාචාරගුණ ගණාඪ්‍ය සඞ්ගත ඡන්දස් නිඝණ්ඩු ව්‍යාකරණ ධර්මවිනයාද්‍යනේකශාස්ත්‍රයන් මනාකොට දත්තාවූ වැලිවිට පිණ්ඩපාතික සරණඞ්කරාභිධාන ප්‍රසිද්ධසඞ්ඝරාජස්වාමිනාන්තර ප්‍රාප්තයතිශ්වරයන් වහන්සේගේ ශිෂ්‍යවූ ඔකොඳපොල ආරාමවාසීවූ ධර්මජෝතිනම් භික්ෂූත්තමයන් විසින් සද්ධීකප්ප දීපයි ධානදීයෙහි පදසිද්ධි ක්‍රමසඳ විමසා බලා ශබ්දශාස්ත්‍රානුකූලකොට මෙම ව්‍යාඛ්‍යානය කිරීමට ප්‍රාරම්භකළෝ.

එහි "බුද්ධං තිධාභිවන්දිත්වා" යනාදීන් කියයේනම් සුප්‍රසිද්ධාභිමනොහර නීලොත්පල පත්‍ර ප්‍රතිභාගාතිසුන්දර පඤ්චවර්ණ ප්‍රසාදනීමනොඥ නයනවරනෙව්‍යාපශොභිත අභිනවයති එනරනිකාලාබ්‍යප්‍රභෙද කාලත්‍රය ප්‍රවෘත්ත අශේෂාර්ථයන් නිරවශේෂකොට කරතල මධ්‍යගතාතිසුන්දර සුපරිශුද්ධ ජොතිරඞ්ගවාණික්‍යාකාරයෙන් අවිපරීතකොට ස්වයම්භූඥානයෙන් නිශ්චය කොට දත්තාවූ ද්වාත්‍රිංශත්වර මහාපුරුෂලක්ෂණශිත්‍යනු ව්‍යඤ්ජනබහමප්‍රභාමණ්ඩලමණ්ඩිත කේතුමාලාලඞ්කාර සශොභන අසදෘශාතුල්‍ය අනන්‍ය සාධාරණ නාම ශෙසශ්‍රී භාරධාරීනවූ සර්වඥ රාජෝත්තමයානන්වහන්සේගේ ෂොඩශොත්තරවිශත්ප්‍රමාණ අසාධාරණ නාම මඞ්ගල්‍යලක්ෂණශ්‍රීසාර විරාජිත ප්‍රමාණතිත්‍රාන්ත රාජාධිරාජ ප්‍රශුප්ත සම්සත්පන්න මසනකාලඞ්කෘත කිරීට කොටිමාණික්‍යසඞ්ඝර්ෂවූ ශ්‍රීපාද ප්‍රගමය ලොභාචාර කුලභස්‍යාදි විරහිතවූ කාවිසිවුති සඞ්ඛ්‍යාත් මාරත්‍රශොපසූරිත භක්තිප්‍රෙම පූර්වාඞ්ගම උත්තමාඞ්ගයෙන් සක්සා වැඳ අශේෂ බුද්ධවචනයන් විශේෂයෙන් නොවිදිනවූ අව්‍යක්තාදක්ෂ බාලජනයන්ගේ ඥානාභිවෘද්ධිය පිණිස බාලාවතාරනම් ප්‍රකරණයක් කරන්නාවූ පූර්වාචාර්යොත්තමයානන් වහන්සේ.

උත්තානාත්‍යුත්තානාදි ෂඩ්විංශත් ඡන්දසාන්තරයෙන් තුන්දහසක් අවසිය සත ළිස් අඟුල්ප්‍රමාණවූ පෘථිවිප්‍රදේශයෙහි සර්වඥ රූපාදයෙහි පටින් සටම් ලක්ෂපාදයදක්වා ප්‍රස්තාර කටයුතුවූ සර්වඥ රූ වෘත්ත එකක්හා එකක් ලඝු වෘත්ත අටක්හා දෙකක්ලඝු වෘත්ත විසිඅටක්හා තුනක් ලඝු වෘත්ත සප ණසක්ද සතරක් ලඝු වෘත්තසැත්තෑවක්හා පසක් ලඝු වෘත්ත සප ණ

සක්ද සයක් ලක්‍ෂ වෘත්ත විසිඅටක්හා සතක් ලක්‍ෂ වෘත්ත අටක්ද සව් ලක්‍ෂ වෘත්ත එකක් ඇතුළුව ෂට්පඤ්ඤාශොත්තර ශතප්‍රමාණ වෘත්ත විත්තාකර්ෂිතවූ අනුෂ්ටුබ්නම් ඡන්දසෙහි එකවිංශත් ත්‍රයාත්‍රු පංචෙනාශීති මහාසර්වාතෝභද්‍ර පදසතර එයින් ගෙණ ප්‍රථමවක්ත්‍රනම් වෘත්ත යට නගා බාහිරාභ්‍යන්තරෙහි සර්වතෝභද්‍රවනාක් පද්මපත්‍රප්‍රාප්ත උදක බින්දුවාකාරයෙන් අලගනව නිර්දුඃඛනිර්වාධි භාවාදි සර්වකල්‍යාණ ධර්ම ප්‍රාදුර්භූතවීමෙන් කායචිත්ත ප්‍රීතිප්‍රමොදය ජනනයකරණු කැමතිව ඉෂ්ටදෙවතා නමස්කාර සඳහා මෙම ''බුද්ධං තිධාභිවන්දියිත්වා'' යනාදී ගාථාව රචනා කළෝය.

''අක්ඛරාපාදයො එකචත්තාලීසං'' යන සූත්‍රයෙන් ''අ ආ ඉ ඊ උ ඌ එ ඔ ක ඛ ග ඝ ඞ ච ඡ ජ ඣ ඤ ට ඨ ඩ ඪ ණ ත ථ ද ධ න ප ඵ බ භ ම ය ර ල ව ස හ ළ අං'' යන මේ එක්සාළිසක් පමණවූ අක්‍ෂර යන්ට අක්‍ෂරයෝයයි කියා සංඥා කළනියාය.

''තත්‍රොදන්තා සරා අට්ඨ'' යන සූත්‍රයෙන් ඒ සතළිස්එකක් පමණවූ අක්‍ෂරයන්ගෙන් පළමුකොටම කී ''අආ ඉඊ උඌ එඔ'' යන මේ අක්‍ෂරයන් අටදෙනාට ස්වරාක්‍ෂරයෝ යයි සංඥාකළ නියාය.

''ලහුමත්තා තයො රස්සා'' යන සූත්‍රයෙන් ඒස්වරයන් අටදෙනාගෙන් අ ඉ උ යන අකුරු තුණට හ්‍රස්වාක්‍ෂරයෝයයි සංඥාකළ නියාය.

''අඤ්ඤෙ දීඝා'' යන සූත්‍රයෙන් ඒස්වරයන් අටදෙන අතුරෙන් හ්‍රස්ව අකුරුතුණ හැර ඉතිරිවතුබූ ''ආ ඊ ඌ එ ඔ'' යන මේ අක්‍ෂරයන් පස් දෙනාට දීර්ඝස්වරයෝ යයි සංඥාකළබවය.

මෙහි එකාර ඔකාර දෙදෙන ''එත්ථ සෙය්‍යො ඔට්ඨො සොත්ථි'' යනාදි තැන්හි මෙන් සමහර තෙනෙක්හි හ්‍රස්වයන්මෙන් යුනුව කීවද මෙම උදාහරණයෙන්ම දීර්ඝබව හැඟේ.

''සෙසා බ්‍යඤ්ජනා'' යනසූත්‍රයෙන් යථෝක්තවූ ස්වරයන් අටදෙනා හැර ''ක ඛ ග ඝ ඞ ච ඡ ජ ඣ ඤ ට ඨ ඩ ඪ ණ ත ථ ද ධ න ප ඵ බ භ ම ය ර ල ව ස හ ළ අං'' යන මේ අක්‍ෂරයන් තේතිස් දෙනාට ව්‍යඤ්ජනාක්‍ෂරයෝයයි සංඥාකළ බවය.

''වග්ගා පඤ්චපඤ්චසො මන්තා'' යන සූත්‍රයෙන් ඒ ව්‍යඤ්ජන අක්‍ෂර යන් තෙතිස්දෙනාගෙන් ''ක ඛ ග ඝ ඞ ච ඡ ජ ඣ ඤ ට ඨ ඩ ඪ ණ ත ථ ද ධ න ප ඵ බ භ ම'' යන මේ පසක් බැගින් වර්ග පසක්වූ අක්‍ෂරයන් පස්විසි දෙනාට වර්ගාක්‍ෂරයෝයයි සංඥාකළබවය.

මෙම වර්ගාක්‍ෂරයන්ගෙන් ප්‍රථමද්විතීයවූ ''ක ඛ ච ඡ ට ඨ ත ථ ප ඵ'' යනදසාක්‍ෂරයෝද සකාරයද යන මේ අක්‍ෂරයෝ එකොළොස්දෙන අඝොෂාක්‍ෂරයෝය.

''ළනත්තා ඝොසා'' යන්නෙන් එම වර්ගාක්‍ෂරයන්ගේම පළමුව න දෙවන අක්‍ෂරයන් හැර ඉතිරිව තුබූ ''ග ඝ ඞ ජ ඣ ඤ ඩ ඪ ණ ද ධ

න බ භ ම ය ර ල ව හ ළ" යන මේ අක්ෂරයෝ එක්විසිදෙනාට ඝොෂාක්ෂරයෝයයි සංඥා කළ බව ය.

"අං ඉති නිග්ගහීතං" යන සූත්‍රයෙන් කෙළවර 'අං, බින්දුවට "නිග්ගහීත" යයි සංඥා කළබවයි.

"කඛ ගඝ ඞ අහ" යන මේ අක්ෂරයෝ සත්දෙන කණ්ඨයෙන් උපදිත්ල.

"චඡ ජඣ ඤ ඉ ය" යන මේ අක්ෂරයෝ සත්දෙන තාලුයෙන් උපදිත්ල.

"පඵ බභ ම උ" යන මේ අක්ෂරයෝ සදෙන ඔෂ්ඨයෙන් උපදිත්ල.

"ටඨ ඩඪ ණ ර ළ" යන මේ අක්ෂරයෝ සත්දෙන මුද්ධනෙන් උපදිත්ල.

"තථ දධ න ල ස" යන මේ අක්ෂරයෝ සත්දෙන දන්තයෙන් උපදිත්ල.

එකාරයතෙම කණ්ඨයෙන්හා තාලුයෙන් උපදිල.

ඔකාරයතෙම කණ්ඨයෙන්හා ඔෂ්ඨයෙන් උපදිල.

වකාරයතෙම දන්තයෙන්හා ඔෂ්ඨයෙන් උපදිල.

සංඥා කාණ්ඩයයි.

---*---

"ලොකග්ගො" කියා සංහිතා කාය්‍යීක් කළමනා තන්හි "ලොක කියාවේ-අග්ගො කියාවේ-"ලොක අග්ගො" යන තන්හි "පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ" යන පරිභාෂා සූත්‍රයෙන් ස්වරයාගෙන් ව්‍යඤ්ජන පහවෙයි-පහවන්නෙහිවූ කකාරස්ථ අකාරයාගෙන් කකාරපහවේ-කකාර හල්වේ-ස්වරයා පරකල්හි පූර්වස්වරයාහට "සරා සරෙ ලොපං" යන සූත්‍රයෙන් ලොප්වේ—ස්වාශ්‍රිත ස්වර රහිතවූ ව්‍යඤ්ජන තෙම "නයෙ පරං යුත්තෙ" යන පරිභාෂා සූත්‍රයෙන් පරාක්ෂරයාකාර පැමිණේ-"ලොක් අග්ගො" කියා පද බිඳ තුබූතන්හි සංහිතා කාය්‍යීව "ලොකග්ගො" යනුවේ.

මේ සූත්‍රයෙහි "සරා සරෙ ලොපං" කියා ඕපශ්ලෙෂිකාධාරසප්තමියෙන් දක්වූ හෙයින් වර්ණව්‍යවධාන කාලව්‍යවධානයක් නම් සන්ධියෙක පෙණේ නම් එබඳු තන්හි සංහිතා කාය්‍යී නොවේ.

එහි වර්ණව්‍යවධාන නම් "අකොච්ඡි මං අවධි මං" යනාදී ගාථාවෙහි "මං අවධි මං අජිනි" යනතන්හි ස්වරයන් පරවූවද මකාරස්ථ අකාර ලොප්කොට පරාක්ෂරයාකාර පමුණුවා "මවධි මජිනි" කියා පදසිද්ධකිරීම මං යන නිග්ගහීතයා විසින් බාධිතහෙයින් මේ වර්ණව්‍යවධානනම.

කාලව්‍යවධානනම් "පමාදමනුයුඤ්ජන්ති" යනාදී ගාථාවෙහි "බාලා දුම්මෙධිනො ජනා අප්පමාදඤ්ච මෙධාවී" යනතන්හිද "කතමා චානන්ද අනිච්ච සඤ්ඤා" යනතන්හිද "ජනා" කියාද "ආනන්ද" කියාද මදක

ලස් නැවති සිට "අප්පමාදම" කියාද "අනිච්චසඤ්ඤ" කියාද පසුව කියන හෙයින් "ජනාප්පමාදං" කියාද "ආනඤ්ඤනිච්චසඤ්ඤ" කියාද සංහිතාකාරියකිරීම නොහැකිබව කාලව්‍යවධානනම්.

සෙසු සංහිතාකාර්‍ය්‍යයෙහිදු මෙසේමැයි.

"පනාමෙ පනිමෙ" කියා සංහිතාකාර්‍යයක් කළමනා තන්හි, පන කියාවේ-ඉමේ කියාවේ-පන් කියාවේ—ඉමෙ කියාවේ— "පන ඉමෙ පන ඉමෙ" යනතන්හි "පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ," යන පරිභාෂා සූත්‍රයෙන් ස්වරයාකෙරෙන් ව්‍යඤ්ජන පහවේ—පහවන් නෙහිදු නකාරසවි අකාරයා කෙරෙන් නකාරපහවේ-නකාරගල්වේ-අසමානවර්ණ්‍යයාකෙරෙන් පරස්වරයාහට "වා පරෝ අසරූපා" යන සූත්‍රයෙන් විකල්පයෙන් ලොප්වේ—තුබූ පක්ෂයෙහිදු පරස්වරයාහට "වා පරෝ අසරූපා" යන සූත්‍රයෙන් ලොප්පැමිණි කල්හි එහිම අනුවෘත්ත වාශබ්ද ග්‍රහණයෙන් ප්‍රතිෂෙධව "සර සරෙලොපං" යන සූත්‍රයෙන් පූර්වස්වරයාහට ලොප්වේ-ඝට සිටි ස්වරරහිතවූ ව්‍යඤ්ජනතෙම "නයෙ පරං යුත්තෙ" යන පරිභාෂා සූත්‍රයෙන් පරාක්ෂරයාකරාපැමිණි "පන ඉමෙ පන ඉමෙ" කියාපදබිඳ තුබූ තන්හි සංහිතාකාර්‍යව "පනාමෙ පනිමෙ" යනුවේ.

මතු කියන සියලුම සංහිතා කාර්‍යයෙහිදු යෙදෙන යෙදෙන පරිච්ඡෙදයන් මෙසේම ව්‍යාක්‍යයොදා ගතයුතු-මේ "පනාමෙ පනිමෙ" යන එක් පක්ෂයෙක්හි පූර්වස්වරයාහට ලොප්කොළේනම් අසමානවර්ණ්‍යයා කෙරෙන් වූවත් පරස්වරයාහට කිසිතැනෙක්හි ලොප්නොවනබව හඟවනපිණිසයි.

"බන්ධුස්සෙව නොපෙති" කියා සංහිතාකාර්‍යයක් කළම්නාතන්හි "බන්ධුස්ස කියාවේ—ඉව කියාවේ-න කියාවේ—උපෙති කියාවේ— "බන්ධුස්සඉව න උපෙති" යනතන්හි "දුබ්බ—පෙ-ස්වරයා පරකල්හි පූර්වස්වරයහට "සර සරෙ ලොපං" යනසූත්‍රයෙන් ලොප්වේ-පූර්වස්වරයහට ලොප්කළකල්හි පරස්වරයහට "ක්වාසවණ්ණං යුත්තෙ" යනසූත්‍රයෙන් අසවර්ණබවයවේ-වන්නේනහිදු ඝට්නාසන්නනහෙයින් ඉකාර උකාරයන්ට එකාර ඔකාර දෙදෙන යථාක්‍රමයෙන් ආදෙශවෙත්—ඝටසිටි ස්වරහිතවූ ව්‍යඤ්ජනතෙම "නයෙ පරං යුත්තෙ" යන පරිභාෂා සූත්‍රයෙන් පරාක්ෂරයාකරා පැමිණි "බන්ධුස්ස ඉව න උපෙති" කියා පදබිඳ තුබූ තන්හි සංහිතා කාර්‍යව "බන්ධුස්සෙව නොපෙති" යනුවේ.

"තත්‍රායං යානිධ බහූපකාරං සබ්බ තථූපමං" කියා සංහිතාකාර්‍යයක් කළම්නාතන්හි තත්‍ර කියාවේ-අයං කියාවේ-යානි කියාවේ—ඉධ කියාවේ-බහු කියාවේ-උපකාරං කියාවේ-සබ්බා කියාවේ-ඉධ කියාවේ-තථා කියාවේ-උපමං කියාවේ-"තත්‍ර අයං යානි ඉධ බහු උපකාරං සබ්බා.

ඉධ තථා උපමං" යනතන්හි "පුබ්බ-පෙ-සරයා පරකල්හි පූර්වස්වරයහට "සරා සරෙ ලොපං" යන සූත්‍රයෙන් ලොප්වේ-පූර්වස්වරයහට ලොප්කළකල්හි පරස්වරයහට "දීඝං" යන සූත්‍රයෙන් සමගානැනෙක දීඝිවේ-යටසිටි-පෙ-පැමිණ "තත්‍රායං යානිධ බහූපකාරං සඞ්ඝ තත්‍රූපමං" යනුවේ-

"කිංසුධ" කියා සංහිතා කාර්යක් කළමනාතන්හි කිංසු කියාවේ-ඉධ කියාවේ-"කිංසු ඉධ" යනතන්හි "පුබ්බ-පෙ-අසමානවර්ණයා කෙරෙන් පරස්වරයහට "වාපරො අසරූපා" යන සූත්‍රයෙන් ලොප්වේ. පරස්වරයහට ලොප්කළකල්හි පූර්වස්වරයහට "පුබ්බොච" යන සූත්‍රයෙන් දීඝිවේ-යටසිටි-පෙ-පැමිණ "කිංසූධ" යනුවේ.

"ත්‍යජ්ජ ත්‍යහං" කියා සංහිතා කාර්යක් කළමනාතන්හි තෙ කියාවේ අජ්ජ කියාවේ-තෙ කියාවේ-අහං කියාවේ-"තෙ අජ්ජ තෙ අහං" යනතන්හි "පුබ්බ පෙ-සරයා පරකල්හි පදන්තවූ එකාරයහට "යමෙදන්තස්සා දෙසො" යන සූත්‍රයෙන් යකාරාදෙශවේ "පච්චයාදනිට්ඨා නිපාතනා සිජ්ඣන්ති" යන සූත්‍රයෙන් යකාර තකාරයෙහි බඩවේ-පූර්වස්වරයහට ලොප්කළකල්හි පරස්වරයහට "දීඝං" යන සූත්‍රයෙන් එක්පක්ෂයෙක්හි දීඝිවේ-යටසිටි-පෙ-පැමිණ "ත්‍යජ්ජ ත්‍යහං" යනුවේ.

"නෙත්ථ" කියා සංහිතා කාර්යක් කළමනාතන්හි නෙ කියාවේ-එත්ථ කියාවේ- "නෙ එත්ථ" යනතන්හි පදන්තවූ එකාරයහට "යමෙදන්තස්සාදෙසො" යන සූත්‍රයෙන් යකාරාදෙශපතෙතහි මෙම සූත්‍රයෙහි අනුවෘත්ත ක්වචිග්‍රහණයෙන් ප්‍රතිෂේධවේ. පූර්වස්වරලොප්වේ පරස්වරයාකරා පැමිණ "නෙත්ථ" කියාමවේ.

"ස්වාස්ස අඥෙති" කියා සංහිතා කාර්යක් කළමනාතන්හි සො කියාවේ-අස්ස කියාවේ-අඥු කියාවේ-එති කියාවේ-"සො අස්ස අඥු එති" යනතන්හි "පුබ්බ-පෙ-සරයාපරකල්හි පදන්තවූ ඔකාර උකාරයන්ට "වමොදුදන්තානං" යන සූත්‍රයෙන් වකාරාදෙශවේ "පච්චයාදනිට්ඨා නිපාතනා සිජ්ඣන්ති" යන සූත්‍රයෙන් වකාර සකාරයෙහි වකාර තකාරයෙහි බඩවේ. පූර්වස්වරයහට "සරා සරෙ ලොපං" යනසූත්‍රයෙන් ලොප්වේ-යටසිටි-පෙ-පැමිණ "ස්වාස්ස අඥෙති" යනුවේ.

"තයො අස්සු සමෙතු ආයස්මා" යනතන්හි සරයාපරකල්හි පදන්තවූ ඔකාර උකාරයන්ට "වමොදුදන්තානං" යනසූත්‍රයෙන් වකාරාදෙශපතෙතහි මෙමසූත්‍රයෙහි අනුවෘත්ත ක්වචිග්‍රහණයෙන් ප්‍රතිෂේධවේ. පූර්වස්වරලොප්වේ පරස්වරයාකරා පැමිණ "තයස්සු සමෙතායස්මා" යනුවේ.

මෙසින්මතු සියලු සංහිතා කාර්යෙහිම පූර්වස්වරලොප්කරන්ට කීතැන "සරා සරෙලොපං" යන සූත්‍රයෙන්ද-පරස්වරලොප්කරන්ට කීතැන

"වාපරො අසරූපා" යන සූත්‍රයෙන්ද ලොප්කොට ස්වර-පරක්ෂරයාකර පමුණුවන්ට කීතැන "නයෙ පරං යුත්තෙ" යන සූත්‍රයෙන් පරක්ෂරයාකර පැමිණ වියයුතුයි.

"ඉදූහං" කියා සංහිතා කාර්යක් කළමනාතන්හි ඉධ කියාවේ-අහං කියාවේ-"ඉධ අහං" යනතන්හි ස්වරයාපරකල්හි ධකාරයහට "දොධස්සච" යන සූත්‍රයෙන් යම්හර තැනෙක්හි දකාරයෙක් ආදේශවේ දකාරයේ අකාරයාකෙරෙන් දකාරපශවේ දකාරහල්වේ ස්වරයාපරකල්හි පූර්වස්වරයහට "සරා සරෙ ලොපං" යන සූත්‍රයෙන් ලොප්වේ-පූර්වස්වර යනව ලොප්කළකල්හි පරස්වරයහට "දීඝං" යන සූත්‍රයෙන් දීඝවේ පරක්ෂරයාකර පැමිණ "ඉදූහං" යනුවේ.

"ඉධඑව" යනතන්හි ස්වරයාපරකල්හි ධකාරයහට "දොධස්සච" යන සූත්‍රයෙන් දකාරාදේශ පතතනී මෙම සූත්‍රයෙහි අනුවාතනකවිග්‍රහණයෙන් ප්‍රතිෂෙධව පූර්වස්වරලොප්වේ පරක්ෂරයාකර පැමිණ "ඉධෙව" කියාමවේ.

"ඉධභික්ඛවෙ" යනතන්හි ව්‍යංජනයා පරකල්හි ධකාරයහට "දොධස්සච" යන සූත්‍රයෙහි චග්‍රහණයෙන් දකාරාදේශව "ඉදභික්ඛවෙ" යනුවේ-එසේම "සුගදො" යනතන්හි දකාරයහට තකාරාදේශව "සුගතො" කියාද-"දුක්කතං" යනතන්හි තකාරයාට ටකාරව "දුක්කටං" කියාද "ගන්තබ්බා" යනතන්හි තකාරයාට ධකාරව "ගන්ධබ්බා" කියාද-"අත්තජො" යනතැන තකාරයාට ත්‍රකාරව "අත්‍රජො" කියාද-"කුල්ලූපගො" යනතැන ගකාරයාට කකාරව "කුල්ලූපකො" කියාද-"මහාසාරො" යනතැන රකාරයාට ළකාරව "මහාසාළො" කියාද—"ගවයො" යනතන්හි යකාරයාට ජකාරව "ගවජො" කියාද-"කුච්ඡිතො" යනතන්හි චකාරවයට බකාරවීයක්ව "කුබ්බිතො" කියාද-"සයො" යනතැන යකාරයාට කකාරව "සකො" කියාද—"නිජං පුත්තං" යනතැන ජකාරයාට යකාරව "නියංපුත්තං" කියාද—"නියතො" යනතැන තකාරයාට කකාරව "නියකො" කියාද-"භාවිතා" යනතැන තකාරවයට වකාරවීයක්ව "භාවෙවා" කියාද—"නිප්පන්ති" යනතැන පකාරයාට ඵකාරව "නිප්ඵන්ති" කියාද-යනාදී මේ ආදේශයෝ "දොධස්සච" යන සූත්‍රයෙහි චග්‍රහණයෙන්ම වේත්-

"පච්චත්තං වුත්තාස්ස" කියා සංහිතාකාරියක් කළමනාතන්හි, පති කියාවේ-අත්තං කියාවේ-වුත්ති කියාවේ-අස්ස කියාවේ-"පති අත්තං වුත්ති අස්ස" යනතන්හි, "පුබ්බ-පෙ-ස්වරයා පරකල්හි ඉවර්ණයහට "ඉවණ්ණො යං නවා" යන සූත්‍රයෙන් කිසිතැනෙක්හි යකාරාදේශවේ, "පච්චයාදනිට්ඨාදී" සූත්‍රයෙන් යකා රතකාරයෙහි බඩවේ, කර ණලද යකාරාදේශඇති තිශබ්දයහට "සබ්බො චනති" යන සූත්‍රයෙන්

විකල්පයෙන් වකාරාදේශවේ, “පරවෙනාවො ඨානෙ” යනසූත්‍රයෙන් වකාරනිපාතවේ, පූර්වස්වරලොප්වේ, පරාක්ෂරයාකර පැමිණ “පච්චනතාං වුත්තායස්ස” යනුවේ.

“පටිගයි” කිවමනායතන්හි පති කියාවේ–අගයි කියාවේ—“පති අගයි” යනතන්හි පතිශබ්දයහා “ක්වචි පටි පතිස්ස” යන සූත්‍රයෙන් කිසිතැනෙක්හි පටියනාදේශවේ, ස්වරයා පරකල්හි ටකාරස්ථ ඉකාර යහට “ඉවණ්ණො යන්නවා” යන සූත්‍රයෙන් යකාරාදේශ පතනෙහි මෙහිම අනුවත්ති වාග්‍රහණයෙන් ප්‍රතිෂෙධවේ, පූර්වස්වරලොප්වේ, පරාක්ෂරයාකර පැමිණ “පටිගයි” යනුවේ.

“යථරිව යථෙව” කීයාසංහිතා කාරියක්කළමනාතන්හි යථා කියාවේ–එව කියාවේ–යථා කියාවේ–එව කියාවේ–“යථා එව යථා එව” යනතන්හි “දුබ්බ–පෙ–ස්වරයාකෙරෙන් පරවූ එවශබ්දයන් දෙදෙනාගෙන් පළමුවන එවශබ්දයාගේ එකාරයහා “එවාදිස්ස රි පුබ්බොච රස්සො” යන සූත්‍රයෙන් රිකාරාදේශද ථකාරස්ථ ආකාරයට හ්‍රස්වදවේ–තුබුපක්ෂයෙහි පූර්වස්වරලොප්ව පරාක්ෂරයා කර පැමිණ “යථරිව යථෙ ව යනුවේ.

“නයිමස්ස තිවඩ්ඪිතං ලහුමෙස්සති අනත්ථදජ්ජං ඉතො නායති තස්මාතිහ සබ්බිරෙව ජලභිඤ්ඤ” කියා සංහිතාකාරියක්කළමනාතන්හි–න කියාවේ–ඉමස්ස කියාවේ–හි කියාවේ–අධිගතං කියාවේ–ලහු කියාවේ–එස්සති කියාවේ–අනත්ථ කියාවේ–අජ්ජ කියාවේ–ඉතො කියාවේ–ආයති කියාවේ–තස්මා කියාවේ—ඉහ කියාවේ–සබ්බි කියාවේ එව කියාවේ–ජ කියාවේ–අභිඤ්ඤ කියාවේ–“නඉමස්ස හිඅධිගතං” යනාදීතන්හි “දුබ්බ–පෙ—ස්වරයා පරකල්හි “යවමදනතරලාචාගමා” යන සූත්‍රයෙන් යකාරාදීනු යථාක්‍රමයෙන් ආගමවෙත්—යකාරාදීන්ගේ ස්වරපහවේ–ස්වරයා පරකල්හි පූර්වස්වරයන්ට “සරා සරෙ ලොපං” යන සූත්‍රයෙන් ලොප්වේ–පරාක්ෂරයාකර පැමිණ “නයිමස්ස තිවඩ්ගිතං” යනාදියවේ–

“පුථුඑව පාඑව” යනතන්හි “යවමදනතරලාචාගමා” යන සූත්‍රයෙහි වග්‍රහණයෙන් ගකාරාගම්වේ, ව්‍යඤ්ජනයා පරකල්හි පකාරස්ථ ආකාරයට “රස්සං” යන සූත්‍රයෙන් හ්‍රස්වවේ–පූර්වස්වරලොප්වේ–පරාක්ෂරයාකර පැමිණ “පුථගෙව පගෙව” යනුවේ.

එසේම “චිරම්පවාසිං” යනතැන මකාරයාට පකාරව “චිරප්පවාසිං” කියාද–“සතත්ථපසූතො” යනතැන තකාරයාටදකාරව “සදත්ථපසූතො” කියාද–“සුගදො”යනතැන දකාරයාට තකාරව “සුගතො” කියාද යනමේ ආදෙශයෝ “යවමදනා,, දීසූත්‍රයෙහි වග්‍රහණයෙන්මවෙත්.

“ජඅභිඤ්ඤ පුථුඑව පාඑව,, යනතන්හි ස්වරයාපරකල්හි “යවමදනා,, දී සූත්‍රයෙන් ලකාරගකාරාගම් පතනෙහි මෙම සූත්‍රයෙහි අනු

විභාගවාග්‍රහණයෙන් ප්‍රතිෂෙධවේ—එන්නේ ස්වරයාපරකල්හි "සරෙ ක්වචි,, යන සූත්‍රයෙන් ස්වරයන්ගේ ප්‍රකෘති ස්වභාව ඇත්තේනුයි එහෙයින් සිසිනැගෙනක්හි ලොපාගමාදි කිසිවිකාරයක් නොවේ, එහෙයින්, "අභිඤ්ඤා, දුළුද්ව පාළුව,, කියාම වේ.

"අබ්භුග්ගතො,, කියා සංහිතාකාරියක් කළමනාතන්හි-අභි කියාවේ උග්ගතො කියාවේ "අභි උග්ගතො,, යනතන්හි අභිශබ්දයහට "අබ්භො අභි,, යන සූත්‍රයෙන් අබ්භාදෙශවේ-පූර්වස්වරලොප්වේ-පරක්ෂරයාක්ෂර පැමිණ "අබ්භුග්ගතො,, අනුවේ.

ස්වරසන්ධියි.

—*—

"සභික්ඛු කච්චිනොත්වං ජානෙමුතං,, කියා සංහිතාකාරියක් කළමනාතන්හි-සො කියාවේ-භික්ඛු කියාවේ—කච්චිනු කියාවේ-ත්වං කියාවේ-ජානෙම කියාවේ-තං කියාවේ-"සො භික්ඛු කච්චිනු ත්වං ජානෙම තං,, යනතන්හි "පුබ්බ—පෙ—බ්‍යඤ්ජනෙ පරකල්හි පූර්වස්වරයන්ට "ලොපඤ්ච තත්‍රාකාරො,, යන සූත්‍රයෙන් ලොප්වේ—එයින් ඔකාරයා ලොප්කළතන්හි මෙම සූත්‍රයෙන් අකාරයෙක් ආගමවේ-තුබූ දෙතන්හි මෙම සූත්‍රයෙහි චශබ්දග්‍රහණයෙන් ඔකාර උකාරයන් දෙදෙනා ක්‍රමයෙන් ආගමවෙත්-සවසිටි-පෙ-පැමිණ "සභික්ඛු කච්චිනොත්වං ජානෙමුතං,, යනුවේ.

"උග්ඝොසො අබ්භාතං,, කියා සංහිතාකාරියක් කළමනාතන්හි—උ කියාවේ-ඝොසො කියාවේ-ආ කියාවේ-භාතං කියාවේ-"උ ඝොසො ආ භාතං,, යනතන්හි වර්ගාක්ෂරයන් සම්බන්ධවූ චතුර්ථ ද්විතීයාක්ෂරයන්ට "වග්ගෙ ඝොසාඝොසානං තතියපඨමා,, යන සූත්‍රයෙන් එම වර්ගයෙහිවූ තෘතීය ප්‍රථමාක්ෂරයෝ යුක්තස්ථානයෙහි පනතින් ද්විත්වවෙත්-බ්‍යඤ්ජනයා පරකල්හි පූර්වආකාරයහට "රස්සං,, යන සූත්‍රයෙන් හ්‍රස්වවේ—"උග්ඝොසො අබ්භාතං,, යනුවේ.

"පරොසහස්සං අතිප්පගොඛො,, කියා සංහිතාකාරියක් කළමනාතන්හි-පර කියාවේ-සහස්සං කියාවේ-අතිප්ප කියාවේ-ඛො කියාවේ-"පර සහස්සං අතිප්ප ඛො,, යනතන්හි බ්‍යඤ්ජනයා පරකල්හි "ක්වචි ඔ බ්‍යඤ්ජනෙ,, යන සූත්‍රයෙන් යුක්තස්ථානයෙහි ඔකාරයෝ ආගමවෙත්—එක්පක්ෂයෙක්හි ස්වරයාපරකල්හි "යවමදනා,, දිසූත්‍රයෙහි චග්‍රහණයෙන් ගකාරයෙක් ආගමවේ—පූර්වස්වරලොප්වේ—පරක්ෂරයාක්ෂර පැමිණ "පරොසහස්සං අතිප්පගොඛො,, යනුවේ.

"ඔනද්ධා,, කියා සංහිතාකාරියක් කළමනාතන්හි—අව කියාවේ—නද්ධා කියාවේ—"අව නද්ධා,, යනතන්හි අව ශබ්දයහට "ඔ අවස්ස,, යන සූත්‍රයෙන් ඔකාරාදෙශවේ "ඔනද්ධා,, යනුවේ.

# ඔකොඳපොළ සන්නය.

—— ** ——

මෙය ඔකොඳපොළ විහාරවාසී ධම්මජෝති තෙරුන් විසින් බාලාවතාර යෙන් මාගධී ව්‍යාකරණ හදාරන්නන්ගේ සුඛාවබෝධය පිණිස ප්‍රකෘති හා ප්‍රත්‍යයන් යෙදෙන පරිදි යෙහෙන් උගන්වනු සඳහා මහෝත්සාහයෙන් සාදනලද සන්නයකි.

මේ සන්නය තැනූ තැන් පටන් මෙකල් දක්වා අවුරුදු (100) සියයක් කියහැකි කාලයයි, මෙසේ සිතියහැකි වන්නේ මේ තෙරනුවෝ වැලිවිට පිණ්ඩපාතික සරණඞ්කර සඞ්ඝරාජ මහාස්ථවිරපාදයන්ගේ ශිෂ්‍යයෙක් බැවිනි, ඒ සඞ්ඝරාජ මහතෙරුන්වහන්සේ මෙනම් පදවිය ලැබුවේ කීර්තිශ්‍රී මහරජානන්ගෙනි, මෙම රජතුමා ඔටුනු පැලැන්දේ බුද්ධවර්ෂ (2257) දෙදහස් දෙසිය අසූසත් වැන්නෙහිය, එතැන් පටන් (35) තිස් පස් අවුරුද්දක් රාජ්‍යානුශාසනා කෙළේය, මේ ගණිතින් කල්පනාක්‍රම මුල්යේ වර්ෂ ගණන ආසන්නව පෙණේයි.

ලඞ්කාද්වීපවාසීන්ගේ ආගමෙහි නානාශාස්ත්‍ර දැන්මෙහි බුහුටිබව දෙවැනි පෑතිස් රජ්ජුරුවන්ගේ කාලයෙහි එනම් බුද්ධවර්ෂ (236) දෙසිය සතිසේදී පටන් ගෙණ කලින්කල වැඩි අඩු බවට ගිය නමුත් සීතාවක රාජසිංහ රජු දක්වා අවිච්ජිනනව පැවැත්තේය, මේ රජුදවසින් පළමු අවුරුදු (100) සියයක් පමණ කාලයෙහි පටන් ප්‍රඞ්ගිකාරයින් විසින් දෙවිනුවර එනම් දෙවුන්දර දෙවාලය සහිත නානාප්‍රකාර විහාරද වැලිගම අග්‍රබෝධි විහාරය තොටගමු විහාරය ගලපාත විහාරාදී බෙන්තොට බොහෝ විහාර දෙවාලද කළුකොට දැනට කොටුව පිහිටි තැන තුබුනු ගඞ්ගාතිලක විහාරය පානදුරේ සුදර්ශනදෙවාලය පැපිළියානේ සුනෙත්‍රාදේවී පිරිවෙණ ජයවර්ධනපුරය එනම් කෝට්ටේපුරය සිසාරා පැවති නොයෙක් විහාර දෙවාලහා එම නුවර පිහිටි තුන් මහල් දළදා මන්දිරය සැලලිහිණිසන්දේශයෙහි කීපරිදෙන් කැළණි විහාරයෙහිවූ නොයෙක් විහාර දෙවාලහා වත්තල විජයබාපිරිවෙණ ඇතුළු තවත් බොහෝ විහාර දෙවාල නටබුන් කරණලදහ, මින් ඉතුරුව රට මැද පැවති බොහෝ විහාර දෙවාලහා මහණුන්නාන්සේලාහා පොත්පතද මේ අධර්ම රාජසිංහ රජහුවිසින් නටබුන් කරණලදහ.

මෙසේ ලොකශාසනහානියෙන් උගත්කම ඉතා හීනකාලයෙහි විමලධර්ම සූර්ය මහරජහු විසින් රක්ඛඞ්ගයෙන් මහණුන්නාන්සේලා ගෙන්වා මෙහි ටිකදෙනෙක් මහණ මහළු පැවිදිකරවූ නමුත් එම රජ්ජුරුවන්ගේ අපවත් වීමෙන් නැවතත් ප්‍රඞ්ගිකාරයෝ උනසනනව සිංහලයන්හා ආගම ශාස්ත්‍රත් දුර්වලකළහ, එහෙයින් ඒ මහණුන්නාන්සේලා අතුරෙන් සාමණේර ටික දෙනෙක් හැර සියල්ලෝ නටබුන්ව ගියහ.

මෙබඳු කාලයෙහි වැලිවිට පිණ්ඩපාතික සරණඞ්කර සඞ්ඝරාජ මහතෙරුන්වහන්සේ විසින් සාමණේරකාලයෙහි උත්සාහකරවනලද කීර්තිශ්‍රීමහ රජතුන් විසින් සියම්දෙශයෙන් උපාලිමහාථෙරප්‍රමුඛ අතිරෙකදශවර්ගික සංඝයා වැඩමවා මහනුවර උපොසථාරාමයෙහි බුද්ධවර්ෂ.(2296] දෙදහස් දෙසිය අනූහයේ උපසම්පදාකරවූ තැන්පටන් සියම්නිකාය පිහිටියේය.

මෙසේ ශාසනානම නටබුන්ව බොහෝකල් තිබී ඒ විධිනය නැවත පටන් ගත් අඩිතම මෙපමණ වැඩක් කළාට සතුති කටයුතුමයි, පමණක් පමණක් නැත වරද තුබුනු නමුත් මාගධී භාෂාව පුහුණු කරණ බාලයන්ට පදසිද්ධි දක්වමෙහි අත්‍යන්තොපකාර බැවින් මෙහි ආදරකටයුතුයි.

මේ ලියනසන්නයෙහි කිසිතැනෙක සූත්‍ර ගෙණ හැර දක්වීමේ විරොධය ක් ඇතත් පදසිද්ධික්‍රමය දැන ගැණීමට එයින් හානියක් නොපෙනේ.

ගඩලාදෙණිසන්නය බාලාවතාරයෙහි අර්ථාවබොධකරණුපිණිස ඉතා ප්‍රයොජනවත් අනර්ඝ ප්‍රකරණයක්වනසේම මේ ලියනසන්නයද පදසිද්ධික්‍රමාදිය අවබොධකරණ බාලයින්ට ඉතා මාහැඟි ප්‍රකරණයකි, එසේම පුරාණ පටන් ශුද්ධමාගධික ව්‍යාකරණාභිලාෂී ආධුනිකයන්විසින් ගඩලාදෙණි සන්නය මෙන්ව මෙයද ඉතා ආදරයෙන් භාවිතාකරණලද්දේය.

මේ ආචාර්‍ය්‍යයන්විසින් මේ පොත සංශොධනකරණු පිණිස බොහෝ සෙයින් පෙයනලමුඛයෙන් පාඨ දක්වා තිබේ.

මේ පොත බොහෝකාලයක් මාගධව්‍යාකරණ ඉගෙණ ගන්නන්ට ප්‍රයොජනවත්ව පැවතානමුත් අතින් අතට ලිවීමෙන් ව්‍යාකුලව තිබුනු සෙයින් ඒ ඒ පලාත්වලින් පොත් දහයක් පමණ එකතුකොට බලා, එයින් එකට සම නොවන තැන්හා වැඩිදුර වෙනස්ව තිබෙන තැන්ද ශුද්ධකොට යලිත් අපට අනසිම්නතැන් අංඩොලිපියෙන් දක්වා ලොකශාසනාභිවෘද්ධිය පිණිස ශුද්ධකෙළෙමු.

මෙහි යම්කිසිතැනෙක අක්ෂරඌනතාවක්හෝ අපේ ප්‍රමාදයෙන්වූ දොෂ යක් තිබේනම් එය නුවනැත්තෝ කරුණාධ්‍යාසයෙන් ශුද්ධකෙරෙත්වා.

"අවස්සුසුතං,, යන තන්හි අවශබ්දයහට "ඕ අවස්ස,, යන සූත්‍රයෙන් ඕකාරාදේශප්‍රාප්තහි මෙම සූත්‍රයෙන් අනුවර්තන වාග්‍රහණයෙන් ප්‍රතිෂේධව "අවස්සුසුතං,, කියාමවේ.

## ව්‍යඤ්ජනසන්ධි.

——— * ———

"කිඞ්කතො සඤ්ජාතො සණ්ඨිතො තන්ධනං තම්මිත්තං,, කියා සංහිතා කාරීයක් කලමනාතන්හි—කිං කියාවේ-කතො කියාවේ-සං කියාවේ-ජාතො කියාවේ-සං කියාවේ-ඨිතො කියාවේ-තං කියාවේ-ධනං කියාවේ-තං කියාවේ-මිත්තං කියාවේ "කිං කතො,, යනාදි තන්හි වර්ගව්‍යඤ්ජනයා පරකල්හි නිග්ගහීතයහට "වග්ගන්තං වා වග්ගෙ,, යන සූත්‍රයෙන් තද්වර්ගාන්තාදේශවේ, වන්නේ ඒ ඒ වර්ගයෙහි අන්තවයින් "ඞඤණනම,, යන මේ අක්ෂරයෝ යථාක්‍රමයෙන් නිග්ගහීතයහට ආදේශවෙත්, "පච්ඡයාදනිට්ඨා,, දී සූත්‍රයෙන් පූර්වව්‍යඤ්ජන පරව්‍යඤ්ජනයෙහි බඩවේ "කිඞ්කතො,, යනාදියවේ.

"න තං කම්මං,, යන තන්හි වර්ගව්‍යඤ්ජනයා පරකල්හි "වග්ගන්තං වා වග්ගෙ,, යන සූත්‍රයෙන් තද්වර්ගාන්තාදේශප්‍රාප්තහි මෙම සූත්‍රයෙහි අනුවර්තන වාග්‍රහණයෙන් ප්‍රතිෂේධව "න තං කම්මං,, කියාමවේ — "පුංලිඞ්ගං,, යන තන්හි වර්ගව්‍යඤ්ජනයා පරකල්හි නිග්ගහීතයට "වග්ගන්තං වා,, යනාදි සූත්‍රයෙහි වාග්‍රහණයෙන් ලකාරාදේශව, "පුල්ලිඞ්ගං,, යනුවේ.

"එවමස්ස එතදවොච,, කියා සංහිතා කාරීයක් කලමනාතන්හි, එවං කියාවේ-අස්ස කියාවේ-එතං කියාවේ-අවොච කියාවේ. "එවං අස්ස" යනාදි තන්හි ස්වරයා පරකල්හි නිග්ගහීතයහට "මද සරෙ,, යන සූත්‍රයෙන් මකාරදකාරාදේශයෝ වෙත්, පූර්වස්වරලොපව පරාක්ෂරයාහට නැමුණ "එවමස්ස එතදවොච,, යනුවේ.

"මංඅජ්ජි,, යන තන්හි ස්වරයා පරකල්හි නිග්ගහීතයහට "මද සරෙ,, යන සූත්‍රයෙන් දකාරාදේශප්‍රාප්තහි මෙම සූත්‍රයෙහි අනුවර්තන වාග්‍රහණයෙන් ප්‍රතිෂේධව "මංඅජ්ජි,, කියාවේ.

"තඤ්ඤෙව තමෙව තඤ්හි තංහි,, කියා සංහිතාකාරියක් කලමනාතන්හි; තං කියාවේ-එව කියාවේ-තං කියාවේ-එව කියාවේ-තං කියාවේ—හි කියාවේ—තං කියාවේ—හි කියාවේ—"තංඑව,, යනාදි තන්හි එකාරයාද හකාරයාද පරකල්හි නිග්ගහීතයහට "එහෙ ඤං,, යන සූත්‍රයෙන් විකල්පයෙන් දෙතැනෙහි ඤකාරාදේශවේ, එක්පක්ෂයෙක්හි "පරද්වෙභාවො ඨානෙ,, යන සූත්‍රයෙන් ඤකාරද්විත්වවේ, අනුපක්ෂයෙහි ඤකාර "පච්ඡයාදනිට්ඨා" දී සූත්‍රයෙන් හකාරයෙහි බඩවේ, ස්වරයෝ

පරකල්හි නිග්ගහීතයහට "මදා සරෙ" යන සූත්‍රයෙන් ඒකපක්ෂයෙක්හි මකාරාදෙශවේ, පූර්වස්වරලොප්වේ, පරස්වරයාකරා පැමිණ "තමෙනව තමකුහි තංහි" යනුවේ.

"සඤ්ඤොගො සංයොගො" කියා සංහිතාකාරියක් කළමනාතන්හි, සං කියාවේ—යොගො කියාවේ—සං කියාවේ—යොගො කියාවේ—"සං යොගො සං යොගො" යන තන්හි ප්‍රථමපක්ෂයෙහි යකාරසහ ඤකාර ඇතවේ, යකාරයාපරකල්හි එම පරයකාරයාහා සමග නිග්ගහීතයහට "සයෙ ච" යන සූත්‍රයෙන් විකල්පයෙන් ඤකාරාදෙශවේ, "පරවෙභාවො ඨානෙ" යන සූත්‍රයෙන් ඤකාරද්විත්වවේ, "සඤ්ඤොගො සංයොගො" යනුවේ,

"චක්ඛුං අනිච්චං අවං සිරො" කියා සංහිතාකාරියක් කළමනාතන්හි, චක්ඛු කියාවේ—අනිච්චං කියාවේ—අව කියාවේ—සිරො කියාවේ—"චක්ඛු අනිච්චං අව සිරො" යන තන්හි ස්වරයක්හු හෝ ව්‍යඤ්ජනයක්හු හෝ පරකල්හි "නිග්ගහීතඤ්ච" යන සූත්‍රයෙන් සමහරතැනෙක්හි නිග්ගහීතාගමවේ, "චක්ඛුං අනිච්චං අවංසිරො" යනුවේ.

"විදූනාග්ගං තාසාහං" කියා සංහිතාකාරියක් කළමනාතන්හි, විදූනං කියාවේ-අග්ගං කියාවේ-තාසං කියාවේ-අහං කියාවේ—"විදූනං අග්ගං" යනාදී තන්හි ස්වරයා පරකල්හි නිග්ගහීතයහට "ක්වචි ලොපං" යන සූත්‍රයෙන් කිසිතැනෙක්හි ලොප්වේ, පූර්වස්වරයාව ලොප්කළකල්හි පරස්වරයහට "දීඝං" යන සූත්‍රයෙන් ඒකපක්ෂයෙක්හි දීඝවේ "විදූනාග්ගං තාසාහං" යනුවේ.

"බුද්ධානසාසනං සාරගො" කියා සංහිතාකාරියක් කළමනාතන්හි, බුද්ධානං කියාවේ-සාසනං කියාවේ-සං කියාවේ-රගො කියාවේ-"බුද්ධානං සාසනං සං රගො" යන තන්හි ව්‍යඤ්ජනයා පරකල්හි නිග්ගහීතයහට "ව්‍යඤ්ජනෙ ච" යන සූත්‍රයෙන් ලොප්වේ, ඒකපක්ෂයෙක්හි "දීඝං" යන සූත්‍රයෙන් දීඝවේ, "බුද්ධානසාසනං සාරගො" යනුවේ.

"බීජංව" කියා සංහිතාකාරියක් කළමනාතන්හි, බීජං කියාවේ-ඉව කියාවේ-"බීජං ඉව" යන තන්හි නිග්ගහීතයාගෙන් පරවූ ස්වරයහට "පරො වා සරො" යන සූත්‍රයෙන් ලොප්වේ-බීජංව" යනුවේ.

"එවංස" කියාසංහිතාකාරියක් කළමනාතන්හි, එවං කියාවේ-අස්ස කියාවේ-"එවං අස්ස" යන තන්හි නිග්ගහීතයාගෙන් පරවූ ස්වරයහට "පරො වා සරො" යන සූත්‍රයෙන් ලොප්වේ, පරස්වරයහට ලොප් කළකල්හි සංයොගව්‍යඤ්ජනයෙහු හමුවූ සංයොගඇත්තේනුයි එහෙයින් "ව්‍යඤ්ජනො ච විසඤ්ඤොගො" යන සූත්‍රයෙන් පූර්වසකාරයහට ලොප්වේ, එවංස" යනුවේ.

නිග්ගහීත සන්ධි.

—— * ——

"යජ්ජෙවං බොජ්ඣඞ්ගා" කියා සංහිතාකාරියක් කළමනාතන්හි, යදි කියාවේ-එවං කියාවේ—බොධි කියාවේ-අඞ්ගා කියාවේ- "යදි එවං බොධි අඞ්ගා" යන තන්හි, "පුබ්බ-පෙ-සවරයාපරකල්හි ඉවණ්ණයහට "ඉවණ්ණො යං නවා" යන සූත්‍රයෙන් යකාරාදෙශවේ 'පච්චයාදනිට්ඨා" ඈ සූත්‍රයෙන් යකාර දකාර ධකාරයෙහි බඩවේ, යවත්වූ දකාර ධකාරයන්ට "අඤ්ඤපදිට්ඨානං වුත්තයොගතො" යන සූත්‍රයෙන් ජකාර ඣකාරාදෙශයෝ වෙත්, එක් පක්ෂයෙක්හි ජකාරයහට "පරවෙභාවො ඨානෙ" යන සූත්‍රයෙන් ද්විත්වවේ—ආබ්භන්තරයෙහි ඣකාරයහට "වග්ගෙ ඝොසාඝොසානං" යනාදි සූත්‍රයෙන් එම වර්ගයෙහිවූ තෘතීයාක්ෂරයෙක් ද්විත්වවේ-පූර්වස්වරලොප්වේ-පරාක්ෂරයාකර පැමිණ "යජ්ජෙවං බොජ්ඣඞ්ගා" යනුවේ.

"පරියෙසනා,, කියා සංහිතාකාරියක් කළමනාතන්හි, පරි කියාවේ-එසනා කියාවේ-"පරි එසනා,, යන තන්හි "පුබ්බ-පෙ-සවරයාපරකල්හි ඉවණ්ණයහට" ඉවණ්ණො යංනවා,, යන සූත්‍රයෙන් යකාරාදෙශ කළකල්හි රකාරයහට "අඤ්ඤපදිට්ඨානං වුත්තයොගතො" යන සූත්‍රයෙන් යකාරාදෙශවේ "පච්චයාදනිට්ඨා,, ඈ සූත්‍රයෙන් යකාර යකාරයෙහි බඩවේ. පූර්වස්වරලොප්වේ. පරාක්ෂරයාකර පැමිණ "පරියෙසනා,, යනුවේ.

"සුමරති,, කියා සංහිතාකාරියක් කළමනාතන්හි, ස කියාවේ—රති කියාවේ-"ස රති,, යන තන්හි "පුබ්බ-පෙ-"අඤ්ඤපදිට්ඨානං,, යනාදි සූත්‍රයෙන් මකාරාගමද සකාරයෙහි අකාරයහට උකාරාදෙශද වේ "සුමරති,, යනුවේ.

"ඉච්චෙවං,, කියා සංහිතාකාරියක් කළමනාතන්හි, ඉති කියාවේ-එවං කියාවේ "ඉති එවං,, යන තන්හි පුබ්බ-පෙ-ඉකාරයහට "අඤ්ඤපදිට්ඨානං,, යනාදි සූත්‍රයෙන් චකාරාදෙශවේ "පච්චයාදනිට්ඨා,, ඈ සූත්‍රයෙන් චකාර තකාරයෙහි බඩවේ "පූර්වස්වරලොප්වේ "පරාක්ෂරයාකර පැමිණ "ඉච්චෙවං, යනුවේ

"සොත්ථි,, කියා-පෙ-සු කියාවේ-ඉත්ථි කියාවේ-"සු ඉත්ථි,, යන තන්හි අසමානවර්ණයාගෙන් පරස්වරයහට "වා පරො අසරූපා,, යන සූත්‍රයෙන් ලොප්වේ, පූර්වස්වරයහට "අඤ්ඤපදිට්ඨානං,, යනාදි සූත්‍රයෙන් ඔකාරයෙක් ආදෙශවේ, "සොත්ථි,, යනුවේ.

"බ්‍රූහමෙව,, කියා-පෙ-බ්‍රූහා කියාවේ-එව කියාවේ-"බ්‍රූහා එව,, යන තන්හි ස්වරයාපරකල්හි "යවමදනා,, ඈ සූත්‍රයෙන් මකාරාගමවේ. ආකාරයහට "රස්සං" යන සූත්‍රයෙන් හ්‍රස්වවේ "අඤ්ඤපදිට්ඨානං" යනාදි සූත්‍රයෙන් එකාරයහට ඉකාරාදෙශවේ, පරාක්ෂරයාකර පැමිණ "බ්‍රූහමිව" යනුවේ.

– "බව්හාබාධො" කියා-පෙ-බහු කියාවේ-ආබාධො කියාවේ—"බහු ආබාධො" යන තන්හි "පුබ්බ—පෙ-ස්වරයා පරකල්හි උකාරයහට "වමොදුදන්තානං" යන සූත්‍රයෙන් වකාරාදෙශවේ "පච්චයාදනිට්ඨා" දී සූත්‍රයෙන් වකාර හකාරයෙහි බඩවේ—"අනුපදිට්ඨානං,, යනාදී සූත්‍රයෙන් හකාර වකාරයන්ගේ පූර්වාපරවිම්වශයෙන් විපර්යාසවේ, පූර්වස්වරලොප්වේ; පරාක්ෂරයාකරා පැමිණ "බව්හාබාධො" යනුවේ.

"අධාභවි" කියා-පෙ-අධි කියාවේ-අභවි කියාවේ-"අධි අභවි" යන තන්හි අධිශබ්දයට "අනුපදිට්ඨානං" යනාදී සූත්‍රයෙන් කිසිතැනෙක්හි අධ යනාදෙශවේ—පූර්වස්වරලොප්වේ—පරස්වරයනට "දීඝං" යන සූත්‍රයෙන් දීඝීවේ, පරාක්ෂරයාකරා පැමිණ "අධාභවි" යනුවේ.

"සුඛෙ දුක්ඛෙ ජීවෙ" කියා-පෙ-සුඛං කියාවේ-දුක්ඛං කියාවේ-ජීවො කියාවේ-"සුඛං දුක්ඛං ජීවො" යන තන්හි වකාරස්ථ ඔකාරයහටද නිග්ගහීතයන් දෙදෙනාටද "අනුපදිට්ඨානං" යනාදී සූත්‍රයෙන් එකාරාදෙශවේ-පූර්වස්වරලොප්වේ-පරාක්ෂරයාකරා පැමිණ "සුඛෙ දුක්ඛෙ ජීවෙ" යනුවේ.

"පළිබොධො පරිළාහො" කියා-පෙ-පරි කියාවේ—බොධො කියාවේ-පරි කියාවේ-දාහො කියාවේ-"පරි බොධො පරි දාහො" යන තන්හි "පුබ්බ-පෙ-"අනුපදිට්ඨානං" යනාදී සූත්‍රයෙන් රකාර දකාරයන්ට ළකාරාදෙශවේ-"පළිබොධො පරිළාහො" යනුවේ

"මම් අහාසි බුද්ධම් සරණම්" කියා-පෙ—මං කියාවේ-අහාසි කියාවේ-බුද්ධං කියාවේ-සරණං කියාවේ-"මං අහාසි බුද්ධං සරණං" යන තන්හි ස්වරයන්නුහු ව්‍යඤ්ජනයන්නුහු පරකල්හි නිග්ගහීතයහට "අනුපදිට්ඨානං" යනාදී සූත්‍රයෙන්, ස්වරරහිත මකාරාදෙශවේ. සරණං යන කෙළවර නිග්ගහීතයහට මෙම සූත්‍රයෙහි අනුවෘත්ත ග්‍රහණයෙන්* එසේම ස්වරරහිත මකාරයෙක් ආදෙශවේ, "මම් අහාසි බුද්ධම් සරණම්" යනුවේ.

"තදමිනා" කියා-පෙ-තං කියාවේ-ඉමිනා කියාවේ-"තං ඉමිනා" යන තන්හි නිග්ගහීතයාකෙරෙන් පරවූ ඉකාරයහට "අනුපදිට්ඨානං" යනාදී සූත්‍රයෙන් අකාරාදෙශවේ, ස්වරයා පරකල්හි නිග්ගහීතයහට "මදා සරෙ" යන සූත්‍රයෙන් දකාරාදෙශවේ, පූර්වස්වර ලොප්වේ, පරාක්ෂරයාකරා පැමිණ "තදමිනා" යනුවේ.

"එවුමං කොහං" කියා-පෙ—එවං කියාවේ-ඉමං කියාවේ-කිං කියාවේ-අහං කියාවේ-"එවං ඉමං කිං අහං" යන තන්හි නිග්ගහීතයාකෙරෙන් පර ඉකාර අකාරයන්ට "අනුපදිට්ඨානං" යනාදී සූත්‍රයෙන් උකාර ඕකාරාදෙශයෝ වෙත්-ස්වරයා පරකල්හි නිග්ගහීතයාට "ක්වචි ලොපං" යන සූත්‍රයෙන් ලොප්වේ-පූර්වස්වර ලොප්ව පරාක්ෂරයාකරා පැමිණ "එවුමං කොහං" යනුවේ.

---

* මේ ,අනුවෘත්ත, ය කුමැයි පළකානුලැබේවා

“පටිසංඛායොනිසො” කියා-පෙ-පටිසංඛාය කියාවේ—යොනිසො කියාවේ-“පටිසංඛාය යොනිසො,, යන තන්හි වාක්‍යයාගේ සුඛොච්චාරණයපිණිසද ඡන්දස්නුගේ නොපිරිහීමපිණිසද * “අනුපදිසානං” යනාදි සූත්‍රයෙන් පූර්වාකාරයහට ලොප්වේ “පටිසංඛායොනිසො” යනුවේ.

“අලාපූනි සිදන්ති” යනාදි තන්හි “අනුපදිසානං” යනාදි සූත්‍රයෙන් පූර්වඅකාරයට ලොප්වේ, “ලාපූනි සිදනති සිලා පලවනති” යනුවේ,

“අකාරම්හසතෙ කිච්චං” කියා සංහිතාකාරයක්කළමනානත්හි, අකාරම්හසෙ කියාවේ-තෙකිච්චං කියාවේ-“අකරම්හස තෙකිච්චං,, යන තන්හි “පුබ්බ-පෙ-වා නතීනුගේ අභෙදයපිණිස සකාරයෙහි ගුරු වූ එකාරයහට “අනුපදිසානං” යනාදි සූත්‍රයෙන් ලබුවූ අකාරයෙන් ආදෙශවේ, “අකාරම්හසතෙ කිච්චං” යනුවේ.

සඤ්ඤාවිධානං සරසන්ධි සන්ධි නිසෙධනං ව්‍යඤ්ජනසන්ධි සන්ධි
යො නිග්ගහීතස්ස ච සන්ධිකප්පෙ සුනිච්ඡයො සො ති මයෙත්ථ වුත්තො †
වොමිස්සකසන්ධි.

——— * ———

බුද්ධො, බුද්ධා යන තන්හි “ජිනවචනයුත්තං හි” යනු වැවෙන් කොහි “ලිඞ්ගඤ්ච නිපච්චතෙ” යන පරිභාෂා සූත්‍රයෙන් ජිනවචනානුකූලව බුද්ධ යන ප්‍රකෘති බුද්ධ කියා දෙතැනෙකවේ—ඕහට “පරසමඤ්ඤා පයොගෙ” යන පරිභාෂා සූත්‍රයෙන් ලිඞ්ග සංඥාවෙයි, ඒ ලිඞ්ගනු කෙරෙන් පරව “සියො අංයො නාහි සනං ස්මාහි සනං ස්මිංසු” යන සූත්‍රයෙන් විභක්තිසංඥාකරණලද සභාදිනු “තතො ච විභත්තියො” යන සූත්‍රයෙන් වෙති, ඔවුන්ගේ ප්‍රථමවිභක්ත්‍යාදිවශයෙන් අනියම් ප්‍රාප්තියක් ඇතිකල්හි “වචනාපිවශානුපුබ්බිකායදද්ධපවත්ති” යනු සූත්‍රයෙහින් වචනානු ලිඞ්ගාර්ථමාත්‍රයක් ප්‍රකාශකරණුකැමති[illegible]හි “තතො ච විභත්තියො” යන සූත්‍රයෙන් ප්‍රථමාසංඥාකරණලද සි ප්‍ර

---

* “පටිසංඛායොනිසො” යන්නෙහි යකාරලොපය වාක්‍යසුඛොච්චාරණයපිණිසයි-වාක්‍යයට ඡන්දස් නැති බැවිනි “අලාපූනි” යන්නෙහි අකාරලොපය ඡන්දස්නොපිරිහීම පිණිසයි.

† සඤ්ඤාවිධානං, සංඥාවිධානයද; සරසන්ධි, ස්වරසංහිතාද; නිසෙධනං සන්ධි, ප්‍රතිෂෙධ සංහිතාද; බ්‍යඤ්ජනසන්ධි, ව්‍යඤ්ජනසංහිතාද; නිග්ගහීතස්ස ච සන්ධි, නිග්‍රහීතානුබන්ධ සංහිතාද යන; යො, යම් පංචප්‍රකාරසන්ධියක්; සන්ධිකප්පෙ, සන්ධිකල්පනාවෙහි; වුත්තො, කාත්‍යායනාචාර්යයන්විසින් කියනලදද; සො, ඒ පංචප්‍රකාරසන්ධිතෙම; සුනිච්ඡයො හොති, සුන්දරවිනිශ්චය ඇත්තේම; එත්ථ, මේ පදරූපසිද්ධිනම් ප්‍රකරණයෙහි; මයා, මාවිසින්; වුත්තො, කියනලදී—මේ යස රූපසිද්ධියෙන් ගෙණ යොද, හිගේ—ඒඅන්නය අපි මෙහි ලියා ලීමු.

යො ස යනාදෙදෙන "ලිඞ්ගත්ථෙ පඨමා" යන සූත්‍රයෙන් ලිඞ්ගාර්ථයෙහි වෙති, ඔවුන්ගේදු එකවචනබහුවචනවශයෙන් අනියමින් ප්‍රාප්තියක් ඇතිකල්හි "එකම්හි වත්තබ්බෙ එකවචනං" යනු න්‍යායහෙයින් වක්තෘනු එකාර්ථයක් ප්‍රකාශකරණුකැමතිකල්හි "තතො ච විභත්තියො" යන සූත්‍රයෙහි චශබ්දග්‍රහණයෙන් ප්‍රථමාඑකවචනසංඥාකරණලද සි විභක්ති එක්තැනෙකවේ—"බහුම්හි වත්තබ්බෙ බහුවචනං" යනු න්‍යායහෙයින් වක්තෘනු බහ්වර්ථයක් ප්‍රකාශකරණු කැමතිකල්හි "තතො ච විභත්තියො" යන සූත්‍රයෙහි චශබ්දග්‍රහණයෙන් ප්‍රථමාබහුවචනසංඥාකරණලද යො විභක්ති එක්තැනෙකවේ—විභක්තිපරකල්හි "පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ" යන පරිභාෂාසූත්‍රයෙන් ස්වරයාකෙරෙන් ව්‍යඤ්ජනපෘථග්වේ—පෘථග්වන්නෙහිදු ධකාරයී අකාරයාකෙරෙන් ධකාරපෘථග්වේ—ධකාරහල්වේ—පුල්ලිඞ්ගයෙහිවැටෙන්නාවූ අකාරාන්තනාමයාකෙරෙන් පරවූ සි විභක්තිහට "සො" යන සූත්‍රයෙන් ඔකාරයෙක් ආදෙශවේ-අකාරාන්තනාමයාකෙරෙන් පරවූ ප්‍රථමා යො විභක්තිහට "සබ්බයොනීනමා එ" යන සූත්‍රයෙන් ආකාරයෙක් ආදෙශවේ—විභක්ත්‍යාදෙශස්වරයා පරකල්හි පූර්වස්වරයහට "සරලොපොමාදෙස පච්චයාදිම්හි සරලොපෙ තු පකති" යන සූත්‍රයෙන් ලොප්වේ-පරස්වරයහට "ක්වචාසවණ්ණං ලුත්තෙ" යන සූත්‍රයෙන් අසවර්ණාදෙශප්‍රාප්තකල්හි "සරලොපොමාදෙසපච්චයාදිම්හි සරලොපෙ තු පකති" යන සූත්‍රයෙහි තු ශබ්දග්‍රහණයෙන් ප්‍රතිෂෙධව මෙම සූත්‍රයෙන්ම ප්‍රකෘතිවත්වේ—ඉටසිටි ස්වරරහිතවූ ව්‍යඤ්ජන තෙම "නයෙ පරං යුත්තෙ" යන පරිභාෂා සූත්‍රයෙන් පරස්වරයාකරා පැමිණ විභක්ත්‍යාසන්නහෙයින් "පරසමඤ්ඤා පයොගෙ" යන පරිභාෂාසූත්‍රයෙන් පදසංඥාව බුද්ධො, බුද්ධා යනුවේ.

බුද්ධො යනු බුද්ධශබ්දයහට පුල්ලිඞ්ගයෙහි ලිඞ්ගාර්ථයෙහි සිඩවූ ප්‍රථමා එකවචනාන්තනාමිකපදය—බුද්ධා යනු බුද්ධශබ්දයහට පුල්ලිඞ්ගයෙහි ලිඞ්ගාර්ථයෙහි සිඩවූ ප්‍රථමා බහුවචනාන්තනාමිකපදය—බුද්ධො, පර්‍ය්‍යායනාම; තිළිති, සිටි, බුදු, සර්වඥවරයෝ; ජිණුනි, සිටිත්.

මතුයෙහිදු ලිඞ්ගත්‍රයෙහිවූ හැම ශබ්දයන්ගේම හැම පදයන්ටම සූක්ෂ්ම ලෙසින් මෙසේ ව්‍යාඛ්‍යාකටයුතු.

හෙබුද්ධ, බුද්ධා—භවන්තො බුද්ධා යන පාන්හි "ජිනවචන—පෙ— වක්තෘනු ආමන්ත්‍රණයක් ප්‍රකාශකරණුකැමතිකල්හි "තතො ච විභත්තියො" යන සූත්‍රයෙන් ආලපනසංඥාකරණලද සි යො යනාදෙදෙන "ආලපනෙ ච" යන සූත්‍රයෙන් ආමන්ත්‍රණයෙහි වෙති, ඔවුන්ගේදු එකවචන-පෙ-ආලපනඑකවචන සංඥාකරණලද සි විභක්ති එක්තැනෙකවේ, "බහුම්හි—පෙ—ආලපනබහුවචනසංඥාකරණලද යො විභක්ති එක්තැනෙකවේ, විභක්තිපරකල්හි "පුබ්බ-පෙ-ආමන්ත්‍රණ

යෙහිවූ සි විභක්තිහට "ආලපනෙ සි ගසඤ්ඤො" යන සූත්‍රයෙන් ගසංඥාවේ, ගසංඥයා පරකල්හි අකාරයහට "අකාරපිතාද්‍යන්තානමා" යන සූත්‍රයෙන් අවිකල්පයෙන් ආකාරාදේශවේ—ගසංඥයා පරකල්හි ආකාරයහට "ආකාරො වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් හ්‍රස්වවේ, සෙසයාකෙරෙන් පරවූ ගසංඥයාහට "සෙසතො ලොපං ගසිපි" යන සූත්‍රයෙන් ලොප්වේ, අකාරාන්තනාමයාකෙරෙන් පරවූ ආලපනයා විභක්තිහට "සබ්බයොනීනමාඑ" යන සූත්‍රයෙන් ආකාරාදේශවේ—යටකීපරිදි—පෙ—පදසංඥාව හෙ බුද්ධ, බුද්ධා—භවන්තො බුද්ධා යනුවේ.

හෙ බුද්ධ, බුද්ධා යනු බුද්ධශබ්දයහට පුල්ලිඞ්ගයෙහි ආමන්ත්‍රණයෙහි සිද්ධවූ ආලපනඑකවචනාන්තනාමිකපදයි—භවන්තො බුද්ධා යනු බුද්ධශබ්දයහට පුල්ලිඞ්ගයෙහි ආමන්ත්‍රණයෙහි සිද්ධවූ ආලපනබහුවචනාන්තනාමිකපදය-හෙ බුද්ධ බුද්ධා, පින්වත්වූ සර්වඥය; මං පාහි, මා රක්ෂා කර; භවන්තො බුද්ධා, පින්වත්වූ සර්වඥවරයෙනි; අම්හෙ පාලයථ, අප රක්ෂාකරව්.

බුද්ධං, බුද්ධෙ යන තන්හි "ජිනවචන—පෙ—වක්තෘහු කර්මාර්ථයක් ප්‍රකාශකරණු කැමතිකල්හි "තතො ච විභත්තියො" යන සූත්‍රයෙන් ද්විතීයාසංඥාකරණලද අං යො යනදෙදෙන "කම්මත්ථෙ දුතියා" යන සූත්‍රයෙන් කර්මාර්ථයෙහි වෙති, ඔවුන්ගේද එකවචනසංඥාකරණලද අං විභක්ති එක්තැනෙකවේ, "බහුමහි-පෙ-ද්විතීයාබහුවචනසංඥාකරණලද යො විභක්ති එක්තැනෙකවේ. විභක්තිපරකල්හි-"බුද්ධ-පෙ-පුල්ලිඞ්ගයෙහි වැටෙන්නාවූ අකාරාන්තනාමයාකෙරෙන් පරවූ ද්විතීයා යො විභක්තිහට "සබ්බයොනීනමාඑ" යන සූත්‍රයෙන් එකාරයෙක් ආදේශවේ, අං විභක්තිහා විභක්ත්‍යාදේශස්වරයා පරකල්හි පූර්වස්වරයහට "සරලොපො" යි සූත්‍රයෙන් ලොප්වේ,-යටකීපරිදි—පෙ-පදසංඥාවී බුද්ධං, බුද්ධෙ යනුවේ.

බුද්ධං යනු බුද්ධශබ්දයහට පුල්ලිඞ්ගයෙහි කර්මාර්ථයෙහි සිද්ධවූ ද්විතීයා එකවචනාන්තනාමිකපදය—බුද්ධෙ යනු බුද්ධශබ්දයහට පුල්ලිඞ්ගයෙහි කර්මාර්ථයෙහි සිද්ධවූ ද්විතීයා බහුවචනාන්තනාමිකපදය—බුද්ධං, සර්වඥයා; පනමාමි, වදිමි; බුද්ධෙ, සර්වඥවරයන්; පනමාම, වඳිමු.

බුද්ධෙන, බුද්ධෙහි, බුද්ධෙභි යන තන්හි "ජිනවචන—පෙ—වක්තෘහු කර්තෘකාරකයක් ප්‍රකාශකරණු කැමතිකල්හි "තතො ච විභත්තියො" යන සූත්‍රයෙන් තෘතීයාසංඥාකරණලද නා හි යනදෙදෙන "කත්තරි ච" යන සූත්‍රයෙන් කර්තෘකාරකයෙහි වෙති—ඔවුන්ගේද එකවචන-පෙ-තෘතීයා එකවචනවූ නා විභක්ති එක්තැනෙකවේ—"බහුමහි-පෙ-තෘතීයා බහුවචනවූ හි විභක්ති දෙතැනෙකවේ, විභක්තිපර

කල්හි "පුබ්බ—පෙ—අකාරාන්තනාමිකයෙන් පරවූ නා විභක්තියට "අතොනෙනා" යන සූත්‍රයෙන් එනාදේශවේ, සවර්ණපරකල්හි පූර්වස්වරයාට "සරලොපො" යනාදි සූත්‍රයෙන් ලොපවේ—හි විභක්ති පරකල්හි අකාරයාට "සුනංහිසු ච" යන සූත්‍රයෙන් එකාරාදේශවේ—හි පහන්නට "ස්මාහිස්මිංනං ම්හාභිම්හි වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් භි යනාදේශවේ,—සවිසි—පෙ—පදසංඥාවී බුද්ධෙන—බුද්ධෙහි, බුද්ධෙභි යනුවේ.

බුද්ධෙන යනු බුද්ධශබ්දයට පුල්ලිඞ්ගයෙහි කර්තෘකාරකයෙහි සිඬවූ තෘතීයෛකවචනාන්ත නාමිකපදය—බුද්ධෙහි, බුද්ධෙභි යනු බුද්ධශබ්දය හට පුල්ලිඞ්ගයෙහි කර්තෘකාරකයෙහි සිඬවූ තෘතීයාබහුවචනාන්තනාමිකපදයි.—බුද්ධෙන, සර්වඥයාවිසින්; ධම්මො දෙසිතො, දහම් දෙසන ලද්දී; බුද්ධෙහි බුද්ධෙභි, සර්වඥවරයන්විසින්; සාවකානං අනුසාසෙන්ති, ශ්‍රාවකයන්ට අනුශාසනා කෙරෙත්.

බුද්ධෙන—බුද්ධෙහි, බුද්ධෙභි යන තන්හි "තිනවචන—පෙ—වකානු කරණකාරකයක් ප්‍රකාශකරණු කැමතිකල්හි "ධාතෙනා ච විභත්තියො" යන සූත්‍රයෙන් කරණසංඥ කරණලද නාම හිය යනාදෙදෙනා "කරණෙ තතියා" යන සූත්‍රයෙන් කරණකාරකයෙහි වෙහි, ඔවුන් ගෙන් එකවචන—පෙ—කර්තෘකාරකයෙහිමෙන් නා විභක්තියට එම සූත්‍රයෙන් එන යනාදේශවේ, හි විභක්ති පරකල්හි අකාරයාට එකාරාදේශනා හි යනාදේශවේ. බුද්ධෙන—බුද්ධෙහි, බුද්ධෙභි යනුවේ.

බුද්ධෙන යනු බුද්ධශබ්දයට පුල්ලිඞ්ගයෙහි කරණකාරකයෙහි සිඬවූ කරණෛකවචනාන්ත නාමිකපදය. බුද්ධෙහි, බුද්ධෙභි යනු බුද්ධශබ්දය හට පුල්ලිඞ්ගයෙහි සිඬවූ කරණබහුවචනාන්තනාමිකපදයි.—බුද්ධෙන, සර්වඥයා කරණකොටගෙණ; සුඛිහොමි, සුවපත්වෙමි; බුද්ධෙහි බුද්ධෙභි, සර්වඥවරයන් කරණකොටගෙණ, සුඛිහොම, සුවපත්වෙමු.

බුද්ධාය, බුද්ධස්ස—බුද්ධානං යන තන්හි "චතුත්ථවචන—පෙ—වකානු සම්ප්‍රදානකාරකයක් ප්‍රකාශකරණු කැමතිකල්හි "තස්සා ච විභත්තියො" යන සූත්‍රයෙන් චතුර්ථීසංඥ කරණලද ස නං යනාදෙදෙනා "සම්පදානෙ චතුත්ථී" යන සූත්‍රයෙන් සම්ප්‍රදානකාරකයෙහි වෙහි, ඔවුන්ගෙන් එකවචන—පෙ—චතුර්ථී එකවචනවූ ස විභක්තිද ගනෙකාවේ, බහු මති—පෙ—චතුර්ථී බහුවචනවූ නං විභක්තිඑක්තැනෙකාවේ. විභක්ති පරකල්හි "පුබ්බ-පෙ-පුල්ලිඞ්ගයෙහි වැටෙන්නාවූ අකාරාන්තනාමිකයෙන් පරවූ චතුර්ථී එකවචනවූ ස විභක්තියට "ආය චතුත්ථෙකවචනස්ස තු" යන සූත්‍රයෙන් විකල්පයෙන් ආය යනාදේශවේ, අන්‍ය පක්‍ෂයෙහි ස විභක්තිපරකල්හි "සාගමො සෙ" යන සූත්‍රයෙන් සකාරයෙක් ආගමවේ "ප්‍රචිඩාගනිස" දී සූත්‍රයෙන් සකාර සකාරයෙහි ද්විත්වවේ—

නං විභත්ති පරකල්හි අකාරයහට "සුනංහිසු ච" යන සූත්‍රයෙන් දීර්ඝවේ. ස්‍යාදිවි-පෙ-පදසංඥාව-බුද්ධාය, බුද්ධස්ස-බුද්ධානං යනුයි.

බුද්ධාය, බුද්ධස්ස — යනු බුද්ධශබ්දයහට පුල්ලිඞ්ගයෙහි සම්ප්‍රදානකාරකයෙහි සිඩවූ චතුර්ථී ඒකවචනාන්තනාමිකපදයි, බුද්ධානං යනු බුද්ධශබ්දයහට පුල්ලිඞ්ගයෙහි සම්ප්‍රදානකාරකයෙහි සිඩවූ චතුර්ථී බහුවචනාන්තනාමිකපදය — බුද්ධාය, බුද්ධස්ස, සර්වඥයාහට; පුප්ඵං පූජයාමි, මල් පුදමි; බුද්ධානං. සර්වඥවරයන්ට; පුප්ඵානි පූජයාමි, මල් පුදමු.

චතුර්ථී ඒකවචනවූ ස විභත්තිහට "ආය චතුත්ථෙකස්ස" යනාදි සූත්‍රයෙහි ග්‍රහණයෙන් ආය යනාදෙශව බුද්ධාය සිද්ධවේ.

බුද්ධා, බුද්ධම්හා, බුද්ධස්මා-බුද්ධෙහි, බුද්ධෙභි-යන තන්හි "ජිනවචන-පෙ-වක්ඛානු අපාදානකාරකයක් ප්‍රකාශකරණු කැමතිකල්හි "තතො ච විභත්තියො" යන සූත්‍රයෙහි චකාරයෙන් පචමී සංඥාකරණලද ස්මා හිය යන දෙදෙන "අපාදානෙ පචමී" යන සූත්‍රයෙන් අපාදානකාරකයෙහි වෙති, ඔවුන්ගේදු ඒකවචන-පෙ-පචමී ඒකවචනවූ ස්මා විභත්ති තුන්නැනෙකවේ, "බහුම්හි-පෙ-පචමී බහුවචනවූ හි විභත්ති දෙතැනෙකවේ, විභත්ති පරකල්හි "පුබ්බ-පෙ-ස්මා විභත්තිහට "ස්මාස්මිනනං වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් ආකාරයක් ආදේශවේ, පූර්වස්වරය හට "සරලොපො" යනාදි සූත්‍රයෙන් ලොපවේ, එක් පක්ෂයෙක්හි ස්මා විභත්තිහට "ස්මාහිස්මිනනං මහාභිම්හි වා" යනු සූත්‍රයෙන් විකල්පයෙන් ම්හා යනාදේශහා හි විභත්තිහට භි යනාදේශවේ. හි විභත්ති පරකල්හි අකාරයහට "සුහිස්වකාරො ඒ" යන සූත්‍රයෙන් ඒකාරාදේශවේ, ස්‍යාදිවි-පෙ-පදසංඥාව බුද්ධා, බුද්ධම්හා, බුද්ධස්මා-බුද්ධෙහි, බුද්ධෙභි යනුවේ

බුද්ධා, බුද්ධම්හා, බුද්ධස්මා යනු බුද්ධශබ්දයහට පුල්ලිඞ්ගයෙහි අපාදානකාරකයෙහි සිඩවූ පචමීඒකවචනාන්තනාමිකපදයි, බුද්ධෙහි, බුද්ධෙභි යනු බුද්ධශබ්දයහට පුල්ලිඞ්ගයෙහි අපාදානකාරකයෙහි සිඩවූ පචමීබහුවචනාන්තනාමිකපදයි — බුද්ධා, බුද්ධම්හා, බුද්ධස්මා, සර්වඥයාකෙරෙන්; භික්ඛු කම්මට්ඨානං යාචති, භික්ෂුතෙම කමටහන් ඉල්වන්නේය; බුද්ධෙහි, බුද්ධෙභි, සර්වඥවරයන්කෙරෙන්; භික්ඛවො කම්මට්ඨානානි යාචන්ති, භික්ෂූන්වහන්සේලා කමටහන් ඉල්වන්නේසේලාය.

බුද්ධස්ස-බුද්ධානං යන තන්හි "ජිනවචන-පෙ-වක්ඛානු ස්වාමියක් * ප්‍රකාශකරණු කැමතිකල්හි "තතො ච විභත්තියො" යන සූත්‍රයෙහි චකාරයෙන් ෂෂ්ඨී සංඥාකරණලද ස්ස නං යන දෙදෙන "සාමිස්මිං ඡට්ඨී" යන සූත්‍රයෙන් ස්වාමියෙහි වෙති, ඔවුන්ගේදු ඒකවචන—පෙ—

---

* මෙහි 'ස්වාමිකාරක'යි හැම තන්හිම පෙනේයි. ඒ ප්‍රමාදපාඨ බැවින් ප්‍රතික්ෂෙපකෙළෙමු.

[illegible]ඒකවචනවූ ස විභක්ති එක්නැංගෙනකලේ, "චතුත්ථී—පෙ—ඡට්ඨී බහුවචනවූ නං විභක්ති එක්නැංගෙනකලේ, විභක්ති පරකල්හි "සුබ්බ—පෙ—ස විභක්තිපරකල්හි "සාගමො සෙ" යන සූත්‍රයෙන් සකාරාගමවේ, නං විභක්ති පරකල්හි අකාරයහට "සුනංහිසු ච" යන සූත්‍රයෙන් දීර්ඝවේ-සවසිටි-පෙ—පදසංඥාව බුද්ධස්ස—බුද්ධානං යනුවේ.

බුද්ධස්ස යනු බුද්ධශබ්දයහට පුල්ලිඞ්ගයෙහි ස්වාමියෙහි සිද්ධවූ ෂෂ්ඨී ඒකවචනාන්තනාමිකපදය, බුද්ධානං යනු බුද්ධශබ්දයහට පුල්ලිඞ්ගයෙහි ස්වාමියෙහි සිද්ධවූ ෂෂ්ඨී බහුවචනාන්තනාමිකපදය—බුද්ධස්ස, සර්වඥයාගේ; විහාරො, විහාරයයි; බුද්ධානං, සර්වඥවරයන්ගේ; සාවකා, ශ්‍රාවකයෝයි.

බුද්ධෙ, බුද්ධම්හි, බුද්ධස්මිං—බුද්ධෙසු යන තන්හි "ජිනවචන—පෙ—වත්තනාහු ඕකාසකාරකයක් ප්‍රකාශකරණු කැමතිකල්හි "තතො ච විභත්තියො" යන සූත්‍රයෙන් සප්තමී සංඥාකරණලද ස්මිං සු යන දෙදෙන "ඔකාසෙ සත්තමී" යන සූත්‍රයෙන් ඕකාසකාරකයෙහි වෙති, ඔවුන්ගේද ඒකවචන—පෙ—සප්තමී ඒකවචනවූ ස්මිං විභක්ති තුන් නැංගෙනකලේ, "බහුම්හි-පෙ-සප්තමී බහුවචනවූ සු විභක්ති එක්නැංගෙනකලේ, විභක්ති පරකල්හි "සුබ්බ—පෙ—අකාරාන්තනාමයකෙරෙන් පරවූ ස්මිං විභක්තිහට "ස්මාස්මිංනං වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් ඒකාරාදෙශවේ, පූර්වස්වරයහට "සරලොපො" යනාදී සූත්‍රයෙන් ලොපවේ, එක් පක්ෂයෙක්හි ස්මිං විභක්තිහට "ස්මාහිස්මිංනං ම්හාභිම්හි වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් ම්හි යනාදෙශවේ, සු විභක්ති පරකල්හි අකාරයහට "සුහිස්වකාරො ඒ" යන සූත්‍රයෙන් ඒකාරයෙක් ආදෙශවේ—සවසිටි—පෙ—පදසංඥාව බුද්ධෙ, බුද්ධම්හි, බුද්ධස්මිං—බුද්ධෙසු යනුවේ

බුද්ධෙ, බුද්ධම්හි, බුද්ධස්මිං යනු බුද්ධශබ්දයහට පුල්ලිඞ්ගයෙහි ඕකාසකාරකයෙහි සිද්ධවූ සප්තමී ඒකවචනාන්තනාමිකපදයි, බුද්ධෙසු යනු බුද්ධශබ්දයහට පුල්ලිඞ්ගයෙහි ඕකාසකාරකයෙහි සිද්ධවූ සප්තමී බහුවචනාන්තනාමිකපදය—බුද්ධෙ, බුද්ධම්හි, බුද්ධස්මිං, සර්වඥයාකෙරෙහි; අහං පසන්නොස්මි, මම ප්‍රසන්නයෙමි; බුද්ධෙසු, සර්වඥවරයන්කෙරෙහි; තුම්හෙ පසීදථ, තෙපිද ප්‍රසන්නවව්—මෙතුකියන සියලුම නාමකාණ්ඩයෙහි මෙසෙයින් වාක්‍යයද ඒ ඒ පදයන්ගේ අර්ථයන්ද ඒ ඒ තන්හි සුදුසු සුදුසු ලෙසින් යොදා ගතයුතු.

බුද්ධො, බුද්ධා—(හෙ) බුද්ධ, බුද්ධා (භවන්තො) බුද්ධා—බුද්ධං, බුද්ධෙ—බුද්ධෙන, බුද්ධෙහි, බුද්ධෙභි—කරණෙ—බුද්ධෙන, බුද්ධෙහි, බුද්ධෙභි—බුද්ධාය, බුද්ධස්ස, බුද්ධානං—බුද්ධා, බුද්ධම්හා, බුද්ධස්මා, බුද්ධෙහි, බුද්ධෙභි—බුද්ධස්ස, බුද්ධානං—බුද්ධෙ, බුද්ධම්හි, බුද්ධස්මිං, බුද්ධෙසු,

ඝටපටශබ්දයෙන්ද මෙසේ වරනැගියයුතු.

එවං සුරාසුරනරෝරග නාග යක්ඛා
ගන්ධබ්බ කින්නර මනුස්ස පිසාච පේතා,
මාතඞ්ග ජඞ්ගම තුරඞ්ග වරාහ සීහා
ව්‍යග්ඝච්ඡ කච්ඡප තරච්ඡ මිගස්ස සොණා.

ආලෝක ලෝක නිලයානිල චාගයෝග
වායාමගාම නිගමා'ගම ධම්ම කාමා.
සඞ්ඛ්‍යෝඝඝෝසපරිසාසව කෝධ ලෝභ
සාරම්භථම්භ මදමාන පමාද මක්ඛා

පුන්නාග පූගපනසා සනචම්පකම්බ
හින්තාල තාලවකුලජ්ජුන කිංසුකා ච
මන්දාර කුන්ද පුචිමන්ද කරඤ්ජරුක්ඛා
මයූරසකුණණ්ඩජකොඤ්ච හංසා,

ඉච්චාදයෝ බුද්ධසඤ්ඤා'ව.

සුර, දෙවියෝය; අසුර, අසුරයෝය; නර, මනුෂ්‍යයෝය; උරග, සර්පයෝය; නාග, ඇත්තුය; යක්ඛ, යක්ෂයෝය; ගන්ධබ්බ, දිව්‍යගන්ධර්වයෝය; කින්නර, ලියකිඳුරෝය; මනුස්ස, මිනිස්සුය; පිසාච, පාංශුපිසාචයෝය; පේත, ප්‍රේතයෝය; මාතඞ්ග, ඇත්තුය; ජඞ්ගම, චලද්‍රව්‍යය; තුරඞ්ග, අශ්වයෝය; වරාහ, ඌරෝය; සීහ, සිංහයෝය; ව්‍යග්ඝ, ව්‍යාඝ්‍රයෝය; අච්ඡ, වලස්සුය; කච්ඡප, ඉදිබුවෝය; තරච්ඡ, කරබානාවලස්සුය; මිග, මුවෝය; අස්ස, අශ්වයෝය; සොණ, සුනඛයෝය.

ආලෝක, එළිය; ලෝක, ලෝකය; නිලය, ගෙය; අනිල, වාතය; චාග, ත්‍යාගය; යෝග, යෙදීමය; වායාම, ව්‍යායාමය; ගාම, ග්‍රාමය; නිගම, මහත්ග්‍රාමය; ආගම, පිටකත්‍රය; ධම්ම, පර්‍යාප්තිධර්මය; කාම, පඤ්චකාමය; සඞ්ඛ්‍ය, ගණනය; ඔඝ, වතුරය; ඝෝස, ශබ්දය; පරිස, පිරිසය; ආසව, කාමාදී ආශ්‍රවය; කෝධ, ක්‍රෝධය; ලෝභ, ආශාය; සාරම්භ, කරණකාරියකාරණය; ථම්භ, ඇඹෙහෙ සිතදැඩිබවය; මද, පුරුෂමදාදී මදය; මාන, මානනය; පමාද, ප්‍රමාදය; මක්ඛා, ගුණමකු ආදීමකුබවය.

පුන්නාග, දොඹගස; පූග, පුවක; පනස, කොස; අසන, පියාගස; චම්පක, සපුය; අම්බ, අඹගස; හින්තාල, හිතුල්; තාල, තල්; වකුල, මුනමල්ගස්; අජ්ජුන, කුඹුක; කිංසුකාව, කැල; මන්දාර, පරසතුමඳාරය; කුන්ද, මෑකොඳ. පුචිමන්ද, කොසඹ; කරඤ්ජ, කරඳ; රුක්ඛා, රුක; මයූර, මොනරු; සකුණ, පක්ෂීනු; අණ්ඩජ, විහඟයෝය; කොඤ්ච, කොස්ලිහිණිය; හංසා, හංසයෝය.

මෙයින් මතු කත්තෘකාරක කරණකාරක දෙදෙනාගේද, සම්ප්‍රදානකාරක සම්බන්ධ දෙදෙනාගේද, සමානරූපබව හෙයින් තෘතීයා චතුර්ථී දෙදෙනාගේ පදසිද්ධික්‍රමය බොහෝ කොට දක්වනු ලැබෙයි— මතු කියන හැම ශබ්දමාලාවෙහිම ආලපන සි විභක්තියට ගසංඥ කිරීමද, එහි පුල්ලිඞ්ග නපුංසකලිඞ්ග දෙක්හිවූ ඉවර්ණයහට ඣසංඥ කිරීමද, එසේම උවර්ණයහට ලසංඥකිරීමද, ස්ත්‍රීලිඞ්ගයෙහිවූ ආකාරයහට ඝසංඥකිරීමද, එහිමවූ ඉවර්ණ උවර්ණයන්ට පසංඥකිරීමද, ඒ ඒ තන්හි කිවද නොකීවද යුතුතන්හි යොදා කියයුතු.

අත්තා, අත්තානො යන තන්හි "ජිනවචන-පෙ-පඨමා එකවචනවූ සි විභක්ති එක්තැනෙකවේ, බහුවචනවූ යො විභක්ති එක්තැනෙකවේ, බ්‍රහ්මශබ්දාදීන්කෙරෙන් පරවූ සි විභක්තිහට "ස්‍යාච" යන සූත්‍රයෙන් ආකාරාදේශවේ-බ්‍රහ්මශබ්දාදීන්කෙරෙන් පරවූ යො විභක්තිහට "යොනමානො" යන සූත්‍රයෙන් ආනො යනාදේශවේ, විභක්ත්‍යාදේශ ස්වරයා පරකල්හි පූර්වස්වරයහට "සරලොපො" යනාදී සූත්‍රයෙන් ලොප්හා ප්‍රකෘතිවත්වේ, පරාක්ෂරයාකරා පැමිණ විභක්ත්‍යන්තහෙයින් "පරසමඤ්ඤා පයොගෙ" යන පරිභාෂා සූත්‍රයෙන් පදසංඥව අත්තා, අත්තානො යනුවේ.

(හෙ) අත්ත, අත්තා-(භවන්තො) අත්තානො යන තන්හි "ජිනවචන-පෙ-ආලපනඑකවචනවූ සි විභක්ති දෙතැනෙකවේ, ආලපනබහුවචනවූ යො විභක්ති එක්තැනෙකවේ, ආමන්ත්‍රණයෙහිවූ සි විභක්තිහට "ආලපනෙ සි ගසඤ්ඤො" යන සූත්‍රයෙන් ගසංඥවේ, ගසංඥයා පරකල්හි අකාරයහට "ආකාරපිතාද්‍යන්තානමා" යන සූත්‍රයෙන් අවිකල්පයෙන් ආකාරාදේශවේ, ගසංඥයා පරකල්හි ආකාරයහට "ආකාරො වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් හ්‍රස්වවේ, සෙසයාකෙරෙන් පරවූ ගසංඥයහට "සෙසතො ලොපං ගසිපි" යන සූත්‍රයෙන් ලොප්වේ, යො විභක්තිහට "යොනමානො" යන සූත්‍රයෙන් ආනො යනාදේශවේ, විභක්ත්‍යාදේශ ස්වරයා පරකල්හි පූර්වස්වරයහට "සරලොපො" යනාදී සූත්‍රයෙන් ලොප්හා ප්‍රකෘතිවත්වේ, පරාක්ෂරයාකරා පැමිණ (හෙ) අත්ත, අත්තා-(භවන්තො) අත්තානො යනුවේ.

අත්තානං, අත්තං—අත්තානො යන තන්හි "ජිනවචන-පෙ—දුතියා එකවචනවූ අං විභක්ති දෙතැනෙකවේ, බහුවචනවූ යො විභක්ති එක්තැනෙකවේ, බ්‍රහ්මශබ්දාදීන්කෙරෙන් පරවූ අං විභක්තිහට "බ්‍රහ්මත්තසඛරාජාදිතො අමානං" යන සූත්‍රයෙන් විකල්පයෙන් ආනං යනාදේශවේ, යො විභක්තිහට "යොනමානො" යන සූත්‍රයෙන් ආනො යනාදේශවේ, පූර්වස්වරලොප්වේ, පරාක්ෂරයාකරා පැමිණ අත්තානං, අත්තං, අත්තානො යනුවේ

අත්තෙන, අත්තනා-අත්තනෙහි, අත්තනෙහි යන තන්හි "ජිනවචන-පෙ-තෘතීයාඑකවචනවූ නා විභක්ති දෙතැනෙකවේ, බහුවචනවූ හි විභක්ති දෙතැනෙකවේ, අකාරාන්තනාමයාගෙකරෙන් පරවූ නා විභක්තිහට "අතොනෙන" යන සූත්‍රයෙන් විකල්පයෙන් එන යනාදෙශවේ, හි විභක්ති පරකල්හි අත්තශබ්දයාගේ අන්තයට "අත්තානොහිස්මිමනත්තං" යන සූත්‍රයෙන් අන යනාදෙශවේ, හි විභක්ති පරකල්හි නකාරයෙහි අකාරයහට "සුහිස්වකාරො එ" යන සූත්‍රයෙන් එකාරාදෙශවේ, හි විභක්තිහට "ස්මාහිස්මිංනං මහාභිම්හි වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් භි යනාදෙශවේ, පරාක්ෂරයාකරා පැමිණ අත්තෙන, අත්තනා-අත්තනෙභි, අත්තනෙහි යනුවේ.—තෘතීයා කාරකයෙහි පදසිද්ධික්‍රම යද මෙසේමැයි.

අත්තනො, අත්තානං යන තන්හි "ජිනවචන—පෙ—චතුර්ථී එකවචනවූ ස විභක්ති එක්තැනෙකවේ, බහුවචනවූ නං විභක්ති එක්තැනෙකවේ, ස විභක්තිහට "සස්ස නො" යන සූත්‍රයෙන් නො යනාදෙශවේ, නං විභක්ති පරකල්හි අකාරයහට "සුනංහිසු ච" යන සූත්‍රයෙන් දීර්ඝවේ, පරාක්ෂරයාකරා පැමිණ අත්තනො, අත්තානං යනුවේ.

"ආය චතුත්ථෙකවචනස්ස තු" යන සූත්‍රයෙහි තුග්‍රහණයෙන් සවිභක්තිහට ත්ථං යනාදෙශවේ, අත්තත්ථං සිද්ධවේ

අත්තනා, අත්තම්හා, අත්තස්[illegible]ත්තනෙභි, අත්තනෙහි, යන තන්හි "ජිනවචන-පෙ-පඤ්චමී එකවච[illegible] ස්මා විභක්ති තුන්තැනෙකවේ, බහුවචනවූ හි විභක්ති දෙතැනෙක[illegible]ත්තශබ්දයාගෙකරෙන් පරවූ ස්මා විභක්තිහට "අම්හතුම්හනතුරාජබ්‍රහ්[illegible]සඛසත්ථුපිතාදීහි ස්මා නා'ව" යන සූත්‍රයෙන් විකල්පයෙන් නාවදෙ[illegible] එන්නේ ස්මා විභක්ති මකාරාකාරයෙක්වේ, නුවූ පක්ෂයෙහි [illegible]භක්තිහට "ස්මාහිස්මිංනං මහාභිම්හි වා" යන සූත්‍රයෙන් විකල්[illegible] ම්හා යනාදෙශවේ, හි විභක්තිහට විකල්පයෙන් භි යනාදෙශවේ, හි[illegible]ති පරකල්හි අත්තශබ්දයාගේ අන්තඅකාරයට "සුහිස්වකාරො එ" [illegible]සූත්‍රයෙන් එකාරාදෙශවේ, පරාක්ෂරයාකරා පැමිණ අත්තනා, අත්ත[illegible], අත්තස්මා-අත්තනෙභි, අත්තනෙහි යනුවේ.

මෙයින් මතු සියලු නාමකාණ්ඩයෙහි ස්මා විභක්[illegible]ට ම්හා යනාදෙශද, ස්මිං විභක්තිහට ම්හි යනාදෙශද, හි විභක්තිහට භි යනාදෙශද, කිසිවක් නොකිවද් සුදුසු තන්හි කරන්නේයි.

අත්තනො, අත්තානං, යන තන්හි "ජිනවචන-පෙ-ෂෂ්ඨීඑකවචනවූ ස විභක්ති එක්තැනෙකවේ, බහුවචනවූ නං විභක්ති එක්තැනෙකවේ, ස විභක්තිහට "සස්ස නො" යන සූත්‍රයෙන් නො යනාදෙශවේ, නං විභක්ති පරකල්හි අකාරයහට "සුනංහිසු ච" යන සූත්‍රයෙන් දීර්ඝවේ, පරාක්ෂරයාකරා පැමිණ අත්තනො, අත්තානං යනුවේ.

අත්තනි, අත්තනෙසු යන තන්හි "ජිනවචන–පෙ–සත්තමී එකවචනවූ ස්මිං විභත්ති එක්තැනෙකවේ, බහුවචනවූ සු විභත්ති එක්තැනෙකවේ, බ්‍රහ්මශබ්දාදීන්කෙරෙන් පරවූ ස්මිං විභත්තිහට "ස්මිනො නි" යන සූත්‍රයෙන් නි යනාදෙශවේ, සු විභත්ති පරකල්හි අත්ත ශබ්දයාගේ අන්ත අකාරයට "අත්තන්තො හිස්මිමනත්තං" යන සූත්‍රයෙන් අනත්තං යන යොගවිභාගබලයෙන් අන යනාදෙශවේ, සු විභත්ති පරකල්හි නකාරස්ථ අකාරයට "සුහිස්වකාරො එ" යන සූත්‍රයෙන් එකාරාදෙශවේ, පරක්ෂරයාකර පැමිණි අත්තනි, අත්තනෙසු යනුවේ.

අත්තා, අත්තානො—(හෙ) අත්ත, අත්තා, (භවන්තො) අත්තානො–අත්තානං, අත්තං, අත්තානො—අත්තෙන, අත්තනා, අත්තනෙහි, අත්තනෙභි-එවං කරණෙ–අත්තනො, අත්තානං–අත්තනා, අත්තම්හා, අත්තස්මා, අත්තනෙහි, අත්තනෙභි—අත්තනො, අත්තානං–අත්තනි, අත්තනෙසු.

අත්තශබ්දයෙන් ආත්මය කියත්.

රාජා, රාජානො යන තන්හි "ජිනවචන—පෙ—පඨමෙකවචනවූ සි විභත්ති එක්තැනෙකවේ, බහුවචනවූ යො විභත්ති එක්තැනෙකවේ, බ්‍රහ්මශබ්දාදීන්කෙරෙන් පරවූ සි විභත්තිහට "ස්‍යා ච" යන සූත්‍රයෙන් ආකාරාදෙශවේ, යො විභත්තිහට "යොනමානො" යන සූත්‍රයෙන් ආනො යනාදෙශවේ, පරක්ෂරයාකර පැමිණි රාජා, රාජානො යනුවේ.

(හෙ) රාජ, රාජා, (භවන්තො) රාජානො යන තන්හි "ජිනවචන–පෙ–ආලපනෙකවචනවූ සි විභත්ති එක්තැනෙකවේ, බහුවචනවූ යො විභත්ති එක්තැනෙකවේ, ආමන්ත්‍රණයෙහිවූ සි විභත්තිහට "ආලපනෙ සි ගසඤ්ඤො" යන සූත්‍රයෙන් ගසංඥාවේ, ගසංඥා පරකල්හි අකාරයහට "අකාරපිතාද්‍යන්තානමා" යන සූත්‍රයෙන් ආකාරාදෙශවේ, ගසංඥා පරකල්හි ආකාරයහට "ආකාරො වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් හ්‍රස්වවේ, යො විභත්තිහට "යොනමානො" යන සූත්‍රයෙන් ආනො යනාදෙශවේ, පරක්ෂරයාකර පැමිණි (හෙ) රාජ, රාජා—(භවන්තො) රාජානො යනුවේ.

රාජානං, රාජං, රාජානො යන තන්හි "ජිනවචන—පෙ—දුතියෙකවචනවූ අං විභත්ති දෙතැනෙකවේ, බහුවචනවූ යො විභත්ති එක්තැනෙකවේ, බ්‍රහ්මශබ්දාදීන්කෙරෙන් පරවූ අං විභත්තිහට "බ්‍රහ්මත්තසඛරාජාදිතො අමානං" යන සූත්‍රයෙන් විකල්පයෙන් ආනං යනාදෙශවේ, යො විභත්තිහට "යොනමානො" යන සූත්‍රයෙන් ආනො යනාදෙශවේ, පරක්ෂරයාකර පැමිණි රාජානං, රාජං–රාජානො යනුවේ.

රඤ්ඤා, රාජෙන, රාජූහි, රාජූභි, රාජෙහි, රාජෙභි යන තන්හි "ජිනවචන—පෙ—තතියෙකවචනවූ නා විභත්ති දෙතැනෙකවේ, බහුවච

නවූ හි විභක්ති සතරතැනෙකවේ, නා විභක්ති පරකල්හි එම නා විභක්තිහා සමග රාජශබ්දයහට "නාම්හි රඤ්ඤා වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් රඤ්ඤා යනාදෙශවේ, අනු පක්ෂයෙහි නා විභක්තිහට "අතොනෙන" යන සූත්‍රයෙන් එන යනාදෙශවේ, හි විභක්ති පරකල්හි රාජශබ්දයහට "රාජස්ස රාජු සුනංහිසු ච" යන සූත්‍රයෙන් දෙතැනෙක්හි රාජු යනාදෙශවේ, හි විභක්ති පරකල්හි උකාරයහට "සුනංහිසු ච" යන සූත්‍රයෙන් දීඝවේ, තුන්වූ දෙපක්ෂයෙහි හි විභක්ති පරකල්හි අකාරයහට "සුහිස්වකාරෙ එ" යන සූත්‍රයෙන් එකාරාදෙශවේ, හි විභක්තිහට භි යනාදෙශවේ, රඤ්ඤා, රාජෙන.—රාජූභි, රාජූහි, රාජෙභි, රාජෙහි යනුවේ.— කරණ කාරකයෙහිදු මෙසේ සෙයින් පදසිද්ධිකටයුතු

රඤ්ඤො, රාජිනො,—රඤ්ඤං, රාජූනං, රාජානං, යන තන්හි "ජිනවචන—පෙ—චතුත්ථී එකවචනවූ ස විභක්ති දෙතැනෙකවේ, බහුවචනවූ නං විභක්ති තුන්තැනෙකවේ, ස විභක්ති පරකල්හි එම ස විභක්තිහා සමග රාජශබ්දයහට "රාජස්ස රඤ්ඤො රාජිනො සෙ" යන සූත්‍රයෙන් රඤ්ඤො රාජිනො යනාදෙශයෝ වෙත්, නං විභක්ති පරකල්හි පළමු පක්ෂයෙහි නං විභක්තිහා සමග රාජශබ්දයහට "රඤ්ඤං නම්හි වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් රඤ්ඤං යනාදෙශවේ, ද්විතීය පක්ෂයෙහි නං විභක්ති පරකල්හි රාජශබ්දයහට "රාජස්ස රාජු සුනංහිසු ච" යන සූත්‍රයෙන් විකල්පයෙන් රාජු යනාදෙශවේ, නං විභක්ති පරකල්හි උකාර අකාරයන්ට "සුනංහිසු ච" යන සූත්‍රයෙන් දීඝවේ, පරාක්ෂර යාකර පැමිණ රඤ්ඤො, රාජිනො, රඤ්ඤං, රාජූනං, රාජානං යනුවේ.

රඤ්ඤා, රාජම්හා, රාජස්මා—රාජූභි, රාජූහි, රාජෙභි, රාජෙහි යන තන්හි "ජිනවචන—පෙ—පඤ්චමී එකවචනවූ ස්මා විභක්ති තුන්තැනෙකවේ, බහුවචනවූ හි විභක්ති සතරතැනෙකවේ, රාජශබ්දයාකාරෙන් පරවූ ස්මා විභක්තිහට "අම්භතුම්හ" යනාදි සූත්‍රයෙන් විකල්පයෙන් නාවයුවේ, වන්නේ ස්මා විභක්තියක් මෙසා නාකාරයෙක්වේ, එම නාකාරයා සමග රාජශබ්දයහට "නාම්හි රඤ්ඤා වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් රඤ්ඤා යනාදෙශවේ, හි විභක්ති පරකල්හි රාජශබ්දයහට "රාජස්ස රාජු සුනංහිසු ච" යන සූත්‍රයෙන් දෙතැනෙක්හි රාජු යනාදෙශවේ, හි විභක්ති පරකල්හි උකාරයහට "සුනංහිසු ච" යන සූත්‍රයෙන් දීඝවේ, අනු දෙතැනක්හි හි විභක්ති පරකල්හි අකාරයහට "සුහිස්වකාරෙ එ" යන සූත්‍රයෙන් එකාරාදෙශවේ, පරාක්ෂරයා සාර පැමිණ රඤ්ඤා, රාජම්හා, රාජස්මා, රාජූභි, රාජූහි රාජෙභි, රාජෙහි යනුවේ,

රඤ්ඤො—රාජිනො, රඤ්ඤං, රාජූනං, රාජානං යන තන්හි, "ජිනවචන—පෙ—ෂෂ්ඨීකවචනවූ ස විභක්ති දෙතැනෙකවේ, බහුවචනවූ නං විභක්ති තුන්තැනෙකවේ, ස විභක්ති පරකල්හි එම ස විභක්තිහා සමග රාජශබ්දයහට "රාජස්ස රඤ්ඤොරාජිනො සෙ" යන සූත්‍රයෙන්

රඤ්ඤො රාජිනො යනාදෙශවෙත්, ප්‍රථම පක්‍ෂයෙහි නං විභක්ති පරකල්හි එම නං විභක්තිහා සමග රාජශබ්දයහට "රඤ්ඤං ණාම්හි වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් රඤ්ඤං යනාදෙශවේ, ද්විතීය පක්‍ෂයෙහි නං විභක්ති පරකල්හි රාජශබ්දයහට "රාජස්ස රාජු සුනංහිසු ච" යන සූත්‍රයෙන් විකල්පයෙන් රාජු යනාදෙශවේ, නං විභක්ති පරකල්හි උකාර අකාරයන්ට "සුනංහිසු ච" යන සූත්‍රයෙන් දීඝවේ, පරක්‍ෂරයාකරා පැමිණ රඤ්ඤො, රාජිනො, රඤ්ඤං, රාජූනං, රාජානං යනුවේ.

රඤ්ඤෙ, රාජිනි-රාජූසු, රාජෙසු යන තන්හි, ජිනවචන-පෙ-සත්තමී එකවචනවූ ස්මිං විභක්ති දෙතැනෙකවේ, බහුවචනවූ සු විභක්ති දෙතැනෙකවේ, ස්මිං විභක්ති පරකල්හි එම ස්මිං විභක්තිහා සමග රාජශබ්දයහට "ස්මිම්හි රඤ්ඤෙ රාජිනි" යන සූත්‍රයෙන් රඤ්ඤෙ යනාදෙශහා රාජිනි යනාදෙශවේ, සු විභක්ති පරකල්හි රාජශබ්දයහට "රාජස්ස රාජු සුනංහිසු ච" යන සූත්‍රයෙන් විකල්පයෙන් රාජු යනාදෙශවේ, නුවූ පක්‍ෂයෙහි සු විභක්ති පරකල්හි අකාරයහට "සුහිස්වකාරො එ" යන සූත්‍රයෙන් එකාරාදෙශවේ, පරක්‍ෂරයාකරා පැමිණ රඤ්ඤෙ, රාජිනි, රාජම්හි, රාජස්මිං-රාජූසු, රාජෙසු යනුවේ.

රාජා, රාජානො-(හෙ) රාජ, රාජා, (භවන්තො) රාජානො-රාජානං, රාජං, රාජානො-රඤ්ඤා, රාජෙන, රාජූහි, රාජූභි, රාජෙහි, රාජෙභි-එවං කරණෙ-රඤ්ඤො, රාජිනො, රඤ්ඤං, රාජූනං, රාජානං—රඤ්ඤා, රාජම්හා, රාජස්මා, රාජූහි, රාජූභි, රාජෙහි, රාජෙභි—රඤ්ඤො, රාජිනො, රඤ්ඤං, රාජූනං, රාජානං-රඤ්ඤෙ, රාජිනි, රාජම්හි, රාජස්මිං, රාජූසු, රාජෙසු.

රාජශබ්දයෙන් රජදරුවන් කියත්.

ගුණවා, ගුණවන්තො—ගුණවන්තා, ගුණවන්තා යන තන්හි "ජිනවචන-පෙ—ප්‍රථමා එකවචනවූ සි විභක්ති දෙතැනෙකවේ, බහුවචනවූ යො විභක්ති දෙතැනෙකවේ-සි විභක්ති පරකල්හි එම සි විභක්තිහා සමග ගුණවන්තුශබ්දයාගේ න්තුප්‍රත්‍යයහට "ආ සිම්හි" යන සූත්‍රයෙන් විකල්පයෙන් ආකාරාදෙශවේ, නුවූ පක්‍ෂයෙහි සි විභක්ති පරකල්හි න්තුප්‍රත්‍යයාගේ අන්ත උකාරයහට "සිම්හි වා" යන සූත්‍රයෙන් අකාරාදෙශවේ, සි විභක්තිහට "සො" යන සූත්‍රයෙන් ඔකාරාදෙශවේ, ප්‍රථමා යො විභක්ති පරකල්හි එම යො විභක්තිහා සමග න්තුප්‍රත්‍යයහට "න්තුස්ස න්තො" යන සූත්‍රයෙන් විකල්පයෙන් න්තො යනාදෙශවේ, නුවූ පක්‍ෂයෙහි යො විභක්ති පරකල්හි න්තුප්‍රත්‍යයාගේ අන්ත උකාරයහට "න්තුස්ස න්තො යොසු ච" යන සූත්‍රයෙන් අත්වේ, අකාරාන්ත නාමයන්කෙරෙන් පරවූ ප්‍රථමා යො විභක්තිහට "සබ්බයොනීනමා එ" යන සූත්‍රයෙන් ආකාරාදෙශවේ, පූර්වස්වරලොපවේ, පරක්‍ෂරයාකරා පැමිණ ගුණවා, ගුණවන්තො, ගුණවන්තා, ගුණවන්තා යනුවේ.

(හෙ) ගුණවං ගුණව ගුණවා (භවන්තො) ගුණවන්තො ගුණවන්තා යන තන්හි "ජිනවචන-පෙ-ආලපන එකවචනවූ සි විභක්ති තුන්තැනෙකවේ, බහුවචනවූ යො විභක්ති දෙතැනෙකවේ, ආමන්ත්‍රණයෙහි සි විභක්තිහට "ආලපනෙ සි ගසඤ්ඤො" යන සූත්‍රයෙන් ගසංඥාවේ, ගසංඥා පරකල්හි එම ගසංඥාහා සමග න්තුප්‍රත්‍යයහට "අවණ්ණා ච ගෙ" යන සූත්‍රයෙන් අං අ ආ යන ආදේශයෝ යථාක්‍රමයෙන් වෙත්, යො විභක්ති පරකල්හි එම යො විභක්තිහා සමග න්තුප්‍රත්‍යයහට "න්තුස්සන්තො" යන සූත්‍රයෙන් විකල්පයෙන් න්තො යනාදේශවේ, තුබූ පක්ෂයෙහි යො විභක්ති පරකල්හි න්තුප්‍රත්‍යයාගේ අන්ත උකාරයහට "න්තුස්සන්තො යොසු ච" යි අන්තවේ, අකාරාන්ත නාමයා සෙයින් පවූ ආලපන යො විභක්තිහට "සබ්බයොනීනමාඑ" යි ආකාරාදේශවේ, පූර්වස්වරලොපවේ, පරාක්ෂරයා කර පැමිණි (හෙ) ගුණවං ගුණව ගුණවා (භවන්තො) ගුණවන්තො ගුණවන්තා සිදුවේ.

ගුණවන්තං ගුණවන්තෙ යන තන්හි "ජිනවචන-පෙ—ද්විතීයා එකවචනවූ අං විභක්ති එක්තැනෙකවේ, බහුවචනවූ යො විභක්ති එක්තැනෙකවේ, අං විභක්ති පරකල්හි උකාරයහට "සරලොපො" යි සූත්‍රයෙන් ලොප්වේ, යො විභක්ති පරකල්හි න්තුප්‍රත්‍යයාගේ අන්ත උකාරයට "න්තුස්සන්තො යොසු ච" යන සූත්‍රයෙන් අන්තවේ, අකාරාන්ත නාමයා සෙයින් පවූ ද්විතීයා යො විභක්තිහට "සබ්බයොනීනමාඑ" යි එකාරාදේශවේ, පූර්වස්වරලොප්වේ, පරාක්ෂරයා කර පැමිණි ගුණවන්තං ගුණවන්තෙ සිදුවේ.

ගුණවතා ගුණවන්තෙන ගුණවන්තෙහි ගුණවන්තෙභි යන තන්හි "ජිනවචන—පෙ—තෘතීයා එකවචනවූ නා විභක්ති දෙතැනෙකවේ. බහුවචනවූ හි විභක්ති දෙතැනෙකවේ, නා විභක්ති පරකල්හි එම නා විභක්තිහා සමග න්තුප්‍රත්‍යයහට "තොතිතා සස්මිංනාසු" යන සූත්‍රයෙන් විකල්පයෙන් තා යනාදේශවේ, තුබූ පක්ෂයෙහි නා විභක්ති පරකල්හි න්තුප්‍රත්‍යයාගේ උකාරයහට "න්තුස්සන්තො යොසු ච" යි චශබ්දග්‍රහණයෙන්ද හි විභක්ති පරකල්හි සූත්‍රයෙන්ද අන්තවේ, නා විභක්තිහට "අතො නෙන" යි එන යනාදේශවේ, හි විභක්ති පරකල්හි අකාරයහට "සුහිස්වකාරො එ" යි එකාරාදේශවේ, පරාක්ෂරයා කර පැමිණි ගුණවතා යනාදියවේ—කරණ කාරකයද මෙසේමැයි.

ගුණවතො ගුණවන්තස්ස ගුණවතං ගුණවන්තානං යන තන්හි "ජිනවචන-පෙ-චතුර්ථී එකවචනවූ ස විභක්ති දෙතැනෙකවේ, බහුවචනවූ නං විභක්ති දෙතැනෙකවේ, ස විභක්ති පරකල්හි එම ස විභක්ති සහිතවූ න්තුප්‍රත්‍යයහට "තොතිතා" යනාදි සූත්‍රයෙන් විකල්පයෙන් තො යනාදේශවේ, නං විභක්ති පරකල්හි එම නං විභක්ති සහිතවූ

න්තුප්‍රත්‍යයහට "නම්හි නං වා" යි විකල්පයෙන් නං යනාදෙශවේ, තුබූ දෙතන්හි ස විභක්ති නං විභක්ති පරකල්හි න්තුප්‍රත්‍යයාගේ අන්ත උකාරයහට "න්තුස්සන්තො යොසු ච" යන සූත්‍රයෙහි චශබ්දග්‍රහණයෙන්හා සූත්‍රයෙන්ද අඬවේ, ස විභක්ති පරකල්හි "සාගමො සෙ" යි සකාරාගමව සංහිතවේ, නං විභක්ති පරකල්හි අකාරයහට "සුනංහිසු ච" යි දීර්ඝවේ, පරාක්ෂරයාකරා පැමිණ ගුණවතො යනාදියවේ.

ගුණවතා ගුණවන්තම්හා ගුණවන්තස්මා ගුණවන්තෙහි. ගුණවන්තෙභි යන තන්හි "ජිනවචන—පෙ—පඤ්චමී එකවචනවූ ස්මා විභක්ති තුන්තැනෙකවේ, බහුවචනවූ හි විභක්ති දෙතැනෙකවේ, ස්මා විභක්තිහට "අම්හතුම්හන්තු" යනාදී සූත්‍රයෙන් විකල්පයෙන් නා වන්වේ, වන්නේ ස්මා විභක්තියක් මතා නාකාරයෙක්වේ, එම නාකාරයා සහිතවූ න්තුප්‍රත්‍යයහට "තොතිතා" යනාදී සූත්‍රයෙන් තා යනාදෙශවේ, ස්මා විභක්ති හි විභක්ති පරකල්හි න්තුප්‍රත්‍යයාගේ අන්ත උකාරයහට "න්තුස්සන්තො යොසු ච" යන සූත්‍රයෙහි චශබ්දග්‍රහණයෙන් හා සූත්‍රයෙන් අඬවේ, හි විභක්ති පරකල්හි අකාරයහට "සුහිස්වකාරො එ" යි එකාරාදෙශවේ, ළිහා යනාදෙශහා හිනාදෙශදවේ, පරාක්ෂරයාකරා පැමිණ ගුණවතා යනාදියවේ. ශෙෂයද චතුර්ථියමෙන් දතයුතුයි.

ගුණවති ගුණවන්තෙ ගුණවන්තම්හි ගුණවන්තස්මිං ගුණවන්තෙසු යන තන්හි "ජිනවචන-පෙ—සත්තමී එකවචනවූ ස්මිං විභක්ති සතර තැනෙකවේ, බහුවචනවූ සු විභක්ති එක්තැනෙකවේ, ස්මිං විභක්ති පරකල්හි එම ස්මිං විභක්තිහා සමග න්තුප්‍රත්‍යයහට "තොතිතා" යනාදී සූත්‍රයෙන් විකල්පයෙන් තියනාදෙශවේ, ස්මිං විභක්ති පරකල්හි න්තුප්‍රත්‍යයාගේ අන්ත උකාරයහට "න්තුස්සන්තො යොසු ච" යන සූත්‍රයෙහි චග්‍රහණයෙන් හා සුවිභක්ති පරකල්හි සූත්‍රයෙන්ද අඬවේ, ස්මිං විභක්තිහට "ස්මාස්මිංනං වා" යි විකල්පයෙන් එකාරාදෙශවේ; සු විභක්ති පරකල්හි අකාරයහට "සුහිස්වකාරො එ" යි එකාරාදෙශවේ, ම්හි යනාදෙශදවේ, පරාක්ෂරයාකරා පැමිණ ගුණවති ගුණවන්තෙ යනාදියවේ.

ගුණවා, ගුණවන්තො, ගුණවන්තා, ගුණවන්තා-(හෙ) ගුණවං, ගුණව, ගුණවා (භවන්තො) ගුණවන්තො, ගුණවන්තා-ගුණවන්තං, ගුණවන්තෙ-ගුණවතා, ගුණවන්තෙන, ගුණවන්තෙහි, ගුණවන්තෙභි, එවං කරණෙ-ගුණවතො, ගුණවන්තස්ස, ගුණවතං, ගුණවන්තානං-ගුණවතා, ගුණවන්තම්හා, ගුණවන්තස්මා, ගුණවන්තෙහි, ගුණවන්තෙභි-ගුණවතො, ගුණවන්තස්ස, ගුණවතං, ගුණවන්තානං-ගුණවති, ගුණවන්තෙ, ගුණවන්තම්හි, ගුණවන්තස්මිං, ගුණවන්තෙසු; ගුණවන්තු ශබ්දයෙන් ගුණවතුන් කියත්.

ඒවං මඝවා, කුලවා, ඵලවා, යසවා, ධනවා, සුතවා, භගවා, හිමවා, බලවා, සීලවා, පඤ්ඤවා, සතිමා, ධිතිමා, ගතිමා, මුතිමා, මතිමා, ජුතිමා, හිරිමා, ථුතිමා, රතිමා, යතිමා, සුචිමා, කලිමා, බලිමා, කසිමා, රුචිමා, බුද්ධිමා, චක්ඛුමා, බන්ධුමා, හෙතුමා, සෙතුමා, කෙතුමා, රාහුමා, භානුමා, ඛානුමා, විජ්ජුමා, ඉච්චාදයො ගුණවන්තුසද්දා.

මඝවා, මඝයන නාම ඇත්තේ හෝ පුණ්‍යඇත්තේයි; කුලවා, කුලඇත්තේයි; ඵලවා, ඵලඇත්තේයි; යසවා, කීර්ති ඇත්තේයි; ධනවා, වස්තු ඇත්තේයි; සුතවා, ඇසූපිරූ නැණ ඇත්තේයි; භගවා, භාග්‍ය ඇත්තේයි; හිමවා, හිම (පිනි) ඇත්තේයි; බලවා, ශක්ති ඇත්තේයි; සීලවා, සිල් ඇත්තේයි; පඤ්ඤවා, නුවණ ඇත්තේයි; සතිමා, සිහි ඇත්තේයි; ධිතිමා, ධෛර්‍ය ඇත්තේයි; ගතිමා, ගමන්; මුතිමා, ස්මෘති; මතිමා, නුවන; ජුතිමා, ශොභාව; හිරිමා, ලජ්ජා; ථුතිමා, ස්තුති; රතිමා, ඇලුම්; යතිමා, තපස්වීන්; සුචිමා, සුචි; කලිමා, පව්; බලිමා, බිලි; කසිමා, සී; රුචිමා, රුචි; බුද්ධිමා, ප්‍රඥා; චක්ඛුමා, ඇස්; බන්ධුමා, නෑයන්; හෙතුමා, කාරණ; සෙතුමා, සේතු; කෙතුමා, ධජ; රාහුමා, රාහු; භානුමා, රශ්මි; ඛානුමා, කණු; විජ්ජුමා, විදුලි ඇත්තේයි.

ගච්ඡං ගච්ඡන්තො ගච්ඡන්තා යන තන්හි "ජිනවචන-පෙ—ප්‍රථමෛකවචනවූ සි විභක්ති දෙතැනෙකවේ, බහුවචනවූ යො විභක්ති දෙතැනෙකවේ, සි විභක්ති පරකල්හි ගච්ඡන්තශබ්දයාගේ න්තප්‍රත්‍යයහට "සිම්හි ගච්ඡන්තාදීනං න්තසද්දො අං" යන සූත්‍රයෙන් විකල්පයෙන් අං යනාදේශවේ, සි විභක්තිහට "සෙසතො ලොපං ගසිපි" යන සූත්‍රයෙන් ලොප්වේ, තුබූ පක්‍ෂයෙහි සි විභක්තිහට "සො" යන සූත්‍රයෙන් ඔකාරාදේශවේ, යො විභක්තිපරකල්හි ගච්ඡන්තශබ්දාදීන්ගේ න්තප්‍රත්‍යයහට "සෙසෙසු න්තුව" යන සූත්‍රයෙන් න්තුවත්වේ, ප්‍රථමා යො විභක්ති පරකල්හි එම යො විභක්ති සමග න්තුප්‍රත්‍යයහට "න්තුස්ස න්තො" යන සූත්‍රයෙන් න්තො යනාදේශවේ, තුබූ පක්‍ෂයෙහි යො විභක්තිහට "සබ්බයොනීනමාඒ" යන සූත්‍රයෙන් ආකාරාදේශවේ, පරස්වරයාකර පැමිණි ගච්ඡං ගච්ඡන්තා යනාදියවේ.

(හෙ) ගච්ඡං ගච්ඡ ගච්ඡා (භවන්තො) ගච්ඡන්තො ගච්ඡන්තා යන තන්හි "ජිනවචන—පෙ—ආලපනෛකවචනවූ සි විභක්ති තුන්තැනෙකවේ, බහුවචනවූ යො විභක්ති දෙතැනෙකවේ, විභක්ති පරකල්හි න්තප්‍රත්‍යයහට "සෙසෙසු න්තුව" යන සූත්‍රයෙන් න්තුවත් වේ, ආලපනයෙහිවූ සි විභක්තිහට "ආලපනෙ සි ගසඤ්ඤො" යන සූත්‍රයෙන් ගසංඥාවේ, ගසංඥා පරකල්හි න්තුප්‍රත්‍යයහට "අවණ්ණ ච ගෙ" යන සූත්‍රයෙන් අං අ ආ යනාදේශයෝ පර්‍යායෙන් වෙත්, යො විභක්ති පරකල්හි එම යො විභක්තිනා සමග න්තුප්‍රත්‍යයහට "න්තුස්සන්තො"

යන සූත්‍රයෙන් නො යනාදෙශවේ, තුබූ පක්‍ෂයෙහි යො විභක්තිනට "සබ්බයොනීනමාඒ" යි ආකාරාදෙශවේ, පරාක්‍ෂරයාකරා පැමිණ (හෙ) ගච්ඡං ගච්ඡ ගච්ඡා යනාදිය වේ.

ගච්ඡන්තං ගච්ඡන්තෙ යන තන්හි "ජිනවචන—පෙ—විතීයෙක වචනවූ අං විභක්ති එක් තැනෙකවේ, බහුවචනවූ යො විභක්ති එක් තැනෙකවේ, අකාරාන්ත නාමයාගෙන් පරවූ විතීයා යො විභක්තිනට "සබ්බයොනීනමාඒ" යි ඒකාරාදෙශවේ, පූර්වස්වරලොප්වේ, පරාක්‍ෂරයාකරා පැමිණ ගච්ඡන්තං ගච්ඡන්තෙ යනුවේ.

ගච්ඡතා ගච්ඡන්තෙන ගච්ඡන්තෙහි ගච්ඡන්තෙභි යන තන්හි "ජිනවචන—පෙ—තෘතීයෙකවචනවූ නා විභක්ති දෙතැනෙකවේ, බහුවචනවූ හි විභක්ති දෙතැනෙකවේ, නා විභක්ති පරකල්හි න්තප්‍රත්‍යයහට "සෙසෙසු න්තුව" යන සූත්‍රයෙන් විකල්පයෙන් න්තුවත්වේ, නා විභක්ති පරකල්හි එම නා විභක්තිහා සමග න්තුප්‍රත්‍යයහට "තොතිතා" යනාදී සූත්‍රයෙන් තා යනාදෙශවේ, තුබූ පක්‍ෂයෙහි නා විභක්තිනට "අතොනෙන" යි එන යනාදෙශවේ, හි විභක්ති පරකල්හි නකාරයෙහි අකාරයහට "සුහිස්වකාරො ඒ" යි ඒකාරාදෙශවේ, පරාක්‍ෂරයාකරා පැමිණ ගච්ඡතා යනාදියවේ.—කරණකාරකයෙහිද මෙසේමැයි.

ගච්ඡතො ගච්ඡන්තස්ස ගච්ඡතං ගච්ඡන්තානං යන තන්හි "ජිනවචන-පෙ-චතුර්ථීඒකවචනවූ ස විභක්ති දෙතැනෙකවේ, බහුවචනවූ නං විභක්ති දෙතැනෙකවේ, විභක්ති පරකල්හි න්තප්‍රත්‍යයහට "සෙසෙසු න්තුව" යන සූත්‍රයෙන් විකල්පයෙන් දෙතැනෙක්හි න්තුවත්වේ, ස විභක්ති පරකල්හි එම ස විභක්ති සහිතවූ න්තුප්‍රත්‍යයහට "තොතිතා" යනාදී සූත්‍රයෙන් තො යනාදෙශවේ, තුබූ පක්‍ෂයෙහි ස විභක්ති පරකල්හි "සාගමො සෙ" යි සකාරාගමව සංහිතාවේ, නං විභක්ති පරකල්හි න්තුප්‍රත්‍යයහට "නම්හි තං වා" යි විකල්පයෙන් තං යනාදෙශවේ, තුබූ පක්‍ෂයෙහි නං විභක්ති පරකල්හි අකාරයහට 'සුනංහිසුච' යි දීර්ඝවේ, පරාක්‍ෂරයාකරා පැමිණ ගච්ඡතො යනාදියවේ.

ගච්ඡතා ගච්ඡන්තම්හා ගච්ඡන්තස්මා ගච්ඡන්තෙහි ගච්ඡන්තෙභි යන තන්හි "ජිනවචන—පෙ—පඤ්චමෛකවචනවූ ස්මා විභක්ති තුන් තැනෙකවේ; බහුවචනවූ හි විභක්ති දෙතැනෙකවේ, එක්පක්‍ෂයෙක්හි ස්මා විභක්ති පරකල්හි න්තප්‍රත්‍යයහට "සෙසෙසු න්තුව" යන සූත්‍රයෙන් න්තුවත්වේ, නාමශබ්දයාගෙන් පරවූ ස්මා විභක්තිහට "අම්හා නුම්හ" යනාදී සූත්‍රයෙන් ම්හාවත්වේ, වන්නේ ස්මා විභක්තිව නාකාරයෙක්වේ, එම නාකාරයාහා සමග න්තුප්‍රත්‍යයහට "තොතිතා" යනාදීන් තා යනාදෙශවේ, හි විභක්ති පරකල්හි නකාරස්ථ අකාරයහට "සුහිස්වකාරො ඒ" යි ඒකාරාදෙශවේ, පරාක්‍ෂරයාකරා පැමිණ ගච්ඡතා යනාදියවේ.—ෂෂ්ඨියෙහිද චතුර්ථියමෙන් දතයුතුයි.

ගච්ඡති ගච්ඡන්තෙ ගච්ඡන්තම්හි ගච්ඡන්තස්මිං ගච්ඡන්තෙසු යන තැන්හි "ජිනවචන—පෙ—සප්තම්‍යෙකවචනවූ ස්මිං විභක්ති සතර තැනෙකවේ, බහුවචනවූ සු විභක්ති එක්තැනෙකවේ, එක්පක්ෂයෙක්හි ස්මිං විභක්ති පරකල්හි න්තප්‍රත්‍යයහට "සෙසෙසු න්තුව" යන සූත්‍රයෙන් න්තුවත්වේ, ස්මිං විභක්ති පරකල්හි එම ස්මිං විභක්තිහා සමග න්තු ප්‍රත්‍යයහට "තොතිතා" යනාදීන් ති යනාදෙශවේ, එක්පක්ෂයෙක්හි ස්මිං විභක්තිහට "ස්මාස්මිනං වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් එකාරයෙක් ආදෙශවේ, තුබූ පක්ෂයෙක් ම්හි යනාදෙශවේ, සු විභක්ති පරකල්හි න්තකාරයෙහි අකාරයහට "සුහිස්වකාරො එ" යි එකාරාදෙශවේ, පරාක්ෂරයාකර පැමිණ ගච්ඡති ගච්ඡන්තෙ යනාදියවේ.

ගච්ඡං, ගච්ඡන්තො, ගච්ඡන්තා. ගච්ඡන්තා - (හෙ) ගච්ඡං, ගච්ඡ, ගච්ඡා, (භවන්තො) ගච්ඡන්තො, ගච්ඡන්තා—ගච්ඡන්තං, ගච්ඡන්තෙ—ගච්ඡතා, ගච්ඡන්තෙන, ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි—එවං කරණෙ—ගච්ඡතො, ගච්ඡන්තස්ස, ගච්ඡතං, ගච්ඡන්තානං, ගච්ඡතා, ගච්ඡන්තම්හා, ගච්ඡන්තස්මා, ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි—ගච්ඡතො, ගච්ඡන්තස්ස, ගච්ඡතං, ගච්ඡන්තානං—ගච්ඡති, ගච්ඡන්තෙ, ගච්ඡන්තම්හි, ගච්ඡන්තස්මිං, ගච්ඡන්තෙසු.

ගච්ඡන්තශබ්දයෙන් යන්නවුන් කියත්.

එවං මහං චරං තිට්ඨං දදං භුඤ්ජං සුණං වචං
ජයං ජීරං චවං මීයං සරං කුබ්බං ජපං වජං

ඉච්චාදයො ගච්ඡන්තසද්දසමා.

මහං, පූජාය; චරං, හැසිරීම; තිට්ඨං, සිටීම; දදං, දීම; භුඤ්ජං, කෑම; සුණං, ඇසීම; වචං, කීම; ජයං, දිනීම; ජීරං, දිරීම; චවං, චුතවීම; මීයං, මරණ; සරං, සිහිකිරීම; කුබ්බං, කිරීම; ජපං, ජපකිරීම; වජං, යාමයි.

අකාරාන්තයි.

ආකාරාන්තපුල්ලිඞ්ගනාමය අප්‍රසිද්ධයි.

—— * ——

අග්ගි අග්ගී අග්ගයො යන තැන්හි "ජිනවචන—පෙ—සි විභක්ති එක් තැනෙකවේ; යො විභක්ති දෙතැනෙකවේ, විභක්ති පරකල්හි "පුබ්බ—පෙ—පුල්ලිඞ්ගයෙහිවූ ඉවර්ණයහට "ඉවණ්ණුවණ්ණා ඣලා" යන සූත්‍රයෙන් ඣසංඥවේ, අවර්ණ ඉවර්ණ උවර්ණ යන මොහු ශෙෂයෝයි පූර්වාචාර්යන්විසින් ව්‍යවහාරකළහෙයින් ඉවර්ණවූ ශෙෂයා කෙරෙන් පරවූ සි විභක්තිහට "සෙසතො ලොපං ගසිපි" යන සූත්‍රයෙන් ලොප්වේ, ඣසංඥයාකෙරෙන් පරවූ යො විභක්තිහට "ඝපතො ච යොනං ලොපො" යන සූත්‍රයෙන් විකල්පයෙන් ලොප්වේ, යො විභක්ති ලොප්කළකල්හි ඒ පක්ෂයෙහි ඉකාරයහට "යොසු කතනිකාර ලොපෙසු දීඝං" යන සූත්‍රයෙන් දිඝීවේ, යො විභක්ති පරකල්හි

නොකාරණලද හ්‍රස්වඇති ඣසංඥාහට "යොස්වකතරස්සො ඣො" යන සූත්‍රයෙන් අබවේ, පරිෂ්කාරයාකාර පැමිණ අග්ගී අග්ගයො යනුවේ.

(හෙ) අග්ගි (භවන්තො) අග්ගී අග්ගයො යන තන්හි "ජිනවචන—පෙ- සි විභක්ති එක්වැනෙකවේ, යො විභක්ති දෙවැනෙකවේ, ආමන්ත්‍රණයෙහිවූ සි විභක්තිහට "ආලපනෙ සි ගසඤ්ඤො" යන සූත්‍රයෙන් ගසංඥාවේ, ශෙෂාකාරෙන් පරවූ ගසංඥයහට "සෙසතො ලොපං ගසිපි" යන සූත්‍රයෙන් ලොප්වේ, ඣසංඥාකාරෙන් පරවූ යො විභක්තිහට "ඣපතො ච යොනං ලොපො" යන සූත්‍රයෙන් ලොප්වේ, යො විභක්ති ලොප්කළ පක්ෂයෙහි ඉකාරයහට "යොසු කතනිකාරලොපෙසු දීඝං" යන සූත්‍රයෙන් දීඝවේ, යො විභක්ති පරකල්හි නොකාරණලද හ්‍රස්වඇති ඣසංඥයහට "යොස්වකතරස්සො ඣො" යන සූත්‍රයෙන් අබවේ (හෙ) අග්ගි (භවන්තො) අග්ගී අග්ගයො යනුවේ.

අග්ගිං අග්ගී අග්ගයො යන තන්හි "ජිනවචන-පෙ-අං විභක්ති එක්වැනෙකවේ, යො විභක්ති දෙවැනෙකවේ, ඣසංඥාකාරෙන් පරවූ අං විභක්තිහට "අංමො නිග්ගහීතං ඣලපෙහි" යන සූත්‍රයෙන් නිග්ගහීතබවට පැමිණේ, ඣසංඥාකාරෙන් පරවූ යො විභක්තිහට "ඣපතො ච යොනං ලොපො" යන සූත්‍රයෙන් විකල්පයෙන් ලොප්වේ, එම පක්ෂයෙහි ස්වරයහට "යොසු කතනිකාරලොපෙසු දීඝං" යන සූත්‍රයෙන් දීඝවේ, යො විභක්ති පරකල්හි ඣසංඥයහට "යොස්වකත" යනාදීන් අබවේ, අග්ගිං යනාදියවේ.

අග්ගිනා අග්ගීහි අග්ගීභි යන තන්හි "ජිනවචන—පෙ—නා විභක්ති එක්වැනෙකවේ; හි විභක්ති දෙවැනෙකවේ, හි විභක්ති පරකල්හි ඉකාරයහට "සුනංහිසු ච" යි දීඝවේ, හි විභක්තිහට විකල්පයෙන් භිආදෙශවේ, අග්ගිනා අග්ගීහි යනාදියවේ.—කරණකාරකයෙහිදු මෙසේ මැයි.

අග්ගිනො අග්ගිස්ස අග්ගීනං යන තන්හි "ජිනවචන-පෙ-ස විභක්ති දෙවැනෙකවේ, නං විභක්ති එක්වැනෙකවේ, ඣසංඥාකාරෙන් පරවූ ස විභක්තිහට "ඣලතො සස්ස නො වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් නො යනාදෙශවේ, නුවූ පක්ෂයෙහි ස විභක්ති පරකල්හි "සාගමො සෙ" යන සූත්‍රයෙන් සකාරාගමවේ, නං විභක්ති පරකල්හි ඉකාරයහට "සුනංහිසු ච" යි දීඝවේ, අග්ගිනො යනාදියවේ.

අග්ගිනා අග්ගිම්හා අග්ගිස්මා අග්ගීහි අග්ගීභි යන තන්හි "ජිනවචන-පෙ—ස්මා විභක්ති තුන්වැනෙකවේ, හි විභක්ති දෙවැනෙකවේ, ඣසංඥාකාරෙන් පරවූ ස්මා විභක්තිහට "ඣලතො ච" යන සූත්‍රයෙන් විකල්පයෙන් නා යනාදෙශවේ, හි විභක්ති පරකල්හි ඉකාරයහට

"සුනංහිසු ච" යි දීඝවේ අග්ගීනං අග්ගිම්හා යනාදියවේ —— ෂෂ්ඨිය චතුර්ථිය මෙනි.

අග්ගිම්හි අග්ගිස්මිං අග්ගීසු යන තන්හි "ජිනවචන—පෙ—ස්මිං විභක්ති දෙතැනෙකවේ, සු විභක්ති එක්තැනෙකවේ, ස්මිං විභක්තිහට විකල්පයෙන් ම්හි-යනාදෙශවේ, සු විභක්ති පරකල්හි ඉකාරයහට "සුනංහිසු ච" යි දීඝවේ, අග්ගිම්හි යනාදියවේ.

අග්ගි, අග්ගී, අග්ගයො—(හෙ) අග්ගි, (භවන්තො) අග්ගී, අග්ගයො—අග්ගිං, අග්ගී, අග්ගයො—අග්ගිනා, අග්ගීහි, අග්ගීභි—එවංකරණේ—අග්ගිනො, අග්ගිස්ස, අග්ගීනං—අග්ගිනා, අග්ගිම්හා, අග්ගිස්මා, අග්ගීහි, අග්ගීභි—අග්ගිනො, අග්ගිස්ස; අග්ගීනං—අග්ගිම්හි, අග්ගිස්මිං, අග්ගීසු.

අග්ගිශබ්දයෙන් ගිනි කීයත්.

ජොති පාණි ගණ්ඨි මුට්ඨි කුච්ඡි වත්ථි සාලි වීහි
ව්‍යාධි ඔධි බොධි සන්ධි රාසි කෙසි සාති දීපි.
ඉසි මුනි මණි ධනි ගිරි රවි කවි කපි
අසි මසි නිධි විධි අහි කිමි පති හරි
අරි තිමි කලි බලි ජලනිධි ගහපති
උරුධිති වරමති නිරූපධි අධිපති.

ඉච්චාදයො අග්ගිසද්දාව.

ජොති, ගිනි; පාණි, අත්ල; ගණ්ඨි, ගැට; මුට්ඨි, මිට; කුච්ඡි, බඩ; වත්ථි, වස්තිය; සාලි, හැල්වී; වීහි, සෙසුවීජාති; ව්‍යාධි, රොග; ඔධි, අවධිය; බොධි, බෝරුක; සන්ධි, සන්ධිය; රාසි, සමූහය; කෙසි, ධජය; සාති, * එනම් පුරුෂයෙක්; දීපි, දිවියා.

ඉසි, තපස්වීහු; මුනි, මුනිවරු; මණි, මැණික්; ධනි, ධ්වනිය; ගිරි, පර්වතය; රවි, සූර්යයා; කවි, පණ්ඩිතවරු; කපි, වඳුරෝ; අසි, කඩුව; මසි, අඟුරුදලි; නිධි, නිධාන; විධි, විධිය; අහි, නයි; කිමි, පණුවෝ; පති, හිමියා; හරි, රත්රන්; අරි, සතුරෝ; තිමි, තිමි නම් මත්ස්‍යයා; කලි, පාපය; බලි, බිලිය; ජලනිධි, මුහුද; ගහපති, ගොවියෝ; උරුධිති, මහත්ධෛර්ය; වරමති, උතුම්නුවන; නිරූපධි, උපධිරහිතබව; අධිපති, ඊශ්වරයි.

ආදි ආදී ආදයො යනාදී ආදිශබ්දය අග්ගිශබ්දය වැනියි, සප්තමියෙහි විශේෂඇති—ආදිං ආදෙ ආදිම්හි ආදිස්මිං ආදිසු ආදීසු යන තන්හි "ජිනවචන—පෙ—ස්මිං විභක්ති සතරතැනෙකවේ, සු විභක්ති දෙතැනෙකවේ, ආදිශබ්දයාකෙරෙන් පරවූ ස්මිං විභක්තිහට "ආදිතො ඔ ච" යන සූත්‍රයෙන් අං යනාදෙශහා ඔකාරාදෙශවේ, එක්පක්ෂයෙක්හි ම්හියනාදෙශවේ, සු විභක්ති පරකල්හි ඉකාරයහට "සුනංහිසු ච" යි එක්පක්ෂයෙක්හි දීඝවේ, ආදිං ආදෙ යනාදියවේ.

* සාතිඃ දානාවසානයොඃ, අමර.

ආදි, ආදී ආදයො-(හෙ) ආදි (භවනො) ආදී ආදයො—ආදිං, ආදී, ආදයො—ආදිනා, ආදිභි, ආදීභි—එවං කරණෙ—ආදිනො, ආදිස්ස, ආදීනං—ආදිනා, ආදිස්මා, ආදිම්හා, ආදිභි, ආදීභි—ආදිනො, ආදිස්ස, ආදීනං-ආදිං, ආදෙ, ආදිම්හි, ආදිස්මිං, ආදිසු, ආදීසු

ආදිශබ්දයෙන් ව්‍යවස්ථාව ප්‍රකාරය සමීපය අවයවය යන අර්ථ සතරක් කීයත්.

## ඊකාරාන්තයි.

*

දණ්ඩී දණ්ඩී දණ්ඩිනො යන තන්හි "ජිනවචන—පෙ—සි විභක්ති එක්වැනෙකවේ, යො විභක්ති දෙවැනෙකවේ. විභක්ති පරකල්හි "දීඝ-පෙ—ලුවණ්ණි"යට "ගුවණ්ණුවණ්ණ ලබ්භා" යන සූත්‍රයෙන් ලිංගසංඥාවේ, සි විභක්ති පරකල්හි ලිංගසංඥාහට "අඝො රස්සමෙකවචනයොස්වපි ච" යන සූත්‍රයෙන් හ්‍රස්ව පැමිණි කල්හි නපුංසකලිඞ්ග නොවන්නාවූ ශබ්දයන්ට "න සිස්මිමනපුංසකානි" යන සූත්‍රයෙන් ප්‍රතිෂෙධවේ, ශෙෂාකාරයෙන් පරවූ සි විභක්තිහට "සෙසතො" යනාදීන් ලොප්වේ, ලිංගසංඥාකාරෙන් පරවූ යො විභක්තිහට "ඤපතො ච යොනං" යනාදීන් විකල්පයෙන් ලොප්වේ, තුවු පක්ෂයෙහි යො විභක්ති පරකල්හි ලිංගසංඥාහට "අඝො රස්ස" යනාදීන් හ්‍රස්වවේ, කරණලද හ්‍රස්ව ඇති ලිංගසංඥාකාරෙන් පරවූ යො විභක්තිහට "යොනමනො" යි නො යනාදෙශවේ, දණ්ඩී දණ්ඩී දණ්ඩිනො යනුවේ.

(හෙ) දණ්ඩි (භවනො) දණ්ඩී දණ්ඩිනො යන තන්හි "ජිනවචන—පෙ—සි විභක්ති එක්වැනෙකවේ, යො විභක්ති දෙවැනෙකවේ, ආමන්ත්‍රණයෙහි වූ සි විභක්තිහට "ආලපනෙ සි ගසඤ්ඤො" යි ගසංඥාවේ, ගසංඥා පරකල්හි ලිංගසංඥාහට "ඝලපා රස්සං" යි හ්‍රස්වවේ, ගසංඥාහට "සෙසතො" යනාදීන් ලොප්වේ, යො විභක්තිහට "ඤපතො" යනාදීන් විකල්පයෙන් ලොප්වේ, තුවු පක්ෂයෙහි යො විභක්ති පරකල්හි ලිංගසංඥාහට "අඝො රස්ස" යනාදීන් හ්‍රස්වවේ, කරණලද හ්‍රස්ව ඇති ලිංගසංඥාකාරෙන් පරවූ යො විභක්තිහට "යොනමනො" යි නො යනාදෙශවේ, (හෙ) දණ්ඩි යනාදියවේ.

දණ්ඩිනං දණ්ඩිං දණ්ඩී දණ්ඩිනො යන තන්හි "ජිනවචන—පෙ—අං විභක්ති දෙවැනෙකවේ, යො විභක්ති දෙවැනෙකවේ, අං විභක්තිහා එක්පක්ෂයෙක යො විභක්ති පරකල්හි ලිංගසංඥාහට "අඝො රස්සං" යනාදි සූත්‍රයෙන් හ්‍රස්වවේ, කරණලද හ්‍රස්ව ඇති ලිංගසංඥාකාරෙන් පරවූ අං විභක්තිහට "නං ඣතො කතරස්සා" යන සූත්‍රයෙන් විකල්පයෙන් නං යනාදෙශවේ, තුවු පක්ෂයෙහි අං විභක්තිහට "අම්මො නිග්ගහීතං ඣලපෙහි" යන සූත්‍රයෙන් නිග්ගහීතබවට පැමිණේ, හ්‍රස්වනුවූ පක්ෂයෙහි යො විභක්තිහට "ඤපතො" යනාදි සූත්‍රයෙන් ලොප්වේ, තුවු පක්ෂයෙහි යො විභක්තිහට "යොනමනො" යන සූත්‍රයෙන් නො යනාදෙශවේ, දණ්ඩිනං දණ්ඩිං දණ්ඩී දණ්ඩිනො යනුවේ.

දණ්ඩිනා දණ්ඩීහි දණ්ඩීභි යන තන්හි-පෙ-නා විභත්ති එක්තැනෙක වේ, හි විභත්ති දෙතැනෙක වේ, එකවචනවූ නා විභත්ති පරකල්හි ඣසංඥයහට "අඝො රස්සං" යි සූත්‍රයෙන් හ්‍රස්ව වේ, භි යනාදෙශද වේ, දණ්ඩිනා යනාදියවේ.—— දණ්ඩිනා දණ්ඩීහි දණ්ඩීභි මේ කරණකාරකයි.

දණ්ඩිනො දණ්ඩිස්ස දණ්ඩීනං යන තන්හි "ජිනවචන—පෙ—ස විභත්ති දෙතැනෙකවේ, නං විභත්ති එක්තැනෙක වේ. එකවචන ස විභත්ති පරකල්හි ඣසංඥයහට "අඝො රස්ස" යනාදීන් හ්‍රස්වවේ, ඣසංඥයාකෙරෙන් පරවූ ස විභත්තිහට "ඣලතො සස්ස නො වා" යි විකල්පයෙන් නො යනාදෙශවේ, කුඹු පක්‍ෂයෙහි ස විභත්ති පරකල්හි "සාගමො සෙ" යි සකාරාගමවේ, දණ්ඩිනො යනාදියවේ.

දණ්ඩිනා දණ්ඩිම්හා දණ්ඩිස්මා දණ්ඩීහි දණ්ඩීභි යන තන්හි "ජිනවචන-පෙ-ස්මා විභත්ති තුන්තැනෙකවේ, හි විභත්ති දෙතැනෙකවේ, එකවචන ස්මා විභත්ති පරකල්හි ඣසංඥයහට "අඝො රස්ස" යනාදීන් හ්‍රස්වවේ, ඣසංඥයාකෙරෙන් පරවූ ස්මා විභත්තිහට "ඣලතො ච" යි විකල්පයෙන් නා යනාදෙශවේ, ම්හා යනාදෙශභා භියනාදෙශද වේ, දණ්ඩිනා යනාදියවේ.—— දණ්ඩිනො දණ්ඩිස්ස දණ්ඩීනං මේ ෂෂ්ඨීයි.

දණ්ඩිනි දණ්ඩිම්හි දණ්ඩිස්මිං දණ්ඩීසු යන තන්හි "ජිනවචන—පෙ—ස්මිං විභත්ති තුන්තැනෙකවේ, සු විභත්ති එක්තැනෙකවේ, එකවචන ස්මිං විභත්ති පරකල්හි ඣසංඥයහට "අඝො රස්ස" යනාදීන් හ්‍රස්වවේ, කරණලද හ්‍රස්වඇති ඣසංඥයාකෙරෙන් පරවූ ස්මිං විභත්තිහට "ස්මිංනි" යන සූත්‍රයෙන් විකල්පයෙන් නියනාදෙශවේ, ම්හි යනාදෙශදවේ, දණ්ඩිනි යනාදියවේ.

දණ්ඩී දණ්ඩී දණ්ඩිනො-(හෙ) දණ්ඩී (භවන්තො) දණ්ඩී දණ්ඩිනො—දණ්ඩිනං දණ්ඩිං දණ්ඩී දණ්ඩිනො—දණ්ඩිනා දණ්ඩීහි දණ්ඩීභි—එවං කරණෙ-දණ්ඩිනො දණ්ඩිස්ස දණ්ඩීනං—දණ්ඩිනා දණ්ඩිම්හා දණ්ඩිස්මා දණ්ඩීහි දණ්ඩීභි-දණ්ඩිනො දණ්ඩිස්ස දණ්ඩීනං-දණ්ඩිනි දණ්ඩිම්හි දණ්ඩිස්මිං දණ්ඩීසු.

දණ්ඩී ශබ්දයෙන් අනුගත්තාවුන් කියත්

ධම්මී සඞ්ඝී ඤාණී හත්ථී චක්කී පක්ඛී දාඨී රට්ඨී
ඡත්තී මාලී වම්මී යොගී භාගී භොගී කාමී සාමී.
ධජී ගණී සසී කුට්ඨී ජටී සාඛී සුඛී සිඛී
දන්තී මන්තී කරී චාගී කුසලී මුසලී බලී.
පාපකාරී සත්තුඝාතී මාලාකාරී දීඝජීවී
ධම්මවාදී සීහනාදී භූමිසායී සීඝයායී.

ඉච්චාදයො දණ්ඩීසද්දසමා.

ධම්මී, ධම්මිෂ්ඨ තැනැත්තේයි; සඞ්ඛී, සඞ්ඛ ඇත්තේයි; ඤාණී, ඤාණ ඇත්තේයි; හත්ථී, අත් ඇත්තේයි; චක්කී, චක්‍රඇත්තේයි; පක්ඛී, පක්ෂ ඇත්තේයි; දාඨී, දළ ඇත්තේයි; රට්ඨී, රට ඇත්තේයි; ඡත්තී, ඡත්‍ර ඇත්තේයි; මාලී, කුසුමදාමාදි මාලා දරණ තැනැත්තේයි; වම්මී, වර්ම ඇත්තේයි; යෝගී, යෙදුම් ඇත්තේයි; භාගී, භාග්‍ය ඇත්තේයි; භෝගී, භෝගඇත්තේයි.

ධජී, ධ්වජ ඇත්තේයි; ගණී, ගණ ඇත්තේයි; සසී, සසලප ඇත්තේයි; කුට්ඨී, කුෂ්ඨ ඇත්තේයි; ජටී, ජටා ඇත්තේයි; යානී, යානා ඇත්තේයි; සුඛී, සැප ඇත්තේයි; සිඛී, සිඛා ඇත්තේයි; දන්තී, දන්ත ඇත්තේයි; මන්තී, මන්ත්‍රණ ඇත්තේයි; කරී, අත් ඇත්තේයි; වාගී, ඝනග ඇත්තේයි; කුසලී, කුසල් ඇත්තේයි; මුසලී, මුසලායුධ දරන්නේයි; බලී, බල ඇත්තේයි.
පාපකාරී, පව් කරණසුලුයි; සත්තුඝාතී, සතුරන් මරණසුලුයි; මාලකාරී, මල් ගොතනසුලුයි; දීඝජීවී, බොහෝ කල් ජීවත්වනසුලුයි; ධම්මවාදී, ධර්මවාදියි; සීහනාදී, සිංහනාදකරණසුලුයි; භූමිසායී, බිම හෝනාසුලුයි; සීඝයායී, ශීඝ්‍රව ගමන් යන සුලුයි —— ඊකාරන්තයි.

භික්ඛු භික්ඛවො භික්ඛූ යන තන්හි "ජිනවචන—පෙ—සි විභක්ති එක් තැනෙකවේ, යෝ විභක්ති දෙතැනෙකවේ, විභක්ති පරකල්හි "පුබ්බ—පෙ—පුල්ලිඞ්ගයෙහිවූ උවර්ණයට "ඉවණ්ණුවණ්ණොජ්ඣලා" යන සූත්‍රයෙන් ලසංඥවේ, ලසංඥයාකෙරෙන් පරවූ යෝ විභක්තිහට "ලතො වොකාරො ච" යන සූත්‍රයෙන් විකල්පයෙන් වො යනාදෙශවේ, වො යනාදෙශයා පරකල්හි නොකරණලද හ්‍රස්වඇති ලසංඥයාහට "වෙවොසු ලො ච" යන සූත්‍රයෙන් අත්වවේ, එක්පක්ෂයෙක්හි යෝ විභක්තිහට "ඝපතො ච යොනං ලොපො" යන සූත්‍රයෙන් ලොප්වේ, යෝ විභක්ති ලොප් කළ පක්ෂයෙහි පූර්වස්වරයාහට "යොසු කත" යනාදි සූත්‍රයෙන් දීර්ඝවේ, භික්ඛු භික්ඛවො භික්ඛූ යනුවේ.

(හෙ) භික්ඛු (භවන්තො) භික්ඛවෙ භික්ඛවො භික්ඛූ යන තන්හි "ජිනවචන-පෙ-සි විභක්ති එක්තැනෙකවේ, යෝ විභක්ති තුන්තැනෙකවේ, ආලපන සි විභක්තිහට "ආලපනෙ සි ගසඤ්ඤො" යන සූත්‍රයෙන් ගසංඥවේ, පුල්ලිඞ්ගයෙහිවූ උවර්ණයහට "ඉවණ්ණුවණ්ණොජ්ඣලා" යනාදීන් ලසංඥවේ, ශෙෂයාකෙරෙන් පරවූ ගසංඥයහට "සෙසතො" යනාදීන් ලොප්වේ, නොකරණලද හ්‍රස්වඇති ලසංඥයාකෙරෙන් පරවූ ආලපන යෝ විභක්තිහට "අඤ්ඤතරස්මා ලතො යවාලපනස්ස වෙවො" යන සූත්‍රයෙන් වෙවො දෙදෙන ක්‍රමයෙන් ආදෙශවෙත්, තුබූපක්ෂයෙහි යෝ විභක්තිහට "ඝපතො" යනාදීන් ලොප්වේ, යෝ විභක්තිහට ලොප් කළ කල්හි පූර්වයෙහි සිටි ස්වරයහට "යොසු කත" යනාදීන් දීර්ඝවේ, (හෙ) භික්ඛු යනාදියවේ.

භික්ඛුං භික්ඛවො භික්ඛූ යන තන්හි "ජිනවචන-පෙ-අං විභක්ති එක් තැනෙකවේ, යො විභක්ති දෙතැනෙකවේ, ලසංඥයාකෙරෙන් පරවූ අං විභක්තිහට "අමෙමා නිග්ගහීතං ඣලපෙහි" යන සූත්‍රයෙන් නිග්ගහීත බවවේ, ලසංඥයාකෙරෙන් පරවූ යො විභක්තිහට "ලතො වොකාරො ච" යන සූත්‍රයෙන් විකල්පයෙන් වො යනාදෙශවේ, වො යනාදෙශයා පරකල්හි නොකරණලද හ්‍රස්වඇති ලසංඥයහට "වෙවොසු ලො ච" යී අඃවේ, තුබූ පක්ෂයෙහි යො විභක්තිහට "ඣලතො" යනාදින් ලොප්වේ, යො විභක්තිහට ලොප්කළ පක්ෂයෙහි හ්‍රස්වස්වරයහට "යොසු කත" යනාදීන් දීඝවේ, භික්ඛූ යනාදියවේ.

භික්ඛුනා භික්ඛූහි භික්ඛූභි යන තන්හි "ජිනවචන—පෙ—නා විභක්ති එක්තැනෙකවේ, හි විභක්ති දෙතැනෙකවේ, හි විභක්ති පරකල්හි උකාරය හට "සුනංහිසු ච" යි දීඝවේ, භික්ඛුනා යනාදියවේ—කරණකාරක යෙහිද මෙසේ මැයි.

භික්ඛුනො භික්ඛුස්ස භික්ඛූනං යන තන්හි "ජිනවචන පෙ-ස විභක්ති දෙතැනෙක වේ, නං විභක්ති එක්තැනෙක වේ, ලසංඥයාකෙරෙන් පරවූ ස විභක්තිහට "ඣලතො සස්ස නො වා" යි විකල්පයෙන් නො යනාදෙශවේ, තුබූ පක්ෂයෙහි ස විභක්ති පරකල්හි "සාගමො සෙ" යි සකාරාගමවේ, නං විභක්ති පරකල්හි "සුනංහි" යනාදීන් දීඝවේ භික්ඛුනො යනාදියවේ.

භික්ඛුනා භික්ඛුම්හා භික්ඛුස්මා භික්ඛූහි භික්ඛූභි යන තන්හි "ජින වචන—පෙ—ස්මා විභක්ති තුන්තැනෙක වේ, හි විභක්ති දෙතැනෙක වේ, ලසංඥයාකෙරෙන් පරවූ ස්මා විභක්තිහට "ඣලතො ච" යී නා යනාදෙශවේ, හි විභක්ති පරකල්හි උකාරයහට "සුනංහි" යනාදීන් දීඝවේ, භික්ඛුනා යනාදියවේ—භික්ඛුනො භික්ඛුස්ස භික්ඛූනං යනු ෂෂ්ඨී චතුර්ථීයමෙනි.

භික්ඛුම්හි භික්ඛුස්මිං භික්ඛූසු යන තන්හි "ජිනවචන-පෙ—ස්මිං විභක්ති දෙතැනෙකවේ, සු විභක්ති එක්තැනෙකවේ, ස්මිං විභක්තිහට ම්හි යනාදෙශවේ, සු විභක්ති පරකල්හි උකාරයහට "සුනංහිසු" යනාදීන් දීඝව භික්ඛුම්හි යනාදියවේ.

භික්ඛු භික්ඛවෙ භික්ඛූ (හෙ) භික්ඛු (භවන්තො) භික්ඛවෙ භික්ඛවො. භික්ඛු—භික්ඛුං භික්ඛවො, භික්ඛූ—භික්ඛුනා භික්ඛූහි භික්ඛූභි—එවං කරණෙ—භික්ඛුනො භික්ඛුස්ස භික්ඛූනං-පෙ-භික්ඛුම්හි භික්ඛුස්මිං භික්ඛූසු—භික්ඛුශබ්දයෙන් මහණුන් කියත්.

එවං සෙතු කෙතු භාතු රාහු සඛ්ඛු උච්ඡු වෙළු මච්චු සින්ධු බන්ධු නෙරු මෙරු සත්තු කාරු හෙතු ජන්තු රුරු පටු ඉච්චාදයො භික්ඛුසද්දසමා.

සෙතු, හේදඬු; කෙතු, ධජය; භානු, ඉරුයි; රාහු, රාහුඅසුරිඳු; සබ්ඛු, උල්; උච්ඡු, උක්; වෙළු, හුණ; මච්චු, මර; සින්ධු, සාගරය; බන්ධු; නෑයෝ; නෙරු, එනම්පර්වතය; මෙරු, මේරුපර්වතය; සත්තු, අත්සුණු; කාරු, සිල්පී; හෙතු, කාරණය; ජන්තු, සත්වයෝ; රුරු, එනම්මුවෝ; පටු, ව්‍යක්තයෝයි.

ජන්තු ජන්තූ ජන්තවො ජන්තුනො ජන්තුයො යන තන්හි "ජිනවචන පෙ-සි විභත්ති එක්තැනෙකවේ, යො විභත්ති සතරතැනෙකවේ, උවණ්ණ යහට. "ඉවණ්ණුවණ්ණාජ්ඣලා" යනාදීන් ලසංඥවෙයි, සි විභත්තිහට "සෙසතො" යනාදීන් ලොප්වේ, ලසංඥයාකෙරෙන් පරවූ යො විභත්තින්ට "ඝපතො" යනාදීන් විකල්පයෙන් ලොප්වේ, යො විභත්ති ලොප්කළ පක්ෂයෙහි ස්වරයහට "යොසුකතා" යනාදීන් දීර්ඝවේ, තුබූ පක්ෂයෙහි ලසංඥයාකෙරෙන් පරවූ යො විභත්තිහට "ලතො වොකාරො ච" යි විකල්පයෙන් වො යනාදෙශවේ, වො යනාදෙශයා පරකල්හි නොකරණ ලද හ්‍රස්වඇති ලසංඥයහට "වෙවොසු ලො ච" යි අඞවේ, එක් පක්ෂයෙක්හි යො විභත්තිහට "ලතො වොකාරො ච" යන සූත්‍රයෙහි කාරග්‍රහණයෙන් විකල්පයෙන් නො යනාදෙශවේ, ජන්තු ජන්තූ යනාදියවේ.

(ගෙ) ජන්තු (භවන්තො) ජන්තූ ජන්තවෙ ජන්තවො ජන්තුනො ජන්තුයො යන තන්හි "ජිනවචන—පෙ—සි විභත්ති එක් තැනෙකවේ, යො විභත්ති පස් තැනෙකවේ, ගශඝයාකෙරෙන් පරවූ ගසංඥයහට "සෙසතො" යනාදීන් ලොප්වේ, ලසංඥයාකෙරෙන් පරවූ යො විභත්තිහට "ඝපතො" යනාදීන් විකල්පයෙන් ලොප්වේ, යො විභත්ති ලොප් කළ පක්ෂයෙහි ස්වරයහට "යොසු කතනා" දීන් දීර්ඝවේ, නොකරණ ලද හ්‍රස්වඇති ලසංඥයාකෙරෙන් පරවූ ආලපන යො විභත්තිහට "අකතරස්සා ලතො ය්වාලපනස්ස වෙවො" යන සූත්‍රයෙන් විකල්පයෙන් ක්‍රමයෙන් වෙවො යන ආදෙශයෝ දෙදෙන වෙත්, වෙවො යනාදෙශයන් පරකල්හි ලසංඥයහට "වෙවො" යනාදීන් අඞවේ, එක් පක්ෂයෙක්හි යො විභත්තිහට "ලතො වොකාරො ච" යි කාරග්‍රහණයෙන් නො යනාදෙශව (ගෙ) ජන්තු (භවන්තො) ජන්තූ යනාදියවේ.

ජන්තුං ජන්තූ ජන්තවො ජන්තුනො ජන්තුයො යන තන්හි "ජින වචන-පෙ-අං විභත්ති එක් තැනෙකවේ, යො විභත්ති සතර තැනෙකවේ, ලසංඥයාකෙරෙන් පරවූ අං විභත්ති "අමෙමා නිග්ගහීතං ඣලපෙහි" යන සූත්‍රයෙන් නිග්ගහීතබවට පැමිණේ, ලසංඥයාකෙරෙන් පරවූ යො විභත්තිහට "ඝපතො" යනාදීන් ලොප්වේ, යො විභත්ති ලොප් කළ පක්ෂයෙහි ලසංඥයහට "යොසු කත" යනාදීන් දීර්ඝවේ, එක් පක්ෂයෙක්හි යො විභත්තිහට "ලතො වොකාරො ච" යි වො යනාදෙශවේ, තුබූ පක්ෂයෙහි යො විභත්තිහට "ලතො වොකාරො ච" යන සූත්‍රයෙහි කාර ග්‍රහණයෙන් විකල්පයෙන් නො යනාදෙශව ජන්තුං යනාදියවේ,

ජන්තුනා ජන්තූහි ජන්තූභි යන තන්හි "ජිනවචන—පෙ—නා විභක්ති එක් තැනෙකවේ, හි විභක්ති දෙතැනෙකවේ, හි විභක්ති පරකල්හි ස්වරය හට "සුනංහිසු ච" යි දීඝව ජන්තූනා යනාදීයවේ — කරණකාරකයද මෙසේ මැයි.

ජන්තුනො ජන්තුස්ස ජන්තූනං යන තන්හි "ජිනවචන-පෙ-ස විභක්ති දෙතැනෙකවේ, නං විභක්ති එක් තැනෙකවේ, ලසංඥයාකෙරෙන් පරවූ ස විභක්තිහට "ඣලතො" යනාදීන් විකල්පයෙන් නො යනාදෙශවේ, තුබූ පක්ෂයෙහි ස විභක්ති පරකල්හි "සාගමො සෙ" යි සකාරාගමවේ, නං විභක්ති පරකල්හි ස්වරයට "සුනංහි" යනාදීන් දීඝව ජන්තූනො යනාදියවේ.

ජන්තුනා ජන්තුම්හා ජන්තුස්මා ජන්තූහි ජන්තූභි යන තන්හි "ජිනවචන—පෙ-ස්මා විභක්ති තුන්තැනෙක වේ, හි විභක්ති දෙතැනෙක වේ, ලසංඥයාකෙරෙන් පරවූ ස්මා විභක්තිහට "ඣලතො ච" යි විකල්පයෙන් නා යනාදෙශහා මහාය භිය යනාදෙශව ජන්තුනා ජන්තුම්හා යනාදියවේ. ජන්තුනො ජන්තුස්ස ජන්තූනං යනු ෂෂ්ඨියි.

ජන්තුම්හි ජන්තුස්මිං ජන්තූසු යන තන්හි "ජිනවචන-පෙ-ස්මිං විභක්ති දෙතැනෙක වේ, සු විභක්ති එක්තැනෙක වේ, ස්මිං විභක්තිහට විකල්පයෙන් ම්හියනාදෙශවේ, සු විභක්ති පරකල්හි ස්වරයහට "සුනංහි" යනාදීන් දීඝව ජන්තුම්හි යනාදිය වේ.

ජන්තු ජන්තූ ජන්තවො ජන්තුනො ජන්තුයො—(හෙ) ජන්තු (භවන්තො) ජන්තූ ජන්තවෙ ජන්තවො ජන්තුනො ජන්තුයො - ජන්තුං ජන්තූ ජන්තවො ජන්තුනො ජන්තුයො—ජන්තුනා ජන්තූහි ජන්තූභි— එවං කරණෙ-ජන්තුනො ජන්තුස්ස ජන්තූනං—ජන්තුනා ජන්තුම්හා ජන්තුස්මා ජන්තූහි ජන්තූභි-ජන්තුනො ජන්තුස්ස ජන්තූනං-ජන්තුම්හි ජන්තුස්මිං ජන්තූසු—ජන්තුශබ්දයෙහි සබයන් කියත්.

සත්ථා සත්ථාරො යන තන්හි "ජිනවචන-පෙ-සි විභක්ති එක්තැනෙක වේ, යො විභක්ති එක්තැනෙක වේ, සි විභක්ති පරකල්හි සත්ථුශබ්දයාගේ අන්තඋකාරයහට "සත්ථුපිතාදීනමා සිස්මිං සිලොපො ච" යන සූත්‍රයෙන් ආකාරාදෙශහා සි විභක්තිහට ලොපදවේ, යො විභක්ති පරකල්හි සත්ථුශබ්දයාගේ අන්තඋකාරයට "අඤ්ඤෙසඤ්චාරත්තං" යන සූත්‍රයෙන් ආරයනාදෙශ වේ, ආරයනාදෙශයාකෙරෙන් පරවූ යො විභක්තිහට "තතො යොනමො තු" යන සූත්‍රයෙන් ඔකාරාදෙශ වේ, සත්ථා සත්ථාරො යනුවේ.

(හෙ) සත්ථ සත්ථා (භවන්තො) සත්ථාරො යන තන්හි "ජිනවචන-පෙ-සි විභක්ති දෙතැනෙක වේ, යො විභක්ති එක්තැනෙක වේ, ගසංඥයා පරකල්හි සත්ථුශබ්දයාගේ අන්තඋකාරයට "අකාරපිතාද්‍යන්තානමා" යන සූත්‍රයෙන් ආකාරාදෙශ වේ, ගසංඥයා පරකල්හි ආකාරයහට "ආකාරො වා" යි විකල්පයෙන් හ්‍රස්වවේ, ගසංඥයහට "සෙසතො" යනාදීන්

ලොප්වේ, යො විභක්ති පරකල්හි සඛිශබ්දයාගේ අන්තයහට "අඛෙසු සඛා" යනාදින් ආරයනාදෙශ වේ, ආරයනාදෙශයාගෙන් පරවූ යො විභක්තිහට "තතො යොනමො තු" යි ඔකාරාදෙශව (ගො) සඛා සඛාරො යනාදිය වේ.

සඛාරං සඛාරෙ සඛාරෙ යන තන්හි ජිනවචන-පෙ-අං විභක්ති එක් තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, විභක්ති පරකල්හි සඛිශබ්දයාගේ අන්තයහට "අඛෙසුසඛා" යනාදින් ආරවේ, යො විභක්තිහට "සබ්බයොනීනමාඑ" යි එකාරයෙන් විකල්පයෙන් ආදෙශවේ, තුමූ පක්ෂයෙහි යො විභක්තිහට "නතොනොනො" යනාදීන් ඔකාරාදෙශ වේ. අං විභක්තිද විභක්ත්‍යාදෙශස්වරයන්ද පරකල්හි පූර්වස්වරයන්ට "සර ලොපො" දින් ලොප්ව සඛාරං සඛාරෙ යනාදිය වේ.

සඛාරා සඛාරෙහි සඛාරෙහි යන තන්හි ජිනවචන-පෙ-නා විභක්ති එක්තැනෙක වේ, හි විභක්ති දෙතැනෙක වේ, විභක්ති පරකල්හි සඛිශබ්දයාගේ අන්තයහට "අඛෙසුසඛා" යනාදින් ආරව ඔහුකෙරෙන් පරවූ නාහට "නා අ" යි ආව හි විභක්ති පරකල්හි අකාරයහට "සුහිස්" යනාදින් එකාරව සඛාරා යනාදියවේ—කරණ කාරකයෙහිද මෙසේ මැයි.

සඛිනො සඛිනො සඛීනං සඛාරානං සඛානං යන තන්හි ජිනවචන-පෙ-ස විභක්ති තුන් තැනෙක වේ, නං විභක්ති දෙතැනෙක වේ, ස විභක්ති පරකල්හි සඛිශබ්දයාගේ අන්තයහට "අඛෙසුසාරපතා" යි වන ආරයන්ත හුණේ වැලක්වමින් "උ සස්මිං සලොපො ච" යි උකාරයහටම උකාරව ස විභක්තිහට විකල්පයෙන් ලොප්ද වේ, එක්පක්ෂයෙහි ස විභක්තිහට "ඔ ලුත්තො සස්ස නො වා" යි විකල්පයෙන් නො යනාදෙශවේ, තුමූ පක්ෂයෙහි ස විභක්ති පරකල්හි "සාගමො සෙ" යි සකාරාගම වේ, නං විභක්ති පරකල්හි සඛ්‍යාද්‍යන්තයහට "වා නම්හි" යන සූත්‍රයෙන් විකල්පයෙන ආරවේ, තුමූ පක්ෂයෙහි නං විභක්ති පරකල්හි සඛිශබ්දයාගේ අන්තයහට "සඛීනානනාච" යන සූත්‍රයෙන් ආවවේ, නං විභක්ති පරකල්හි අකාරයන්ට "සුනංහි" යනාදින් දෙතැනෙක්හි දීඝීවේ, සඛිනො සඛිනො යනාදියවේ.

සඛාරා සඛාරෙහි සඛාරෙහි යන තන්හි ජිනවචන-පෙ-ස්මා විභක්ති එක්තැනෙක වේ, හි විභක්ති දෙතැනෙක වේ, විභක්ති පරකල්හි සඛිශබ්දයාගේ අන්තයහට "අඛෙසුසු" යනාදින් ආරවේ, ස්මා විභක්තිහට "අම්හතුම්හ" දින් නාව නාහට "නා අ" යි ආව හි විභක්ති පරකල්හි අකාරයහට "සුහිස්වකාරො එ" යි එව සඛාරා යනාදියවේ—සන්තී සඛිනො සඛීනං සඛාරානං සඛානං යනු ෂෂ්ඨියේ විභක්තීයමෙනි.

සඛරි සඛාරෙසු යන තන්හි ජිනවචන-පෙ-ස්මිං විභක්ති එක්තැනෙක වේ, සු විභක්ති එක්තැනෙක වේ, විභක්ති පරකල්හි සඛිශබ්දයාගේ අන්තයහට "අඛෙසුසඛා" යනාදින් ආරවේ, ආරයනාදෙශයාකෙරෙන්

පරවූ ස්මිං විභක්තිහට "තතො ස්මිමි" යි ඉකාරව ඉකාරයා පරකල්හි ආර යනාදෙශයාගේ ආකාරයහට "ආරො රස්සමිකාරෙ" යි හ්‍රස්වව සු විභක්ති පරකල්හි අකාරයහට "සුහිස්ව" යනාදීන් එකාරව පැමින සත්ථරි යනාදිගවේ.

සත්ථා සත්ථාරෝ-(හෙ) සත්ථ සත්ථා (භවන්තො) සත්ථාරෝ-සත්ථාරං සත්ථාරෙ සත්ථාරෝ-සත්ථාරා සත්ථාරෙහි සත්ථාරෙභි-එවං කරණේ-සත්ථු සත්ථුනො සත්ථුස්ස සත්ථාරානං සත්ථානං—සත්ථාරා සත්ථාරෙහි සත්ථාරෙභි—සත්ථු සත්ථුනො සත්ථුස්ස සත්ථාරානං සත්ථානං-සත්ථරි සත්ථාරෙසු—සත්ථුශබ්දයෙන් ශාස්තෲන් කියත්.

නත්තා නත්තාරෝ යන තන්හි ජිනවචන-පෙ-සි විභක්ති එක්තැනෙක වේ, යො විභක්ති එක්තැනෙක වෙයි, සි විභක්ති පරකල්හි නත්තුශබ්දයාගේ අන්ත උකාරයහට "සත්ථුපිතාදීනමාසිස්මිං සිලොපො ච" යි ආකාරාදෙශ හා සි විභක්තිහට ලොප්දවේ යො විභක්ති පරකල්හි නත්තුශබ්දයාගේ අන්තයහට "අඤ්ඤෙස්වාරු" යනාදීන් ආරව යො විභක්තිහට "තතො යොනමො තු" යි ඔකාරව නත්තා නත්තාරොයනුවේ—මේ නත්තුශබ්දයෙහි ආලපනාදිවූ හැම පදසිද්ධිය සත්ථුශබ්දයාමෙනි-

නත්තා නත්තාරෝ—(හෙ) නත්ත නත්තා (භවන්තො) නත්තාරෝ—නත්තාරං නත්තාරෙ නත්තාරෝ—නත්තාරා නත්තාරෙහි නත්තාරෙභි-එවං කරණේ-නත්තු නත්තුනො නත්තුස්ස නත්තාරානං නත්තානං—නත්තාරා නත්තාරෙහි නත්තාරෙභි—නත්තු නත්තුනො නත්තුස්ස නත්තාරානං නත්තානං—නත්තරි නත්තාරෙසු—නත්තුශබ්දයෙන් මුණුබුරන් කියත්-

එවං භත්තු වත්තු නෙතු සොතු ඤාතු ජෙතු ඡෙත්තු භෙත්තු දාතු ධාතු නත්තු බොද්ධු විඤ්ඤාපෙතු සක්කමන්ධාතු මහාමන්ධාතු ආදයො.

භත්තු, රක්ෂාකරන්නේයි; වත්තු, කියන්නේයි; නෙතු, පමුණුවන්නේයි; සොතු, අසන්නේයි; ඤාතු, දැනගන්නේයි; ජෙතු, ජයගන්නේයි; ඡෙත්තු, කපන්නේයි; භෙත්තු, පළන්නේයි; දාතු දෙන්නේයි; ධාතු, ධරන්නේයි; නත්තු, මුණුබුරායි; බොද්ධු, දන්නේයි; විඤ්ඤාපෙතු, හඟවන්නේයි; සක්කමන්ධාතු, සක්කමන්ධාතුය; මහාමන්ධාතු, මහාමන්ධාතුයි.

පිතා පිතරෝ යන තන්හි ජිනවචන—පෙ-සි විභක්ති එක්තැනෙක වේ, යො විභක්ති එක්තැනෙකවේ, සි විභක්ති පරකල්හි පිතුශබ්දයාගේ අන්තයහට "සත්ථුපිතාදීනමා සිස්මිං සිලොපො ච" යි ආකාරාදෙශ හා සි විභක්තිහට ලොප්ද වේ, යො පරකල්හි පිතුශබ්දයාගේ අන්තයහට "අඤ්ඤෙස්වාරු" යනාදීන් ආරව යොහට "තතො යොනමො තු" යි ඔකාරව ආරයනාදෙශයාගේ ආකාරයහට "පිතාදීනමසිම්හි" යි හ්‍රස්වව පිතරෝ යනාදියවේ—(හෙ) පිත පිතා (භවන්තො) පිතරෝ යනාදියෙහි පදසිද්ධික්‍රමය සත්ථුශබ්දයාමෙනි.

පිතා පිතරො (හෙ) පිත පිතා (භවන්තො) පිතරො - පිතරං පිතරෙ පිතරො - පිතරා පිතරෙභි පිතරෙහි පිතූභි පිතූහි - එවං කරණෙ — පිතු පිතුනො පිතුස්ස පිතරානං පිතානං පිතූනං - පිතරා පිතරෙහි පිතරෙභි පිතූභි පිතූහි - පිතු පිතුනො පිතුස්ස පිතරානං පිතානං පිතූනං - පිතරි පිතරෙසු පිතූසු.

පිතුශබ්දයෙන් පිතෘන් කියත්.

භාතාභාතරො යනාදි භාතුශබ්දයාගේ.

පදසිද්ධික්‍රමය පිතුශබ්දයාමෙනි.

භාතා භාතරො - (හෙ) භාත භාතා (භවන්තො) භාතරො - භාතරං භාතරෙ භාතරො - භාතරා භාතරෙභි භාතරෙහි භාතූභි භාතූහි - එවං කරණෙ - භාතු භාතුනො භාතුස්ස භාතරානං භාතානං භාතූනං - භාතරා භාතරෙභි භාතරෙහි භාතූභි භාතූහි - භාතු භාතුනො භාතුස්ස භාතරානං භාතානං භාතූනං - භාතරි භාතරෙසු භාතූසු — භාතුශබ්දයෙන් භ්‍රාතෘන් කියත් — උකාරාන්තයි.

අභිභූ අභිභුවො අභිභූ යන තන්හි ප්‍රථමාවචන — පෙ — සි විභක්ති එක් තැනෙකවේ, යො විභක්ති දෙතැනෙකවේ, සි විභක්තිහට "සෙසතො" යනාදීන් ලොප්වේ, යො විභක්ති පරකල්හි ලසංඥයහට "අඝො රස්ස මෙකවචන යොස්වපි ච" යි විකල්පයෙන් හ්‍රස්වව ලසංඥයාකෙරෙන් පරවූ යො විභක්තිහට "ලතො වොකාරො ච" යි විකල්පයෙන් වො යනාදේශවේ, තුබූ පක්ෂයෙහි යො විභක්තිහට "ඝපතො ච යොනං ලොපො" යි ලොප්වේ, අභිභූ යනාදියවේ.

(හෙ) අභිභු (භවන්තො) අභිභුවො අභිභූ යන තන්හි ප්‍රථමාවචන පෙ - සි විභක්ති එක්තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, ගසංඥයා පර කල්හි ලසංඥහට "ඝබ්‍රලපා රස්සං" යන සූත්‍රයෙන් හ්‍රස්වවේ, ගසංඥයහට "සෙසතො" යනාදි සූත්‍රයෙන් ලොප්වේ, යො විභක්ති පරකල්හි ලසංඥයහට "අඝො රස්සං" යනාදීන් විකල්පයෙන් හ්‍රස්වවේ, ආලපන යො විභක්තිහට ලසංඥයාකෙරෙන් පරවුවද කරණලද හ්‍රස්වඇතිබැවින් "අකතරස්සා ලතො ය්වාලපනස්ස වෙවො" යන සූත්‍රයෙන් වන වෙවො යනාදෙශ අප්‍රාප්තහෙයින් නොව "ලතො වොකාරො ච" යන සූත්‍රයෙන් විකල්පයෙන් වො යනාදෙශවේ, තුබූ පක්ෂයෙහි යො විභක්තිහට "ඝපතො ච" යනාදීන් ලොප්ව (හෙ) අභිභූ යනාදියවේ — අභිභුං අභිභුවො අභිභූ යනාදිය භික්ඛුශබ්දයාමෙනි වෙනස හ්‍රස්වවීමයි.

අභිභූ අභිභුවො අභිභූ - (හෙ) අභිභූ (භවන්තො) අභිභුවො අභිභූ - අභිභුං අභිභුවො අභිභූ — අභිභුනා අභිභූභි අභිභූහි - එවං කරණෙ - අභිභුනො අභිභුස්ස අභිභූනං — අභිභුනා අභිභුම්හා අභිභුස්මා අභිභූභි අභිභූහි — අභිභුනො අභිභුස්ස අභිභූනං — අභිභුම්හි අභිභුස්මිං අභිභූසු — අභිභූ ශබ්දයෙන් මැඩපවත්වන්නවුන් කියත්.

එවං සයම්භූ වෙස්සභූ පරාභිභූ සහභූ ආදයො.

සයම්භූ, තෙමේම හටගත්තේය; වෙස්සභූ, එනම් බුදුයි; පරාභිභූ, අනුන් මැඩපවත්වන්නේයි; සහභූ, එක්ව උපන්නේයි.

සබ්බඤ්ඤූ සබ්බඤ්ඤුනො සබ්බඤ්ඤූ යන තන්හි "ජිනවචන-පෙ-සි විභක්ති එක්තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, සි විභක්තිහට "සෙසතො" යනාදින් ලොප් වේ, ල සංඥයාකෙරෙන් පරවූ යො විභක්තිහට "ලතො වොකාරො ච" යි වො යනාදෙශ පතෙතහි එම සූත්‍රයෙහි කාරග්‍රහණයෙන් ප්‍රතිෂෙධව මෙයින් නො යනාදෙශව මෙම පක්ෂයෙහි ඌකාරයහට "අඝො රස්සං" යනාදින් හ්‍රස්වව යො හට "ඝපතො" යනාදින් ලොප්ව සබ්බඤ්ඤූ යනාදිය වේ.

(හෙ) සබ්බඤ්ඤු (භවන්තො) සබ්බඤ්ඤුනො සබ්බඤ්ඤූ යන තන්හි "ජිනවචන-පෙ-සි විභක්ති එක්තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, ග සංඥයාපරකල්හි ල සංඥයහට "ඣලපා රස්සං" යි හ්‍රස්ව වේ, ල සංඥයා කෙරෙන් පරවූ යො විභක්තිහට "ලතො වොකාරො ච" යි කාරග්‍රහණයෙන් විකල්පයෙන් නො යනාදෙශ වේ, එම පක්ෂයෙහි ල සංඥයහට "අඝො රස්සං" යනාදින් හ්‍රස්ව වේ, තුඹු පක්ෂයෙහි යො විභක්තිහට "ඝපතො" යනාදින් ලොප් වේ, (හෙ) සබ්බඤ්ඤු යනාදිය වේ.

සබ්බඤ්ඤුං සබ්බඤ්ඤුනො සබ්බඤ්ඤූ යනාදි රූපසිද්ධි ක්‍රමය දණ්ඩී ශබ්දයා මෙනි.

සබ්බඤ්ඤූ සබ්බඤ්ඤුනො සබ්බඤ්ඤූ—(හෙ) සබ්බඤ්ඤු (භවන්තො) සබ්බඤ්ඤුනො සබ්බඤ්ඤූ—සබ්බඤ්ඤුං සබ්බඤ්ඤුනො සබ්බඤ්ඤූ—සබ්බඤ්ඤුනා සබ්බඤ්ඤූහි සබ්බඤ්ඤූභි—එවං කරණෙ-සබ්බඤ්ඤුනො සබ්බඤ්ඤුස්ස සබ්බඤ්ඤූනං-සබ්බඤ්ඤුනා සබ්බඤ්ඤූහි සබ්බඤ්ඤූභි-සබ්බඤ්ඤුනො සබ්බඤ්ඤුස්ස සබ්බඤ්ඤූනං-සබ්බඤ්ඤුම්හි සබ්බඤ්ඤුස්මිං සබ්බඤ්ඤූසු.

සබ්බඤ්ඤූ ශබ්දයෙන් සර්වඥයන් කියත්.

එවං මග්ගඤ්ඤූ ධම්මඤ්ඤූ අත්ථඤ්ඤූ කාලඤ්ඤූ රත්තඤ්ඤූ මත්තඤ්ඤූ කතඤ්ඤූ තත්තඤ්ඤූ විඤ්ඤූ විද්දූ වෙදගූ පාරගූ ආදයො.

මග්ගඤ්ඤූ, මාර්ගය දන්නේයි; ධම්මඤ්ඤූ, ධර්මය දන්නේයි; අත්ථඤ්ඤූ, අර්ථ දන්නේයි; කාලඤ්ඤූ, කල්දන්නේයි; රත්තඤ්ඤූ, චිරරාත්‍රිදන්නේයි; මත්තඤ්ඤූ, පමණ දන්නේයි; කතඤ්ඤූ, කෙළෙහි ගුණ දන්නේයි; තත්තඤ්ඤූ, තත්ව දන්නේයි; විඤ්ඤූ, විශෙෂයෙන් දන්නේයි; විද්දූ, දන්නේයි; වෙදගූ, වේදනිච්චා දන්නේයි; පාරගූ, එතරට ගියේයි.

ඌකාරාන්තයි.

ගො ගාවො යන තන්හි "ජිනවචන—පෙ-සි විභක්ති එක්තැනෙක වේ, යො විභක්ති එක්තැනෙක වේ, සි විභක්තිහට "සෙසතො" යනාදින් ලොප්වේ, යො විභක්ති පරකල්හි ගොශබ්දයාගේ ඔකාරයහට "යොසු ච"

යන සූත්‍රයෙන් ආව යනාදෙශ වේ. යො විභක්තිහට "තතො යොනමො තු" යන සූත්‍රයෙහි තු ග්‍රහණයෙන් ඔ කාරාදෙශව ගො ගාවො යනුවේ.

(හෙ) ගො (භවන්තො) ගාවො යන තන්හි "ජිනවචන-පෙ-සි විභක්ති එක්තැනෙක වේ, යො විභක්ති එක්තැනෙක වේ, ග සංඥයහට "ඝසස ච තො" යනාදීන් ලොප්වේ, යො විභක්ති පරකල්හි ගො ශබ්දයාගේ ඔ කාරයහට "යොසු ච" යි ආව යො විභක්තිහට "තතො යො" යනාදී සූත්‍රයෙහි තු ග්‍රහණයෙන් ඔ ව (හෙ) ගො යනාදියවේ.

ගාවුං ගාවං ගවං ගාවො යන තන්හි "ජිනවචන—පෙ—අං විභක්ති තුන්තැනෙක වේ, යො විභක්ති එක්තැනෙක වේ, අං විභක්ති පරකල්හි ගො ශබ්දයාගේ ඔ කාරයට "අවම්හි ච" යන සූත්‍රයෙන් ආව අව යනාදෙශයෝ වෙත්, අං විභක්ති පරකල්හි ආව යන්නහුගේ වකාරස්ථ අකාරයහට "ආවස්සු වා" යි විකල්පයෙන් උ කාරාදෙශවේ, උකාරයහට "ඉවණ්ණුවණ්ණා" දීන් ල සංඥවේ, ල සංඥයාකෙරෙන් පරවූ අං විභක්ති "අමෙමා නිග්ගහීතං" යනාදීන් නිග්ගහීතබවට පැමිණේ, තුමූ දෙතැන්හි පුබ්බස්සරලොප්වේ, යො විභක්ති පරකල්හි ඔ කාරයට "යොසු ච" යි ආව යොහට "තතො යොනමො තු" යන සූත්‍රයෙහි තු ග්‍රහණයෙන් ඔ ව ගාවුං යනාදියවේ,

ගාවෙන ගවෙන ගොහි ගොභි යන තන්හි "ජිනවචන-පෙ-නා විභක්ති දෙතැනෙක වේ. හි විභක්ති දෙතැනෙක වේ, නා විභක්ති පරකල්හි ගො ශබ්දයාගේ ඔ කාරයහට "අවම්හි ච" යන සූත්‍රයෙහි ච ග්‍රහණයෙන් ආව අව යනාදෙශයෝ වෙත්, නා විභක්තිහට "අතො නෙන" යි එන ච හි විභක්තිහට භී යනාදෙශ ව ගාවෙන යනාදියවේ— කරණ කාරක සෙසිද්ධ මෙසේ මැයි.

ගාවස්ස ගවස්ස ගවං ගුන්නං ගොනං යන තන්හි "ජිනවචන—පෙ—ස විභක්ති දෙතැනෙක වේ, නං විභක්ති තුන්තැනෙක වේ, ස විභක්ති පරකල්හි ගො ශබ්දයාගේ ඔ කාරයහට "ගාව සෙ" යන සූත්‍රයෙන් ආව අව යනාදෙශයෝ වෙත්, ස විභක්ති පරකල්හි "සාගමො සෙ" යන සූත්‍රයෙන් අවිකල්පයෙන් ස කාරාගම වේ, නං විභක්ති පරකල්හි ගො ශබ්දයාගේ ඔ කාරයහට "තතො නමම්පතිම්හාලුත්තෙ ච සමාසෙ" යන සූත්‍රයෙහි ච ග්‍රහණයෙන් ආව යනාදෙශ හා නං විභක්තිහට විකල්පයෙන් අං යනාදෙශද වේ, එක් පක්ෂයෙක්හි නං විභක්ති පරකල්හි සියලුම ගො ශබ්දයහට "සුංහිනාසු ච" යි ච ග්‍රහණයෙන් ගු යනාදෙශවේ, නං විභක්තිහට "පරද්වෙභාවො ඨානෙ" යන සූත්‍රයෙන් ද්විත්වව ගාවස්ස යනාදියවේ.

ගාවා ගවා ගාවම්හා ගවම්හා ගාවස්මා ගවස්මා ගොහි ගොභි යන තන්හි "ජිනවචන-පෙ-ස්මා විභක්ති ස තැනෙක වේ, හි විභක්ති දෙතැනෙකවේ, ස්මා විභක්ති පරකල්හි ගො ශබ්දයාගේ ඔ කාරයහට "අවම්හි ච" යන සූත්‍රයෙහි ච ග්‍රහණයෙන් ක්‍රමයෙන් ආව අව යනාදෙශයෝ වෙත්, ස්මා විභක්තිහට "ස්මා ස්මිංනං වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් දෙතැනෙක්හි

ආකාරාදෙශවේ, දෙතැනෙක්හි ම්හා යනාදෙශ හා යි යනාදෙශවේ, ගාවා යනාදියවේ. ෂෂ්ඨිය චතුර්ථිය මෙනි.

ගාවෙ ගවෙ ගාවම්හි ගවම්හි ගාවස්මිං ගවස්මිං ගාවෙසු ගවෙසු ගොසු යන තන්හි "ජිනවචන-පෙ-ස්මිං විභක්ති සතැනෙක වේ, සු විභක්ති තුන් තැනෙකවේ, විභක්ති පරකල්හි ගො ශබ්දයාගේ ඔ කාරයහට "අවම්හි ච" යන සූත්‍රයෙහි චග්‍රහණයෙන් ආව අව යනාදෙශයෝ වෙත්, ස්මිං විභක්තිහට "ස්මා ස්මිනං වා" යන සූත්‍රයෙන් දෙතැනෙක්හි එකාරාදෙශවේ, ස්මිං විභක්තිහට ම්හි යනාදෙශ දෙතැනෙක්හිවේ, සු විභක්ති පරකල්හි අකාරයහට "සුහිස්වකාරො එ" යන සූත්‍රයෙන් එකාරාදෙශවේ, ගාවෙ ගවෙ යනාදියවේ

ගො ගාවො-(ගෙ) ගො (භවන්තො) ගාවො—ගාවුං ගාවං ගවං ගාවො-ගාවෙන ගවෙන ගොහි ගොභි-එවං කරණේ-ගාවස්ස ගවස්ස ගවං ගුන්නං ගොනං-ගාවා ගවා ගාවම්හා ගවම්හා ගාවස්මා ගවස්මා ගොහි ගොභි-ගාවස්ස ගවස්ස ගුවං ගුන්නං ගොනං-ගාවෙ ගවෙ ගාවම්හි ගවම්හි ගාවස්මිං ගවස්මිං ගාවෙසු ගවෙසු ගොසු.

ගොශබ්දයෙන් වෙරින් කියත්.

ඔකාරන්තයි.

— * —

බුද්ධගා රාජ ගුණවා ගච්ඡන්තගාදි දණ්ඩිච
භික්ඛුච ජන්තු සත්ථාච නත්තාච පිතු භාතුච
අභිභූ සබ්බඤ්ඤූ ගොතීවෙවං පුල්ලිඞ්ග සඞ්ගහො.

පුල්ලිඞ්ගයි.

— * —

සබ්බඤ්ඤූ සබ්බඤ්ඤූ සබ්බඤ්ඤූයො යන තන්හි "ජිනවචන—පෙ—සි විභක්ති එක්තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, විභක්ති පරකල්හි "පුබ්බමධො"—පෙ—ඤකාරසහිත ආකාරයාකෙරෙන් ඤකාරපත වේ, ඤකාරගල්වේ, සත්‍රිලිඞ්ගයෙහිවූ ආකාරයහට "අ ඔ" යන සූත්‍රයෙන් ල සංඥාවේ, සි විභක්තිහට "සෙසතො" යනාදින් ලොප්වේ, ල සංඥායාකෙරෙන් පරවූ යො විභක්තිහට "ලපතො ච යොනං ලොපො" යන සූත්‍රයෙන් විකල්පයෙන් ලොප්වේ, සබ්බඤ්ඤූ යනාදියවේ.

(යො) සබ්බඤ්ඤුනො (හොන්ති) සබ්බඤ්ඤූ සබ්බඤ්ඤූයො යන තන්හි "ජිනවචන-පෙ-සි විභක්ති එක්තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, ල සංඥායාකෙරෙන් පරවූ යො සංඥායාහට "ලතොච" යන සූත්‍රයෙන් එ කාරාදෙශවේ, පූර්වස්වරලොප්වේ, එක්පක්ෂයෙක්හි යො විභක්තිහට "ලපතො" යනාදින් ලොප්වේ, (හෙ) සබ්බඤ්ඤූ යනාදියවේ.

සබ්බඤ්ඤුං සබ්බඤ්ඤූ සබ්බඤ්ඤූයො යන තන්හි "ජිනවචන—පෙ—අං විභක්ති එක්තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, * අං විභක්ති පරකල්හි පූර්වයහට "සරලොපො" යනාදින් ලොප්වේ, එක්පක්ෂයෙක්හි

* සංඥායාකෙරෙන් පරවූ අං විභක්ති "අංමො" යනාදින් නිග්ගහීත බවට පැමිණේ—පොත්.

යො විභත්තිහට "ඝපතො" යනාදි සූත්‍රයෙන් විකල්පයෙන් ලොප්වේ, කඤ්ඤං යනාදියවේ.

කඤ්ඤාය කඤ්ඤාහි කඤ්ඤාභි යන තන්හි "ජිනවචන - පෙ - නා විභත්ති එක්තැනෙක වේ, හි විභත්ති දෙතැනෙක වේ, ඝ සංඥයාකෙරෙන්පරවූ නා විභත්තිහට "ඝතො නාදීනං" යන සූත්‍රයෙන් ආය යනාදෙශවේ, භි යනාදෙශවේ, කඤ්ඤාය යනාදියවේ.—කරණ කාරකයද මෙසේ මැයි.

කඤ්ඤාය කඤ්ඤානං යන තන්හි "ජිනවචන—පෙ—ස විභත්ති එක්තැනෙකවේ, නං විභත්ති එක්තැනෙක වේ, ඝ සංඥයාකෙරෙන් පරවූ ස විභත්තිහට "ඝතො" යනාදීන් ආයව කඤ්ඤාය යනාදියවේ.—පඤ්චමී ෂෂ්ඨී එකවචනයන්ටද "ඝතො" යනාදීන් ආය යනාදෙශවේ, කඤ්ඤාය යනාදියවේ.

කඤ්ඤායං කඤ්ඤාය කඤ්ඤාසු යන තන්හි "ජිනවචන—පෙ—ස්මිං විභත්ති දෙතැනෙකවේ, සු විභත්ති එක්තැනෙකවේ, ඝ සංඥයාකෙරෙන් පරවූ ස්මිං විභත්තිහට "ඝපතො ස්මිං යං වා" යන සූත්‍රයෙන් යං යනාදෙශවේ, එක්පක්ෂයෙක්හි ස්මිං විභත්තිහට "ඝතො නාදීනං" යන සූත්‍රයෙන් ආය යනාදෙශවේ, කඤ්ඤායං කඤ්ඤාය කඤ්ඤාසු යනුවේ.

කඤ්ඤා කඤ්ඤා කඤ්ඤායො—(හෙ) කඤ්ඤෙ (භොති) කඤ්ඤා කඤ්ඤායො—කඤ්ඤං කඤ්ඤා කඤ්ඤායො—කඤ්ඤාය කඤ්ඤාහි කඤ්ඤාභි-එවං කරණේ—කඤ්ඤාය කඤ්ඤානං—කඤ්ඤාය කඤ්ඤාහි කඤ්ඤාභි-කඤ්ඤාය කඤ්ඤානං-කඤ්ඤායං කඤ්ඤාය කඤ්ඤාසු.

කඤ්ඤා ශබ්දයෙන් දස ඇවිරිදි දැරියන් කියත්,

සද්ධා මෙධා පඤ්ඤා විජ්ජා චින්තා මන්තා තණ්හා වීණා
ඉච්ඡා මුච්ඡා එජා මායා මෙත්තා මත්තා සික්ඛා භික්ඛා.
ජඞ්ඝා ගීවා ජිව්හා වාචා ඡායා ආසා ගඞ්ගා නාවා
ගාථා සේනා ලේඛා සාලා මාලා වේලා පූජා ඛිඩ්ඩා.
පිපාසා වේදනා සඤ්ඤා චේතනා තසිනා පජා
දේවතා වට්ටකා ගොධා බලාකා පරිසා සභා.
ඌකා සේඵාලිකා ලඞ්කා සලාකා වාලුකා සිඛා
විසාඛා විසිඛා සාඛා වචා වඤ්ඣා ජටා ඝටා.
ජෙට්ඨා සොණ්ඩා විතණ්ඩා ච කරුණා වනිතා ලතා
කථා නිද්දා සුධා රාධා වාසනා සිංසපා පපා.
පභා සීමා ඛමා ජායා ඛත්තියා සක්ඛරා සුරා
දෝලා තුලා සිලා ලීලා ලාලෙලා මේඛලා කලා.
වළවා ලම්බුසා මූසා මඤ්ජූසා සුලසා දිසා
නාසා ජුණ්හා ගුහා ඊහා ලසිකා වසුධාදයො.

ඉච්චාදයො කඤ්ඤා සද්දසමා.

සද්ධා, ශ්‍රද්ධාව; මෙධා, ප්‍රඥාව; පඤ්ඤා, නුවණ; විජ්ජා, විද්‍යාව; චින්තා, සිතිවිලි; මන්තා, මන්ත්‍රනම්ප්‍රඥාව; තණ්හා, කාමාදිතෘෂ්ණාව; ඊර්ෂ්‍යා, ඊර්ෂ්‍යාව; ඉච්ඡා, කැමැත්ත; මුච්ඡා, මූර්ච්ඡාව; එජා, තෘෂ්ණාව; මායා, වඤ්චාව; මෙත්තා, මෛත්‍රිය; මත්තා, පමණ දැන්ම; සික්ඛා, ශික්ෂාව; භික්ඛා, භික්ෂාව.

ජඞ්ඝා, ජඞ්ඝාව; ගීවා, ග්‍රීවය; ජිව්හා, දිව; වාචා, තෙපල; ඡායා, සෙවන; ආසා, තෘෂ්ණාව; ගඞ්ගා, ගඞ්ගානම්ගඟ; නාවා, නැව; ගාථා, ග්‍රන්ථය; සෙනා, සෙනාව; ලෙඛා, රෙඛාව; සාලා, සාලාව; මාලා, මාලාව; වෙලා, කාල විශෙෂය මූදුවෙරලහෝයි; පූජා, පූජාව; කීඩා, ක්‍රීඩාව.

පිපාසා, පිපාසය; වෙදනා, (සුඛදුඃඛාදි) වෙදනාව; සඤ්ඤා, සංඥාව; චෙතනා, සිතිවිල්ල; තසිනා, තෘෂ්ණාව; පජා, සත්වයෝ; දෙවතා, දෙවතාවෝයි; වට්ටකා, වටුවෝයි; ගොධා, ගොයායි; බලාකා, කණකොකිණි; පරිසා, පිරිස; සභා, සභාව.

ඌකා, උකුණෝ; සෙඵාලිකා, සෙඵාලිකාගස්; ලඞ්කා, ලඞ්කාව; සලාකා, ඉරටු; වාලුකා, වැලි; * සිඛා, සිළු; විසාඛා, විසාකානකත; විසිඛා, වීථිය; සාඛා, වෘක්ෂශාඛාව; වචා, තෙපල; වඤ්ඣා, වඳස්ත්‍රිය; ජටා, ජටාව; ඝටා, සමූහය.

ජෙට්ඨා ජ්‍යෙෂ්ඨභගිනි; සොණ්ඩා, ලොල්බව; විතණ්ඩා, † විරුද්ධශාස්ත්‍රකථා; කරුණා, දයාව; වනිතා, ස්ත්‍රිය; ලතා, වැල්; කථා, කථාව; නිද්දා, නිදි; සුධා, සුධාවහෝසුණු; රාධා, ඒනම්ස්ත්‍රියහෝ අනුරාධනැකත; වාසනා, වාසනාව; × සිංසපා, ඇට්ටර; පපා, පැන්මඩුව.

පභා, ප්‍රභාව; සීමා, සීමාව; ඛමා, ඉවසීම; ජායා, භාර්යාව; ඛත්තියා, ක්ෂත්‍රියාව; සක්ඛරා, ශර්කරා; සුරා, රා; දොලා, දෝලාවහෝ උන්සිල්ලාව; § තුලා, සියක්පලම; සිලා, ගල; ලාලා, කෙළ; එලා, එන්සාල්; මෙඛලා, මෙවුල්දම; කලා, කලාව.

වළවා, වෙළඹ; අලම්බුසා, එනම්දෙව්දුව; ඛුසා, සල්තයි; (කෝච) මඤ්ජූසා, කරඬුව; සුලසා, තලාගස්; දිසා, දිශ්; නාසා, නාසිකාව; ජුණ්හා, සඳරැස්; ගුහා, ලෙන; ඊහා, උත්සාහ; ලසිකා, සඳමිඳුළු; වසුධා, පොළොවයි.

ආකාරාන්තයි.

රත්ති රත්ති රත්තියො යන තන්හි "ජිනවචනා-පෙ—සි විභක්ති එක් තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, ස්ත්‍රීලිඞ්ගයෙහි ඉවර්ණයහට "තෙ ඉත්ථිඛ්‍යා පො" යන සූත්‍රයෙන් පසංඥා වේ, ශෙෂසාධකයෙන්

* සිඛා, ඉස; පොත්.

† විතණ්ඩා=ස්වපක්ෂාව්‍යවස්ථාපනෙන පරපක්ෂමාත්‍රනිරාකරණකථාභෙදෙ

× සිංසපා, සපීපයෝ; පොත්.

§ තුලා, පලම්; පොත්.

පරවූ සි විභක්තිහට "සෙසතො" යනාදී සූත්‍රයෙන් ලොප්වේ, ප සංඥයා කෙරෙන් පරවූ යො විභක්තිහට "ඝපතො" යනාදී සූත්‍රයෙන් විකල්පයෙන් ලොප්වේ, එම පක්ෂයෙහි පූර්වස්වරයහට "යොසුකත" යනාදී සූත්‍රයෙන් දීර්ඝවේ, රත්තී යනාදියවේ.

(හෙ) රත්ති (හොති) රත්තී රත්තියො යන තන්හි "ජිනවචන–පෙ–සි විභක්ති එක්තැනෙකවේ, යො විභක්ති දෙතැනෙකවේ, ශෙෂයාකෙරෙන් පරවූ ග සංඥයහට "සෙසතො" යනාදී සූත්‍රයෙන් ලොප්වේ, යො විභක්තිහට "ඝපතො" යනාදී සූත්‍රයෙන් විකල්පයෙන් ලොප්වේ, එම පක්ෂයෙහි පූර්වස්වරයහට "යොසුකත" යනාදී සූත්‍රයෙන් දීර්ඝවේ, (හෙ) රත්ති යනාදියවේ,

රත්තිං රත්තී රත්තියො යන තන්හි "ජිනවචන—පෙ—අං විභක්ති එක්තැනෙකවේ, යො විභක්ති දෙතැනෙකවේ, ප සංඥයාකෙරෙන් පරවූ අං විභක්ති "අමෙමා නිග්ගහීතං" යනාදී සූත්‍රයෙන් නිග්ගහීතභාවට පැමිණේ, යො විභක්තිහට "ඝපතො" යනාදී සූත්‍රයෙන් ලොප්වේ, එම පක්ෂයෙහි පූර්වස්වරයහට "යොසුකත" යනාදී සූත්‍රයෙන් දීර්ඝවේ, රත්තිං යනාදියවේ.

රත්තියා රත්තීහි රත්තීභි යන තන්හි "ජිනවචන-පෙ-නා විභක්ති එක්තැනෙකවේ, හි විභක්ති දෙතැනෙකවේ, ප සංඥයාකෙරෙන් පරවූ නා විභක්තිහට "පතො යා" යන සූත්‍රයෙන් යා යනාදෙශවේ, හි විභක්ති පරකල්හි ඉකාරයහට "සුනංහිසු ච" යන සූත්‍රයෙන් දීර්ඝවේ, රත්තියා යනාදියවේ.

රත්තියා රත්තීනං යන තන්හි "ජිනවචන—පෙ—ස විභක්ති එක්තැනෙකවේ, නං විභක්ති එක්තැනෙකවේ, ප සංඥයාකෙරෙන් පරවූ ස විභක්තිහට "පතො යා" යන සූත්‍රයෙන් යා යනාදෙශවේ, නං විභක්ති පරකල්හි ඉකාරයහට "සුනංහිසු ච" යන සූත්‍රයෙන් දීර්ඝවේ, රත්තියා රත්තීනං යනුවේ.

රත්‍යා රත්තියා රත්තීහි රත්තීභි යන තන්හි "ජිනවචන—පෙ—ස්මා විභක්ති දෙතැනෙකවේ, හි විභක්ති දෙතැනෙකවේ, ප සංඥයාකෙරෙන් පරවූ ස්මා විභක්තිහට "අම්හා පතො ස්මිං ස්මානං වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් ආ කාරාදෙශවේ, එකවචන විභක්තීහට ආදෙශ වූ ස්වරයා පරකල්හි ප සංඥයහට "පසඤ්ඤස්ස ච" යන සූත්‍රයෙන් ය කාරාදෙශවේ, "පච්චයාදනිට්ඨා" දී සූත්‍රයෙන් යකාර තකාරයෙහි බඳවේ, තුබූ පක්ෂයෙහි ස්මා විභක්තිහට "පතො යා" යන සූත්‍රයෙන් යා යනාදෙශවේ, හි විභක්ති පරකල්හි පූර්වස්වරයහට "සුනංහිසු ච" යන සූත්‍රයෙන් දීර්ඝවේ, රත්‍යා රත්තියා යනාදියවේ.— රත්තියා රත්තීනං යනු චතුර්ථිය මෙනි.

රත්‍යං රත්තියං රත්‍ය රත්‍යා රත්තො රත්තියා රත්තීසු යන තන්හි "ජිනවචන—පෙ—ස්මිං විභක්ති ස තැනෙක වේ, සු විභක්ති එක්තැනෙක වේ,

ප සංඥයාගෙන් පරවූ ස්මිං විභක්තිහට "අම් ආ පතො ස්මිං ස්මානං වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් අං යනාදෙශවේ, එක්පක්‍ෂයෙක්හි ස්මිං විභක්තිහට "ඝපතො ස්මිං යං වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් යං යනාදෙශවේ, "ආදිතො ඔ ච" යන සූත්‍රයෙහි ච ග්‍රහණයෙන් එක්පක්‍ෂයෙක්හි ස්මිං විභක්තිහට ආකාරාදෙශ හා මෙම සූත්‍රයෙන්ම දෙතැනෙක්හි අං ඔ යනාදෙශයෝද ක්‍රමයෙන් වෙත්, ප සංඥයාගෙන් පරවූ අං යනාදෙශයතෙම "අං මො" යනාදි සූත්‍රයෙන් නිග්ගහීතබවට යේ, අං ආ යන දෙදෙනා පරකල්හි ප සංඥයහට "පසඤ්ඤස්ස ච" යන සූත්‍රයෙන් යකාරාදෙශ වේ, "පච්චයාදනිට්ඨා" දී සූත්‍රයෙන් යකාර තකාරයෙහි චච වේ, ඔ කාරයා පරකල්හි පූර්වස්වරයහට "සරලොපො" දීසූත්‍රයෙන් ලොප්වේ, තුබූපක්‍ෂයෙහි ස්මිං විභක්තිහට "පතො යා" යන සූත්‍රයෙන් යා යනාදෙශවේ, සු විභක්ති පරකල්හි ඉකාරයහට "සුනංහිසු ච" යන සූත්‍රයෙන් දීර්ඝ වේ, පරාක්‍ෂරයාකාර පැමිණි රච්චං රත්තියං රච්චා රත්‍යං රත්තො රත්තියා රත්තීසු යනුවේ.

රත්ති රත්තී රත්තියො—(හෙ) රත්ති (භොන්ති) රත්තී රත්තියො—රත්තිං රත්තී රත්තියො—රත්තියා රත්තීහි රත්තීභි—එවං කරණෙ—රත්තියා රත්තීනං—රච්චා රත්තියා රත්තීහි රත්තීභි—රත්තියා රත්තීනං—රච්චං රත්තියං රච්චා රත්‍යං රත්තො රත්තියා රත්තීසු.

රත්ති ශබ්දයෙන් රාත්‍රිය කියත්.

පන්ති සුත්ති වුත්ති කිත්ති මුත්ති තිත්ති ඛන්ති කන්ති
සන්ති තන්ති සිද්ධි සුද්ධි ඉද්ධි වුද්ධි බුද්ධි බොධි.
භූමි ජාති පීති සූති නන්දි සන්ධි සානි කොටි
දිට්ඨි වුට්ඨි තුට්ඨි යට්ඨි පාළි ආළි නාළි කෙළී.
සති මති ගති චුති ධිති යුවති විකති රති රුචි රස්මි
අසනි වසනි ඔසධි අඞ්ගුලි ධූලි දුන්දුභි දොණි අටවි
ඡවි ආදීනි ඉකාරන්තනාමානි.

පන්ති, පාබලසෙනඟ; සුත්ති, සුක්තිය; වුත්ති, වෘත්තිය; කිත්ති, කීර්තිය; මුත්ති, මිදීම; තිත්ති, තෘප්තිය; ඛන්ති, ක්‍ෂාන්තිය; කන්ති, දීප්තිය; සන්ති, සංසිඳීම; තන්ති, පාළිවචනය; සිද්ධි, නිෂ්පත්තිය; සුද්ධි, විශුද්ධිය; ඉද්ධි, ඍද්ධිය; වුද්ධි, අභිවෘද්ධිය; බුද්ධි, ප්‍රඥාව; බොධි, සම්‍යක්සම්බොධිය.

භූමි, පෘථිවිය; ජාති, ඉපදීම; පීති, ප්‍රීතිය; සූති, ප්‍රසූතිය; නන්දි, සන්තොෂය; සන්ධි, ප්‍රතිසන්ධිය; සානි, තිරය; කොටි, කෙළවර; දිට්ඨි, දෘෂ්ටිය; වුට්ඨි, මෙඝය; තුට්ඨි, සතුටුවීම; යට්ඨි, යෂ්ටිය; පාළි, පෙළ; ආළි, කුලය; නාළි, නැළිය; කෙළි, කෙළිය.

සති, ස්මෘතිය; මති, ප්‍රඥාව; ගති, ගමන; චුති, චුතිය; ධිති, ධෛර්‍ය්‍යය; යුවති, තරුණස්ත්‍රිය; විකති, විකෘතිය; රති, ඇල්ම; රුචි, කැමැත්ත; රස්මි, ප්‍රභාව; අසනි, හෙන; වසනි, වස්ත්‍රය; ඔසධි, ඖෂධිතාරකාව; අඞ්ගුලි, ඇඟිලි; ධූලි, රජස්; දුන්දුභි, භෙරිවිශෙෂය; දොණි, දෙණ; අටවි, මහකැලෑ; ඡවි, තුනීවූ ඡවියයි.

ඉකාරාන්තයි.

නදී නදී නජ්ජො නදියො යන තන්හි “ජිනවචන-පෙ-සි විභත්ති එක් තැනෙක වේ, යො විභත්ති තුන් තැනෙක වේ, ශෙෂයාකෙරෙන් පරවූ සි විභත්තිහට “සෙසතො” යනාදී සූත්‍රයෙන් ලොප්වේ, ප සංඥයාකෙරෙන් පරවූ යො විභත්තිහට “ඝපතො” යනාදී සූත්‍රයෙන් විකල්පයෙන් ලොප් වේ, එක්පක්‍ෂයෙක්හි යො විභත්ති පරකල්හි එම යො විභත්ති සහිතවූ නදීශබ්දයාගේ ඊකාරයහට “මාතුලාදීනමානත්තමීකාරෙ” යන සූත්‍රයෙහි ආනත්තග්‍රහණයෙන් විකල්පයෙන් ජ්ජො යනාදෙශ වේ, තුබූ පක්‍ෂයෙහි යො විභත්ති පරකල්හි ප සංඥයහට “අඝො රස්සං” යනාදී සූත්‍රයෙන් හ්‍රස්වවේ, නදී නදී නජ්ජො නදියො යනුවේ.

(හෙ) නදි (භොති) නදී නජ්ජො නදියො-යන තන්හි “ජිනවචන-පෙ-සි විභත්ති එක්තැනෙක වේ, යො විභත්ති තුන්තැනෙක වේ, ඒකවචන විභත්තිහා යො විභත්ති පරකල්හි ප සංඥයහට “අඝො රස්ස” යනාදී සූත්‍රයෙන් කිසිතැනෙක්හි හ්‍රස්ව වේ, ශෙෂයාකෙරෙන් පරවූ ග සංඥයහට “සෙසතො” යනාදී සූත්‍රයෙන් ලොප් වේ, ප සංඥයාකෙරෙන් පරවූ යො විභත්තිහට “ඝපතො ච” යනාදී සූත්‍රයෙන් විකල්පයෙන් ලොප්වේ, තුබූ පක්‍ෂයෙහි යො විභත්ති පරකල්හි එම යො විභත්තියා සමග නදීශබ්දයාගේ ඊකාරයහට “මාතුලාදීනමානත්තමීකාරෙ” යන සූත්‍රයෙහි ආනත්තග්‍රහණයෙන් ජ්ජො යනාදෙශ වේ, (හෙ) නදි (භොති) නදී නජ්ජො නදියො යනුවේ.

නදියං නදිං නදී නජ්ජො නදියො—යන තන්හි “ජිනවචන—පෙ—අං විභත්ති දෙතැනෙක වේ, යො විභත්ති තුන්තැනෙක වේ, ප සංඥවූ ඊකාරයාකෙරෙන් පරවූ අං විභත්තිහට “අං යමීතො පසඤ්ඤතො” යන සූත්‍රයෙන් විකල්පයෙන් යං යනාදෙශවේ, තුබූ පක්‍ෂයෙහි අං විභත්ති “අංමො” යනාදී සූත්‍රයෙන් නිගෘහීතභාවට පැමිණේ, ඒකවචන විභත්තියා යො විභත්ති පරකල්හි ඊකාරයහට “අඝො රස්සං” යනාදී සූත්‍රයෙන් කිසි තැනෙක්හි හ්‍රස්ව වේ, එක් පක්‍ෂයෙක්හි යො විභත්ති පරකල්හි එම යො විභත්ති සහිතවූ නදී ශබ්දයාගේ ඊකාරයහට “මාතුලාදීනමානත්ත මීකාරෙ” යන සූත්‍රයෙහි ආනත්තග්‍රහණයෙන් ජ්ජො යනාදෙශ වේ, එක්පක්‍ෂයෙක්හි යො විභත්තිහට “ඝපතො” යනාදී සූත්‍රයෙන් ලොප් වේ, නදියං නදිං නදී නජ්ජො නදියො යනුවේ.

නජ්ජා නදියා නදීහි නදිහි යන තන්හි “ජිනවචන—පෙ—නා විභත්ති දෙතැනෙක වේ, හි විභත්ති දෙතැනෙක වේ, නා විභත්ති පරකල්හි විභත්ති සහිතවූ නදී ශබ්දයාගේ ඊකාරයහට “මාතුලාදීනමානත්ත මීකාරෙ” යන සූත්‍රයෙහි ආනත්තග්‍රහණයෙන් විකල්පයෙන් ජ්ජා යනාදෙශ වේ, තුබූ පක්‍ෂයෙහි නා විභත්තිහට “පතො යා” යන සූත්‍රයෙන් යා යනාදෙශ වේ, ඒකවචන විභත්ති පරකල්හි ප සංඥයහට “අඝො රස්සං” යනාදී සූත්‍රයෙන් හ්‍රස්ව වේ, නජ්ජා නදියා නදීහි නදිහි යනුවේ.—කරණ කාරකයද මෙසේ මැයි.

නජ්ජා නදියා නදීනං යන තන්හි ''ජිනවචන-පෙ-ස විභක්ති දෙතැනෙක වේ, නා විභක්ති එක්තැනෙක වේ, ස විභක්ති පරකල්හි විභක්ති සහිතවූ නදී ශබ්දයාගේ ඊකාරය හට ''මාතුලාදීනමානත්තමීකාරෙ'' යන සූත්‍රයෙහි ආනත්තග්ගහණයෙන් විකල්පයෙන් ජ්ජා යනාදෙශ වේ, එකවචන විභක්ති පරකල්හි ප සංඥයහට ''අඝො රස්සං'' යනාදී සූත්‍රයෙන් හ්‍රස්ව වේ, එම පක්ෂයෙහි ස විභක්තිහට ''පතො යා'' යන සූත්‍රයෙන් යා යනාදෙශ වේ, නජ්ජා නදියා නදීනං යනුවේ.—නජ්ජා නදියා නදීහි නදීභි යනුද—නජ්ජා නදියා නදීනං යනුද තෘතීයා චතුර්ථී දෙක මෙන්නි.

නජ්ජං නදියං නදියා නදීසු යන තන්හි ''ජිනවචන-පෙ—ස්මිං විභක්ති තුන්තැනෙක වේ, සු විභක්ති එක්තැනෙක වේ, ප සංඥයාකෙරෙන් පරවූ ස්මිං විභක්තිහට ''අං පතො ස්මිංස්මානං වා'' යන සූත්‍රයෙන් විකල්පයෙන් අං යනාදෙශ වේ, විභක්ත්‍යාදෙශස්වරයා පරකල්හි ප සංඥයහට ''පසඤ්ඤස්ස ච'' යන සූත්‍රයෙන් ය කාරාදෙශවේ, ය කාර දකාරයෙහි බඩ වේ, සවත්වූ දකාරයහට ''යවතං තලනදකාරානං බ්‍යඤ්ජනානි චලඤ්ඤජකාරත්තං'' යන සූත්‍රයෙන් ජකාරාදෙශ වේ, ද්විත්ව වේ, එක්පක්ෂයෙක්හි ස්මිං විභක්ති හට ''ඝපතො ස්මිං යං වා'' යන සූත්‍රයෙන් විකල්පයෙන් යං යනාදෙශවේ, තුබූ පක්ෂයෙහි ස්මිං විභක්තිහට ''පතො යා'' යන සූත්‍රයෙන් යා යනාදෙශ වේ, නජ්ජං නදියං නදියා නදීසු යනුවේ.

නදී නදී නජ්ජො නදියො—(භො) නදි (භොන්ති) නදී නජ්ජො නදියො—නදියං නදිං නදී නජ්ජො නදියො—නජ්ජා නදියා නදීහි නදීභි—එවං කරණේ—නජ්ජා නදියා නදීනං—නජ්ජා නදියා නදීහි නදීභි—නජ්ජා නදියා නදීනං—නජ්ජං නදියං නදියා නදීසු.

නදී ශබ්දයෙන් ගැනෝ කියත්.

මහී වෙතරණී වාපී පාටලී කදලී ඝටී
නාරී කුමාරී තරුණී වාරුණී බ්‍රාහ්මණී සඛී.
ගන්ධබ්බී කින්නරී නාගී දෙවී යක්ඛී අජා මිගී
වානරී සූකරී සීහී හංසී කාකී ච කුක්කුටී.

ඉච්චාදයො නදී සදෘශව.

මහී, පොළොව; වෙතරණී, එනම් නරකය; වාපී, වැව; පාටලී, පලොල්ගස්; කදලී, කෙසෙල්; ඝටී, කලගෙඩියක්; * නාරී, ස්ත්‍රිය; කුමාරී, කුමාරිකාව; තරුණී, ළඳරිය; වාරුණී, වරුණයාගේ භාර්‍ය්‍යාව; † බ්‍රාහ්මණී, බැමිණිය; සඛී, යෙහෙළි.

---

* ඝටීයෝ සාමාන්‍ය කලය, පැතැවියගෝයි සටිනිසිළුව, කලශ නිසි.

† සුරාය ඝශ්ම දිගය යනාදියයි.

ගන්ධබ්බී, ගන්ධර්වදුව; කින්නරී, ලියකින්නරාඞනාව; නාගී, නාගමානවිකාව; ‡ දෙවී, දිව්‍යාප්සරාව; § යක්ඛී, යකින්නී; අජී, එළදෙන; මිගී, මුවදෙන; වානරී, වැඳිරී; සූකරී, ඌරී; සීහී, සිංහධෙනුව; හංසී, හංසධෙනුව; කාකී, කැවිඩී; කුක්කුටී, කිකිළී.

ඊකාරාන්තයි.

යාගු යාගූ යාගුයො යන තන්හි "ජිනවචන-පෙ-සි විභක්ති එක් තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, ඉත්ථිලිඞ්ගයෙහි වූ උවර්ණයහට "ඉත්ථියමිත්ථිඛ්‍ය පො" යන සූත්‍රයෙන් ප සංඥා වේ, ප සංඥායාකෙරෙන් පරවූ සි විභක්තිහට "සෙසතො" යනාදීන් ලොප් වේ, යො හට "අපතො ච" යනාදීන් ලොප් වේ, එම පක්ෂයෙහි උකාරයහට "යොසු කත" යනාදීන් දීර්ඝ වේ, යාගු යනාදිය වේ.

(හෙ) යාගු (හොන්ති) යාගූ යාගුයො යන තන්හි "ජිනවචන—පෙ—සි විභක්ති එක් තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, ගසංඥයහට "සෙසතො" යනාදීන් ලොප් වේ, යො හට "අපතො" යනාදීන් ලොප්ව උකාරයහට "යොසු කත" යනාදීන් දීර්ඝව (හෙ) යාගු යනාදිය වේ.

යාගුං යාගූ යාගුයො යන තන්හි "ජිනවචන—පෙ—අං විභක්ති එක් තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, පසංඥයාකෙරෙන් පරවූ අං හට "අං මො නිග්ගහීතං" යනාදීන් නිග්ගහීත වේ, යො හට "අපතො" යනාදීන් ලොප්ව උ කාරයහට "යොසු කත" යනාදීන් දීර්ඝව යාගුං යනාදිය වේ.

යාගුයා යාගූහි යාගූභි යන තෘතීයායෙහිද, යාගුයා යාගූනං යන චතුර්ථීයෙහිද, යාගුයා යාගූහි යාගූභි යන පඤ්චමියෙහි ද, යාගුයා යාගූනං යන ෂෂ්ඨියෙහි ද ප සංඥයාකෙරෙන් පරවූ එකවචන විභක්ති හට "පතො යා" යි යාව "සුනංහි" යනාදීන් පූර්වස්වර දීර්ඝව යාගුයා යනාදිය වේ.

යාගුයං යාගුයා යාගූසු යන තන්හි "ජිනවචන—පෙ-ස්මිං විභක්ති දෙතැනෙක වේ, සු විභක්ති එක් තැනෙක වේ, ස්මිං හට "අපතො ස්මිං යං වා" යි විකල්පයෙන් යං යනාදෙශ වේ, තුබූ පක්ෂයෙහි ස්මිං හට "පතො යා" යි යාව "සුනංහි" යනාදීන් පූර්වස්වර දීර්ඝව යාගුයා යනාදිය වේ.

යාගු යාගූ යාගුයො –(හෙ) යාගු (හොන්ති) යාගූ යාගුයො—යාගුං යාගූ යාගුයො – යාගුයා යාගූහි යාගූභි—එවං කරණේ—යාගුයා යාගූනං–යාගුයා යාගූහි යාගූභි—යාගුයා යාගූනං– යාගුයං යාගුයා යාගූසු.

යාගු ශබ්දයෙන් හුළුකැන් කියත්.

එවං ධාතු ධෙනු කාසු දද්දු කඩු කච්ඡු රජ්ජු කණේරු පියඞ්ගු සස්සු ආදිසද්ද පි.

---

‡ ගැටිනී ඇතිනී ආදියයි

§ රාජවනිතාදිය.

ඛාණු, ඛාණුසි; ධේනු, දෙන; කාසු, වළ; දද්දු, දද; කණ්ඩු, කසිළිව්; කච්ඡු, කස්; රජ්ජු, රැහැණ; කණේරු, ඇතිනි; පියඞ්ගු, පුවඟුගස්; සස්සු, නැන්දනී.

මාතා මාතරො යන තන්හි "ජිනවචන—පෙ—සි විභත්ති එක් තැනෙක වේ, යො විභත්ති එක් තැනෙක වේ, සි විභත්ති පරකල්හි මාතු ශබ්දයාගේ අන්තයහට "සත්ථුපිතාදීනං" යනාදීන් ආකාරාදෙශයා සි හට ලොප්වේ, යො පරකල්හි මාතුශබ්දයාගේ අන්තයට "අඤ්ඤෙස්වාරත්තං" යන සූත්‍රයෙන් ආරයනාදෙශ වේ, ආරයනාදෙශයාගේ ආකාරයහට "පිතාදීනමසිම්හි" යන සූත්‍රයෙන් හ්‍රස්ව වේ, යො විභත්තිහට "තතො යොනමො තු" යන සූත්‍රයෙන් ඔකාරාදෙශ වේ, මාතා මාතරො යනු වේ.

(හෙ) මාත මාතා (භොන්ති) මාතරො යන තන්හි "ජිනවචන—පෙ—සි විභත්ති දෙතැනෙක වේ, යො විභත්ති එක් තැනෙක වේ, ග සංඥා පරකල්හි මාතු ශබ්දාන්තයහට "අකාරපිතාද්‍යන්තානමා" යන සූත්‍රයෙන් ආකාරාදෙශ වේ, ආකාරයහට "ආකාරො වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් හ්‍රස්ව වේ, යො විභත්ති පරකල්හි මාතුශබ්දයාගේ අන්තයහට "අඤ්ඤෙස්වා" යනාදීන් ආරව ඔහුකෙරෙන් පරවූ යො හට "තතො යොනමො තු" සී ඔ ව මාතුශබ්දයා සම්බන්ධවූ ආරයනාදෙශයාගේ ආකාරයහට "පිතාදීනමසිම්හි" සී හ්‍රස්ව වේ, (හෙ) මාත මාතා යනාදිය වේ.

මාතරං මාතරෙ මාතරො යන තන්හි "ජිනවචන-පෙ- අං විභත්ති එක් තැනෙක වේ, යො විභත්ති දෙතැනෙක වේ, විභත්ති පරකල්හි මාතුශබ්දාන්තයහට "අඤ්ඤෙස්වා" යනාදීන් ආර වේ, ආරහුගේ ආකාරයහට "පිතාදීන" යනාදීන් හ්‍රස්ව ව පසංඥයාකෙරෙන් පරවූ අං හට "අංමමං" යනාදීන් නිග්ගහීතව යොහට "සබ්බයොනීනමාඑ" යී එව තුබූ පක්ෂයෙහි යො හට "තතො යො" යනාදීන් ඔව මාතරං මාතරෙ මාතරො යනු වේ.

මාතුයා මාතුරෙහි මාතරෙහි යන තෘතීයායෙහිද, මාතුයා මාතරෙහි මාතරෙහි යන පඤ්චමියෙහිද, නා විභත්ති ස්මා විභත්තිහට "පතො යා" සී යා ව හි විභත්ති පරකල්හි "අඤ්ඤෙස්වා" යනාදීන් ආර වේ, ආර යන ආ හට "පිතාදීන" යනාදීන් හ්‍රස්ව වේ, අ කාරයහට "සුහිස්වකාරො එ" සී එව මාතුයා යනාදිය වේ.

මාතුයා මාතරානං මාතානං මාතූනං යන චතුර්ථී ෂෂ්ඨී දෙකෙහිද ස විභත්තිහට "පතො යා" යී යා ව නං විභත්ති පරකල්හි මාතුශබ්දාන්තය හට "වා නම්හි" යන සූත්‍රයෙන් ආරව එක් පක්ෂයෙක්හි මාතු ශබ්දාන්තය හට "සත්ථුනාතත්ත ච" යී අත්ව වේ, ආරයන ආ හට "පිතාදීන" යනාදීන් හ්‍රස්වවී අකාරයහට "සුනංහි" යනාදීන් දීර්ඝව මාතුයා මාතරානං යනාදිය වේ.

මාතරි මාතරෙසු මාතුසු යන තන්හි "ජිනවචන-පෙ-ස්මිං විභත්ති එක් තැනෙක වේ, සු විභත්ති දෙතැනෙක වේ, ස්මිං විභත්ති පරකල්හි මාතු ශබ්දාන්තයහට "අඤ්ඤෙස්වා" යනාදීන් ආර වේ, ආර යන ආ හට "පිතාදීන"

යනාදීන් හ්‍රස්ව වේ, සමිං හට ''තතො සම් මි'' යි ඉකාරවේ, සු පරකල්හි අ හට'' සුහිස්වකාරො එ'' යි එව තුබූ පක්‍ෂයෙහි උ කාරයාහට ''සුනංහි'' යනාදීන් දීර්ඝව මාතරි යනාදිය වේ.

මාතා මාතරො-(හෙ) මාත මාතා (භොන්ති) මාතරො-මාතරං මාතරෙ මාතරො—මාතුයා මාතරෙහි මාතරෙභි—එවං කරණෙ-මාතුයා මාතරානං මාතානං මාතූනං-මාතුයා මාතරෙහි මාතරෙභි-මාතුයා මාතරානං මාතානං මාතූනං-මාතරි මාතරෙසු මාතුසු.

මාතු ශබ්දයෙන් මවුන් කියත්.

ධීතා ධීතරො—දුහිතා දුහිතරො—යනාදී ධීතු දුහිතු ශබ්දයොද මාතු ශබ්දයා මෙනි.

## උකාරාන්තයි.

---*---

ජම්බූ ජම්බූ ජම්බුයො—යනාදි සියල්ල නදී ශබ්දයාගේ ජ්ජයනාදෙශය හැර සෙස්ස මෙනි.

ජම්බූ ජම්බූ ජම්බුයො-(හෙ) ජම්බු (භොන්ති) ජම්බූ ජම්බුයො-ජම්බුං ජම්බූ ජම්බුයො—ජම්බුයා ජම්බූහි ජම්බූභි—එවං කරණෙ—ජම්බුයා ජම්බූනං—ජම්බුයා ජම්බූහි ජම්බූභි-ජම්බුයා ජම්බූනං-ජම්බුයං ජම්බුයා ජම්බූසු.

ජම්බු ශබ්දයෙන් දඹ කියත්.

## ඌකාරාන්තයි.

---*---

කඤ්ඤා ශබ්ද කඤ්ඤා කියා වේ, ඒ ලිඟුහුකෙරෙන් පරව අනෙක් ප්‍රත්‍යයන්ගේ ප්‍රාප්තියක් ඇති කල්හි ව්‍යාත්‍ය විවක්‍ෂාවසයෙන් ස්ත්‍රීලිඟුයෙහි වූ අකාරාන්තයාකෙරෙන් පරව ''ඉත්ථියමතො ආපච්චයො'' යන සූත්‍රයෙන් ආප්‍රත්‍යය වේ, ඤ්ඤ කාරස්ථ අකාරයාකෙරෙන් ඤ කාරපහ වේ, ඤකාර ගල් වේ, ප්‍රත්‍යයා පරකල්හි පූර්වස්වරයාහට ''සරලොපො'' දි සූත්‍රයෙන් ලොප් වේ, පරාක්‍ෂරයාකරා පැමිණි ''ධාතුපච්චයවිභත්තිවජ්ජිතමත්ථවලලිඞ්ගං'' යනු කිහෙයින් ප්‍රත්‍යයාන්තයා නාම ලිඟුහෙයින් ''තද්ධිතසමාසකිතකා නාමංවාතවෙතුනාදිසු ච'' යන සූත්‍රයෙහි චශබ්දග්‍රහණයෙන් නාමව නි ඔහු කෙරෙන් පරව ස්‍යාදී විභක්ති වේ, ඤකාරස්ථ ආකාරයාහට ''ආ ඝො'' යන සූත්‍රයෙන් ඝසංඥ වේ, සි විභක්ති හට ''සෙසතො'' යනාදීන් ලොප්ව කඤ්ඤා යනු වේ—අජ ශබ්ද එළක ශබ්ද කොකිල ශබ්ද අස්ස ශබ්ද මූසික ශබ්ද බලාක ශබ්ද මණ්ඩ ශබ්ද ජර ශබ්දාදීන් කෙරෙන්ද මෙකී ක්‍රමයෙන් ව්‍යාක්‍යයොද පදසිද්ධිය කටයුතු.

නදී නගරී කුමාරී බ්‍රාහ්මණී තරුණී කුක්කුටී ඉත්ථී යන තන්හි නද ශබ්ද නද කියා වේ, නගර ශබ්ද නගර කියා වේ, කුමාර ශබ්ද කුමාර කියා වේ, බ්‍රාහමණ ශබ්ද බ්‍රාහමණ කියා වේ, තරුණ ශබ්ද තරුණ කියා වේ,

කුක්කුට ශබ්ද කුක්කුට කියා වේ, ඉසි ශබ්ද ඉසි කියා වේ, ස්ත්‍රීලිඞ්ගයෙහි වූ නදාදිශබ්දයන්කෙරෙන් පරව "නදාදිතො වා ඊ" යන සූත්‍රයෙන් ඊ ප්‍රත්‍යයව පූර්වස්වර ලොප් වේ, පරාක්ෂරයා කරා පැමිණ "ධාතුප්පච්චය විභත්තිවජ්ජිතමත්ථවං ලිඞ්ගං" යනු කීහෙයින් ප්‍රත්‍යයාන්තයා තමා අලිඞ්ග හෙයින් "තද්ධිතා" දී සූත්‍රයෙහි චග්‍රහණයෙන් නාමවූ ඔවුන්කෙරෙන් පරව ස්‍යාදි විභක්තිව ලොප්ව නදී නගරී යනාදිය වේ.

මාතුලානී යන තන්හි මාතුල ශබ්ද මාතුල කියා වේ, අනදාදි ශබ්දයන් කෙරෙන් පරව්ද "නදාදිතො වා ඊ" සී ඊ ප්‍රත්‍යය වේ, ඊප්‍රත්‍යයා පර කල්හි මාතුලශබ්දාන්ත අකාරයහට "මාතුලාදීනමානත්තමීකාරෙ" යන සූත්‍රයෙන් ආන යනාදෙශ ව මාතුලානී කියා තිබේ "ධාතුප්පච්චය-පෙ-නාමවූ ස්‍යාදි විභක්ති වේ.——සඛී හත්ථී යන තන්හි සඛ ශබ්ද සඛ කියා වේ, හත්ථ ශබ්ද හත්ථ කියා වේ, අනදාදිශබ්දයන්කෙරෙන් පරවද "නදාදිතො වා ඊ" සී ඊ ප්‍රත්‍යයව සඛී හත්ථී කියා තිබේ "ධාතුප්පච්චය-පෙ-නාමවූ ඔවුන්කෙරෙන් පරව ස්‍යාදි විභක්ති වේ.——භොතී කිවමනාතන්හි භවන්ත ශබ්ද භවන්ත කියා වේ, අනදාදිශබ්දයන්කෙරෙන් පරව "නදාදිතො වා ඊ" සී ඊ ප්‍රත්‍යය වේ, ප්‍රත්‍යයා පරකල්හි භවන්ත ශබ්දයහට "භවතො භොතො" යන සූත්‍රයෙන් භොත යනාදෙශ වේ, භොතී කියා තිබෙයි "ධාතුප්පච්චය—පෙ-නාමවූ ඔහුකෙරෙන් පරව ස්‍යාදි විභක්ති වේ.

මානව ශබ්ද මානව කියා වේ, නාවික ශබ්ද නාවික කියා වේ, වෙනතෙය්‍ය ශබ්ද වෙනතෙය්‍ය කියා වේ, ගොතම ශබ්ද ගොතම කියා වේ, ඔවුන්කෙරෙන් පරව "ණවණිකණෙය්‍යණන්තුහි" යන සූත්‍රයෙන් ඊ ප්‍රත්‍යය වේ, මානවී නාවිකී වෙනතෙයී ගොතමී කියා තිබෙයි "ධාතුප්පච්චය-පෙ-නාමවූ ස්‍යාදි විභක්ති වේ, ගුණවන්තු ශබ්ද ගුණවන්තු කියා දෙතැනෙක වේ, ධිතිමන්තු ශබ්ද ධිතිමන්තු කියා දෙතැනෙක වේ, ඔවුන්කෙරෙන් පරව "ණවණිකණෙය්‍යණන්තුහි" යන සූත්‍රයෙන් ඊප්‍රත්‍යය වේ, ඊප්‍රත්‍යයා පරකල්හි න්තුප්‍රත්‍යයහට "න්තුස්සන්තමීකාරෙ" සී විකල්පයෙන් තකාරාදෙශව ගුණවතී ගුණවන්තී ධිතිමතී ධිතිමන්තී කියා තිබේ "ධාතුප්පච්චය-පෙ-නාමවූ ඔවුන්කෙරෙන් පරව ස්‍යාදි විභක්ති වේ.——මහන්ත ශබ්ද මහන්ත කියා දෙතැනෙක වේ, න්ත ප්‍රත්‍යයහට "සෙසෙසු න්තුව" යන සූත්‍රයෙන් න්තුවත් වේ, න්තුකියන ව්‍යවහාර මාත්‍රයෙකි, න්තු ප්‍රත්‍යයාකෙරෙන් පරව "ණවණිකා" දින් ඊ ප්‍රත්‍යයව ඊප්‍රත්‍යයා පරකල්හි "න්තුස්ස තමීකාරෙ" සී න්තු ප්‍රත්‍යයහට විකල්පයෙන් තකාරව මහතී මහන්තී කියා තිබේ "ධාතුප්පච්චය-පෙ-නාමවූ ඔවුන්කෙරෙන් පරව ස්‍යාදි විභක්ති වේ.——ගහපති ශබ්ද ගහපති කියා වේ, එසේම භික්ඛු කියා වේ, රාජ කියා වේ, මෙධාවී කියා වේ, තපස්සී කියා වේ, ධම්මචාරී කියා වේ භයදස්සාවී කියාවේ, භූතාවී කියා වේ, පති ශබ්දාදීන්කෙරෙන්ද ඊකාරාන්තයන් කෙරෙන්ද පරව "පතිභික්ඛුරාජීකාරන්තෙහි ඉනී" යන සූත්‍රයෙන්

ඉනි ප්‍රත්‍යය වේ, ඉනිප්‍රත්‍යයා පරකල්හි පතිශබ්දයාගේ අන්ත්‍ය ඉකාරයහට "පතිස්සියිම්හි" යි අත්ව වේ. ප්‍රත්‍යයා පරකල්හි පූර්වස්වරයහට "සරලොපා" දින්ලොප් ප්‍රාප්තවූ එම සූත්‍රයෙහි තු ග්‍රහණයෙන් ප්‍රතිෂෙධ වේ, පතිසි භික්ඛු ශබ්දයන් දෙදෙනාකෙරෙන් පරවූ ඉ කාරය හට "වා පරො අසරූපා" යන සූත්‍රයෙන් ලොප් වේ, පරස්වරයහට ලොප් කළ කල්හි අ කාරයහට "දීඝං" යන සූත්‍රයෙන් දීර්ඝව ගෙණ තන්හි "සරලොපා" දින් ලොප් වේ, පරාක්ෂරයා කරා පැමිණ ගහපතානී භික්ඛුනී රාජිනී මෙධාවිනී තපස්සිනී ධම්මචාරිණී භයදස්සාවිනී ආනාවිනී කියා තිබේ "ධාතුප්පච්චය-පෙ-නාමව" ච ඔවුන්කෙරෙන් පරව ස්‍යාදි විභක්තිව ගහපතානී යනාදිය වේ,

කාණැඩු, රත්ති නාදී යාගු මාතු ධීතු දුහිතාපි
ජම්බූ අජාදී නාගරාදී මාතුලාදී සඛාදි ච.
බොධී මානවිකාදි ගුණවතී මහතී ති ච
ගහපතානී ච මෙධාවී ධම්මචාරිණී සඞ්ඝතො.
ඉත්ථිලිඞ්ගං.

—— * ——

චිත්තං චිත්තා චිත්තානි යන තන්හි "ජිනවචන—පෙ—සි විභක්ති එක් තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, නපුංසකලිඞ්ගයෙහි වැටෙන් නාවූ අකාරාන්ත නාමයාකෙරෙන් පරවූ සි විභක්ති හට "සිං" යන සූත්‍රයෙන් අංයනාදෙශ වේ, නපුංසකලිඞ්ගයෙහි වූ අකාරාන්ත නාමයාකෙරෙන් පරවූ යො විභක්තිහට "අතො නිච්චං" යන සූත්‍රයෙන් අවිකල්පයෙන් නි යනාදෙශ වේ, නි යනාදෙශයහට "සබ්බයොනීනමා ඒ" යන සූත්‍රයෙන් විකල්පයෙන් ආ කාරාදෙශ වේ, තුබූ පක්ෂයෙහි නි යනාදෙශයා පරකල්හි පූර්වස්වරයහට "යොසු කතනිකාරලොපෙසු දීඝං" යන සූත්‍රයෙන් දීර්ඝ වේ, චිත්තං චිත්තා චිත්තානි යනු වේ.

(භො) චිත්ත චිත්තා (භවන්තො) චිත්තානි යන තන්හි "ජිනවචන-පෙ-සි විභක්ති දෙතැනෙක වේ, යො විභක්ති එක් තැනෙක වේ, ග සංඥයා පරකල්හි චිත්තශබ්දාන්ත අකාරයහට "අකාරපිතාද්‍යන්තානමා" යන සූත්‍රයෙන් ආකාරාදෙශ වේ, ග සංඥයා පරකල්හි ආකාරයහට "ආකාරො වා" යන සූත්‍රයෙන් හ්‍රස්ව වේ, ග සංඥයහට "සෙසතො" යනාදීන් ලොප් වේ, යො විභක්තිහට "අතො නිච්චං" යන සූත්‍රයෙන් නි යනාදෙශ වේ, නි යනාදෙශයා පරකල්හි අකාරයහට "යොසු කත" යනාදීන් දීර්ඝ වේ, (භො) චිත්ත චිත්තා යනාදිය වේ.

චිත්තං චිත්තෙ චිත්තානි යන තන්හි "ජිනවචන—පෙ—අං විභක්ති එක් තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, අකාරාන්තනාමයාකෙරෙන් පරවූ යො හට "අතො නිච්චං" යි අවිකල්පයෙන් නි යනාදෙශ වේ, එක් පක්ෂයෙක්හි නිහට "සබ්බයොනීනමාඑ" යි එකාරව නි පරකල්හි පූර්වස්වරය හට "යොසු කත" යනාදීන් දීර්ඝව චිත්තං යනාදිය වේ,

චිත්තෙන චිත්තෙහි චිත්තෙභි යන තන්හි "ජිනවචන-ම්ප නා විභත්ති එක් තැනෙක වේ, හි විභත්ති දෙතැනෙක වේ, අකාරාන්තනාමයාකෙරෙන් පරවූ නා විභත්ති හට "අතොනෙන" යි එන ව හි පරකල්හි අකාරයහට "සුහිස්වකාරෙඑ" යි එව හි හට විකල්පයෙන් භි යනාදෙශව චිත්තෙන යනාදිය වේ.—කරණකාරකාදිවූ සියලු පදයෝම බුද්ධශබ්දයා මෙනි.

චිත්තං චිත්තා චිත්තානි-(හෙ) චිත්ත චිත්තා (භවන්තානි) චිත්තානි—චිත්තං චිත්තෙ චිත්තානි—චිත්තෙන චිත්තෙහි චිත්තෙභි-එවං කරණෙ—චිත්තස්ස චිත්තානං—චිත්තා චිත්තම්හා චිත්තස්මා චිත්තෙහි චිත්තෙභි—චිත්තස්ස චිත්තානං-චිත්තෙ චිත්තම්හි චිත්තස්මිං චිත්තෙසු.

චිත්ත ශබ්දයෙන් සිත කියත්.

පුඤ්ඤ පාප ඵල රූප සාධනං සොත ඝාණ සුඛ දුක්ඛ කාරණං
දාන සීල ධන ඣාන ලොචනං මූල කූල බල ජාල මඞ්ගලං.
නලින ලිඞ්ග මුඛඞ්ග ජලම්බුජං පුලින ධඤ්ඤ හිරඤ්ඤ පදාමතං
පදුම පණ්ණ සුසාන වනායුධං හදය චීවර වත්ථ කුලින්ද්‍රියං.

නයන වදන යානොදාන සොපාන පානං
භවන භුවන ලොහාලාත තුණ්ඩණ්ඩ පීඨං
කරණ මරණ ඤාණාරම්මණාරඤ්ඤ තාණං
තගර නගර තීරච්ඡත්ත ඡිද්දොදකානි.

ඉච්චාදයො චිත්තසද්දසමා.

පුඤ්ඤ, පින්; පාප, පව්; ඵල, විපාක; රූප, රූපය; සාධනං, * කාරණය; සොත, ශ්‍රොත්‍රය; ඝාණ, නාසිකාව; සුඛ, සුව; දුක්ඛ, දුක; කාරණං, හෙතුව; දාන, දන්; සීල, සිල්; ධන, වස්තුව; ඣාන, ධ්‍යානය; ලොචනං, ඇස; මූල, මිළ; කූල, ඉවුර; බල, බලය; ජාල, දැල්; මඞ්ගලං, මගුල.

නලින, පියුම; ලිඞ්ග, ලිඞ්ගය; මුඛ, මුහුණ; අඞ්ග, අවයව; ජල, දිය; අම්බුජං, පියුම; පුලින, වැලි; ධඤ්ඤ, ධාන්‍යය; හිරඤ්ඤ, අමුරන්; පද, පිහිට; අමතං, නිවන්; පදුම, පියුම; පණ්ණ, පත්‍රය; සුසාන, සොහොන; වන, ආරණ්‍යය; ආයුධං, ආයුධය; හදය, හෘදය; චීවර, සිවුර; වත්ථ, වස්ත්‍රය; කුල, වංශය; ඉන්ද්‍රියං, ඉන්ද්‍රියය.

නයන, ඇස; වදන, මුහුණ; යාන, යානාව; උදාන, ප්‍රීතිවාක්‍යය; සොපාන, හිනිපෙත්ත; පානං, පානවර්ගය; භවන, රාජභවනාදිය; භුවන, ත්‍රිභුවනය; ලොහ, පස්ලෝ; අලාත, පෙනෙහෙලි; තුණ්ඩ, තුඩ; අණ්ඩ, බිජුවට; පීඨං, පුටුව; කරණ, කරණය; මරණ, මෘත්‍යුය; ඤාණ, ඤාණය; ආරම්මණ, අරමුණ; අරඤ්ඤ, වනය; තාණං, රක්ෂාස්ථානය; තගර තුවරලා; නගර, නුවර; තීර, තෙර; ඡත්ත, ඡත්‍රය; ඡිද්ද, සිදුර; උදකානි, ජලයයි.

---

* සිද්ධිඋපකරණ—කර්තෘආදියයි.

මනං මනා මනානි යන තන්හි "ජිනවචන—පෙ—සි විභක්ති එක් තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, නපුංසකලිඞ්ගයෙහි වැටෙන් නාවූ අකාරාන්ත නාමයාකෙරෙන් පරවූ සි විභක්තිහට "සිං" යන සූත්‍රයෙන් අං යනාදෙශ වේ, එසේම යො විභක්ති හට "අතො නිච්චං" යී අවිකල්පයෙන් නි වේ, නි හට "සබ්බයොනීනමාඒ" යී විකල්පයෙන් ආ වේ, නි පරකල්හි පූර්වස්වරයහට "යොසු කත" යනාදීන් දීර්ඝව මනං යනාදිය වේ.

(හෙ) මන මනා (භවන්තානි) මනානි යන තන්හි "ජිනවචන—පෙ—සි විභක්ති දෙතැනෙක වේ, යො විභක්ති එක් තැනෙක වේ, ග සංඥා පරකල්හි මනශබ්දාන්තය හට "අකාරපිතාද්‍යන්තානමා" යී ආ වේ, ග සංඥා පරකල්හි ආකාරයහට "ආකාරො වා" යී විකල්පයෙන් හ්‍රස්ව වේ, ග හට "සෙසතො" යනාදීන් ලොප්ව (හෙ) මන මනා යනාදිය වේ.

මනං මනෙ මනානි යන තන්හි "ජිනවචන—පෙ—අං විභක්ති එක් තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, අං විභක්ති පරකල්හි පූර්වස්වරය හට "සරලොපො" දීන් ලොප් වේ, නපුංසකලිඞ්ගයෙහි වූ අකාරාන්ත නාමයාකෙරෙන් පරවූ යො හට "අතො නිච්චං" යී අවිකල්පයෙන් නි වේ, නි හට "සබ්බ යොනීනමාඒ" යී විකල්පයෙන් එව නිපරකල්හි අකාරය හට "යොසු කත" යනාදීන් දීර්ඝව මනං මනෙ යනාදිය වේ.

මනසා මනෙන මනෙහි මනෙභි යන තන්හි "ජිනවචන-පෙ-නා විභක්ති දෙතැනෙක වේ හි විභක්ති දෙතැනෙක වේ, මනශබ්දයාකෙරෙන් පරවූ නාහට "මනොගණාදිතො ස්මිංනානමිආ" යී ආ ව විභක්ත්‍යාදෙශ ස්වරයා පරකල්හි මනශබ්දයාකෙරෙන් පරව "සසරෙ වාගමො" යී ස කාරයෙන් ආගම වේ, ස කාරයට අකාරය හට "සරලොපො" දීන් ලොප් වේ, තුබූ පක්ෂයෙහි නා හට "අතො නෙන" යී එන යනාදෙශව හි විභක්ති පරකල්හි අකාරය හට "සුහිස්වකාරො එ" යී එව මනසා මනෙන යනාදියවේ......කරණ කාරකය ද මෙසේ මැයි.

මනසො මනස්ස මනානං යන තන්හි "ජිනවචන—පෙ—ස විභක්ති දෙතැනෙක වේ, නං විභක්ති එක්තැනෙක වේ, මනශබ්දයාකෙරෙන් පරවූ ස විභක්තිහට "සස්ස චො" යී විකල්පයෙන් ඔ වේ, විභක්ත්‍යාදෙශස්වරයා පරකල්හි මන ශබ්දයාකෙරෙන් පරව "සසරෙ වාගමො" යී සකාරාගම වේ, සකාරයට අකාරය හට "සරලොපො" දීන් ලොප් වේ, තුබූ පක්ෂයෙහි ස හට "සාගමො සෙ" යී සකාරාගම වේ, නං පරකල්හි "සුනංහිසු" යනාදීන් පූර්වස්වර දීර්ඝ වේ, මනසො යනාදිය වේ.

මනසා මනා මනම්හා මනස්මා මනෙහි මනෙභි යන තන්හි "ජිනවචන—පෙ—ස්මා විභක්ති සතර තැනෙක වේ, හි විභක්ති දෙතැනෙක වේ, මන ශබ්දයාකෙරෙන් පරවූ ස්මාහට "සස්ස චො" යන සූත්‍රයෙහි චශබ්ද

ග්‍රහණයෙන් විකල්පයෙන් ආ වේ, විභක්ත්‍යාදෙශස්වරයා පරකල්හි මන ශබ්දයාකෙරෙන් පරව "සසරෙ වාගමො" යි සකාරාගම වේ, එක් පක්ෂයෙහි ස්මා හට "අම්හ තුම්හ නන්තු රාජ" යනාදි සූත්‍රයෙහි ආදිග්‍රහණයෙන් නාවත් වේ, * එක් පක්ෂයෙහි මනා යනාදේශ වේ, හි විභක්ති පරකල්හි අකාරයහට "සුහිසුවකාරෙ එ" යි එකාරව මනසා මනා යනාදිය වේ.—මනසො මනස්ස මනානං යනු චතුර්ථිය මෙනි.

මනසි මනෙ මනම්හි මනස්මිං මනෙසු යන තන්හි "ජිනවචන—පෙ—ස්මිං විභක්ති සතර තැනෙක වේ, සු විභක්ති එක් තැනෙක වේ, මන ශබ්දයාකෙරෙන් පරවූ ස්මිං හට "ස්මිනොනාගමා"දි සූත්‍රයෙන් විකල්පයෙන් ඉකාර වේ, විභක්ත්‍යාදෙශස්වරයා පරකල්හි මනශබ්දයාකෙරෙන් පරව "සසරෙවාගමො" යි සකාරාගම වේ, සකාරයාගේ අකාරයහට "සරලොපා" දින් ලොප් වේ, එක් පක්ෂයෙහි ස්මිං හට "ස්මාස්මින්නං වා" යි එකාර වේ, එක් පක්ෂයෙහි ම්හි වේ, සු පරකල්හි "සුහිසුවකාරෙ එ" යි එකාරව මනසි මනෙ යනාදිය වේ.

මනං මනා මනානි—(නෙ) මන මනා (භවනානි) මනානි—මනං මනෙ මනානි-මනසා මනෙන මනෙහි මනෙභි—එවං කරණෙ-මනසො මනස්ස මනානං-මනසා මනා මනම්හා මනස්මා මනෙහි ,මනෙභි-මනසො මනස්ස මනානං මනසි මනෙ මනම්හි මනස්මිං මනෙසු.

මන ශබ්දයෙන් මනස කියත්.

**මනං සිරං උරං තෙජං රජං ඔජං වයං පයං**
**යසං තපං වචං චෙතං එවමාදි මනො ගණො.**

මනං, සිත; සිරං, ඉස; උරං, ලය; තෙජං, තෙජස්; රජං, රජස්; ඔජං, ඔජස්; වයං, වයස්; පයං, දියහෝ කිරි; යසං, යසස්; තපං, තපස්; වචං, වචනය; චෙතං, සිතයි.

ගුණවං ගුණවන්තා ගුණවන්තානි—යන තන්හි "ජිනවචන—පෙ—සි විභක්ති එක් තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, සි විභක්ති පරකල්හි විභක්ති සහිතවූ න්තුප්‍රත්‍යයහට "අං නපුංසකෙ" යන සූත්‍රයෙන් අං යනාදෙශ වේ, යො විභක්ති පරකල්හි න්තුප්‍රත්‍යයාගේ අන්තයහට "න්තුස්ස න්තො යොසු ච" යන සූත්‍රයෙන් අවිකල්පයෙන් අත් වේ, යො විභක්තිහට "අතො නිච්චං" යන සූත්‍රයෙන් නි යනාදෙශ වේ, නි යනාදෙශය හට "සබ්බයොනීනමාඑ" යි විකල්පයෙන් ආකාරාදෙශ වේ, නි යනාදෙශයා පරකල්හි පූර්වස්වරයහට "යොසු කත" යනාදින් දීර්ඝ වේ, ගුණවං ගුණවන්තා ගුණවන්තානි යනු වේ.

---

* මෙසේනම් ආදේශය මනනායි වියයුතුයි.

"ස්මාස්මින්නං වා" යි ආකාරවූ පක්ෂයෙහි ස්ථානමිනොවේයයි ගැනේ.

(යො) ගුණවං ගුණව ගුණවා (භවන්තානි) ගුණවන්තා ගුණවන්තානි යන තන්හි "ජිනවචන-පෙ-සි විභත්ති තුන් තැනෙක වේ, යො විභත්ති දෙතැනෙක වේ, ග සංඥයා පරකල්හි විභත්ති සහිතවූ න්තුප්‍රත්‍යයනට "අවණ්ණා ච ගෙ" යන සූත්‍රයෙන් අං අ ආ යනාදෙශයෝ වෙත්, යො විභත්ති පරකල්හි න්තුප්‍රත්‍යයාගේ අන්තයහට "න්තුස්ස න්තො යොසු ච" යන සූත්‍රයෙන් අඩවේ, යො විභත්තිහට "අතො නිච්චං" යි අවිකල්පයෙන් නියනාදෙශ වේ, නි හට "සබ්බයොනීනමා ඒ" යි විකල්පයෙන් ආකාරාදෙශ වේ, නි පරකල්හි අකාරයනට "යොසු කත" යනාදීන් දීර්ඝ වේ, (හෙ) ගුණවංයනාදිය වේ.

ගුණවන්තං ගුණවන්තෙ ගුණවන්තානි යන තන්හි "ජිනවචන-පෙ-අං විභත්ති එක් තැනෙක වේ, යො විභත්ති දෙතැනෙක වේ, අං විභත්ති පරකල්හි න්තුප්‍රත්‍යයාගේ අන්තයහට "න්තුස්ස න්තො යොසු ච" යන සූත්‍රයෙහි චග්‍රහණයෙන් අඩවේ, යො පරකල්හි න්තුප්‍රත්‍යයහට එම සූත්‍රයෙන්ම අඩ වේ, යො හට "අතො නිච්චං" යි අවිකල්පයෙන් නිවේ, නිහට "සබ්බයොනීනමා ඒ" යි විකල්පයෙන් එ වෙයි නි පරකල්හි අකාරයනට "යොසු කත" යනාදීන් දීර්ඝ වේ, ගුණවන්තං යනාදිය වේ. ගුණවතා ගුණවන්තෙන යනාදී හැම පදයෝම පුල්ලිඞ්ගයෙහිවූ ගුණවන්තු ශබ්දයා මෙනි.

ගුණවං ගුණවන්තා ගුණවන්තානි—(හෙ) ගුණව, ගුණව ගුණවා (භවන්තානි) ගුණවන්තා ගුණවන්තානි-ගුණවන්තං ගුණවන්තෙ ගුණවන්තානි—ගුණවතා ගුණවන්තෙන ගුණවන්තෙහි ගුණවන්තෙභි—එවං කරණෙ-ගුණවතො ගුණවන්තස්ස ගුණවතං ගුණවන්තානං—ගුණවතා ගුණවන්තම්හා ගුණවන්තස්මා ගුණවන්තෙහි ගුණවන්තෙභි-ගුණවතො ගුණවන්තස්ස ගුණවතං ගුණවන්තානං-ගුණවති ගුණවන්තෙ ගුණවන්තම්හි ගුණවන්තස්මිං ගුණවන්තෙසු.

මෙයින් ගුණවත් නපුංසකයන් කීයත්.

ගච්ඡං ගච්ඡන්තා ගච්ඡන්තානි යන තන්හි "ජිනවචන-පෙ—සි විභත්ති එක් තැනෙක වේ, යො විභත්ති දෙතැනෙක වේ, සි විභත්ති පරකල්හි ගච්ඡන්තශබ්දයාගේ න්තප්‍රත්‍යයහට "සිම්හි ගච්ඡන්තාදීනං න්තසද්දො අං" යි අං ව සි හට "සෙසතො" යනාදීන් ලොප් වේ, යො හට "අතො නිච්ච" යි අවිකල්පයෙන් නි වේ. නි හට "සබ්බයොනීනමා ඒ" යි විකල්පයෙන් ආ ව නි පරකල්හි අකාරයනට "යොසු කත" යනාදීන් දීර්ඝවේ, ගච්ඡං යනාදිය වේ.

(හෙ) ගච්ඡං ගච්ඡ ගච්ඡා (භවන්තානි) ගච්ඡන්තා ගච්ඡන්තානි යන තන්හි "ජිනවචන-පෙ-සි විභත්ති තුන් තැනෙක වේ, යො විභත්ති දෙ තැනෙක වේ, ග සංඥයා පරවූ තන්හි න්තාද්‍යන්තයහට "සෙසෙසු න්තුව" යන සූත්‍රයෙන් න්තුවත් වේ, ග සංඥයා පරකල්හි එම සි විභත්ති හා සමග

න්ත ප්‍රත්‍යයහට "අවණ්ණෙ ච ගෙ" යි අං අ ආ යනාදෙශයෝ වෙත්, යො හට "අතො නිච්චං" යි අ විකල්පයෙන් නි වේ, නි හට "සබ්බ යොනීනං ආ ඒ" යි විකල්පයෙන් ආ ව නි පරකල්හි "යොසු කත" යනාදින් දීර්ඝව (හෙ) ගච්ඡං යනාදිය වේ.

ගච්ඡන්තං ගච්ඡන්තෙ ගච්ඡන්තානි-යන තන්හි "ජිනවචන—පෙ—අං විභත්ති එක් තැනෙක වේ යො විභක්ති දෙතැනෙක වේ, යො විභක්තිහට "අතො නිච්චං" යි අවිකල්පයෙන් නි ව නි හට "සබ්බයොනීනං ආ ඒ" යි විකල්පයෙන් ඒව නි පරකල්හි "යොසු කත" යනාදින් පූර්වස්වර දීර්ඝව ගච්ඡන්තං යනාදිය වේ.

ගච්ඡතා ගච්ඡන්තෙන යනාදි සියලු පදයෝම පුලිංගයෙහි ගච්ඡන්ත ශබ්දයා මෙනි.

ගච්ඡං ගච්ඡන්තා ගච්ඡන්තානි-(හෙ) ගච්ඡං ගච්ඡ ගච්ඡා (භවන්තානි) ගච්ඡන්තා ගච්ඡන්තානි—ගච්ඡන්තං ගච්ඡන්තෙ ගච්ඡන්තානි—ගච්ඡතා ගච්ඡන්තෙන ගච්ඡන්තෙහි ගච්ඡන්තෙභි—එවං කරණෙ—ගච්ඡතො ගච්ඡන්තස්ස ගච්ඡතං ගච්ඡන්තානං—ගච්ඡතා ගච්ඡන්තම්හා ගච්ඡන්තස්මා ගච්ඡන්තෙහි ගච්ඡන්තෙභි—ගච්ඡතො ගච්ඡන්තස්ස ගච්ඡතං ගච්ඡන්තානං—ගච්ඡති ගච්ඡන්තෙ ගච්ඡන්තම්හි ගච්ඡන්තස්මිං ගච්ඡන්තෙසු.

මෙසින් යන්නාවූ නපුංසකයන් කීයත්.

අ කාරාන්තයි.

——— * ———

අට්ඨි අට්ඨීනි අට්ඨී යන තන්හි "ජිනවචන—පෙ—සි විභක්ති එක් තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, ඊකාරයට ඉකාරයාකෙරෙන් ඊකාරපත වේ, ඊකාරහල් වේ, නපුංසකලිංගයෙහිවූ ඉවණ්ණයහට "ඉවණ්ණුවණ්ණොකාරා" දින් ඕඩ ස ඥවේ, සි හට "සෙසතො" යනාදින් ලොප්වේ, නපුංසකලිංගයෙහිවූ යොහට "යොනං නි නපුංසකෙහි" යි නිවේ, තුබ්බ පක්ෂයෙහි යො හට "ඝපතො" යනාදින් ලොප්වේ, පූර්වස්වරයහට "යොසු කත" යනාදින් දීර්ඝවේ අට්ඨි අට්ඨීනි අට්ඨී යනුවේ.

(හෙ) අට්ඨි (භවන්තානි) අට්ඨීනි අට්ඨී යන තන්හි "ජිනවචන—පෙ—සි විභක්ති එක් තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, ග සංඥයහට "සෙසතො" යනාදින් ලොප්වේ, යො හට "යොනං නි" යනාදින් විකල්පයෙන් නිවේ, තුබ්බ පක්ෂයෙහි යොහට "ඝපතො" යනාදින් ලොප්වේ, පූර්වස්වරයහට "යොසු කත" යනාදින් දීර්ඝවේ, (හෙ) අට්ඨියනාදියවේ.

අට්ඨිං අට්ඨීනි අට්ඨී යන තන්හි "ජිනවචන-පෙ-අං විභක්ති එක් තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, ඕධ සංඥයාකෙරෙන් පරවූ අං විභක්ති "අමෙම්ං නිග්ගහීතං" යනාදින් නිග්ගහීතභාවට පැමිණේ, යොහට "යොනං නි" යනාදින් විකල්පයෙන් නිවේ, තුබ්බ පක්ෂයෙහි යොහට "ඝපතො" යනාදින් ලොප්ව පූර්වස්වරයහට "යොසු කත" යනාදින් දීර්ඝව අට්ඨිං යනාදිය වේ.—අට්ඨිනා යනාදි හැම පදයෝම පුලිංගයෙහි අග්ගි ශබ්දයාමෙනි.

අට්ඨි අට්ඨීනි අට්ඨී-(හෙ) අට්ඨි (භවන්තානි) අට්ඨීනි අට්ඨී-අට්ඨිං අට්ඨීනි අට්ඨී අට්ඨිනා අට්ඨීහි අට්ඨීභි-එවං කරණෙ-අට්ඨිනො අට්ඨිස්ස අට්ඨීනං-අට්ඨිනා අට්ඨිම්හා අට්ඨිස්මා අට්ඨීහි අට්ඨීභි—අට්ඨිනො අට්ඨිස්ස අට්ඨීනං—අට්ඨිම්හි අට්ඨිස්මිං අට්ඨීසු.

අට්ඨිශබ්දයෙන් ඇට කියත්.

එවං සප්පි දධි වාරි අක්ඛි අච්ඡි අච්චි ඉච්චාදයො.

සප්පි, කලවය; දධි, දී; වාරි ජලය; අක්ඛි, ඇස; අච්ඡි, නෙත්‍රය; අච්චි, ගිනිසිළයි.

ඉකාරන්තයි.

---*---

දණ්ඩි දණ්ඩීනි දණ්ඩී යනාදී සියල්ලම අට්ඨිශබ්දයාමෙනි වෙනසනම් "අඝොසා රස්සං" යනාදීන් ඣ සංඥයහට හ්‍රස්ව හා ස්මිංහට නි පමණකි.

දණ්ඩි දණ්ඩීනි දණ්ඩී-(හෙ) දණ්ඩි (භවන්තානි) දණ්ඩීනි දණ්ඩී දණ්ඩිං දණ්ඩීනි දණ්ඩී-දණ්ඩිනා දණ්ඩීහි දණ්ඩීභි-එවං කරණෙ-දණ්ඩිනො දණ්ඩිස්ස දණ්ඩීනං-දණ්ඩිනා දණ්ඩිම්හා දණ්ඩිස්මා දණ්ඩීහි දණ්ඩීභි-දණ්ඩිනො දණ්ඩිස්ස දණ්ඩීනං—දණ්ඩිනි දණ්ඩිම්හි දණ්ඩිස්මිං දණ්ඩීසු.

දණ්ඩිශබ්දයෙන් දඬුගත් නපුංසකයන් කියත්.

ඊකාරන්තයි.

---*---

ආයු ආයූනි ආයූ-යන තන්හි "ජිනවචන-පෙ-සි විභත්ති එක් තැනෙක වේ, යො විභත්ති දෙතැනෙක වේ, විභත්ති පරකල්හි "පුබ්බ-පෙ-උකාර පහවේ, යකාරහල්වේ, නපුංසකලිඟුයෙහිවූ උවණ්ණයහට "ඉවණ්ණු වණ්ණා" යනාදීන් දීඝ වේ, සි විභත්තිහට "සෙසතො" යනාදීන් ලොප් වේ, යොහට "යොනං නි" යනාදීන් විකල්පයෙන් නිවේ, තුබූ පක්ෂයෙහි යොහට "ඣලතො" යනාදීන් ලොප්ව ආයු ආයූනි ආයූ යනු වේ.—(හෙ) ආයු (භවන්තානි) ආයූනි ආයූ-යනාදී හැම පදයෝම අට්ඨි ශබ්දයාමෙනි.

ආයු ආයූනි ආයූ-(හෙ) ආයු (භවන්තානි) ආයූනි ආයූ-ආයුං ආයූනි ආයූ-ආයුනා ආයූහි ආයූභි-එවං කරණෙ-ආයුනො ආයුස්ස ආයූනං-ආයුනා ආයුම්හා ආයුස්මා ආයූහි-ආයුනො ආයුස්ස ආයූනං—ආයුම්හි ආයුස්මිං ආයූසු.

ආයුශබ්දයෙන් ආයුෂ කියත්.

එවං චක්ඛු වසු ධනු දාරු තිපු මධු සිඟු හිඞ්ගු වත්ථු මත්ථු ජතු අම්බු අස්සු ආදී.

චක්ඛු ඇස; වසු, පොංගලාව; * ධනු දුන්න; දාරු, දඬු; තිපු, ඊයම්; මධු, මී; සිඟු මුරුංගා; හිඞ්ගු, පෙරුංකායම්; වත්ථු, වස්තුව; මත්ථු, දීපෙරලිදිය; ජතු, ලාක්ඛ අම්බු, ජලය; අස්සු, කඳුලුයි.

උකාරන්තයි.

---*---

* ධනුව-ධනාදී අන්කිසිවකි.

චිත්තං මනාදි ගුණවං ගච්ඡං අක්ඛිව දක්ඛිව
ආයු ඉච්චෙව සංඛෙපො සද්දානෙත්ථ නපුංසකා.

## නපුංසක ලිඞ්ගයි.

—— * ——

සබ්බං සබ්බෙ යන තන්හි "ජිනවචන-පෙ-සි විභක්ති එක් තැනෙක වේ, යො විභක්ති එක් තැනෙක වේ, සි විභක්තිහට "සො" යන සූත්‍රයෙන් ඔකාරාදෙශ වේ, සබ්බශබ්දාදීන්කෙරෙන් පරවූ ප්‍රථමා යොවිභක්තිහට "සබ්බනාමකාරතෙ පඨමො" යන සූත්‍රයෙන් එකාරාදෙශවේ, ස්වර ලොපාදී කාර්‍ය්‍යව සබ්බො සබ්බෙ යනු වේ. ආලපන විතීයා තෘතීයා කරණකාරකයද බුද්ධශබ්දයා මෙනි.

සබ්බස්ස සබ්බෙසං සබ්බෙසානං—යන තන්හි "ජිනවචන—පෙ—ස විභක්ති එක් තැනෙක වේ, නං විභක්ති දෙතැනෙක වේ, අකාරාන්තනාමයා කෙරෙන් පරවූ ස විභක්තිහට "ආය චතුත්ථෙකවචනස්ස තු" යන සූත්‍රයෙන් ආය යනාදෙශ පැමිණි "තයො නෙව ච සබ්බනාමෙහි" යන සූත්‍රයෙන් ප්‍රතිෂෙධව "සාගමො සෙ" සී සකාරාගම වේ, සබ්බශබ්දාදීන් කෙරෙන් පරවූ නං විභක්තිහට "සබ්බතො නං සංසානං" යන සූත්‍රයෙන් සංය සානංය යනාදෙශයෝ ක්‍රමයෙන් වෙත්, සං සානං යනාදෙශයන් පර කල්හි සබ්බශබ්දයාගේ අන්ත අකාරයහට "සබ්බනාමානං නම්හි ච" සී එකාරාදෙශව සබ්බස්ස සබ්බෙසං සබ්බෙසානං යනු වේ.

සබ්බම්හා සබ්බස්මා සබ්බෙහි සබ්බෙභි යන තන්හි "ජිනවචන-පෙ-ස්මා විභක්ති දෙතැනෙක වේ, හි විභක්ති දෙතැනෙක වේ, අකාරාන්තනාමයා කෙරෙන් පරවූ ස්මා විභක්තිහට "ස්මාස්මින්නං වා" සී ආකාරාදෙශ පැමිණි "තයො නෙව ච" යනාදීන් ප්‍රතිෂෙධව "ස්මාහිස්මින්නං" යනාදීන් විකල්පයෙන් ම්හා යනාදෙශහා හි විභක්තිහට එසේම භි යනාදෙශද වේ, හි පරකල්හි අකාරයහට "සුහිස්වකාරො එ" සී එව සබ්බම්හා යනාදිය වේ. සබ්බස්ස සබ්බෙසං සබ්බෙසානං යනු චතුර්ථිය මෙනි.

සබ්බම්හි සබ්බස්මිං සබ්බෙසු යන තන්හි "ජිනවචන-පෙ-ස්මිං විභක්ති දෙතැනෙක වේ, සු විභක්ති එක් තැනෙක වේ, අකාරාන්තනාමයාකෙරෙන් පරවූ ස්මිංහට "ස්මාස්මින්නං" යනාදීන්වූ එහට "තයො නෙව ච" යනාදීන් ප්‍රතිෂෙධව "ස්මාහිස්මින්නං" යනාදීන් විකල්පයෙන් ම්හි වේ, සු පරකල්හි අහට "සුහිස්ව" යනාදීන් එව සබ්බම්හි යනාදිය වේ.

### ස්ත්‍රීලිඞ්ගයෙහි.

සබ්බා සබ්බා සබ්බායො යන තන්හි "ජිනවචන—පෙ—සි විභක්ති එක් තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, බකාරයෙන් ආකාරපහවේ, බකාර හල්වේ, ස්ත්‍රීලිඞ්ගයෙහිවූ ආකාරයහට "ආ ඝො" යන සූත්‍රයෙන් ඝ සංඥා වේ, සි විභක්තිහට "සෙසතො" යනාදීන් ලොප් වේ, ඝ සංඥයාකෙරෙන් පරවූ යොහට "ඝපතො" යනාදීන් ලොප් වේ, සබ්බා යනාදිය වේ.

(නො) සබ්බෙ (නොති) සබ්බා සබ්බායො යන තන්හි "ජිනවචන–පෙ–සි විභත්ති එක් තැනෙක වේ, යො විභත්ති දෙතැනෙක වේ, ඝ සංඥයාකෙරෙන් පරවූ ඝ සංඥයහට "ඝතෙච" යි එකාරාදෙශ වේ, යො විභත්තිහට "ඝපතො" යනාදීන් විකල්පයෙන් ලොප් වේ, (නො) සබ්බෙ යනාදිය වේ,

සබ්බං සබ්බා සබ්බායො යන තන්හි "ජිනවචන—පෙ—අං විභත්ති එක් තැනෙක වේ, යො විභත්ති දෙතැනෙක වේ, ඝ සංඥයාකෙරෙන් පරවූ අං විභත්ති "අං මො" යනාදීන් නිග්ගහීතත්වයට පැමිණේ, එකවචන විභත්ති පරකල්හි ඝහට "ඝො රස්සං" යි හ්‍රස්ව වේ,* යො විභත්තිහට "ඝපතො" යනාදීන් විකල්පයෙන් ලොප් වේ, සබ්බං යනාදිය වේ.

සබ්බාය සබ්බාහි සබ්බාහි යන තන්හි "ජිනවචන–පෙ–නා විභත්ති එක් තැනෙක වේ, හි විභත්ති දෙතැනෙක වේ, ඝ සංඥයාකෙරෙන් පරවූ නා ආදී එකවචන විභත්තීන්ට "ඝතො නාදීනං" යි ආයව සබ්බාය යනාදිය වේ.

සබ්බස්සා සබ්බාය සබ්බාසං සබ්බාසානං යන තන්හි "ජිනවචන–පෙ–ස විභත්ති දෙතැනෙක වේ, නං විභත්ති දෙතැනෙක වේ, ඝ සංඥවූ සබ්බ ශබ්දාදීන්කෙරෙන් පරවූ ස හට "ඝපතො ස්මිං සානං සංසා" යි විකල්පයෙන් සං වේ, සා පරකල්හි "සංසාසේවකවචනෙසු ච" යි සකාරාගම වේ, එකවචන විභත්ති පරකල්හි ඝහට "ඝො රස්සං" යි හ්‍රස්වව තුබූ පක්ෂයෙහි ඝහට "ඝතො නාදීනං" යි ආය වේ, සබ්බශබ්දාදීන් කෙරෙන් පරවූ නංහට "සබ්බතො නං සංසානං" යි සං සානං යනාදෙශයෝ වෙත්, සබ්බස්සා යනාදිය වේ.

සබ්බාය සබ්බාහි සබ්බාහි යන තන්හි "ජිනවචන–පෙ–ස්මිං විභත්ති එක් තැනෙක වේ, හි විභත්ති දෙතැනෙක වේ, ඝ කෙරෙන් පරවූ ස්මිං හට "ඝතො නාදීනං" යි ආය ව සබ්බාය යනාදිය වේ.—සබ්බස්සා සබ්බාය සබ්බාසං සබ්බාසානං යනු චතුර්ථිය මෙනි.

සබ්බස්සං සබ්බායං සබ්බාසු යන තන්හි "ජිනවචන—පෙ—ස්මිං විභත්ති දෙතැනෙක වේ, සු විභත්ති එක් තැනෙක වේ, ඝ කෙරෙන් පරවූ ස්මිංහට "ඝපතො ස්මිං සානං සංසා" යි විකල්පයෙන් සං වේ, සං පරකල්හි "සංසාසේවකවචනෙසු ච" යි සකාරාගම වේ, සං පරකල්හි ආකාරයහට "ඝො රස්සං" යි හ්‍රස්ව වේ, තුබූ පක්ෂයෙහි ස්මිංහට "ඝතො" යනාදීන් ආය යනාදෙශ පතෙනහි "නෙතාහි ස්මිමායයා" යි ප්‍රතිෂෙධව "ඝපතො ස්මිං යං වා" යි යං ව සබ්බස්සං යනාදිය වේ.

නපුංසකලිඞ්ගයෙහි.

සබ්බං සබ්බානි යන තන්හි "ජිනවචන—පෙ—සි විභත්ති එක් තැනෙක වේ, යො විභත්ති එක් තැනෙක වේ, නපුංසකලිඞ්ගයෙහිවූ අකාරාන්තනාම සාකෙරෙන් පරවූ සි හට "සිං" යි අං වේ, යොහට "අතො නිච්චං" යි නි

---

* අම්පරකල්හි "සරලොපො" දි සූත්‍රයෙන් පූර්වස්වර ලොප්විය මෙහිවා යනායෙදේ.

වේ, නි පරකල්හි අකාරයහට "යොසු කත" යනාදින් දීඝ් වේ, සබ්බං සබ්බානි යනු වේ.—(හෙ) සබ්බ සබ්බා (භවන්තානි) සබ්බානි යනු (හෙ) චිත්ත චිත්තා ශක කැන මෙනි.

සබ්බං සබ්බානි යන තන්හි "ජිනවචන—පෙ—අං විභත්ති එක් තැනෙක වේ, යො විභත්ති එක් තැනෙක වේ, යොහට "අතො නිච්චං" යී නි වේ, නි පරකල්හි අකාරයහට "යොසු කත" යනාදින් දීඝ්ව සබ්බං යනාදිය වේ.

නා විභත්තියට එනව හි පරකල්හි එව සබ්බෙන සබ්බෙහි සබ්බෙභි යනු වේ.—කරණකාරකයද මෙසේ මැයි.

සබ්බස්ස සබ්බෙසං සබ්බෙසානං යන තන්හි "ජිනවචන—පෙ—ස විභත්ති එක් තැනෙක වේ, නං විභත්ති දෙතැනෙක වේ, ස පරකල්හි "සාගමො සෙ" යී සකාරාගම වේ, නං පරකල්හි අකාරයහට "සබ්බනා මානං නාමහි ච" යී එව සබ්බශබ්දාදින්කෙරෙන් පරවූ නංහට "සබ්බතො නං සංසානං" යී සං සානං යනාදෙශයෝ වෙත් සබ්බස්ස යනාදිය වේ.—සබ්බම්හා සබ්බස්මා සබ්බෙහි සබ්බෙභි යනු පුංලිඞ්ගයෙහි පඤ්චමිය මෙනි.—සබ්බස්ස සබ්බෙසං සබ්බෙසානං යනු චතුර්ථිය මෙනි,

සබ්බම්හි සබ්බස්මිං සබ්බෙසු යන තන්හි "ජිනවචන-පෙ—ස්මිං විභත්ති දෙතැනෙක වේ, සු විභත්ති එක් තැනෙක වේ, ස්මිංහට "ස්මාහිස්මිංනං ම්හාම්හි වා" යී එකාරාදෙශ පතෙතහි "නාඤ්ඤො තෙච" යනාදින් ප්‍රතිෂෙධව මහියනා දෙශ වේ, සු පරකල්හි අකාරයහට "සුහිස්වකාරො එ" යී එව සබ්බම්හි යනාදිය වේ.

සබ්බො සබ්බෙ—(හෙ) සබ්බ සබ්බා (භවන්තො) සබ්බෙ—සබ්බං සබ්බෙ—සබ්බෙන සබ්බෙහි සබ්බෙභි—එවං කරණෙ—සබ්බස්ස සබ්බෙසං සබ්බෙසානං—සබ්බම්හා සබ්බස්මා සබ්බෙහි සබ්බෙභි—සබ්බස්ස සබ්බෙසං සබ්බෙසානං—සබ්බම්හි සබ්බස්මිං සබ්බෙසු.

ඉත්ථියං.

සබ්බා සබ්බා සබ්බායො—(හෙ) සබ්බෙ (භොති) සබ්බා සබ්බායො—සබ්බං සබ්බා සබ්බායො—සබ්බාය සබ්බාහි සබ්බාභි—එවං කරණෙ—සබ්බස්සා සබ්බාය සබ්බාසං සබ්බාසානං—සබ්බාය සබ්බාහි සබ්බාභි—සබ්බස්සා සබ්බාය සබ්බාසං සබ්බාසානං—සබ්බස්සං සබ්බායං සබ්බාසු.

නපුංසකෙ.

සබ්බං සබ්බානි—(හෙ) සබ්බ සබ්බා (භවන්තානි) සබ්බානි—සබ්බං සබ්බානි—සබ්බෙන සබ්බෙහි සබ්බෙභි—එවං කරණෙ—සබ්බස්ස සබ්බෙසං සබ්බෙසානං—සබ්බම්හා සබ්බස්මා සබ්බෙහි සබ්බෙභි—සබ්බස්ස සබ්බෙසං සබ්බෙසානං—සබ්බම්හි සබ්බස්මිං සබ්බෙසු.

සබ්බශබ්දයෙන් සියල්ල කියත්.

සබ්බ සතර සතම උභය ඉතර අඤ්ඤ අඤ්ඤතර අඤ්ඤතම ශබ්දයෝද ලිඞ්ගත්‍රයෙහිම මේ සබ්බශබ්දයා මෙනි.

පුබ්බො පුබ්බෙ යන තන්හි "ජිනවචන—පෙ—සි විභක්ති එක් තැනෙක වේ, යො විභක්ති එක් තැනෙක වේ, සිහට "සො" යි ඔ වේ, සබ්බශබ්දාදීන්කෙරෙන් පරවූ ප්‍රථමා යොහට "සබ්බනාමකාරතෙ පඨමො" යි එව පුබ්බෙ සනාදිය වේ.

(භො) පුබ්බ පුබ්බා (භවන්තො) පුබ්බෙ යන තන්හි "ජිනවචන—පෙ—සි විභක්ති දෙතැනෙක වේ, යො විභක්ති එක් තැනෙක වේ, ග පරකල්හි "අකාරපිතාද්‍යන්තානමා" යි අහට අ වේ, "ආකාරො වා" යි විකල්පයෙන් හ්‍රස්ව වේ, යොහට "සබ්බනාමානං" යනාදීන් එව (භො) පුබ්බෙ සනාදිය වේ.— පුබ්බං පුබ්බෙ යනුද, පුබ්බෙන පුබ්බෙහි පුබ්බෙභි යනුද, සබ්බශබ්දයා මෙනි.

පුබ්බස්ස පුබ්බෙසං පුබ්බෙසානං යන තන්හි "ජිනවචන—පෙ—ස විභක්ති එක් තැනෙක වේ. නං විභක්ති දෙතැනෙක වේ, ස පරකල්හි අහට "සබ්බනාමානං නම්හි ච" යි එ වේ නංහට "සබ්බතො නං සංසානං" යි සං සානංය යනාදෙශයෝ වෙත්, පුබ්බස්ස යනාදිය වේ.— පුබ්බස්මා පුබ්බම්හා පුබ්බෙහි පුබ්බෙභි යනුද, පුබ්බස්ස පුබ්බෙසං පුබ්බෙසානං යනුද, සබ්බශබ්දයෙනි පඤ්චමිය ෂෂ්ඨිය මෙනි.

පුබ්බෙ පුබ්බම්හි පුබ්බස්මිං යන තන්හි "ජිනවචන—පෙ—ස්මිං විභක්ති තුන්තැනෙක වේ, සු විභක්ති එක් තැනෙක වේ, ස්මිංහට "ස්මාස්මිනං" යනාදීන් එකාරවූකල්හි "[illegible]" යනාදීන් එකාර ප්‍රතිෂෙධව "[illegible]" යනාදීන් එ වේ, ම්හි වේ, සු පරකල්හි "සුහිස්වකාරෙ එ" යි එව පුබ්බෙසු සනාදිය වේ.

පුබ්බා පුබ්බා පුබ්බායො යන තන්හි ප්‍රථමාය ආලපනය විභක්තියාවය තෘතීයාවය කරණ කාරකය යන මොහු ස්ත්‍රීලිඞ්ගයෙහි සබ්බාශබ්දයා මෙනි.

පුබ්බස්සා පුබ්බාය පුබ්බාසං පුබ්බාසානං යන තන්හි "ජිනවචන—පෙ—ස විභක්ති දෙතැනෙක වේ, නං විභක්ති දෙතැනෙක වේ, ඝ කෙරෙන් පරවූ සහට "ඝපතො ස්මිං යො නං සං ස්සා" යි විකල්පයෙන් සා වේ, සාපරකල්හි "සංසාස්වෙකවචනෙසු ච" යි ඝහට අ වේ. සාපරකල්හි ඝහට "ඝෝ රස්සං" යි හ්‍රස්ව වේ, නුවූ පක්ෂයෙහි සහට "ඝතො නාදීනං" යි ආය වේ, සබ්බශබ්දාදීන් කෙරෙන් පරවූ නංහට "සබ්බතො නං" යනාදීන් සංය සානංය යනාදෙශයෝ වෙත්, පුබ්බස්සා යනාදිය වේ.— පුබ්බාය පුබ්බාහි පුබ්බාභි යනු තෘතීයාව මෙනි.— පුබ්බස්සා පුබ්බාය පුබ්බාසං පුබ්බාසානං යනු චතුර්ථිය මෙනි.

පුබ්බස්සං පුබ්බායං පුබ්බාසු යන තන්හි "ජිනවචන—පෙ—ස්මිං විභක්ති දෙතැනෙක වේ, සු විභක්ති එක් තැනෙක වේ, ඝ කෙරෙන් පරවූ ස්මිංහට

"ඝඨතො සමිං" යනාදීන් විකල්පයෙන් ය වේ, සං පරයෙහි "සංසා සානං" යනාදීන් සාගම වේ, සං පරකල්හි ඉසට "ඉතො ඥන්නං" යි ත්‍රිත්ව වේ, තුඹු පක්ෂයෙහි සමිං හට "ඝඨතො සමිං ඨං වා" යි යං වේ, පුබ්බස්ස පදා දිය වේ.

පුබ්බං පුබ්බානි යනාදීවූ හැමපදයෝම නපුංසකලිඟුයෙහි සබ්බශබ්දයා මෙනි.

පුබ්බො පුබ්බෙ - (භො) පුබ්බ පුබ්බා (භවන්තො) පුබ්බෙ - පුබ්බං පුබ්බෙ - පුබ්බෙන පුබ්බෙභි පුබ්බෙහි - එවං කරණෙ - පුබ්බස්ස පුබ්බෙසං පුබ්බෙසානං - පුබ්බා පුබ්බස්මා පුබ්බම්හා පුබ්බෙභි පුබ්බෙහි - පුබ්බස්ස පුබ්බෙසං පුබ්බෙසානං - පුබ්බෙ පුබ්බම්හි පුබ්බස්මිං පුබ්බෙසු.

ඉත්ථියං.

පුබ්බා පුබ්බා පුබ්බායො — (භො) පුබ්බෙ (භොති) පුබ්බා පුබ්බායො - පුබ්බං පුබ්බා පුබ්බායො — පුබ්බාය පුබ්බාභි පුබ්බාහි — එවං කරණෙ — පුබ්බස්සා පුබ්බාය පුබ්බාසං පුබ්බාසානං - පුබ්බාය පුබ්බාභි පුබ්බාහි — පුබ්බස්සා පුබ්බාය පුබ්බාසං පුබ්බාසානං - පුබ්බස්සං පුබ්බායං පුබ්බාසු.

නපුංසකෙ.

පුබ්බං පුබ්බානි — (භො) පුබ්බ පුබ්බා (භවන්තානි) පුබ්බානි — පුබ්බං පුබ්බානි — පුබ්බෙන පුබ්බෙභි පුබ්බෙහි - එවං කරණෙ පුබ්බස්ස පුබ්බෙසං පුබ්බෙසානං පුබ්බා පුබ්බස්මා පුබ්බම්හා පුබ්බෙභි පුබ්බෙහි — පුබ්බස්ස පුබ්බෙසං පුබ්බෙසානං පුබ්බෙ පුබ්බම්හි පුබ්බස්මිං පුබ්බෙසු.

පුබ්බශබ්දයෙන් ප්‍රවීය කියත්.

පර අපර ශබ්දයන්ගේ පදසිද්ධිය ද තුන් ලිඟුයෙහිම පුබ්බශබ්දයා මෙනි.

එකො එකෙ යන පුල්ලිඟු ස්වරූපය ද, එකා එකා එකායො යන ඉත්ථිලිඟු ස්වරූපය ද, එකං එකානි යන නපුංසකලිඟු ස්වරූපය ද, සබ්බශබ්දයන් තුන් දෙනා මෙනි — එකශබ්දයෙන් සඞ්ඛ්‍යාය අතුල්‍යය අනඤ්ඤ අසහාය යන අර්ථ සතරක් කියත්.

යො යෙ යන තන්හි "ජිනවචන-පෙ-සි විභක්ති එක් තැනෙක වේ, යො විභක්ති එක් තැනෙක වේ, සි හට "සො" යි ඔව සබ්බශබ්දාදීන්ගේ කාරෙන් පරවූ ප්‍රථමා යො විභක්තිහට "සබ්බනාමිකාරතෙ පඨමො" යි එකාරම යො යෙ යනු වේ — මේ යශබ්දයෙහි පටන් ලිඟුත්‍රයෙහිම ආමන්ත්‍රණයෙහි පද සිද්ධියක් නැත් — ඒ හැර සා යා යායො කියා ද, යං යානි කියා ද, තුන් ලිඟුයෙහිම සබ්බශබ්දයන් මෙන් පදසිද්ධිය කටයුතු.

යො යෙ - යං යෙ - යෙන යෙභි යෙහි එවං කරණෙ — යස්ස යෙසං යෙසානං - යම්හා යස්මා යෙභි යෙහි — යස්ස යෙසං යෙසානං — යම්හි යස්මිං යෙසු.

ඉත්ථියං.

යා යා යායො - යං යා යායො — යාය යාභි යාහි - එවං කරණෙ — යස්සා යාය යාසං යාසානං - යාය යාභි යාහි - යස්සා යාය යාසං යාසානං — යස්සං යායං යාසු.

## නපුංසකෙ.

යං යානි-යං යෙ යානි—යෙන යෙහි යෙභි-එවං කරණෙ—යස්ස යෙසං යෙසානං—යම්හා යස්මා යෙහි යෙභි—යස්ස යෙසං යෙසානං—යම්හි යස්මිං යෙසු.

### යශබ්දයෙන් යමක් යන අර්ථ කියත්.

සො නෙ තෙ යන තන්හි "ජිනවචන-පෙ-ත ශබ්ද ත කියා තුන් තැනෙක වේ, සි විභත්ති එක් තැනෙක වේ, යො විභත්ති දෙතැනෙක වේ, සි විභත්ති පරකල්හි ත ශබ්දයහට "එතතෙසං තො" යන සූත්‍රයෙන් සකාරාදෙශ වේ, සිහට "සො" සී ඔකාරාදෙශ වේ, සබ්බශබ්දාදීන්කෙරෙන් පරවූ ප්‍රථමා යොහට "සබ්බනාමකාරතෙ පඨමො" සී අවිකල්පයෙන් එකාරාදෙශ වේ, සබ්බාදීන්ගේ තශබ්දයහට "තස්ස වා නත්තං සබ්බත්ථ" යන සූත්‍රයෙන් විකල්පයෙන් නකාරාදෙශ වේ, සො නෙ තෙ යනු වේ.

නං තං නෙ තෙ යන තන්හි "ජිනවචන—පෙ—අං විභත්ති දෙතැනෙක වේ, යො විභත්ති දෙතැනෙක වේ, සබ්බාදීන්ගේ තශබ්දයහට "තස්ස වා නත්තං සබ්බත්ථ" යන සූත්‍රයෙන් විකල්පයෙන් නකාරාදෙශ වේ, විතියා යොහට "සබ්බයොනීනමාඒ" සී එකාරව නං තං නෙ තෙ යනුවේ.

නෙන තෙන නෙහි තෙහි නෙභි තෙභි යන තන්හි "ජිනවචන—පෙ—නා විභත්ති දෙතැනෙක වේ, හි විභත්ති සතර තැනෙක වේ, තශබ්දයහට "තස්ස වා" යනාදීන් විකල්පයෙන් න වේ, නාහට "අතො නෙන" සී එන වේ, හි පරකල්හි "සුහිස්වෙ" යනාදීන් එ වේ, නෙන තෙන යනාදිය වේ.—කරණකාරකයෙහිද මෙසේ මැයි.

නස්ස තස්ස නෙසං නෙසානං තෙසං තෙසානං යන තන්හි "ජිනවචන-පෙ-ස විභත්ති දෙතැනෙක වේ, නං විභත්ති සතර තැනෙක වේ, තශබ්දයහට "තස්ස වා" යනාදීන් විකල්පයෙන් නකාරාදෙශ වේ, ස පරකල්හි "සාගමො සෙ" සී අවිකල්පයෙන් සාගම වේ, නං පරකල්හි අකාරයහට "සබ්බනාමානං නම්හි ච" සී එවේ, නංහට "සබ්බතො නං සංසානං" සී සංය සානංය යනාදෙශයෝ වෙත්, නස්ස තස්ස යනාදිය වේ.

නම්හා තම්හා නස්මා තස්මා නෙහි තෙහි නෙභි තෙභි යන තන්හි "ජිනවචන-පෙ-ස්මා විභත්ති සතරතැනෙක හා හි විභත්ති සතරතැනෙක වේ, තශබ්දයහට "තස්ස වා" යනාදීන් විකල්පයෙන් න වේ, ස්මාහට ම්හා යනාදෙශහා හිහට විකල්පයෙන් භියනාදෙශ වේ, අහට හි පරකල්හි "සුහිස්වකාරෙ ඒ" සී එව නම්හා තම්හා යනාදියවේ.—ෂෂ්ඨියද චතුර්ථිය මෙනි.

නම්හි තම්හි නස්මිං තස්මිං නෙසු තෙසු යන තන්හි "ජිනවචන—පෙ—ස්මිං විභත්ති සතරතැනෙක වේ, සු විභත්ති දෙතැනෙක වේ, තහට "තස්ස වා" යනාදීන් විකල්පයෙන් නව ස්මිංහට ම්හිව සු පරකල්හි අහට එව නම්හි තම්හි යනාදිය වේ.

### ස්ත්‍රීලිඞ්ගයෙහි.

සා තා තායො තා තායො යන තන්හි ''ජිනවචන-පෙ සි විභක්ති එක් තැනෙක වේ, යො විභක්ති සතරතැනෙක වේ, සි පරකල්හි තශබ්දයහට ''එතතෙසං තො'' යි ස වූ සිහට ''සෙසතො'' යනාදින් ලොප් වේ, තශබ්දයහට ''තස්ස වා'' යනාදින් විකල්පයෙන් නවේ, ස්ත්‍රීලිඞ්ගයෙහිවූ ආනට ''ආ ඝො'' යි සංඥාවේ, ඝතොරෙන් පරවූ යොහට ''ඝ පතො ච'' යි විකල්පයෙන් ලොප් වේ, සා නා යනාදිය වේ.

නං තං නා නායො තා තායො යන තන්හි ''ජිනවචන-පෙ-අං විභක්ති දෙතැනෙක වේ, යො විභක්ති සතරතැනෙක වේ, තශබ්දයහට ''තස්ස වා'' යනාදින් විකල්පයෙන් නවේ, එකවචන විභක්ති පරකල්හි ඝහට ''ඝො රස්සං'' යි හ්‍රස්වවේ, අංහට ''අං මො'' යනාදින් නිග්ගහීතවේ, යොහට ''ඝපතො'' යනාදින් විකල්පයෙන් ලොප්වේ, නං තං යනාදිය වේ.

නාය තාය නාහි තාහි නාභි තාභි යන තන්හි ''ජිනවචන-පෙ-නා විභක්ති දෙතැනෙක වේ, හි විභක්ති සතරතැනෙක වේ, තාහට ''තස්ස වා'' යනාදින් විකල්පයෙන් නවේ, නාහට ''ඝතො නාදීනං'' යි ආය යනාදෙශවේ, නාය තාය යනාදියවේ.—කරණකාරකයද මෙසේ මැයි.

තිස්සාය තිස්සා තස්සා තාය තාසං තාසානං යන තන්හි ''ජිනවචන-පෙ-ස විභක්ති සතරතැනෙක වේ, නං විභක්ති දෙතැනෙක වේ, තශබ්දයා කෙරෙන් පරවූ ඉත්ථිපක්ඛයෙහි සහට ''ඝතො ස ස්සා ස්සාය'' යි ස්සාය යනාදෙශවේ, සහට ''ඝපතො ස්මිං සා සාංසා'' යි දෙතැනෙක්හි සා වේ, සා පරකල්හි ''සංසාස්වෙකවචනෙසු ච'' යි සාගමවේ, නුවූ පක්ෂයෙහි සහට ''ඝතො නාදීනං'' යි ආයවේ, සපරකල්හි තශබ්දයාගේ ආකාරයහට ''තස්සා වා'' යි දෙතැනෙක්හි ඉකාරවේ, නංහට ''සබ්බතො නං සංසානං'' යි සං සානං යනාදෙශව තිස්සාය යනාදිය වේ.—නාය තාය නාහි තාහි නාභි තාභි යනු තෘතීයාව මෙනි.—තිස්සාය තිස්සා තස්සා තාය තාසං තාසානං යනු චතුර්ථිය මෙනි.

තිස්සං තස්සං තායං තාසු යන තන්හි ''ජිනවචන-පෙ-ස්මිං විභක්ති තුන්තැනෙක වේ, සු විභක්ති එක්තැනෙක වේ. ඝතොරෙන් පරවූ ස්මිංහට ''ඝපතො ස්මිං'' යනාදින් දෙතැනෙක්හි සං යනාදෙශ වේ, සං පරකල්හි තශබ්දයාගේ ආකාරයහට ''තස්සා වා'' යි එක්තැනෙක්හි ඉවේ, නුවූ පක්ෂයෙහි ස්මිංහට ''ඝපතො ස්මිං යං වා'' යි යංව තිස්සං යනාදිය වේ.

### නපුංසකලිඞ්ගයෙහි.

තං තං තානි තානි යන තන්හි ''ජිනවචන-පෙ-සි විභක්ති දෙතැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, තශබ්දයහට ''තස්ස වා'' යනාදින් විකල්පයෙන් නවේ, සිහට ''සිං'' යි අංවේ, යොහට ''අතො නිච්චං'' යි අවිකල්පයෙන් නිවේ, නිපරකල්හි ''යොසු කතනිකාර ලොපෙසු දීඝං'' යි දීර්ඝව නං තං යනාදියවේ.—ඉතිරි සියලු පදයෝම නපුංසකලිඞ්ගයෙහි පුංලිඞ්ගශබ්දයා මෙනි.

සො නෙ තෙ-නං තං නෙ තෙ-නෙන තෙන නෙහි තෙහී නෙභි තෙභි-එවං කරණෙ-නස්ස තස්ස නෙසං නෙසානං තෙසං තෙසානං-නම්හා තම්හා නස්මා තස්මා නෙහි තෙහි නෙභි තෙභි—නස්ස තස්ස නෙසං නෙසානං තෙසං තෙසානං-නම්හි තම්හි නස්මිං තස්මිං නෙසු තෙසු.

ඉත්ථියං.

සා තා නායො තා තායො—නං තං නා නායො තා තායො—නාය තාය නාහි තාහි නාභි තාභි—එවං කරණෙ—තිස්සාය තිස්සා තස්සා තාය තාසං තාසානං—නාය තාය නාහි තාහි නාභි තාභි—තිස්සාය තිස්සා තස්සා තාය තාසං තාසානං-තිස්සං තස්සං තායං තාසු.

නපුංසකෙ.

නං තං නානි තානි—නං තං නෙ නානි තෙ තානි—නෙන තෙන නෙහි තෙහි නෙභි තෙභි—එවං කරණෙ—නස්ස තස්ස නෙසං නෙසානං තෙසං තෙසානං—නම්හා තම්හා නස්මා තස්මා නෙහි තෙහි නෙභි තෙභි—නස්ස තස්ස නෙසං නෙසානං තෙසං තෙසානං—නම්හි තම්හි නස්මිං තස්මිං නෙසු තෙසු.

තශබ්දයෙන් ශෙෂ යන අර්ථ කියත්.

එසො එතෙ යන තන්හි "ජිනවචන-පෙ—සි විභක්ති එක්තැනෙක වේ, යො විභක්ති එක්තැනෙකවේ, සි පරකල්හි එතශබ්දයාගේ තකාරයහට "එතතෙසං තො" යී සකාරාදෙශ වේ, සිහට "සො" යී ඔවේ, සබ්බශබ්ද දින්කෙරෙන් පරවූ ප්‍රථමා යොහට "සබ්බනාමකාරතෙ පඨමො" යී එකාරව එසො එතෙ යනු වේ.

එතං එතෙ යන තන්හි "ජිනවචන-පෙ-අං විභක්ති එක්තැනෙක වේ, යො විභක්ති එක්තැනෙක වේ, විනියා යොහට "සබ්බයොනීනං" යනාදීන් එව එතං එතෙ යනු වේ.—එතෙන එතෙහි එතෙභි-එවං කරණෙ.

එතස්ස එතෙසං එතෙසානං යන තන්හි "ජිනවචන—පෙ—ස විභක්ති එක් තැනෙකවේ, යො විභක්ති දෙතැනෙක වේ, ස විභක්ති පරකල්හි "සාගමො සෙ" යී සාගමවේ, නං පරකල්හි එතශබ්දනතයහට "සබ්බනාමානං නංම්හි ච" යී එකාරවේ, නංහට "සබ්බතො" යනාදීන් සං ය සානං ය යනාදෙශයෝ වෙත්, එතස්ස යනාදිය වේ.

එතම්හා එතස්මා එතෙහි එතෙභි යන තන්හි "ජිනවචන—පෙ—ස්මා විභක්ති දෙතැනෙක වේ, හි විභක්ති දෙතැනෙක වේ, හි පරකල්හි අකාර යත්ව "සුහිස්වකාරෙ එ" යී එවේ, ස්මාහට "ස්මාහිස්මිංනං" යනාදීන් මහාව හිහට විකල්පයෙන් භිවේ, එතම්හා යනාදිය වේ.—එතස්ස එතෙසං එතෙසානං යනු චතුර්ථිය මෙනි

එතම්හි එතස්මිං එතෙසු යන තන්හි "ජිනවචන—පෙ—ස්මිං විභක්ති දෙතැනෙක වේ, සු විභක්ති එක්තැනෙක වේ, ස්මිංහට ම්හිවේ, සු පරකල්හි අකාරයහට "සුහිස්ව" යනාදීන් එව එතම්හි යනාදිය වේ.

ඉත්ථිලිඞ්ගයෙහි.

එසා එතා එතායො යන තන්හි "ජිනවචන-පෙ සි විභත්ති එක්තැනෙක වේ, යො විභත්ති දෙතැනෙක වේ, සි පරකල්හි එතශබ්දයාගේ තකාරය හට "එතතෙසං" යනාදීන් සකාරව සිහට "සෙසතො" යනාදීන් ලොප් වේ, ආකාරෙන් පරවූ යොහට "ආපතො ච" යනාදීන් විකල්පයෙන් ලොප් වේ, එසා එතා එතායො යනු වේ.

එතං එතා එතායො යන තන්හි "ජිනවචන—පෙ—අං විභත්ති එක්තැනෙක වේ, යො විභත්ති දෙතැනෙක වේ, එකවචන විභත්ති පරකල්හි ඝහට "ඝො රස්සං" යී හ්‍රස්වවේ, අං හට "අම්මො" යනාදීන් නිග්ගහීතවේ, * යොහට "ඝපතො" යනාදීන් විකල්පයෙන් ලොප්වේ, එතං යනාදිය වේ.—එතාය එතාහි එතාභි-එවං කරණෙ.

එතිස්සාය එතිස්සා එතාය එතාසං එතාසානං යන තන්හි "ජිනවචන-පෙ-ස විභත්ති තුන්තැනෙක වේ, නං විභත්ති දෙතැනෙක වේ, එතාශබ්දයා කෙරෙන් පරවූ සහට "තතො ස ස්ස ස්සාය" යී එක්තැනෙක්හි ස්සායවේ, ඝකෙරෙන් පරවූ සහට "ඝපතො සස්මිං සානං සංසා" යී විකල්පයෙන් සාවේ. සාපරකල්හි "සංසාස්වෙකවචනෙසු ච" යී සාගමවේ, සායනාදෙශයන් පරකල්හි එතාශබ්දයාගේ ආකාරයහට "එතිමාසමි" යී දෙතැනෙක්හි ඉකාරවේ, තුබු පක්ෂයෙහි සහට "ඝතො නාදීනං" යී ආයවේ, නංහට "සබ්බතො නං" යනාදීන් සාය සානංව යනාදෙශයෝ වෙත්, එතිස්සාය යනාදිය වේ—එතාය එතාහි එතාභි යන පඤ්චමියෙහි ආයයනාදෙශහා භියනාදෙශ වේ—එතිස්සාය එතිස්සා එතාය එතාසං එතාසානං යනු චතුර්ථිය මෙනි.

එතිස්සං එතාස්සං එතායං එතාසු යන තන්හි "ජිනවචන—පෙ—ස්මිං විභත්ති තුන්තැනෙක වේ, සු විභත්ති එක්තැනෙක වේ, ඝකෙරෙන් පරවූ ස්මිංහට "ඝපතො ස්මිං" යනාදීන් දෙතැනෙක්හි සංවේ; සංපරකල්හි එතාශබ්දයාගේ ආකාරයහට "එතිමාසමි" යී එක්තැනෙක්හි ඉවේ, තුබු පක්ෂයෙහි සංපරකල්හි ඝහට "ඝො රස්සං" යී හ්‍රස්වවේ, සංයනාදෙශයන් පරකල්හි "සංසාස්වෙක" යනාදීන් සකාරාගම වේ, තුබු පක්ෂයෙහි ස්මිංහට "ඝපතො ස්මිං යං වා" යී යංව එතිස්සං යනාදිය වේ.

නපුංසකලිඞ්ගයෙහි.

එතං එතානි යන තන්හි "ජිනවචන-පෙ—සි විභත්ති එක්තැනෙක වේ, යො විභත්ති එක්තැනෙක වේ, සි හට "සිං" යන සූත්‍රයෙන් අංයනාදෙශ වේ, යොහට "අතො නිච්චං" යී නිවේ, එතං එතානි යනුවේ.

එතං එතෙ එතානි යන තන්හි "ජිනවචන-පෙ-අං විභත්ති එක්තැනෙක වේ, යො විභත්ති දෙතැනෙක වේ, යොහට "අතො නිච්චං" යී අවිකල්පයෙන් නිවේ, නිහට "සබ්බයොනීනං" යනාදීන් විකල්පයෙන් එවේ,

---

* මෙය මෙසේ නොවිය හැකියි - සරලොපාදීන් පූර්වස්වර ලොපි.

එතං යනාදිය වේ.....එතෙන එතෙහි එතෙභි යනාදි හැම නපුංසකලිඞ්ගයෙහි සබ්බශබ්දයා මෙනි.

එසො එතෙ–එතං එතෙ–එතෙන එතෙහි එතෙභි–එවං කරණෙ–එතස්ස එතෙසං එතෙසානං—එතම්හා එතස්මා එතෙහි එතෙභි—එතස්ස එතෙසං එතෙසානං–එතම්හි එතස්මිං–එතෙසු.

ඉත්ථියං.

එසා එතා එතායො—එතං එතා එතායො–එතාය එතාහි එතාභි එවං කරණෙ–එතිස්සාය එතිස්සා එතාය එතාසං එතාසානං–එතාය එතාහි එතාභි–එතිස්සාය එතිස්සා එතාය එතාසං එතාසානං–එතිස්සං එතස්සං එතායං එතාසු.

නපුංසකෙ.

එතං එතානි–එතං එතෙ එතානි–එතෙන එතෙහි එතෙභි–එවං කරණෙ–එතස්ස එතෙසං එතෙසානං—එතම්හා එතස්මා එතෙහි එතෙභි––එතස්ස එතෙසං එතෙසානං–එතම්හි එතස්මිං එතෙසු.

එතශබ්දයෙන් * මේය යන අර්ථ කියත්.

අයං ඉමෙ යන තන්හි "ජිනවචන–පෙ–සි විභක්ති එක්තැනෙක වේ. යො විභක්ති එක්තැනෙක වේ, සි පරකල්හි නපුංසකලිඞ්ග නොවන්නාවූ ඉමශබ්දයහට "අනපුංසකස්සායං සිම්හි" යි අයං යනාදෙශ වේ, ප්‍රථම යොහට "සබ්බනාමකාරතෙ පඨමො" යි එ වේ, සිහට "සෙසතො" යනාදීන් ලොප්ව අයං ඉමෙ යනුවේ.

ඉමං ඉමෙ යන තන්හි "ජිනවචන–පෙ—යොහට "සබ්බයොනීනං" යනාදීන් එවේ, පූර්වස්වරලොප්ව ඉමං ඉමෙ යනුවේ.

අනෙන ඉමිනා එහි එභි ඉමෙහි ඉමෙභි යන තන්හි "ජිනවචන–පෙ–නා විභක්ති දෙතැනෙක වේ, හි විභක්ති සතරතැනෙක වේ, නා පරකල්හි ඉම ශබ්දයහට "අනිමිනාමිනි ච" යි අනයනාදෙශහා ක්‍රමයෙන් ඉමියනාදෙශ වේ, නාහට "අතො නෙන" යි විකල්පයෙන් එන වේ, හි පරකල්හි ඉම ශබ්දයහට "සබ්බස්සිමස්සෙ වා" යි විකල්පයෙන් ප්‍රත්‍යයින් දෙතැනෙක්හි එවේ, තුබූ දෙතැන්හි ඒ පරකල්හි ඉමශබ්දයාගේ අන්ත්‍යඅහට "සුහිස්වකාරො ඒ" යි එව අනෙන යනාදිය වේ.....එවං කරණෙ.

අස්ස ඉමස්ස එසං එසානං ඉමෙසං ඉමෙසානං යන තන්හි "ජිනවචන—පෙ–ස විභක්ති දෙතැනෙක වේ, නං විභක්ති සතරතැනෙක වේ, ස පරකල්හි ඉමශබ්දයහට "ඉමස්සානිත්ථියං ච" යන සූත්‍රයෙන් විකල්පයෙන් අවේ, ස පරකල්හි "සාගමො සෙ" යි සාගමවේ, නං පරකල්හි ඉමශබ්දයට "සබ්බස්සිමස්සෙ වා" යි ප්‍රත්‍යයින් දෙතැනෙක්හි එවේ, තුබූ පක්ෂයෙහි ඉමශබ්දයාගේ අන්ත්‍යයහට "සබ්බනාමීනං නම්හි ච" යි එවේ, නංහට "සබ්බතො නං සංසානං" යි සෙදෙන සෙදෙන සේ සං සානං යනාදෙශයෝ වෙත්, අස්ස ඉමස්ස යනාදිය වේ.

---

* එතශබ්දයෙන් මෙතල (අර) යන අර්ථයි.

අස්මා ඉමම්හා ඉමස්මා එහි එහි ඉමෙහි ඉමෙහි යන තන්හි "ජිනවචන—පෙ-ස්මා විභත්ති තුන්තැනෙක වේ, හි විභත්ති සතරතැනෙක වේ, ස්මා පරකල්හි ඉමශබ්දයහට "ඉමසද්දස්ස ච" යී එක්තැනෙක්හි අත්වවේ, එක්තැනෙක්හි ස්මාහට ම්හාවේ, හි පරකල්හි ඉමශබ්දයහට "සබ්බස්සිමස්සෙ වා" යී පසතින් දෙතැනෙක්හි එවේ, තුබූ දෙතැන්හි හි පරකල්හි ඉමශබ්දාන්තඅහට "සුහිස්වකාරෙ එ" යී එව අස්මා යනාදියවේ — අස්ස ඉමස්ස එසං එසානං ඉමෙසං ඉමෙසානං යනු චතුර්ථීය මෙනි.

අස්මිං ඉමම්හි ඉමස්මිං එසු ඉමෙසු යන තන්හි "ජිනවචන—පෙ—ස්මිං විභත්ති තුන්තැනෙක වේ, සු විභත්ති දෙතැනෙක වේ, ස්මිං පරකල්හි ඉමශබ්දයහට "ඉමසද්දස්ස ච" යී එක්තැනෙක අත්වවේ, එක්පක්ෂයෙක්හි ස්මිංහට ම්හිවේ, සු පරකල්හි ඉමශබ්දයහට "සබ්බස්සිමස්සෙ වා" යී විකල්පයෙන් එවේ, තුබූ පක්ෂයෙහි සු පරකල්හි අහට "සුහිස්වෙ" යනාදින් එව අස්මිං යනාදිය වේ.

ස්ත්‍රීලිඞ්ගයෙහි.

අයං ඉමා ඉමායො යන තන්හි "ජිනවචන-පෙ-සි විභත්ති එක්තැනෙක වේ, යො විභත්ති දෙතැනෙක වේ, සි පරකල්හි ඉමා ශබ්දයාහට "අනපුංසකස්සායං සිම්හි" යී අයං වේ, සිහට "සෙසතො" යනාදින් ලොප්වේ, යොහට "ඝපතො" යනාදින් විකල්පයෙන් ලොප්ව අයං ඉමා යනාදියවේ.

ඉමං ඉමා ඉමායො යනු ස්ත්‍රීලිඞ්ගයෙහි එතාශබ්දයා මෙනි.

ඉමාය ඉමාහි ඉමාභි යන තන්හි නාහට "ඝතො නාදීනං" යී ආය යනාදේශව ඉමාය ඉමාහි ඉමාභි යනුවේ — එව කරණේ.

අස්සාය අස්සා ඉමිස්සාය ඉමිස්සා ඉමාය ඉමාසං ඉමාසානං යන තන්හි "ජිනවචන-පෙ-ස විභත්ති පස්තැනෙක වේ, නං විභත්ති දෙතැනෙකවේ, ඉමශබ්දයාකෙරෙන් පරවූ සහට "ඝතො සස්සාය" යී විකල්පයෙන් ස්සාය යනාදෙශයෝ දෙතැනෙක වෙත්, තුබූ දෙතැන්හි "ඝපතො ස්මිංසානං සංසා" යී සායනාදෙශයෝ වෙත්. සා පරකල්හි ඉමාහට "ඉමසද්දස්ස ච" යී පසතින් දෙතැනෙක්හි අත්වවේ, තුබූ දෙතැන්හි සායනාදෙශයන් පරකල්හි ඉමාශබ්දාන්තයාහට "එතිමාසමි" යී ඉකාරාදෙශ වේ, සා යනාදෙශයන් පරකල්හි "සංසා" යනාදින් සාගමවේ, තුබූ පක්ෂයෙහි සහට "ඝතො නාදීනං" යී ආයවේ, නංහට "ඝපතො නං" යනාදින් සංය සානංය යනාදෙශයෝ වෙති, අස්සාය යනාදිය වේ — ඉමාය ඉමාහි ඉමාභි යන පඤ්චමියද තෘතීයාව මෙනි — අස්සාය අස්සා ඉමිස්සාය ඉමිස්සා ඉමාය ඉමාසං ඉමාසානං යනු චතුර්ථීය මෙනි.

අස්සං ඉමිස්සං ඉමායං ඉමාසු යන තන්හි "ජිනවචන-පෙ-ස්මිං විභත්ති තුන්තැනෙක වේ, සු විභත්ති එක්තැනෙක වේ, ස්මිංහට "ඝපතො ස්මිංසානං සංසා" යී දෙතැනෙක්හි පසතින් සංවේ, සංයනාදෙශයා පරකල්හි ඉමාශබ්දයහට "ඉමසද්දස්ස ච" යී විකල්පයෙන් අත්වවේ, තුබූ පක්ෂයෙහි

ස පරකල්හි ඉමශබ්දයාගේ අන්තඅාහට ''එතිමාසමි'' යි ඉවෙ, සං පර කල්හි ''සංසාස්වෙකවචනෙසු ච'' යි සකාරාගම වේ, තුබු දෙපක්‍ෂයෙහි ස්මිංහට ''සපනො සමිං යාං වා'' යි යංව අස්සං යනාදිය වෙ.

### නපුංසකලිඞ්ගයෙහි.

ඉදං ඉමං ඉමෙ ඉමානි යන තන්හි ''ජිනවචන-පෙ-සි විභත්ති දෙකැනෙක වේ, යො විභත්ති දෙකැනෙක වේ, සි පරකල්හි එම සිහා සමග ඉමශබ්දය හට ''ඉමස්සිදමංසිසු නපුංසකෙ'' යි විකල්පයෙන් ඉදං වේ, තුබු පක්‍ෂයෙහි සිහට අං වේ, යොහට ''සබ්බනාමකාරතෙ පඨමො'' යි විකල්පයෙන් එවේ, තුබු පක්‍ෂයෙහි යොහට ''අතො නිච්චං'' යි නිවේ, නි පර කල්හි ''යොසු කත'' යනාදින් දීඝව ඉදං යනාදිය වේ.

ඉදං ඉමං ඉමෙ ඉමානි යන විභත්ත්‍යාවද ප්‍රථමාව මෙසේ, වෙනසනම් යොහට අවිකල්පයෙන් නිහා නිහට ''සබ්බයොනීනමාඒ'' යනාදින් විකල්පයෙන් එ වීමයි. තෘතියාව පටන් සෙසස පුල්ලිඞ්ගය මෙනි.

අයං ඉමෙ-ඉමං ඉමෙ-අනෙන ඉමිනා එහි එභි ඉමෙහි ඉමෙභි-එවං කරණේ-අස්ස ඉමස්ස එසං එසානං ඉමෙසං ඉමෙසානං-අස්මා ඉමස්මා ඉමම්හා එහි එභි ඉමෙහි ඉමෙභි-අස්ස ඉමස්ස එසං එසානං ඉමෙසං ඉමෙසානං-අස්මිං ඉමම්හි ඉමස්මිං එසු ඉමෙසු.

### ඉත්ථියං.

අයං ඉමා ඉමායො-ඉමං ඉමා ඉමායො-ඉමාය ඉමාහි ඉමාභි-එවං කරණේ-අස්සාය අස්සා ඉමිස්සාය ඉමිස්සා ඉමාය ඉමාසං ඉමාසානං-ඉමාය ඉමාහි ඉමාභි-අස්සාය අස්සා ඉමිස්සාය ඉමිස්සා ඉමාය ඉමාසං ඉමාසානං-අස්සං ඉමිස්සං ඉමායං ඉමාසු.

### නපුංසකෙ.

ඉදං ඉමං ඉමෙ ඉමානි—ඉදං ඉමං ඉමෙ ඉමානි—අනෙන ඉමිනා එහි එභි ඉමෙහි ඉමෙභි-එවං කරණේ—අස්ස ඉමස්ස එසං එසානං ඉමෙසං ඉමෙසානං—අස්මා ඉමස්මා ඉමම්හා එහි එභි ඉමෙහි ඉමෙභි—අස්ස ඉමස්ස එසං එසානං ඉමෙසං ඉමෙසානං—අස්මිං ඉමස්මිං ඉමම්හි එසු ඉමෙසු.

අසු අමුකො අමූ අමුයො යන තන්හි ''ජිනවචන—පෙ—සි විභත්ති දෙකැනෙක වේ, යො විභත්ති දෙකැනෙක වේ, සි පරකල්හි අමුශබ්දයාගේ මකාර යහට ''අමුස්ස මො සං'' යි විකල්පයෙන් සකාරවේ, සිහට ''සෙසතො'' යනාදින් විකල්පයෙන් ලොප් වේ, තුබු පක්‍ෂයෙහි සි පරකල්හි අමුශබ්දයා කෙරෙන් පරව ''සබ්බතො කො'' යි කකාරාගමවේ, සිහට ''සො'' යි ඔවේ, මකාරස්ථ උකාරපත වේ, මකාරහල් වේ, උහට ''ඉවණ්ණුවණ්ණා'' දින් ලස ඇවේ, ලසංඥයාකෙරෙන් පරවූ යොහට ''ඤපඤතො'' යනාදින් විකල්පයෙන් ලොප්වේ, එම පක්‍ෂයෙහි ''යොසු කත'' යනාදින් දීඝව අසු අමුකො අමූ අමුයො යනුවේ.

අමුං අමූ අමුයො යන තන්හි "ජිනවචන—පෙ—අං විභත්ති එක්තැනෙක වේ, යො විභත්ති දෙතැනෙක වේ, ලසංඥයාකෙරෙන් පරවූ අං විභත්ති "අමෙම්මා" යනාදින් නිග්ගහීතබවට පැමිණේ, යොහට "ඝපතො" යනාදින් විකල්පයෙන් ලොප්වේ, එම පක්ෂයෙහි "යොසු කත" යනාදින් දීඝීව අමුං යනාදිය වේ.

අමුනා අමූහි අමූභි යනු තෘතීයායි, මෙහි හි විභත්තිහට භියනාදෙශහා පූර්වස්වරයහට දීඝීයි, කරණකාරකයෙහිද මෙසේමැයි.

අමුනො අමුස්ස අමූසං අමූසානං යන තන්හි "ජිනවචන-පෙ-ස විභත්ති දෙතැනෙක වේ, නං විභත්ති දෙතැනෙක වේ, ල සංඥයාකෙරෙන් පරවූ සහට "ඝඛලතො සස්ස නො වා" යී විකල්පයෙන් නො වේ, තුබූ පක්ෂයෙහි සපරකල්හි "සාගමො සෙ" යී සකාරාගම වේ, නං පරකල්හි "සුනංහි" යනාදින් දීඝී වේ, නංහට "සබ්බතොනං" යනාදින් සංය සානංය යනාදෙශයෝ වෙත්, අමුනො යනාදිය වේ.

අමුනා අමුම්හා අමුස්මා අමූහි අමූභි යන තන්හි "ජිනවචන—පෙ—ස්මා විභත්ති තුන්තැනෙක වේ, හි විභත්ති දෙතැනෙක වේ, ස්මාහට "අම්හා තුම්හ" යනාදී සූත්‍රයෙහි ආදිග්‍රහණයෙන් එක්තැනෙක්හි නාවත්වේ, හි පරකල්හි "සුනංහි" යනාදින් දීඝීව අමුනා යනාදිය වේ... අමුනො අමූස්ස අමූසං අමූසානං යනු චතුර්ථීය මෙහි... අමුම්හි අමුස්මිං අමූසු යන තන්හි මහිව සු පරකල්හි දීඝීව අමුම්හි යනාදිය වේ.

සත්‍රීලිඟයෙහි.

අසු අමූ අමුයො යන තන්හි "ජිනවචන-පෙ-සි විභත්ති එක්තැනෙකවේ, යො විභත්ති දෙතැනෙක වේ, සි පරකල්හි අමුශබ්දයාගේ මකාරයහට "අමුස්ස මො සං" යී ස වේ, සිහට "සෙසතො" යනාදින් ලොප්වේ, මකාරසථ උකාරපහ වේ, මකාරහල්වේ, සත්‍රීලිඟයෙහිවූ උවර්ණයහට "තෙ ඉත්ථිඛ්‍යා" යනාදින් පසංඥවේ, පසංඥයාකෙරෙන් පරවූ යොහට "ඝප තො" යනාදින් විකල්පයෙන් ලොප්වේ, එම පක්ෂයෙහි පසංඥයහට "යොසු කත" යනාදින් දීඝීවේ, අසු අමූ යනාදිය වේ.

අමුං අමූ අමුයො යන තන්හි "ජිනවචන—පෙ—පසංඥයාකෙරෙන් පරවූ අංහට "අමෙම්මා" යනාදින් නිග්ගහීත වේ, යොහට විකල්පයෙන් ලොප් වේ, දීඝීව අමුං යනාදිය වේ.

අමුයා අමූහි අමූභි යන තන්හි "ජිනවචන-පෙ-පසංඥයාකෙරෙන් පරවූ නාහට "පතො යා" යී යා වේ, හි පරකල්හි දීඝීව අමුයා යනාදිය වේ... කරණකාරකයද මෙසේමැයි.

අමුස්සා අමුයා අමූසං අමූසානං යන තන්හි "ජිනවචන—පෙ—ස විභත්ති දෙතැනෙක වේ, නං විභත්ති දෙතැනෙක වේ, පසංඥයාකෙරෙන් පරවූ සහට "ඝපතො ස්මිංසානං සංසා" යී විකල්පයෙන් සා වේ, සා පරකල්හි

"සංසාස්වෙකවචනෙසු ච" සී සකාරාගම වේ, තුබූ පක්‍ෂයෙහි සහට "ඝපතො යා" සී යා වේ, නං පරකල්හි උහට "සුනංහි" යනාදීන් දීඝ වේ, නංහට "සබ්බතො නං" යනාදීන් සංය සානංය යනාදෙශව අමුස්සා යනාදිය වේ— අමුයා අමූහි අමූහි යනු තෘතීයාව මෙනි, අමුස්සා අමුයා අමූසං අමූසානං යනු චතුර්ථිය මෙනි.

අමුස්සං අමුයං අමූසු යන තන්හි "ජිනවචන-පෙ-ස්මිං විභක්ති දෙතැනෙක වේ, සු විභක්ති එක්තැනෙක වේ, පසංඥාකෙරෙන් පරවූ ස්මිංහට "ඝපතො ස්මිං" යනාදීන් විකල්පයෙන් සං වේ, සංපරකල්හි "සංසාස්වෙක" යනාදීන් සාගමවේ, තුබූ පක්‍ෂයෙහි ස්මිංහට "ඝපතො ස්මිං යං වා" සී යංවේ, සු පරකල්හි "සුනංහිසු ච" සී දීඝව අමුස්සං යනාදිය වේ.

නපුංසකලිඞ්ගයෙහි.

අදුං අමූ අමූනි යන තන්හි "ජිනවචන—පෙ—සිවිභක්ති එක්තැනෙක වේ, යො විභක්ති දෙතැනෙක වේ, සි විභක්ති පරකල්හි සිහා සමග අමු ශබ්දයහට "අමුස්සාදුං" සී අදුං වේ, යොහට "ඝපතො" යනාදීන් විකල්පයෙන් ලොප්වේ, තුබූ පක්‍ෂයෙහි යොහට "යොනංනි නපුංසකෙහි" සී නි වේ, කරණලද ලොප්ඇති යො විභක්තිහා නියනාදෙශයා පරකල්හී උකාරයහට "යොසු ඣනා" යනාදීන් දීඝව අදුං යනාදිය වේ— අදුං අමූ අමූනි යන ද්විතීයාවද ප්‍රථමාවමෙනි, අමුනා අමූහි අමූහි යනාදිය පුලිඞ්ග ශබ්දයා මෙනි.

අසු අමුකො අමූ අමුයො—අමුං අමූ අමුයො—අමුනා අමූහි අමූහි—එවං කරණේ—අමුනො අමුස්ස අමූසං අමූසානං—අමුනා අමුම්හා අමුස්මා අමූහි අමූහි—අමුනො අමුස්ස අමූසං අමූසානං—අමුම්හි අමුස්මිං අමූසු.

ඉත්ථියං.

අසු අමූ අමුයො—අමුං අමූ අමුයො—අමුයා අමූහි අමූහි—එවං කරණේ—අමුස්සා අමුයා අමූසං අමූසානං—අමුයා අමූහි අමූහි—අමුස්සා අමුයා අමූසං අමූසානං—අමුස්සං අමුයං අමූසු.

නපුංසකෙ.

අදුං අමූ අමූනි—අදුං අමූ අමූනි—අමුනා අමූහි අමූහි—එවං කරණේ—අමුනො අමුස්ස අමූසං අමූසානං—අමුනා අමුම්හා අමුස්මා අමූහි අමූහි—අමුනො අමුස්ස අමූසං අමූසානං—අමුම්හි අමුස්මිං අමූසු.

අමුශබ්දයෙන්ද ඉමශබ්දයෙන්ද මෙය යන අර්ථ කියත්.

කො කෙ යන තන්හි "ජිනවචන-පෙ-කිංශබ්ද කිං කියා දෙතැනෙකවේ, ඔහුකෙරෙන් පරව ස විභක්ති එක්තැනෙක වේ, යො විභක්ති එක්තැනෙක වේ, විභක්ති පරකල්හි "කෙසෙසු ච" සී කිංශබ්දයහට කවේ, සිහට "සො" සී ඔවේ, ප්‍රථමායොහට "සබ්බනාමකාරතෙ පඨමො" සී එවේ,

කො කෙ යනු වේ.---- ලිඞ්ගත්‍රයෙහිවූ කිංශබ්දයාගේ හැම පදවලටම පළමු කොට "සෙසෙසු ච" යන සූත්‍රයෙන් කයනාදෙශ කොට ඉක්බිති සියලු කාර්‍ය්‍ය කටයුතු.---- මේ කිංශබ්දය ලිඞ්ගත්‍රයෙහිම සබ්බශබ්දයා මෙනි,

කො කෙ-කං කෙ-කෙන කෙහි කෙභි-එවං කරණෙ-කස්ස කෙසං කෙසානං-කම්හා කස්මා කෙහි කෙභි-කස්ස කෙසං කෙසානං-කම්හි කස්මිං කෙසු.

ඉත්ථියං.

කා කායො - කං කා කායො-කාය කාහි කාභි-එවං කරණෙ-කස්සා කාය කාසං කාසානං—කාය කාහි කාභි—කස්සා කාය කාසං කාසානං—කස්සං කායං කාසු.

නපුංසකෙ;

කං කානි-කං කෙ කානි-කෙන කෙහි කෙභි-එවං කරණෙ-කස්ස කෙසං කෙසානං-කම්හා කස්මා කෙහි කෙභි-කස්ස කෙසං කෙසානං-කම්හි කස්මිං කෙසු.

කිංශබ්දයෙන් කිමෙක යන අර්ථ කියත්.

ත්වං තුවං අහං තුම්හෙ මයං අම්හෙ යන තන්හි "ජිනවචන—පෙ—සි විභක්ති තුන්තැනෙක වේ, යො විභක්ති තුන්තැනෙක වේ, සි පරකල්හි එම සිහා සමග තුම්හ අම්හශබ්දයන්ට "ත්වමහං සිම්හි ච" යී ත්වං අහං වේ, තුබූ පක්ෂයෙහි තුම්හශබ්දයහටද සිහා සමග මෙම සූත්‍රයෙහි චග්‍රහණයෙන් තුවං වේ, තුම්හශබ්දයාකෙරෙන් පරවූ යොහට "සබ්බනාමකාරතෙ පඨමො" යී එ වේ, යොහා සමග අම්හශබ්දයහට "මයං යොම්හි පඨමෙ" යී මයං වේ, ස්වරලොප්ප්‍රකෘති ආදී කාර්‍ය්‍යව ත්වං තුවං අහං යනාදිය වේ.

තං තවං ත්වං තුවං මං මමං තුම්හාකං තුම්හෙ අම්හාකං අම්හෙ යන තන්හි "ජිනවචන-පෙ-අං විභක්ති සතැනෙක වේ, යො විභක්ති සතරතැනෙක වේ, අං පරකල්හි එම අංහා සමග තුම්හඅම්හශබ්දයන්ට "තංමම්මම්හි" යී තං යනාදෙශහා මං යනාදෙශ වේ, එසේම අංපරකල්හි එම අංවිභක්ති සහිතවූ තුම්හඅම්හශබ්දයන්ට "තවංමමඤ්ච නවා" යී තවං යනාදෙශහා මමං යනාදෙශ වේ, තුබූ පක්ෂයෙහි අංපරකල්හි විභක්ති සහිතවූ තුම්හඅම්හශබ්දයන්ට "තුම්හස්ස තුවං ත්වමම්හි" යී තුවං යනාදෙශහා ත්වං යනාදෙශ වේ, විනියා යොහට "වාය්වප්පඨමො" යී විකල්පයෙන් දෙතැනෙක ආකං යනාදෙශ වේ, තුබූ දෙපක්ෂයෙහි යොහට "සබ්බයොනී" යනාදීන් එව තං තවං යනාදිය වේ.

ත්වයා තයා මයා තුම්හෙහි තුම්හෙභි අම්හෙහි අම්හෙභි යන තන්හි "ජිනවචන—පෙ-නා විභක්ති තුන්තැනෙක වේ, හි විභක්ති සතරතැනෙක වේ, නා පරකල්හි එම විභක්ති සහිතවූ තුම්හඅම්හශබ්දයන්ට "නාම්හි තයාමයා වා" යී තයා යනාදෙශ දෙතැනෙකහා මයා යනාදෙශ දෙතැනෙක වේ, එක් පක්ෂයෙක්හි තයා යනාදෙශයාගේ තකාරයහට "තයාතයීනං තකාරො ත්වත්තං වා" යී ත්වවේ, හි පරකල්හි අකාරයහට "සුහිස්ව" යනාදීන් එහා හිහට භිව ත්වයා තයා මයා යනාදිය වේ.---- එවං කරණෙ.

තව තුය්හං තුම්හං මම මය්හං අම්හං මමං තුම්හාකං අම්හාකං යන තන්හි "ජිනවචන-පෙ-ස විභත්ති සත් තැනෙක වේ, නං විභත්ති දෙතැනෙක වේ, ස පරකල්හි එම විභත්ති සහිතවූ තුම්හඅම්හශබ්දයන්ට "තවමම සෙ" යී විකල්පයෙන් තව හා මම යනාදෙශ වේ, එසේම විභත්ති සහිතවූ තුම්හඅම්හ ශබ්දයන්ට "තුය්හංමය්හං ච" යන සූත්‍රයෙන් තුය්හං යනාදෙශහා මය්හං යනාදෙශවේ, අම්හශබ්දයාකෙරෙන් පරවූ සහට "සස්සං" යී විකල්පයෙන් අංවේ, තුබූ පක්‍ෂයෙහි විභත්ති සහිතවූ අම්හශබ්දයහට "අම්හාස්ස මමං සවිභත්තිස්ස සෙ" යී මමං යනාදෙශ වේ, තුම්හඅම්හශබ්දයන්කෙරෙන් පරවූ නංහට "තුම්හාම්හාහි නමාකං" යී ආකංව තව තුය්හං යනාදිය වේ.

ත්වයා තයා මයා තුම්හෙහි තුම්හෙභි අම්හෙහි අම්හෙභි යන තන්හි "ජිනවචන-පෙ-ස්මා විභත්ති තුන්තැනෙක වේ, හි විභත්ති සතරතැනෙක වේ, ස්මාහට "අම්හතුම්හ න්තුරාජ" යනාදින් නාවත් වේ, නා විභත්ති සහිතවූ තුම්හඅම්හශබ්දයන්ට "නාම්හි තයාමයා වා" යී දෙතැනෙක්හි තයා යනාදෙශහා එක්තැනෙක්හි මයා යනාදෙශ වේ, එක්පක්‍ෂයෙක්හි තයා යනාදෙශයාගේ තකාරයහට "තයාතයීනං තකාරො ත්වත්තං වා" යී විකල්පයෙන් ත්වයනාදෙශ වේ, හිපරකල්හි අකාරයන්ට "සුහිස්ව" යනාදින් එවේ, හිහට භිව ත්වයා තයා මයා යනාදිය වේ.

තව තුය්හං තුම්හං මම මය්හං අම්හං මමං තුම්හාකං අම්හාකං යන තන්හි "ජිනවචන-පෙ-චතුත්ථිය මෙනි.

ත්වයි තයි මයි තුම්හෙසු අම්හෙසු යන තන්හි "ජිනවචන—පෙ—ස්මිං විභත්ති තුන් තැනෙක වේ, සු විභත්ති දෙතැනෙක වේ, ස්මිං විභත්ති පරකල්හි එම විභත්තිහා සමග තුම්හඅම්හශබ්දයන්ට "තුම්හාම්හානං තයි මයි" යී දෙතැනෙක්හි තයි යනාදෙශහා එක් පක්‍ෂයෙක්හි මයි යනාදෙශ වේ, එක්පක්‍ෂයෙක්හි තයි යනාදෙශයාගේ තකාරයහට "තයාතයීනං තකාරො ත්වත්තං වා" යී විකල්පයෙන් ත්වයනාදෙශ වේ, සු පරකල්හි අකාරයන්ට "සුහිස්ව" යනාදින් එවේ, ත්වයි යනාදිය වේ.

ත්වං තුවං අහං තුම්හෙ මයං අම්හෙ—තං තවං තුවං ත්වං මං මමං තුම්හාකං තුම්හෙ අම්හාකං අම්හෙ—ත්වයා තයා මයා තුම්හෙහි තුම්හෙභි අම්හෙහි අම්හෙභි-එවං කරණෙ-තව තුය්හං තුම්හං මම මය්හං අම්හං මමං තුම්හාකං අම්හාකං-ත්වයා තයා මයා තුම්හෙහි තුම්හෙභි අම්හෙහි අම්හෙභි-තව තුය්හං තුම්හං මම මය්හං අම්හං ම මං තුම්හාකං අම්හාකං—ත්වයි තයි මයි තුම්හෙසු අම්හෙසු.

ලිඞ්ගත්‍රයෙහිම එකාකාරමැයි.

ත්වං තුවං තුම්හෙ—තං තවං තුවං ත්වං තුම්හාකං තුම්හෙ—ත්වයා තයා තුම්හෙහි තුම්හෙභි—එවං කරණෙ—තව තුය්හං තුම්හං තුම්හාකං—ත්වයා තයා තුම්හෙහි තුම්හෙභි-තව තුය්හං තුම්හාකං—ත්වයි තයි තුම්හෙසු.

තුම්හශබ්දයෙන් තෝය යන අර්ථ කියත්.

අහං මයං අම්හෙ-මං මමං අම්හාකං අම්හෙ-මයා අම්හෙහි අම්හෙභි-එවං. කරණෙ—මම මය්හං අම්හං මමං අම්හාකං-මයා අම්හෙහි අම්හෙභි—මම මය්හං අම්හං මමං අම්හාකං-මයි අම්හෙසු.

අම්හශබ්දයෙන් මමය යන අර්ථ කියත්.

රක්ඛතු වො පස්සතු නො යන තන්හි රක්ඛතු යන පදය රක්ඛතු කියාවේ, පස්සතු යන පදය පස්සතු කියාවේ, ඒපදයන්කෙරෙන් පරවූ තුම්හ අම්හශබ්ද තුම්හඅම්හකියා වේ, ඔවුන්කෙරෙන් පරව විතීයා යො විභක්ති වේ, පදයන් කෙරෙන් පරවූ තුම්හඅම්හශබ්දයන්ට "පදතො දුතියාචතුත්ථීඡට්ඨීසු වොනො" යන සූත්‍රයෙන් විභක්ති සමග වො නො යනාදෙශයෝ වෙත්, රක්ඛතු වො පස්සතු නො යනු වේ—මතෙතනහිදු මෙසේ වාක්‍යයෙදියයුතු.

දදාති වො දදාහි නො යන තන්හි දදාති දදාහි යන පදයන්කෙරෙන් පරව තුම්හ අම්හශබ්ද වේ, ඔවුන්කෙරෙන් පරව චතුර්ථී බහුවචනවූ නං විභක්ති වේ, පදයන්කෙරෙන් පරවූ තුම්හඅම්හශබ්දයන්ට "පදතො දුතියාචතුත්ථීඡට්ඨීසු වොනො" සී විභක්තිහා සමග වො නො යනාදෙශ වෙත්, දදාති වො දදාහි නො යනු වේ.

සඛා වො සජ්ඣා නො යන තන්හි සඛා සජ්ඣා යන පදයන්කෙරෙන් පරව තුම්හඅම්හශබ්දවේ, ඔවුන්කෙරෙන් පරව ෂෂ්ඨී බහුවචනවූ නං විභක්ති වේ, පදයන්කෙරෙන් පරවූ තුම්හඅම්හශබ්දයන්ට "පදතො දුතියා" යනාදීන් විභක්ති සහිතව වො නො යන දෙදෙන වෙත්, සඛා වො සජ්ඣා නො යනු වේ.

දදාමි තෙ දදාහි මෙ යන තන්හි දදාමි දදාහි යන පදයන්කෙරෙන් පරව තුම්හඅම්හශබ්දවේ, ඔවුන්කෙරෙන් පරව චතුර්ථී එකවචනවූ ස විභක්ති වේ, පදයන්කෙරෙන් පරවූ තුම්හඅම්හශබ්දයන්ට "තෙමෙකවචනෙ" යන සූත්‍රයෙන් විභක්ති හා සමග තෙ මෙ යනාදෙශයෝ වෙත්, දදාමි තෙ දදාහි මෙ යනු වේ.

ඉදං තෙ අයං මෙ යන තන්හි ඉදං අයං යන පදයන්කෙරෙන් පරව තුම්හ අම්හශබ්ද වේ, ඔවුන්කෙරෙන් පරව ෂෂ්ඨ්‍යෙකවචනවූ ස විභක්ති වේ, පදයන් කෙරෙන් පරවූ තුම්හඅම්හශබ්දයන්ට "තෙමෙකවචනෙ" යන සූත්‍රයෙන් විභක්ති හා සමග තෙ මෙ යනාදෙශයෝ වෙත්, ඉදං තෙ අයං මෙ යනු වේ.

පස්සථ තං අජිනි මං යන තන්හි පස්සථ අජිනි යන පදයන්කෙරෙන් පරව තුම්හඅම්හශබ්ද වේ, ඔවුන්කෙරෙන් පරව විතීයා එකවචනවූ අං විභක්තිවේ, පදයන්කෙරෙන් පරවූ තුම්හඅම්හශබ්දයන්ට "තෙමෙකවචනෙ" සී තෙ මෙ යනාදෙශ පතෙතහි "නාම්හි" යන සූත්‍රයෙන් ප්‍රතිෂෙධව "තං මමම්හි" යන සූත්‍රයෙන් තං මං යනාදෙශව පස්සථ තං අජිනි මං යනු වේ.

කථං යන පදය කථං කියා සතරතැනෙක වේ, පදයාකෙරෙන් පරව තුම්හ අම්හශබ්ද සතරතැනෙක වෙත්. ඔවුන්කෙරෙන් පරව නා විභක්ති වේ, පදයා

කෙරෙන් පරවූ තුම්හාම්හශබ්දයන්ට "වා තතියෙ ච" යන සූත්‍රයෙන් විකල්පයෙන් විභක්ති සහිතව තෙ මෙ යන ආදෙශයෝ වෙත්, තුබ්‍ර දෙතැන්හි විභක්ති සහිතවූ තුම්හඅම්හශබ්දයන්ට "නාම්හි තයාමයා" යන සූත්‍රයෙන් තයා මයා යන ආදෙශයෝ වෙත්, කතං තෙ, කතං මෙ, කතං තයා, කතං මයා යනු වේ.

කතං වො කතං නො යන තන්හි කතං යන පදයාකෙරෙන් පරව තුම්හඅම්හයි වේ, ඔවුන්කෙරෙන් පරව තෘතීයා බහුවචනවූ හි විභක්ති වේ, පදයාකෙරෙන් පරවූ තුම්හඅම්හශබ්දයන්ට "බහුවචනෙසු වොනො" යන සූත්‍රයෙන් විභක්ති සහිතව වොය නොය යන ආදෙශයෝ වෙත්, කතං වො කතං නො යනු වේ.

ගාමං යන පදයාකෙරෙන් පරව තුම්හඅම්හයි වේ, ඔවුන්කෙරෙන් පරව ප්‍රථමා යො විභක්ති වේ, පදයාකෙරෙන් පරවූ තුම්හඅම්හශබ්දයන්ට "බහුවචනෙසු වොනො" යන සූත්‍රයෙහි බහුවචනග්‍රහණයෙන් විභක්ති සහිතව වොය නොය යනාදෙශයෝ වෙත්, ගාමං වො ගච්ඡෙය්‍යාථ, ගාමං නො ගච්ඡෙය්‍යාම යනු වේ — ගච්ඡෙය්‍යාථ ගච්ඡෙය්‍යාම යන පද තුම්හඅම්හ ශබ්දයන්කෙරෙන් පරකොට ලියයුතු.

සබ්බනාමවිශබ්දයන්ගේ පද සිද්ධිය කියනුලැබේ — එකශබ්දයතෙම සර්වනාමයන්කෙරෙහි කියනලදී.

දුවෙ ද්වෙ යන තන්හි ද්විශබ්ද ද්වි කියා දෙතැනෙක වේ, සඞ්ඛ්‍යාදිවූ එකවචන විභක්ති මෙහි නැති, ද්විශබ්දයාකෙරෙන් පරව ප්‍රථමා යො විභක්ති වේ, යො පරකල්හි එම විභක්ති සහිතවූ ද්විශබ්දයහට "යොසු ද්විනන්නං ද්වෙ ච" යන සූත්‍රයෙන් ද්වෙ යනාදෙශයහා මේම සූත්‍රයෙහි චග්‍රහණයෙන් දුවෙ යනාදෙශද වේ, දුවෙ ද්වෙ යනු වේ — ද්විතීයාවද මෙසේ මැයි- ද්වීහි ද්වීහි යනු තෘතීයායි- මෙහි හි පරකල්හි "සුනංහිසු" යනාදීන් දීර්ඝ වේ — එවං කරණෙ — දුවින්නං ද්වින්නං යන තන්හි නං විභක්ති පරකල්හි ද්විශබ්දයහට "යොසු ද්විනන්නං ද්වෙ ච" යන සූත්‍රයෙහි චග්‍රහණයෙන් විකල්පයෙන් දුවියනාදෙශ වේ, ද්විශබ්දාදීන්කෙරෙන් නං විභක්ති පරකල්හි "නො ච ද්වාදිතො නම්හි" යි නකාරාගම වේ, දුවින්නං ද්වින්නං යනු වේ — ද්වීහි ද්වීහි යනු පඤ්චමියි- දුවින්නං ද්වින්නං යනු ෂෂ්ඨියි-ද්වීසු යනු සප්තමියි — තුන්ලිඟයෙහිම එකාකාරයි.

දුවෙ ද්වෙ-දුවෙ ද්වෙ-ද්වීහි ද්වීහි එවං කරණෙ-දුවින්නං-ද්වින්නං-ද්වීහි ද්වීහි දුවින්නං ද්වින්නං—ද්වීසු — ද්විශබ්දයෙන් දෙදෙනය යන අර්ථ කියත්

තයො යන තන්හි "ජිනවචන—පෙ-තිශබ්ද ති කියාවේ, ඔහුකෙරෙන් පරව ප්‍රථමා යො විභක්ති වේ, යො පරකල්හි විභක්ති සහිතවූ තිශබ්දයහට "තිචතුන්නං තිස්සො චතස්සො තයො චත්තාරො තීණි චත්තාරි" යන සූත්‍රයෙන් තයො යනාදෙශව තයො යනු වේ — ද්විතීයාවද මෙසේ මැයි — තීහි තීහි-එවං කරණෙ — තිණ්ණං තිණ්ණන්නං යන තන්හි

තිශබ්දයාකෙරෙන් පරවූ නංහට "ඉණ්ණම් ඉණ්ණන්නං තීහි සඞ්ඛ්‍යාහි" යන සූත්‍රයෙන් ඉණ්ණං යනාදෙශයා ඉණ්ණන්නං යනාදෙශ වේ, තිණ්ණං තිණ්ණන්නං යනු වේ — තීහි තීහි යනු පචමියි — තිණ්ණං තිණ්ණන්නං තීසු.

### ස්ත්‍රීලිඞ්ගයෙහි.

තිස්සො යන තන්හි ප්‍රථමා යො විභක්ති පරකල්හි විභක්ති සහිතවූ තිශබ්දයහට "තිචතුන්නං" යනාදින් තිස්සො යනාදෙශව තිස්සො යනු වේ — ද්විතීයාවද මෙසේමැයි — තීහි තීහි - එවං කරණෙ - තිස්සන්නං යන තන්හි නං පරකල්හි තිශබ්දයාකෙරෙන් පරව "ණො ච ව්‍යාදිතො නම්හි" යී චග්‍රහණයෙන් ස්සං යනාගම වේ, නිග්ගහීතයහට "වග්ගන්තං වා වග්ගෙ" යී නකාරාන්තාදෙශ වේ, තිස්සන්නං යනු වේ — තීහි තීහි යනු පචමියි — තිස්සන්නං - තීසු.

### නපුංසකලිඞ්ගයෙහි.

තීණි යන තන්හි යො පරකල්හි විභක්ති සහිතවූ තිශබ්දයහට "තිචතුන්නං" යනාදින් තීණි යනාදෙශ වේ, තීණි යනු වේ — ද්විතීයාවද මෙසේමැයි — තීහි තීහි යනාදිය පුල්ලිඞ්ගයෙහි මෙනි.

තයො — තයො — තීහි තීහි — එවං කරණෙ * තිණ්ණං තිණ්ණන්නං — තීහි තීහි - තිණ්ණං තිණ්ණන්නං - තීසු.

### ඉත්ථියං.

තිස්සො - තිස්සො — තීහි තීහි - එවං කරණෙ - තිස්සන්නං - තීහි තීහි - තිස්සන්නං — තීසු.

### නපුංසකෙ.

තීණි - තීණි - තීහි තීහි - එවං කරණෙ - * තිණ්ණං තිණ්ණන්නං - තීහි තීහි - තිණ්ණං තිණ්ණන්නං - තීසු — තිශබ්දයෙන් තුන්දෙනාය යන අර්ථ කියත්.

චත්තාරො චතුරො යන තන්හි චතුශබ්ද චතුකියාදෙතැනෙක වේ, ඔහු කෙරෙන් පරව යො විභක්ති වේ, යො පරකල්හි විභක්ති සහිතවූ චතුශබ්දයහට "තිචතුන්නං" යනාදින් චත්තාරො යනාදෙශ වේ, තුබූ පක්ෂයෙහි යො පරකල්හි චතුශබ්දයාගේ උකාරයහට "ඔ සරෙ ච" යන සූත්‍රයෙහි චග්‍රහණයෙන් උරයනාදෙශ වේ, යොහට "තතො යොනමො තු" යී තුග්ගහණයෙන් ඔවේ, චත්තාරො චතුරො යනු වේ — ද්විතීයාවද මෙසේමැයි — චතූහි චතූහියනු තෘතීයායි — එවං කරණෙ.

චතුන්නං යන තන්හි නං පරකල්හි "ණො ච ව්‍යාදිතො නම්හි" යී නකාරාගමවේ, චතුන්නං යනු වේ — චතූහි චතූහි යනු පචමියි — චතුන්නං යනු ෂෂ්ඨියි - චතූසු යනු සප්තමියි.

### ස්ත්‍රීලිඞ්ගයෙහි.

චතස්සො යන තන්හි යො පරකල්හි එම යොහා සමග චතුශබ්දයහට "තිචතුන්නං" යනාදින් චතස්සො යනාදෙශ වේ, චතස්සො යනු වේ —

---

* මෙහි චතුර්ථී-ෂෂ්ඨීදෙතැනම "තින්නං" යී ද අවශ්‍යයි

එවං දුතියා-චතූහි චතූභි-එවංකරණෙ ~ චතස්සන්නං යන තන්හි නං පරකල්හි චතුශබ්දයාකෙරෙන් පරව "නොවා" දී සූත්‍රයෙහි වග්ගහණයෙන් සං ආගම වේ, නිග්ගහීතයට "වග්ගන්තං" යනාදින් තවග්ගන්තාදෙශ වේ, චතුශබ්දයාගේ උහට "යදු" දින් අව්ව චතස්සන්නං යනු වේ ~ චතූහි චතූභි යනු පඤ්චමියි ~ චතස්සන්නං යනු ෂෂ්ඨියි-චතූසු යනුසප්තමියි.

නපුංසකලිඞ්ගයෙහි.

චත්තාරි යන තන්හි යො පරකල්හි එම යොහා සමග චතුශබ්දයහට "ති චතුන්නං" යනාදින් චත්තාරි යනාදෙශ වේ, චත්තාරි යනු වේ ~ එවං දුතියා—තතියාදී හැමපදම පුලිඞ්ගයෙහි මෙනි.

චත්තාරො චතුරො—චත්තාරො චතුරො—චතූහි චතූභි—එවං කරණෙ—චතුන්නං-චතූහි චතූභි-චතුන්නං-චතූසු.

ඉත්ථියං.

චතස්සො-චතස්සො-චතූහි චතූභි-එවං කරණෙ-චතස්සන්නං-චතූහි චතූභි-චතස්සන්නං-චතූසු.

නපුංසකෙ.

චත්තාරි චත්තාරි-චතූහි චතූභි-එවං කරණෙ චතුන්නං-චතූහි චතූභි-චතුන්නං—චතූසු.

චතුශබ්දයෙන් සතර දෙනස යන අර්ථ කියත්.

පඤ්ච යන තන්හි ප්‍රථමා යො පරකල්හි අකාරාන්තනාමයාකෙරෙන් පරවූ යොහට "සබ්බයොනී" යනාදින් වන ආකාරයාගේ වැලකීම පිණිස "පඤ්චාදීනමකාරො" යි විභක්ති සහිතවූ පඤ්චශබ්දයහට අව්ව පඤ්ච යනු වේ.

පඤ්ච යන තන්හි ද්විතීයා යොහට "සබ්බයොනී" යනාදින් වන එකාරයාගේ වැලකීම පිණිස එසේම අව්ව පඤ්ච යනු වේ ~ පඤ්චහි යනාදී සියල්ලෙහිම ඒ ඒ සූත්‍රයෙන් වන එකාර දීර්ඝ වලකන පිණිස එසේම අව්වේ.

පඤ්ච-පඤ්ච-පඤ්චහි පඤ්චභි-එවං කරණෙ-පඤ්චන්නං-පඤ්චහි පඤ්චභි-පඤ්චන්නං-පඤ්චසු ~ පඤ්චශබ්දයෙන් පස්දෙනස යන අර්ථ කියත්.

ඡ සත්ත අට්ඨ නව දස එකාදස ද්වාදස බාරස තෙළස තෙරස චුද්දස චොද්දස චතුද්දස පණ්ණරස පඤ්චදස සොළස සොරස සත්තරස සත්තදස අට්ඨාරස අට්ඨාදස යනුමේ ශබ්දයෝ බහුවචනාන්තයෝයි, පඤ්චශබ්දයාගේ මෙන් පද සිද්ධකටයුතුයි ~ ලිඞ්ගත්‍රයෙහිම ඒකාකාරමැයි.

එකූනවීසති යන තන්හි එකූනවීසතිශබ්දයාකෙරෙන් පරවූ සිහට "සෙසතො" යනාදින් ලොප් වේ, එකූනවීසති යනු වේ ~ (හො) එකූනවීසති යනුද මෙසේ මැයි-එකූනවීසතිං යන තන්හි පසංඥයාකෙරෙන් පරවූ අංහට "අමෙම්මා" යනාදින් නිග්ගහීත වේ, එකූනවීසතිං යනු වේ—එකූනවීසතියා යනාදීහු රත්තිශබ්දයා මෙනි.

එකූනවීසති—(හො) එකූනවීසති—එකූනවීසතිං—එකූනවීසතියා—එවං කරණෙ-එකූනවීසතියා—එකූනවීසතියා—එකූනවීසතියා—එකූනවීසතියං-එකූනවීසතියා.

එකූනවීසතිශබ්දයෙන් එකක්අඩු විස්සක් කියත්.

වීසති ශබ්දය ආදිකොට ඇති නවුති ශබ්දය අන්තකොටඇති ශබ්දයෝ ස්ත්‍රීලිඞ්ගයෝල, හෙද එකවචනයෝල, බහුවචන නැති—වීසති ශබ්දදීහු රත්තිශබ්දය වැනිල—චත්තාලීස පඤ්ඤාස ශබ්දයන්කෙරෙන් පරවූ හැම විභත්තීන්ටම "සබ්බාසමාවුසොපසග්ගනිපාතාදීහි ච" යන සූත්‍රයෙහි ආදිග්‍රහණයෙන් ලොප් වේ—සට්ඨි සත්තති අසීති නවුති ශබ්දයෝ වීසති ශබ්දයා මෙනි-සතශබ්දය නපුංසකලිඞ්ගය, හෙද එකවචනාන්තමැයි-සහස්සාදී ශබ්දයෝද මෙසේ මැයි—කොටිශබ්දය වීසති ශබ්දයා මෙනි.

අලිඞ්ගනාමයෝ කියනුලැබෙත්.

චොරතො යන තන්හි චොරශබ්ද චොර කියා වේ, ඔහුකෙරෙන් පරව ස්මා විභත්ති වේ, ඒලිඞ්ගහුකෙරෙන් පරව පඤ්චමීයෙහි වූ ස්මාහට "ක්වචි තො පඤ්චම්‍යත්ථෙ" යි කිසිතැනෙක්හි තොප්‍රත්‍යය වේ, ඊහට "ත්වාදයො විභත්තිසඤ්ඤායො" යි විභත්ති සංඥාව චොරස්මා යන වාක්‍යයෙහි චොරතො යනු වේ,

පිතිතො මාතිතො යන තන්හි පිතු ශබ්ද මාතු ශබ්ද පිතු මාතු කියා දෙතැනෙක වේ, ඔහුකෙරෙන් පරව ස්මා විභත්ති වේ, ඒ ලිඞ්ගහුකෙරෙන් පරවූ ස්මාහට "ක්වචි තො පඤ්චම්‍යත්ථෙ" යි තොප්‍රත්‍යය වේ, තො ප්‍රත්‍යය පරකල්හි පිතු මාතුශබ්දයන්ගේ උකාරයන්ට "පිතාදීනමසිම්හි" යන සූත්‍රයෙහි අසිම්හි ග්‍රහණයෙන් ඉකාරවේ, තොප්‍රත්‍යයහට 'ත්වාදයො විභත්තිසඤ්ඤායො" යි විභත්තිසංඥාවේ, පිතරා මාතුයා යන වාක්‍යයෙහි පිතිතො මාතිතො යනු වේ.

ඉතො යන තන්හි ඉමශබ්දයාකෙරෙන් පරවූ ස්මාහට "ක්වචි තො" යනාදීන් තොප්‍රත්‍යය වේ, තො ප්‍රත්‍යය පරකල්හි ඉමශබ්දයහට "ඉමස්සිත්ථංදානිහතොධෙසු ච" යි ඉකාරවේ, තොප්‍රත්‍යයහට "ත්වාදයො" යනාදීන් විභත්ති සංඥා වේ, ඉමස්මා යන වාක්‍යයෙහි ඉතො යනු වේ.

අතො එත්තො යන තන්හි එතශබ්ද එත කියා දෙතැනෙක වේ, ඔහුකෙරෙන් පරවූ ස්මාහට "ක්වචි තො" යනාදීන් තොප්‍රත්‍යය වේ, ඊහට "ත්වාදයො" යනාදීන් විභත්ති සංඥාවේ, තොප්‍රත්‍යය පරකල්හි එතශබ්දයහට "සබ්බස්සෙතස්සාකාරො වා" යි විකල්පයෙන් අකාරවේ, නොවූ පක්ෂයෙහි එතශබ්දාන්තයහට "සරලොපො" දීන් ලොප් වේ, තකාර ත්කාරයෙහි බඩවේ, එතස්මා යන වාක්‍යයෙහි අතො එත්තො යනු වේ.

කුතො යන තන්හි කිංශබ්දයාකෙරෙන් පරවූ ස්මා විභත්තිහට "ක්වචි තො" යනාදීන් තොප්‍රත්‍යය වේ, ඊහට "ත්වාදයො" යනාදීන් විභත්ති

සංඥවේ, තො පරකල්හි කිංශබ්දයහට "ත්‍රතොථෙසු ච" යි කුයනාදේශ වේ, කස්මා යන වාක්‍යයෙහි කුතො යනු වේ.

ආදිතො යන තන්හි ආදිශබ්දයාකෙරෙන් පරවූ ස්මිංහට "ක්වචිතො" යි සූත්‍රවිධාකරණයෙන් සප්තම්‍යර්ථයෙහිද තොප්‍රත්‍යය වේ, ඕහට "ත්වාදයො" යනාදීන් විභක්ති සංඥවේ, ආදිස්මිං යන වාක්‍යයෙහි ආදිතො යනු වේ.

සබ්බත්‍ර සබ්බත්ථ යන තන්හි සබ්බශබ්දයාකෙරෙන් පරවූ ස්මිංහට "ත්‍රත්ථ සත්තමියා සබ්බනාමෙහි" යන සූත්‍රයෙන් සප්තම්‍යර්ථයෙහි ත්‍රය ත්ථ යන ප්‍රත්‍යයෝ වෙත්, ත්ථකාරයහට "වග්ගඝොසාඝොසානං" යනාදීන් එම වර්ගයෙහි වූ ප්‍රථමාක්ෂරයෙක් ද්විත්වවේ, සබ්බස්මිං යන වාක්‍යයෙහි සබ්බත්‍ර සබ්බත්ථ යනු වේ.

අත්‍ර අත්ථ එත්ථ යන තන්හි එත ශබ්ද එත කියා තුන්තැනෙක වේ, ඔහුකෙරෙන් පරවූ ස්මිං විභක්තිහට "ත්‍රත්ථ සත්තමියා සබ්බනාමෙහි" යි එක් තැනෙක්හි ත්‍රප්‍රත්‍යයහා දෙතැනෙක්හි ත්ථප්‍රත්‍යය වේ, එක්පක්ෂයෙක්හි ත්ථකාර යහට "වග්ගඝොසාඝොසානං" යනාදීන් එම වර්ගයෙහි වූ ප්‍රථමාක්ෂර යෙක් ද්විත්වවේ, ප්‍රත්‍යයා පරකල්හි එත ශබ්දයහට "එතෙනිච්චං" යි අකාර වේ, ත්ථප්‍රත්‍යයාපරකල්හි "සබ්බස්සෙතස්සාකාරො වා" යි විකල්පයෙන් අකාරවේ, තුබූ පක්ෂයෙහි තකාර පූර්වතකාරයෙහි බඩවේ, එතස්මිං යන වාක්‍යයෙහි අත්‍ර අත්ථ එත්ථ යනු වේ.

කුත්‍ර කුත්ථ කත්ථ ක්ව යන තන්හි කිංශබ්ද කිං කියා සතරතැනෙක වේ, ඔහු කෙරෙන් පරවූ ස්මිං විභක්තිහට "ත්‍රත්ථසත්තමියා" යනාදීන් එක් තැනෙක්හි ත්‍රප්‍රත්‍යය වේ, දෙතැනෙක්හි ත්ථ ප්‍රත්‍යය වේ, ත්‍ර ත්ථ ප්‍රත්‍යයන් පරකල්හි කිංශබ්දයහට "ත්‍රතොථෙසු ච" යි දෙතැනෙක්හි කු යනාදේශ වේ, ත්ථ ප්‍රත්‍යයන්ට "වග්ගඝොසා" දීන් එම වර්ගයෙහි ප්‍රථමාක්ෂරයෙක් ද්විත්වවේ, එක්පක්ෂයෙක්හි කිංශබ්දයහට "සෙසෙසු ච" යි කකාරාදේශ වේ, තුබූ පක්ෂයෙහි කිංශබ්දයාකෙරෙන් පරවූ ස්මිංහට "කිස්මා වො ච" යි වප්‍රත්‍යය වේ, වප්‍රත්‍යයා පරකල්හි කිංශබ්දයහට "කිස්ස ක වෙ ච" යි කකාරාදේශ වේ, කකාරයෙහිවූ අකාරයහට "සරලොපො" දීන් ලොප් වේ වකාරකකාරයෙහි බඩවේ, කස්මිං යන වාක්‍යයෙහි කුත්‍ර කුත්ථ කත්ථ ක්ව යනුවේ.

කුහිං කුහං කුහිඤ්චනං යන තන්හි කිං ශබ්ද කිං කියා තුන්තැනෙක වේ, ඔහු කෙරෙන් පරව ස්මිං විභක්ති වේ, කිංශබ්දයාකෙරෙන් පරවූ ස්මිංහට "හිං හංහිඤ්චනං" යි හිංය හංය හිඤ්චනංය යන ප්‍රත්‍යයෝ වෙත්, හිං හං ප්‍රත්‍යයන් පරකල්හි කිංශබ්දයහට "කුහිංහංසු ච" යන් සූත්‍රයෙන් දෙතැනෙක්හි කු යනාදේශවේ, හිඤ්චනං ප්‍රත්‍යයා පරකල්හි මෙම සූත්‍රයෙහි චග්‍රහණයෙන් කුයනාදේශවේ, කස්මිං යන වාක්‍යයෙහි කුහිං කුහං කුහිඤ්චනං යනු වේ.

තහිං තහං යන තන්හි ත ශබ්ද ත කියා දෙතැනෙක වේ, ඔහුකෙරෙන් පරවූ ස්මිං විභක්තිහට "තම්හා ච" යි හිං හං යනාදෙශ වේ, තස්මිං යන වාක්‍යයෙහි තහිං තහං යනු වේ.

යහිං යන තන්හි යශබ්දයාකෙරෙන් පරවූ ස්මිංහට "යතෝ හිං" යි හිං යනාදෙශවේ, යස්මිං යන වාක්‍යයෙහි යහිං යනු වේ.

ඉහ ඉධ යන තන්හි ඉම ශබ්දයාකෙරෙන් පරවූ ස්මිං විභක්තිහට "ඉමස්මා හධා ච" යි හ ප්‍රත්‍යය ධ ප්‍රත්‍යය යන දෙදෙන වෙත්, හ ධ යනප්‍රත්‍යයන් පරකල්හි ඉම ශබ්දයහට "ඉමස්සිථංදානිහතොධෙසු ච" යි ඉකාරාදෙශ ව ඉමස්මිං යන වාක්‍යයෙහි ඉහ ඉධ යනු වේ.

සබ්බධි යන තන්හි සබ්බශබ්දයාකෙරෙන් පරවූ ස්මිංහට "සබ්බතො ධි" යි ධිප්‍රත්‍යයවේ, සබ්බස්මිං යන වාක්‍යයෙහි සබ්බධි යනු වේ.

කදා කුදාචනං යන තන්හි කිංශබ්ද කිං කියා දෙතැනෙකවේ, ඔහුකෙරෙන් පරවූ ස්මිංහට "කිංසබ්බඤ්ඤෙකයකුහි දාදාචනං" යන සූත්‍රයෙන් දා ප්‍රත්‍යයහා දාචනං ප්‍රත්‍යයවේ, දාප්‍රත්‍යයා පරකල්හි කිංශබ්දයහට "කිස්ස ක වෙ ච" යි කකාරාදෙශවේ, දාචනං ප්‍රත්‍යයා පරකල්හි කිංශබ්දයහට "කුහිංහංසු ච" යි චග්‍රහණයෙන් කු යනාදෙශවේ, කස්මිං කාලෙ යන වාක්‍යයෙහි කදා යනු වේ— කුදාචනං යනුද එම මැයි.

සදා සබ්බදා යන තන්හි සබ්බ ශබ්ද සබ්බ කියා දෙතැනෙකවේ; ඔහුකෙරෙන් පරවූ ස්මිංහට "කිංසබ්බඤ්ඤෙකයකුහි දාදාචනං" යි දාප්‍රත්‍යය වේ, දාප්‍රත්‍යයා පරකල්හි සබ්බ ශබ්දයහට "සබ්බස්ස සො දාම්හි වා" යි විකල්පයෙන් ස කාරාදෙශවේ, සදා සබ්බදා යනු වේ.

තදානි තදා යන තන්හි ත ශබ්ද ත කියා දෙතැනෙක වේ, ඔහුකෙරෙන් පරවූ ස්මිංහට "තම්හා දානි ච" යි දානි ප්‍රත්‍යයහා දාප්‍රත්‍යයවේ, ඕහට "ත්වාදයො" යනාදින් විභක්ති සංඥාවේ, තස්මිං කාලෙ යන වාක්‍යයෙහි තදානි කියාද තදා කියාද වේ— මෙයින් මතු විභක්ති සංඥා කිරීමක් නැත්ල.

අජ්ජ සජ්ජු අපරජ්ජු කිවමනාතන්හි ඉම ශබ්ද ඉම කියා වේ, සමාන ශබ්ද සමානකියා වේ, අපරශබ්දඅපරකියා වේ, ඉම සමාන අපරශබ්ද යන්කෙරෙන් පරව "යදනුපපන්නා" යින් එක්තැනෙක ජ්ජප්‍රත්‍යයහා දෙතැනෙක ජ්ජුප්‍රත්‍යයයෝවෙත්, ඉම ශබ්දයහට මෙම "යද" යින් අකාරාදෙශද සමාන ශබ්දයහට සකාරාදෙශදවේ, අජ්ජ සජ්ජු අපරජ්ජු යනුවේ,

එතරහි අධුනා ඉදානි යන තන්හි ඉම ශබ්ද ඉම කියා තුන්තැනෙකවේ, ඉම ශබ්දයන්කෙරෙන් පරව "ඉමස්මා රහිධුනාදානි ච" යි රහි ධුනා දානි යන ප්‍රත්‍යයෝ යථාක්‍රමයෙන් වෙත්, රහි ප්‍රත්‍යයා පරකල්හි ඉමශබ්දයහට "එත රහිම්හි" යි එත යනාදෙශවේ, ධුනා ප්‍රත්‍යයා පරකල්හි ඉම ශබ්දයහට "අ ධුනාම්හි ච" යි අකාරාදෙශවේ, දානිප්‍රත්‍යයා පරකල්හි ඉමශබ්දයහට "ඉමස්සිථංදානිහතොධෙසු ච" යි ඉකාරාදෙශවේ, එතරහි අධුනා ඉදානි යනු වේ,

ආවුසො කිවමනාතන්හි ආවුසො ශබ්දයාකෙරෙන්ද උපසර්ගයන්කෙරෙන්ද නිපාතයන්කෙරෙන්ද පරවූ ප්‍රථමවිභක්ත්‍යාදි සප්තවිභක්තියෙහි ඒකවචන බහුවචනවූ හැම විභක්තීන්ට "සබ්බාසමාවුසොපසග්ගනිපාතාදීහි ච" යන සූත්‍රයෙන් ලොප්වේ—එයට උදාහරණ මෙසේයි.

ත්වං ආවුසො—තුම්හෙ අවුසො—තං ආවුසො-තුම්හාකං ආවුසො—තයා ආවුසො—තුම්හෙහි ආවුසො—ත්වයා ආවුසො—තුම්හෙහි ආවුසො—ත්වයා ආවුසො-තුම්හෙහි ආවුසො තව ආවුසො-තුම්හාකං ආවුසො-යනාදී ලක්ෂණයෙන් දතයුතු.

නාම කාණ්ඩය නිමි.

---

මහාවීරො මහාවීරා යන තන්හි මහන්ත ශබ්ද මහන්ත කියා දෙතැනෙක වේ, බහුකෙරෙන් පරව සිවිභක්තිවේ, සි විභක්තිහට "සො" යන සූත්‍රයෙන් ඔකාරාදෙශ වේ, පූර්වස්වර ලොප්ව පරස්වරයා කරාපැමිණෙණ්,ච යන නිපාත චකියාවේ, බහුකෙරෙන් පරව සි විභක්ති වේ, සි විභක්තිහට "සබ්බාසමාවුසො" යනාදීන් ලොප්වේ, සො යනවාක්‍යයවේ, වීරශබ්ද වීර කියා දෙතැනෙක වේ, බහුකෙරෙන් පරව සි විභක්ති වේ, සි විභක්තිහට "සො" යන සූත්‍රයෙන් ඔකාරාදෙශවේ, පූර්වස්වරලොප්ව ච යන නිපාත චකියා වේ, බහුකෙරෙන් පරවූ සි විභක්තිහට "සබ්බාසමාවුසො" යනාදීන් ලොප්වේ, මහන්තො ච සො වීරො ච යන වාක්‍යයෙහි විශෙෂණ විශෙෂ්‍යවූ සමානාධිකරණ වූ පදයෝ දෙදෙනෙක් යම්කලෙක්හි සමාස කරණුලැබෙද්ද එකල්හි ඒසමාසය "නාමානං සමාසො යුත්තත්ථො" යනු වැටෙන්නෙහි "විසෙසනමභිකරණෙ කම්මධාරයො" යන සූත්‍රයෙන් කර්මධාරයසමාස වෙයි, ඊහට එම සූත්‍රයෙන් කර්මධාරයසංඥාදවේ, වාක්‍යයාවිසින්ම තුමා තුල්‍යාධිකරණබව හැඟෙන හෙයින් වාක්‍යයහට "වුත්තත්ථානමප්පයොගො" යනු න්‍යාය හෙයින් අප්‍රයොග වේ, පූර්වෝත්තරපදයන් සම්බන්ධවූ විභක්තීන්ට "තෙසං විභත්තියො ලොපා ච" යන සූත්‍රයෙන් කිසිතැනෙක්හි ලොප්වේ, විභක්තීන්ට ලොප්කලකල්හි පූර්වෝත්තරපදයන් සම්බන්ධවූ ස්වරාන්තප්‍රකෘතිහට "පකති චස්ස සරන්තස්ස" යන සූත්‍රයෙන් ප්‍රකෘතිවත් වේ, සමානාධිකරණ වූ උත්තර පදයා පරකල්හි මහන්තශබ්දය හට "මහතං මහා තුල්‍යාධිකරණෙ පදෙ" යන සූත්‍රයෙන් මහා යනාදෙශ වේ, සමාසාන්තනාමයා තමා අභිහුහෙයින් "තද්ධිතසමාසකිතකා නාමංවාතවෙතුනාදී සු ච" යන සූත්‍රයෙන් නම්වත්වේ, බහුකෙරෙන් පරව විසර්ජනීය විවක්ෂාවශයෙන් සි විභක්තිද යොවිභක්තිදවේ, සි විභක්තිහට "සො" සි ඔකාරාදෙශවේ, . යොහට "සබ්බයොනීනමාඑ" සි ආකාරාදෙශවේ, මහාවීරො මහාවීරා යනු වේ.

මෙහි විශෙෂණ විශෙෂ්‍යනාම් මහායනු විශෙෂණය,වීරො යනු විශෙෂ්‍යයි-එට උදාහරණ මෙසේයි—ලොකයෙහි බොහෝ වස්තූන්කෙරෙහි සාධා

රණ වූ ශ්වේතවර්ණය විශෙෂණ නම, සුදුමල් සුදුපිළි සුදුගොන් යනාදිවශයෙන් එම සුදු අනික් ද්‍රව්‍යයකට එක්කිරීම විශෙෂ්‍යනම්—මෙසේම සෙසු වස්තූන්ගේ වශයෙන්ද, විශෙෂණ විශෙෂ්‍යදෙදෙනාගේ විභාග පරීක්‍ෂාකට යුතු.

රාජපතී යන තන්හි රාජශබ්දයාකෙරෙන් පරව සි විභක්තිවේ, ඊහට "සෙසතො" යනාදීන් ලොප්වේ, ච යන නිපාතයාකෙරෙන්ද සිව ලොප්වේ, සා යන වාක්‍යයවේ. පතී ශබ්ද පතී කියා වේ, ඔහු කෙරෙන්ද සිව ලොප්වේ, ච යන නිපාත ච කියා වේ, ඔහුකෙරෙන්ද සිව ලොප්වේ, රාජා ච සා පතී ච යන තන්හි විශෙෂණ-පෙ-පූර්වපදයා තමා "කම්මධාරයසඤ්ඤෙ ච" යි පුංවත්වේ, සමාසාන්තනාමයා තමා අලිඞ්ග හෙයින් "තබ්ධිතා" දීන් නම්වත්වේ, ස්‍යාදි විභක්ති වේ, "සෙසතො" යනාදීන් ලොප්වේ—රාජා ච සා පතී ච යන වාක්‍යයෙහි රාජපතී යනු වේ.

මහාසභා යන තන්හි මහන්තශබ්ද මහන්තකියා වේ, ඔහුකෙරෙන් පරව වක්ඛමානවිවක්ඛාවශයෙන් යො විභත්ති වේ, යො පරකල්හි න්තප්‍රත්‍යයහට "සෙසෙසු න්තුව" යි න්තුවත්වේ, තකාරස්ථ උකාරපහවේ, ස්ත්‍රීලිඞ්ගයෙහිවූ උවණ්ණයට "ඉතො ඉත්ථියං පො" යි පසංඥවේ, පසංඥයාකෙරෙන් පරවූ යොහට "ඝපතො" යනාදීන් ලොප්වේ, ස්ත්‍රීලිඞ්ගයෙහිවූ න්තුප්‍රත්‍යයා කෙරෙන් පරව "ණවණ්ණනාමෙණයණන්තුහි" යි ඊප්‍රත්‍යයවේ, පූර්වස්වරලොප් පැමිණ මහන්ති කියා තිබේ, ච සා යන වාක්‍යයවේ, සභාශබ්ද සභාකියා වේ, ඔහුකෙරෙන් පරවූ සිහට ලොප්වේ, ච යන නිපාතවේ, මහන්ති ච සා සභා ච යනතන්හි විශෙෂණ-පෙ-විභත්ත්‍යන්තයා තමා හැඟෙන හෙයින් වාක්‍යයහට "වුත්තත්ථානමප්පයොගො" යනු න්‍යායහෙයින් අප්‍රයොගවේ, පූර්වපදයා තමා "කම්මධාරයසඤ්ඤෙ ච" යන සූත්‍රයෙන් පුංවත්වේ, සමාසාන්තනාමයා තමා අලිඞ්ගහෙයින් "තබ්ධිතා" දි සූත්‍රයෙන් නම්වත්ව වක්ඛමාණ විවක්ඛාවශයෙන් ඔහුකෙරෙන් පරව සි විභක්තිව ලොප්වේ, මහන්ති ච සා සභා ච යන වාක්‍යයෙහි මහා සභා යනුවේ—මහන්තහිදු සුදුසු පරිච්ඡෙදන් මෙසේම වාක්‍යයෙදියයුතු.

නීලුප්පලං යන තන්හි නීල ශබ්දයාකෙරෙන් පරවූ සි විභක්තිහට "සිං" යන සූත්‍රයෙන් අං යනාදෙශවේ, ච යන වාක්‍යයවේ, උප්පල ශබ්දයාකෙරෙන්ද සි විභක්තිව අංයනාදෙශවේ, ච යන වාක්‍යය වේ, නීලං ච තං උප්පලං ච යන තන්හි විශෙෂණවිශෙෂ්‍යවූ-පෙ-නම්වත්ව ඔහුකෙරෙන් පරව ස්‍යාදි විභක්ති වේ, නීලංච තං උප්පලං ච යන වාක්‍යයෙහි නීලුප්පලං යනු වේ.

සජ්ජීසාමා යන තන්හි සජ්ජීශබ්දයාකෙරෙන් පරවූ සි විභක්තිහට "සෙසතො" යනාදි සූත්‍රයෙන් ලොප් වේ, ච සා යන වාක්‍යයවේ, සාමාශබ්දයාකෙරෙන් පරවූ සි විභක්තිහටද ලොප් වේ, ච යන වාක්‍යයවේ, සජ්ජී ච සා සාමා ච යන තන්හි විශෙෂණවිශෙෂ්‍යවූ-පෙ-නම්වත්ව ඔහුකෙරෙන් පරව ස්‍යාදිවිභක්ති වේ, සජ්ජී ච සා සාමා ච යන වාක්‍යයෙහි සජ්ජීසාමා යනු වේ.

මුඛවණ්ණො යන තන්හි මුඛ ශබ්දයාකෙරෙන් පරවූ සිහට "යිං" යන සූත්‍රයෙන් අංයනාදෙශවේ, එව යන වාක්‍යයවේ, වණ්ණශබ්දයාකෙරෙන් පරවූ සිහට "සො" යන සූත්‍රයෙන් ඔකාරාදෙශවේ, මුඛංඑව වණ්ණො යන තන්හි විශෙෂණ විශෙෂ්‍යවූ—පෙ—නම්වත්ව ඔහුකෙරෙන් පරව සහාදී විභක්තිවේ, මුඛං එව වණ්ණොයන වාක්‍යයෙහි මුඛවණ්ණො යනු වේ.

ඛත්තියභූතො යන තන්හි ඛත්තියශබ්දයාකෙරෙන් පරවූ සිහට ඔකාරාදෙශවේ, ච සො යන වාක්‍යයවේ, භූතශබ්දයාකෙරෙන්ද සිව ඔව ඛත්තියො ච සො භූතො ච යන තන්හි විශෙෂණ විශෙෂ්‍යවූ—පෙ—නම්වත්ව සහාදී විභක්තිවේ, ඛත්තියො ච සො භූතො ච යන වාක්‍යයෙහි ඛත්තිය භූතො යනු වේ.

අසුරො යන තන්හි න යන නිපාත න කියාවේ, ඔහුකෙරෙන් පරවූ සිහට "සබ්බාසමාවුපසො" යනාදී සූත්‍රයෙන් ලොප්වේ, සුරශබ්ද සුර කියා වේ, ඔහුකෙරෙන් පරවූ සිහට ඔකාරාදෙශවේ, නසුරො යන තන්හි "නාමානං සමාසො යුත්තත්ථො" යනු වැටෙන්නෙහි "විපදෙ" යනාදී සූත්‍රයෙන් කම්මධාරය සමාස වෙයි, ඕහට, "උභෙ තප්පුරිසා" යන සූත්‍රයෙන් තත්පුරුෂ සමාස සංඥවේ, තත්පුරුෂ සමාසයෙහිවූ පූර්වනකාරයහට "අත්තං නස්ස තප්පුරිසෙ" යන සූත්‍රයෙන් අවවේ, සමාසාන්තයා තමා අලිඟු හෙයින් "තද්ධිතා" දී සූත්‍රයෙන් නම්වත්ව ඔහුකෙරෙන් පරව සහාදී විභක්තිවේ, නසුරො යන වාක්‍යයෙහි අසුරො යනු වේ.

අනසෙසා යන තන්හි න යන නිපාත න කියා වේ, ඔහුකෙරෙන් පරවූ සිහට ලොප්වේ, අසසශබ්දයාකෙරෙන් පරවූ සිහට ඔකාරාදෙශවේ, න අසෙසා යන තන්හි "නාමානං සමාසො යුත්තත්ථො" යනු වැටෙන්නෙහි "විපදෙ තුල්‍යාධිකරණෙ කම්මධාරයො" යන සූත්‍රයෙන් කම්මධාරය සමාස වෙයි, ඕහට, "උභෙ තප්පුරිසා" යන සූත්‍රයෙන් තත්පුරුෂ සමාස සංඥ වේ, ස්වරයා පරකල්හි නකාරයහට "සරෙ අන්" යන සූත්‍රයෙන් අන් යනාදෙශවේ, සමාසාන්තයා තමා අලිඟුහෙයින් "තද්ධිතා" දී සූත්‍රයෙන් නම්වත්ව ඔහුකෙරෙන් පරව සහාදී විභක්තිවේ, නඅසෙසා යන වාක්‍යයෙහි අනසෙසා යනු වේ.

අපුනගෙය්‍යා යන තන්හි න යන පුන යන නිපාතයන්කෙරෙන් පරවූ සිහට ලොප්වේ, ගෙය්‍යශබ්දයාකෙරෙන් පරවූ සිහටද "සෙසතො" යනාදී සූත්‍රයෙන් ලොප්වේ, අයුක්තාර්ථවූද නාමයෝ "නාමානං සමාසොයුත්තත්ථො" යන සූත්‍රයෙහි "නාමානං සමාසො" යි සූත්‍රවිධාකරණ බලයෙන් කිසිතැනෙක්හි සමාස වෙත්, වන්නේ "විපදෙ තුල්‍යාධිකරණෙ කම්මධාරයො" යන සූත්‍රයෙන් කම්මධාරය සමාස වෙයි, ඕහට "උභෙ තප්පුරිසා" යන සූත්‍රයෙන් තත්පුරුෂ සමාස සංඥවේ, තත්පුරුෂ සමාසයෙහිවූ න ශබ්දයහට "අත්තං නස්ස තප්පුරිසෙ" යන සූත්‍රයෙන් අකාරාදෙශවේ, ස

මාසාන්තයා තමා අලිඞ්ගහෙයින් "තද්ධිතා" දී සූත්‍රයෙන් නම්වත්ව ඔහුකෙරෙන් පරව සතදී විභක්තිවේ, නපුනගෙය්‍ය යන වාක්‍යයෙහි අපුනගෙය්‍ය යනු වේ.

කම්මධාරය සමාසයයි.

තිලොකං යන තන්හි තිශබ්දයී කියාවේ, ඔහුන්කෙරෙන් පරව යො විභක්තිවේ, යො විභක්ති පරකල්හි විභක්ති සහිතවූ තිශබ්දයහට "තිචතුන්නං තිස්සො" යනාදී සූත්‍රයෙන් තයො යනාදෙශවේ, ලොක ශබ්දයාකෙරෙන් පරවූ යො විභක්තිහට "සබ්බයොනීනමාඑ" යන සූත්‍රයෙන් ආකාරාදෙශවේ, සමාහටා යන වාක්‍යයවේ, තයො ලොකා සමාහටා යන තන්හි "නාමානං සමාසො යුත්තත්ථො" යනු වැටෙන්නෙහි "විපදෙ" යනාදී සූත්‍රයෙන් කම්මධාරය සමාසවේ, ඕහට "සඞ්ඛ්‍යාපුබ්බො දිගු" යන සූත්‍රයෙන් දිගුසමාස සංඥවේ, ස්වරාන්තප්‍රකෘතිහට "පකතිචස්ස සරන්තස්ස" යන සූත්‍රයෙන් ප්‍රකෘතිවත් වේ, පූර්වොත්තරපදයන් සම්බන්ධවූ විභක්තින්ට "තෙසං විභත්තියො ලොපා ච" යන සූත්‍රයෙන් ලොප්වේ, ච කෘයහට "වුත්තත්ථානමප්පයොගො" යනු න්‍යායහෙයින් අප්‍රයොගවේ, සමාසාන්තයා තමා අලිඞ්ගහෙයින් "තද්ධිතා" දී සූත්‍රයෙන් නම්වත්වේ, දිගුසමාසයහට "දිගුස්සෙකත්තං" යන සූත්‍රයෙන් එකත්ව නපුංසකත්වය වේ, තයො ලොකා සමාහටා යනවාක්‍යයෙහි තිලොකං යනු වේ.

දිගු සමාසයයි.

ගාම ගතො යන තන්හි ගාම ශබ්ද ගාම කියා වේ, ඔහුකෙරෙන් පරව අංවේ, ගත ශබ්ද ගත කියා වේ, ඔහුකෙරෙන් පරවූ සිහට ඔව ගාමං ගතො යන තන්හි විතීයාන්තාදීනු උත්තර පදනාමයන්හා යම්කලෙක්හි සමාසකරණු ලැබෙද්ද එකල්හි ඒසමාසය "නාමානං සමාසො යුත්තත්ථො" යනු වැටෙන්නෙහි "අමාදයොපරපදෙහි" යි තත්පුරුෂ සමාස වෙයි, ඕහට එම සූත්‍රයෙන් තත්පුරුෂ සංඥවෙයි, පූර්වොත්තරපදයන් සම්බන්ධවූ විභක්තින්ට "තෙසං විභත්තියො ලොපා ච" යි ලොප්වේ, සමාසාන්තයා තමා අලිඞ්ගහෙයින් "තද්ධිතා" දීන්නම්වත්ව, ඔහුකෙරෙන් පරව සිව ඔව ගාමං ගතො යන වාක්‍යයෙහි ගාමගතො යනු වේ.

පස්ස වාසිඑ ගාමං ගතො යනාදියෙහි අයුක්තාර්ථහෙයින් සමාසනොවේ.

මේ විතීයා සමාසයයි.

රාජහතො යන තන්හි රාජශබ්ද රාජකියා වේ, ඔහුකෙරෙන් පරව නා විභක්තිවේ, නා පරකල්හි විභක්ති සහිතවූ රාජශබ්දයහට "නාම්හි රඤ්ඤා වා" යි රඤ්ඤා යනාදෙශවේ, හතශබ්ද හතකියා වේ, ඔහුකෙරෙන් පරවූ සිහට ඔවේ, රඤ්ඤා හතො යන තන්හි විතීයාන්තාදීහු උත්තර-පෙ- නම්වත්ව සි ආදී විභක්තිව, රඤ්ඤා හතො යන වාක්‍යයෙහි රාජහතො වේ.

සොණලෙය්‍යො යන තන්හි සොණශබ්දයාකොරෙන්වූ සි විභක්තී පර කල්හි අකාරයනට "සුහිස්වකාරොඑ" සි එ වේ, ලෙය්‍යශබ්දයාකොරෙන් සිව ඔවේ, සොනෙහි යන විතියානතාදීහු උත්තර—පෙ—නම්වත්ව සහදී විභක්තිවේ, සොනෙහි ලෙය්‍යො යන වාක්‍යයෙහි, සොණලෙය්‍යො යනු වේ.

දධිභොජනං යන තන්හි දධිශබ්දයාකොරෙන් පරව නා විභක්තිවේ, උපසිත්තං යන වාක්‍යයාවි, භොජනශබ්දයාකොරෙන්වූ සි හට අංවේ, දධිනා උපසිත්තං භොජනං යන තන්හි විතියානතාදීහු උත්තර—පෙ—නම්වත්ව සිව අංව පැමිණි දධිනා උපසිත්තං භොජනං යන වාක්‍යයෙහි දධිභොජනං යනු වේ-මෙහි පූර්වීයනී මෙන් වාක්‍යයනට අප්‍රයොග කරණු.

මේ පදනූය තෘතීයා සමාසයයි.

අසි කලහො යන තන්හි අසිශබ්දයාකොරෙන් පරව නා විභක්තිවේ, කලහශබ්දයාකොරෙන් පරව සිව ඔවේ, අසිනා කලහො යන තන්හි විතියානතාදීහු උත්තර-පෙ-නම්වත්ව සිව ඔව අසිනා කලහො යන වාක්‍යයෙහි අසිකලහො යනු වේ.

මේ කරණකාරකයෙහි සමාසයයි-

බුඩදෙය්‍යං යන තන්හි බුඩශබ්දයාකොරෙන් පරව ස විභක්තිවේ, ස පරකල්හි "සාගමොසෙ" සී සකාරාගමවේ, දෙය්‍යශබ්දයාකොරෙන් සිව අංවේ, බුඩස්ස දෙය්‍යං යන තන්හි විතියානතාදීහු උත්තර-පෙ-නම්වත්ව, සිව අංව පැමිණි බුඩස්ස දෙය්‍යං යන වාක්‍යයෙහි බුඩදෙය්‍යං යනු වේ— පරස්සපදං යන තන්හි පරශබ්දයාකොරෙන් පරව ස විභක්තිවේ, ස පර කල්හි "සාගමොසෙ" යි සකාරාගමවේ, පදශබ්දයාකොරෙන් සිව අංවේ, පරස්සපදංයනාදීහු උත්තර—පෙ—පූර්වපදයාගේ විභක්තිහට "තෙසං" යනාදීන් ලොප් පැමිණි කල්හි මෙම සූත්‍රයෙහි චග්‍රහණයෙන් ප්‍රතිෂෙධ ව "තාඩිතා" දීන් නම්වත්ව සිව අංව පරස්ස පදං යනු වේ—අත්තනො පදං යන තන්හි අත්තශබ්දයාකොරෙන් පරවූ ස විභක්තිහට "සස්ස නො" යි නො වේ, පදශබ්දයාකොරෙන් සිව අංව අත්තනො පදං යන තන්හි විතියානතාදීහු උත්තර—පෙ—පූර්වපදයාගේ විභක්තිහට පරස්ස පදං යන තන්හි සෙයින් ප්‍රතිෂෙධව "තාඩිතා" දීන්නම්වත්ව සිව අංව අත්තනො පදං යනු වේ—බුඩදෙය්‍යං යනාදී මේ පදනූය චතුර්ථී සමාසයයි.

චොරභයං යන තන්හි චොරශබ්දයාකොරෙන් පරව ස්මා විභක්තිවේ, භයශබ්දයාකොරෙන් පරව සිව අංවේ, චොරස්මා භයං යන තන්හි විතියානතාදීහු උත්තර—පෙ-නම්වත්ව සිව අංව චොරස්මා භයං යන වාක්‍යයෙහි චොරභයං යනු වේ—බන්ධනස්මා මුත්තො යන වාක්‍යයෙහි බන්ධනමුත්තො යනුද මෙසේ මැයි.

මේ දෙක පචමී සමාසයි.

රාජපුත්තො යන තන්හි රාජශබ්ද රාජකීය වේ, ඔහුකෙරෙන් පරව ස විභක්ති වේ, ස විභක්තිහා සමග රාජශබ්දයහට "රාජස්ස රඤ්ඤොරාජිනො සෙ" යි රඤ්ඤො යනාදෙශ වේ, පුත්තශබ්දයාකෙරෙන් පරව සිව ඔව රඤ්ඤො "පුත්තො" යන තන්හි විතීයානතාදීහු උත්තර-පෙ-නම්වත්ව සිව ඕව රඤ්ඤො පුත්තො යන වාක්‍යයෙහි රාජපුත්තො යනු වේ.

බ්‍රාහ්මණකණ්හදන්තා යන තන්හි බ්‍රාහ්මණශබ්ද කණ්හශබ්ද දන්තශබ්ද යන පදත්‍රයක එහෙයින් දන්තශබ්දය අපේක්ෂා කෙළේනුයි කණ්හශබ්දයහා සම්බන්ධබවක් නැත්ල, එහෙයින් සමාස නොවේ, කණ්හා ච තෙ දන්තා ච යි කම්මධාරය සමාස කළහොත් කණ්හදන්තශබ්දවය එකක්වූහෙයින් බ්‍රාහ්මණකණ්හදන්තා කියා සමාස වේ, එහෙයින් බ්‍රාහ්මණකණ්හදන්ත යන තන්හි බ්‍රාහ්මණශබ්දයාකෙරෙන් ස විභක්තිව "සාගමො සෙ" යි සකාරාගමවේ, කණ්හදන්තශබ්දවය එකක්වූහෙයින් කණ්හදන්තශබ්දයාකෙරෙන් යො විභක්ති වේ, ඊහට "සබ්බයොනී" යනාදීන් ආ වේ, බ්‍රාහ්මණස්ස කණ්හදන්තා යන තන්හි විතියානතාදීහු උත්තර-පෙ-නම්වත්ව යො විභක්තිව යොහට "සබ්බයොනී" යනාදීන් ආ වේ, බ්‍රාහ්මණස්ස කණ්හදන්තා යන වාක්‍යයෙහි බ්‍රාහ්මණකණ්හදන්තා යනු වේ.

රඤ්ඤො මාගධස්ස ධනං යන තන්හි රඤ්ඤො යන ෂෂ්ඨීතොමෝ ධනශබ්දය අපේක්ෂා කෙළේනුයි රාජශබ්දයෙන්ද මාගධශබ්දයෙන්ද එකම රජහු කියනුලබනහෙයින් භෙදයක්හු නැතිහෙයින් සම්බන්ධයක්හු නැත්නුයි සමානාධිකරණවූවද මාගධශබ්දයහා රාජශබ්දය සමාස කරණු නොලැබේ— රඤ්ඤො, අස්සා ච පුරිසා ච යන්නෙහි රඤ්ඤො අස්සා රඤ්ඤො පුරිසො යී වෙන වෙනම සමාසවන හෙයින් අපෙක්ෂා සහිතබවක් ඇත්නුයි සමාස නොවේ, එහෙයින් අස්සා ච පුරිසො ච අස්සපුරිසා කියා චව සමාසකිරීමෙන් එකක්කොට රාජශබ්දයාකෙරෙන් පරවූ සහට "රාජස්ස රඤ්ඤොරාජිනො සෙ" යන සූත්‍රයෙන් රඤ්ඤො යනාදේශ වේ, අස්සපුරිසශබ්දයාකෙරෙන් යොව යොහට "සබ්බයොනී" යනාදීන් ආව රඤ්ඤො, අස්සපුරිසා යන තන්හි විභීයානතාදීහු උත්තර-පෙ-නම්වත්ව ඔහුකෙරෙන් පරව යොව ආව රඤ්ඤො අස්සපුරිසා යන වාක්‍යයෙහි රාජස්සපුරිසා යනු වේ— අනිකක්හුගේ අපෙක්ෂාබවක් නැතිහෙයින් සමාසවූ නියායි.

රාජගුරුපුත්තො යන තන්හි රාජශබ්දයාකෙරෙන් ස විභක්ති පරකල්හි විභක්ති සහිතවූ රාජශබ්දයහට "රාජස්ස" යනාදීන් රඤ්ඤො යනාදෙශ වේ, ගුරුශබ්දයාකෙරෙන් පරවූ සහට "ඝපලතො සස්ස නො වා" යි නො වේ, පුත්තශබ්දයාකෙරෙන් සිව ඔව රඤ්ඤො, ගුරුනො පුත්තො යන තන්හි විතීයානතාදීහු උත්තර-පෙ-නම්වත්ව සිව ඔව රඤ්ඤො ගුරුනො පුත්තො යන වාක්‍යයෙහි රාජගුරුපුත්තො යනු වේ — ගමකත්වබැවින් පදත්‍රය සමාසවූ නියායි-රාජපුත්තො යනාදි සතරපදය ෂෂ්ඨීසමාසයි.

රූපසඤ්ඤා යන තන්හි රූපශබ්දයාකෙරෙන් පරවූ ස්මිංහට "අමා සම්නාතං වා" සී එවේ, සඤ්ඤාශබ්දයාකෙරෙන් පරවූ සිහට "සෙසතො" යනාදීන් ලොප්වේ, රූපෙ සඤ්ඤා යන තන්හි විතියානතාදිහු උත්තර පද—පෙ-නම්වත්ව රූපෙ සඤ්ඤා යන වාක්‍යයෙහි රූපසඤ්ඤා යනු වේ.

කූපමණ්ඩූකො යන තන්හි කූප ශබ්දයාකෙරෙන් පරවූ ස්මිංහට එකාර වේ, මණ්ඩූකශබ්දයාකෙරෙන් සිව ඔවේ, විය යන වාක්‍යයවේ, කූපෙ මණ්ඩූකො විය යන තන්හි විතියානතාදීහු උත්තරපද—පෙ-නම්වත්ව සිව ඔව කූපෙ මණ්ඩූකො විය යන වාක්‍යයෙහි කූපමණ්ඩූකො යනු වේ—මෙහි විය යන වාක්‍යයහට "වුත්තත්ථාන" යනාදීන් අප්‍රයොග කටයුතු—නගරෙ කාකො විය යන වාක්‍යයෙහි නගරකාකො යනුද මෙසේ මැයි.

අන්තෙවාසිකො යන තන්හි අන්තශබ්දයාකෙරෙන් පරවූ ස්මිංහට එකාරවේ, වාසිකශබ්දයාකෙරෙන් සිව ඔව අන්තෙ වාසිකො යන තන්හි විතියානතාදීහු උත්තරපද—පෙ—පුබ්බපදයාගේ විභත්තිහට "තෙසං" යනාදීන් ලොප් පැමිණිකල්හි මෙම සූත්‍රයෙහි චග්ගහණයෙන් ප්‍රතිෂෙධ වේ, නම්වත්ව සිව ඔව අන්තෙවාසිකො යනු වේ—රූපසඤ්ඤා යනාදි හැම සප්තමී සමාසයි.

අමාදිසමාසයි.

—— ** ——

ආගතසමණො යන තන්හි ආගතශබ්දයාකෙරෙන්ද සමණශබ්දයාකෙරෙන්ද ප්‍රථමා යො වේ, යොහට "සබ්බයොනි" යනාදීන් ආවේ, යං සො යන වාක්‍යය වේ, ආගතා සමණා යං සො යන තන්හි ප්‍රථමාන්තනොවන්නාවූ අන්‍ය පදයන්ගේ අර්ථයෙහි නාමයෝ දෙදෙනෙක්හෝ බොහෝදෙනෙක්හෝ යම්කලෙක්හි සමාසකරණුලැබෙද්ද එකල්හි ඒසමාසය "නාමානං සමාසො යුත්තත්ථො" යනු වැටෙන්නෙහි "අඤ්ඤපදත්ථෙසු බහුබ්බීහි" යන සූත්‍රයෙන් බහුබ්‍රීහි සමාසවේ, ඊහට එම සූත්‍රයෙන්ම බහුබ්‍රීහි සමාස සංඥාවේ, සමාසයාවිසින්ම වාක්‍යයා කමා හැඟෙනහෙයින් වාක්‍යයහට "වුත්තත්ථානමප්පයොගො" යනු න්‍යායහෙයින් අප්‍රයොග වේ, පුබ්බොත්තරපදයන් සම්බන්ධිවූ විභත්තීන්ට "තෙසං" යනාදීන් ලොප්වේ, සමාසාන්තයා නමා අලිඟුහෙයින් "ස්‍යාදිතො" දීන්නම්වත් වේ, ඔහුකෙරෙන් පරව සිව ඔවේ, ආගතා සමණා යං සො යන වාක්‍යයෙහි ආගත සමණො යනු වේ—මගෙනහිදු මෙසේම වාක්‍ය යොද ගතයුතු—මෙයින් සංඝාරාමය හැඟේ—මේ කර්මකාරක සමාසයි.

ජිතින්ද්‍රියො යන තන්හි ජිතශබ්දයාකෙරෙන්ද ඉන්ද්‍රියශබ්දයාකෙරෙන්ද පරව විතියා * යො විභක්ති වේ, ඔවුන්ට "අතො නිච්චං" සී නිවේ, නිආදෙශයන් පරකල්හි "යොසු කතනිකාර" යනාදීන් දීඝවේ, යෙන සො යන වාක්‍යයවේ, ජිතානි ඉන්ද්‍රියානි යෙන සො යන වාක්‍යයෙහි ප්‍රථමාන්ත—පෙ—නම්වත්ව සිව ඔව ජිතානි ඉන්ද්‍රියානි යෙන සො යන වාක්‍යයෙහි ජිතින්ද්‍රියො යනු වේ—මෙයින් බුදුවරයන් ප්‍රකාශිතයි.

* ප්‍රථමාසි-විතියා නොවේ.

ආහිතග්ගි යන තන්හි ආහිතශබ්දයාකෙරෙන් සිව ඔවේ, අග්ගිශබ්දයාකෙරෙන් සිව ලොප්වේ, යෙන සො යන වාක්‍යයවේ, ආහිතො අග්ගි යෙන සො යන තන්හි ප්‍රථමානත—පෙ—නම්වත්ව සිව ලොප්ව ආහිතො අග්ගි යෙන සො යන වාක්‍යයෙහි ආහිතග්ගි යනු වේ...... වක්ඛාවිචිත්‍රතාවශයෙන් විශෙෂණයා පරකොට විශෙෂ්‍යයා පූර්වකොට අග්ගි ආහිතො යන වාක්‍යයෙහි අග්‍යාහිතො යනු වේ—මෙයින් ගිනි දල්වන පුරුෂයා හැඟේ—මේ කර්තෘකාරක සමාසයි.

ඡින්නරුක්ඛො යන තන්හි ඡින්නශබ්දයාකෙරෙන්ද රුක්ඛශබ්දයාකෙරෙන්ද සිව ඔවේ, යෙන සො යන වාක්‍යයවේ, ඡින්නා රුක්ඛා යෙන සො යන තන්හි ප්‍රථමානත—පෙ—නම්වත්ව සිව ඔව ඡින්නා රුක්ඛා යෙන සො යන වාක්‍යයෙහි ඡින්නරුක්ඛො යනු වේ...... මෙයින් පොරොව ප්‍රකාශිතයි—මේ කරණකාරක සමාසයි.

දින්නසුඞ්කො යන තන්හි දින්නශබ්දයාකෙරෙන්ද සුඞ්කශබ්දයාකෙරෙන්ද සිව ඔවේ, යස්ස සො යන වාක්‍යයවේ, දින්නො සුඞ්කො යස්ස සො යන තන්හි ප්‍රථමානත-පෙ—නම්වත්ව සිව ඔව දින්නො සුඞ්කො යස්ස සො යන වාක්‍යයෙහි දින්නසුඞ්කො යනු වේ...... මෙයින් නරෙන්ද්‍රයා ප්‍රකාශිතයි-මේ චතුර්ථී සමාසයි.

නිග්ගතජනො යන තන්හි නිග්ගතශබ්ද ජනශබ්දයන්කෙරෙන් පරව ප්‍රථමා යො වේ, යොහට "සබ්බයොනී" යනාදීන් ආ වේ, යස්මිං සො යන වාක්‍යයවේ, නිග්ගතා ජනා යස්මිං සො යන තන්හි ප්‍රථමානත—පෙ—නම්වත්ව නිග්ගතා ජනා යස්මිං සො යන වාක්‍යයෙහි නිග්ගතජනො යනු වේ—මෙයින් ගම ප්‍රකාශිතයි-මේ පඤ්චමී සමාසයි.

දසබලො යන තන්හි දසශබ්දයාකෙරෙන් යොවේ, යොහා සමග දසශබ්දයාගේ අන්ත්‍යයහට "පඤ්චාදීනමකාරො" සී අත්වේ, බලශබ්දයාකෙරෙන් පරවූ යො හට "අතො නිච්චං" යී නි වේ, නි පරකල්හි පූර්වස්වරයහට "යොසු කත" යනාදීන් දීර්ඝවේ, යස්ස සො යන වාක්‍යයවේ, දසබලානි යස්ස සො යන තන්හි ප්‍රථමානත-පෙ-නම්වත්ව දසබලානි යස්ස සො යන වාක්‍යයෙහි දසබලො යනු වේ.

අසමො යන තන්හි න යන නිපාතයාකෙරෙන් පරවූ සි හට ලොප් වේ, නත්ථි යන වාක්‍යය වේ, සමශබ්දයාකෙරෙන් සිව ඔවේ, යස්ස සො යන වාක්‍යය වේ, නත්ථි සමො යස්ස සො යන තන්හි ප්‍රථමානත-පෙ-විභක්තිහට ලොප් වේ, පූර්වනකාරයහට "අත්තං නස්ස තප්පුරිසෙ" යන සූත්‍රයෙහි "අත්තං නස්ස" යන යොගවිභාග බලයෙන් අකාරාදෙශවේ, "තද්ධිතා" දීන් නම්වත්ව සිව ඔව නත්ථි සමො යස්ස සො යන වාක්‍යයෙහි අසමො යනු වේ.

පහූතජිව්හො යන තන්හි පහූත ශබ්දයාකෙරෙන් පරව "ඉත්ථියමිතො ආපච්චයො" සී ආ ප්‍රත්‍යය වේ, පහූතා ශබ්දයාකෙරෙන්ද ජිව්හා ශබ්දයාකෙරෙන්ද සිව ලොප් වේ, යස්ස සො යන වාක්‍යය වේ, පහූතා ජිව්හා යස්ස

සො යන තන්හි ප්‍රථමාන්ත-පෙ-විභත්තීන්ට ලොප් වේ, පූර්වෝත්තරපද යන්ට "ඉත්ථියමභාසිතපුම්ත්ථී පුමාව චෙ" සී පුංවත් වේ, සමාසාන්තයා තමා අලිඟුහෙයින් "තද්ධිතා" දින් නම්වත්ව සිව බව පහූතජිව්හො යනු වේ.

මහාපඤ්ඤො යන තන්හි මහන්ති ශබ්දයාකෙරෙන්ද පඤ්ඤා ශබ්දයාකෙරෙන්ද සිහට ලොප් වේ, යස්ස සො යන වාක්‍යය වේ, මහන්ති පඤ්ඤා, යස්ස සො යන තන්හි ප්‍රථමාන්ත-පෙ-මහන්ති ශබ්දයාගේ අන්ත ඊකාරය හට "ක්වචි සමාසන්තගතානමකාරන්තො" සී අත්‍ව වේ, පූර්වෝත්තර පදයන්ට "ඉත්ථියමභාසිත පුම්ත්ථී පුමාව චෙ" සී පුංවත් වේ, මහන්තශබ්දය හට "මහතං මහා" යනාදීන් මහා ආදේශ වේ, "තද්ධිතා" දින් නම්වත්ව සිව බව මහන්ති පඤ්ඤා යස්ස සො යන වාක්‍යයෙහි මහාපඤ්ඤො යනු වේ.

විසාලක්ඛො යන තන්හි විසාල ශබ්දයාකෙරෙන් සිව අං වේ; අක්ඛිශබ්දයාකෙරෙන් සිව ලොප් වේ, යස්ස සො යන වාක්‍යය වේ, විසාලං අක්ඛි යස්ස සො යන තන්හි ප්‍රථමාන්ත-පෙ-අක්ඛිශබ්දයාගේ අන්ත ඉකාරය හට "ක්වචි සමාසන්ත" යනාදී සූත්‍රයෙන් අත්‍ව වේ, නම්වත්ව සිව බව විසාලං අක්ඛි යස්ස සො යන වාක්‍යයෙහි විසාලක්ඛො යනු වේ.

පච්චක්ඛධම්මා යන තන්හි පච්චක්ඛ ශබ්දයාකෙරෙන්ද ධම්මශබ්දයාකෙරෙන්ද සිව ඕ වේ, යස්ස සො යන වාක්‍යය වේ, පච්චක්ඛො ධම්මො යස්ස සො යන තන්හි ප්‍රථමාන්ත-පෙ-ධම්ම ශබ්දයාගේ අන්තයහට "ක්වචි සමාසන්ත" යනාදී සූත්‍රයෙහි කාරග්‍රහණයෙන් ආ වේ, නම්වත්ව සිව ලොප් වේ, පච්චක්ඛො ධම්මො යස්ස සො යන වාක්‍යයෙහි පච්චක්ඛධම්මා යනු වේ.

සුගන්ධි යන තන්හි සු යන උපසර්ගයාකෙරෙන් සිව ලොප් වේ, සොභනො යන වාක්‍යය වේ, ගන්ධශබ්දයාකෙරෙන් සිව ඔ වේ, යස්ස සො යන වාක්‍යය වේ, සොභනො ගන්ධො යස්ස සො යන තන්හි ප්‍රථමාන්ත-පෙ-ගන්ධ ශබ්දයාගේ අන්තයහට "ක්වචි සමාසන්ත" යනාදීසූත්‍රයෙහි කාරග්‍රහණයෙන් ඉකාර වේ, නම්වත්ව සිව ලොප්ව සොභනො ගන්ධො යස්ස සො යන වාක්‍යයෙහි සුගන්ධි යනු වේ.

බහුකන්තිකො යන තන්හි බහුශබ්දයාකෙරෙන් පරවූ යොහට "ලතො වොකාරො ච" සී වො ආදේශ වේ, වො යනාදේශයා පරකල්හි ලසංඥයාහට "වෙවොසු ලො ච" සී අත්‍වවේ, කන්තිශබ්දයාකෙරෙන් යො වේ, යස්ස සො යන වාක්‍යය වේ, බහවො කන්තියො යස්ස සො යන වාක්‍යයෙහි ප්‍රථමාන්ත-පෙ-ස්ත්‍රීලිඟුයෙහි වැටෙන්නාවූ ඉවණ්ණාන්තයාකෙරෙන් පරව "ක්වචි සමාසන්ත" යනාදියෙහි කාරග්‍රහණයෙන් කප්‍රත්‍යය වේ, නම්වත්ව සිව බව බහවො කන්තියො යස්ස සො යන වාක්‍යයෙහි බහුකන්තිකො යනුවේ — දසබලො යනාදී අටපදයෙන් බුදුන් ප්‍රකාශිතයි — බහුකන්තිකො යන්නමෙන් බහුවුඩ්ඪිකො යනුත් සිඩකටයුතු

බහුනදිකො යන තන්හි බහුශබ්දයාකෙරෙන් පරවූ යොහට "ලතො වොකාරො ච" යි වො යනාදෙශ වේ. වො යනාදෙශයා පරකල්හි "වෙ වොසු ලො ච" යි අත්වවේ, නදීශබ්දයාකෙරෙන් යො විභක්ති වේ, යො විභක්ති පරකල්හි නදී ශබ්දයාගේ ඊකාරයහට "අඝො රස්සං" යනාදීන් හ්‍රස්වවේ, බහවො නදියො යස්ස සො යන තන්හි ප්‍රථමාන්ත-පෙ-ස්වරාන්ත ප්‍රකෘතිහට "ප්‍රකෘති චස්ස" යනාදී සූත්‍රයෙන් ප්‍රකෘතිවත් වේ, ස්ත්‍රීලිඞ්ගයෙහිවූ ඉවර්ණාන්තයාකෙරෙන්ද පරවූ "ක්වචි සමාසන්තා" යනාදී සූත්‍රයෙහි කාරග්‍රහණයෙන් කප්‍රත්‍යය වේ, කප්‍රත්‍යයා පරකල්හි ඊකාරයහට "යදනුපපන්නා" යනාදී සූත්‍රයෙන් හ්‍රස්වවේ, බහවො නදියො යස්ස සො යන වාක්‍යයෙහි බහුනදිකො යනු වේ —— මෙයින් සමුද්‍රය ප්‍රකාශිතයි.

බහුකත්තුකො යන තන්හි බහුශබ්දයාකෙරෙන්ද කත්තුශබ්දයාකෙරෙන්ද යො වේ, බහු ශබ්දයහට ආදෙශාදිය යට ක්‍රමයෙන් කටයුතු-යො පරකල්හි කත්තුශබ්දයාගේ අන්තයහට "අඤ්ඤෙස්වාරත්තං" යි ආර වේ, ආර යනාදෙශයාකෙරෙන් පරවූ යොහට "තතො යො නමො තු" යි ඔ වේ, යස්ස සො යන වාක්‍යය වේ, බහවො කත්තාරො යස්ස සො යන වාක්‍යයෙහි ප්‍රථමාන්ත—පෙ—ස්වරාන්තප්‍රකෘතිහට "ප්‍රකෘති චස්ස" යනාදීන් ප්‍රකෘතිවත් වේ, ඌවර්ණාන්තයාකෙරෙන් පරවද "ක්වචි සමාසන්තා" යනාදියෙහි කාරග්‍රහණයෙන් කප්‍රත්‍යය වේ, නම්වත්ව සිව ඔව බහවො කත්තාරො යස්ස සො යන වාක්‍යයෙහි බහුකත්තුකො යනු වේ-දසබලො යනාදී හැම ෂෂ්ඨී සමාසයි.

මත්තබහුමාතඞ්ගං යන තන්හි මත්තශබ්දයාකෙරෙන්ද මාතඞ්ගශබ්දයාකෙරෙන්ද යොව යොහට ආ වේ, බහුශබ්දයාකෙරෙන්ද යො වේ, යොහට වො යනාදෙශද ලසංඥයහට අත්වද වේ, යස්මිං තං යන වාක්‍යයවේ, මත්තා බහවො මාතඞ්ගා යස්මිං තං යන තන්හි ප්‍රථමාන්ත—පෙ—නම්වත්ව සිව අංව මත්තා බහවො මාතඞ්ගා යස්මිං තං යන වාක්‍යයෙහි මත්තබහුමාතඞ්ගං යනු වේ—මේ පදයෝ බොහෝදෙනෙක් සමාස කළ තැනි—මෙයින් වනාන්තරය ගැනේ—මේ සප්තමී සමාසයි—මේ හැම තුල්‍යාධිකරණබහුව්‍රීහියි.

සුවණ්ණවණ්ණ යන තන්හි සුවණ්ණ ශබ්දයාකෙරෙන් ස විභක්ති ව "සාගමො සෙ" යි සාගම වේ, විය යන වාක්‍යය වේ, වණ්ණශබ්දයාකෙරෙන් සිව ඉ වේ, යස්ස සො යන වාක්‍යය වේ, සුවණ්ණස්ස විය වණ්ණො යස්ස සො යන තන්හි ප්‍රථමාන්ත—පෙ—නම්වත්ව සුවණ්ණස්ස විය වණ්ණො යස්ස සො යන වාක්‍යයෙහි සුවණ්ණවණ්ණො යනු වේ—මෙයින්බුදුන් ප්‍රකාශිතයි.

වජිරපාණී යන තන්හි වජිරශබ්දයාකෙරෙන් සිව අං වේ, පාණිශබ්දයාකෙරෙන් ස්මිං වේ, ඕ හට මහි වේ, යස්ස සො යන වාක්‍යය වේ, වජිරං පාණිම්හි යස්ස සො යන තන්හි ප්‍රථමාන්ත—පෙ—නම්වත්ව සිව ලොප්ව වජිරං පාණිම්හි යස්ස සො යන වාක්‍යයෙහි වජිරපාණී යනු වේ —— මෙයින් ශක්‍රයා ගැනේ,

උරසිලොමො යන තන්හි උරශබ්දයාකෙරෙන් පරව ස්මිං වේ, මනොගණාදීන්කෙරෙන් පරවූ ස්මිංහට "මනොගණාදිතො ස්මිංනානමිආ" සී ඉ වේ, විභක්ත්‍යාදෙශස්වරයා පරකල්හි මනාදිශබ්දයන්කෙරෙන් පරව "ස සරෙ වාගමො" සී සාගම වේ, ලොමශබ්දයාකෙරෙන් පරව යොව යොහට "අතො නිච්චං" සී නි වේ, නි පරකල්හි "යොසු කත" යනාදීන් දීඝ වේ, යස්ස සො යන වාක්‍යය වේ, උරසි ලොමානි යස්ස සො යන තන්හි ප්‍රථමාන්ත—පෙ—පුබ්බපදයාගේ විභත්තිහට "තෙසං" යනාදීන් ලොප් පැමිණි කල්හි මෙහිම වක්‍ෂ්‍යමාණයෙන් ප්‍රතිෂෙධව උත්තරපදයාගේ විභක්තිහට මෙයින් ලොප් වේ, වාක්‍යයහට "වුත්තත්ථානමප්පයොගො" යනු න්‍යායයෙහින් අප්‍රයොගවේ, නම්වත්ව සිව ඔව උරසි ලොමානි යස්ස සො යන වාක්‍යයෙහි උරසිලොමො යනු වේ.

සහෙතුකො යන තන්හි සහ යන නිපාතයාකෙරෙන් පරවූ සිහට ලොප් වේ, හෙතුශබ්දයාකෙරෙන් නා වේ, යො වත්තතෙ සො යන වාක්‍යය වේ, සහහෙතුනා යො වත්තතෙ සො යන තන්හි "නාමානං සමාසො යුත්තත්ථො" යනු වැටෙන්නෙහි "අඤ්ඤපදත්ථෙසු බහුබ්බීහි" යන සූත්‍රයෙහි "අත්ථෙසු" යන බහුවචන ග්‍රහණයෙන් ප්‍රථමාන්තයන්ගේ අර්ථයෙහිද කිසිතැනෙක්හි සමාස වෙයි, ඊහට එම සූත්‍රයෙන් බහුබ්බීහි සංඥාද වේ, විභක්තිහට "තෙසං" යනාදීන් ලොප් වේ, වාක්‍යයහට "වුත්තත්ථානං" යනාදීන් අප්‍රයොග වේ, සහශබ්දයහට "සදඤ්ඤපපනානා" යනාදීන් ස වේ, හෙතුශබ්දයාකෙරෙන් පරව "ක්වචි සමාසන්තා" යනාදියෙහි කාරග්‍රහණයෙන් කප්‍රත්‍යයවේ, නම්වත්ව සිව ඔවේ, සහ හෙතුනා යො වත්තතෙ සො යන වාක්‍යයෙහි සහෙතුකො යනු වේ.

සත්තාහ යන තන්හි සත්තශබ්ද අහශබ්දයන්කෙරෙන් පරව යො විභක්ති වේ, එම යොහා සමග සත්ත අහ ශබ්දයන්ගේ අන්තස්වරයහට "පචාදි නම්හාරෙ" සී අ වේ, වා කියාද යෙ තෙ කියාද වාක්‍යය වේ, සත්ත වා අහ වා යෙ තෙ යන තන්හි ප්‍රථමාන්ත—පෙ—නම්වත්ව සත්ත වා අහ වා යෙ තෙ යන වාක්‍යයෙහි සත්තාහ යනු වේ.—මෙයින් මාසයන් හැනේ.

දක්ඛිණපුබ්බා යන තන්හි දක්ඛිණශබ්ද පුබ්බශබ්දයන්කෙරෙන් ස වේ, ඝ සංඥයාකෙරෙන් පරවූ සහට "ඝපතො ස්මිංසානං සංසා" සී සා නාදෙශ වේ, සා යනාදෙශයා පරකල්හි "සංසාස්වෙකවචනෙසු ච" සී සාගම වේ, සා පරකල්හි ඝහට "ඝො රස්සං" සී හ්‍රස්ව වේ, ච කියාද දිසාය යං අන්තරාලං සා කියාද වාක්‍යය වේ, දක්ඛිණස්සා ච පුබ්බස්සා ච දිසාය යං අන්තරාලං සා යන තන්හි "නාමානං"—පෙ—යනු වැටෙන්නෙහි "අඤ්ඤ"—පෙ—යෙහි "අත්ථෙසු" යන බහුවචනග්‍රහණයෙන් ප්‍රථමාන්තයන්ගේ අර්ථයෙහිද කිසිතැනෙක්හි සමාසවේ, ඊහට එම සූත්‍රයෙන් නම්වත්ව දක්ඛිණස්සා ච පුබ්බස්සා ච දිසාය යං අන්තරාලං සා යන වාක්‍යයෙහි දක්ඛිණපුබ්බා යනු වේ.—මෙයින් දක්ෂිණාදි දිශාවන් ප්‍රකාශිතයි-

මේ හැම භින්නාධිකරණබහුබ්‍රීහියි- ප්‍රථමාන්තවූ අන්‍යපදයන්ගේ අර්ථයෙහි සමාසනොකරණු ලැබෙයි කීයේනම් දෙසිතො බුද්ධෙන යො ධම්මො යනාදි තන්හි සමාස නොවන නිසායි-

බහුබ්‍රීහිසමාසයි.

----- ** -----

චන්දසුරියා යන තන්හි චන්දශබ්ද සූර්යශබ්දදෙදෙනාකෙරෙන් සිව ඔවේ, ච යන වාක්‍යය වේ, චන්දො ච සුරියො ච යන තන්හි එකවිභක්තිකවූ නාමයෝ දෙදෙනෙක් යම්කලෙක්හි සමාසකරණුලැබෙද්ද එකල්හි ඒසමාසය "නාමානං සමාසො යුත්තත්ථො" යනු වැටෙනෙනහි "නාමානං සමුච්චයො ද්වන්දො" යන සූත්‍රයෙන් ද්වන්ද්වසමාස වෙයි, ඊහට එයින්ම ද්වන්ද්වසංඥද වේ, වාක්‍යයහට "වුත්තත්ථා න" යනාදීන් අප්‍රයොග වේ, පූර්වෝත්තරපදයන් සම්බන්ධවූ විභක්තීන්ට "තෙසං" යනාදීන් ලොප් වේ, සමාසාන්තයා —පෙ— නම්වත්ව යො ව ඔහුකෙරෙන් පරව යොහට "සබ්බයොනීනමාඒ" යී ආව චන්දො ච සුරියො ච යන වාක්‍යයෙහි චන්දසුරියා යනු වේ— නරො ච නාරියො ච යන වාක්‍යයෙහි නරනාරියො යනුද මෙසේ මැයි.

අක්ඛරපදානි යන තන්හි අක්ඛරශබ්ද පදශබ්දයන්කෙරෙන් පරවූ යොහට "අතො නි වා" යී නිවේ, නියතාදෙශයා පරකල්හි "යොසු කත" යනාදීන් දීර්ඝවේ, ච යන වාක්‍යය වේ, අක්ඛරානි ච පදානි ච යන තන්හි එකවිභක්තිකවූ—පෙ– නම්වත්ව අක්ඛරානි ච පදානි ච යන වාක්‍යයෙහි අක්ඛරපදානි යනු වේ.

චක්ඛුසොතං යන තන්හි චක්ඛුශබ්දයාකෙරෙන් සි විභක්ති ලොප්වේ, සොතශබ්දයාකෙරෙන් සිව අංවේ, ච යන වාක්‍යය වේ, චක්ඛුච සොතං ච යන තන්හි එකවිභක්තිකවූ—පෙ—ප්‍රකෘතිවත් වේ, දිගුසමාස යෙහිමෙන් පාණ්‍යඞ්ගාදීන්ගේ අර්ථයෙහිද "තථා ද්වන්දෙ පාණිතූරිය යොග්ග සෙනඞ්ගඛුද්දජන්තුකවිවිධවිරුද්ධවිසභාගත්ථාදීනං ච" යන සූත්‍රයෙන් එකත්ව නපුංසකත්වය වේ, සමාසාන්තයා තමා අලිඞ්ගහෙයින් "තබිතා" දීන් නම්වත්ව සිව අංව චක්ඛු ච සොතං ච යන වාක්‍යයෙහි චක්ඛුසොතං යනු වේ— ගීතං ච වාදිතං ච ගීතවාදිතං — යුගං ච නඞ්ගලං ච යුගනඞ්ගලං- යන මේ පදවලද මෙසේ මැයි.

හත්ථස්සං යන තන්හි හත්ථිශබ්දයාකෙරෙන් සිව ලොප්වේ, අස්සශබ්දයාකෙරෙන් සිව ඔවේ, ච යන වාක්‍යය වේ, හත්ථි ච අස්සො ච යන තන්හි එකවිභක්තිකවූ—පෙ—ප්‍රකෘතිවත්වේ. දිගුසමාසයෙහි මෙන් පාණ්‍යඞ්ගාදීන්ගේ අර්ථයෙහිද "තථා ද්වන්දෙ" යනාදී සූත්‍රයෙන් එකත්ව නපුංසකත්වය වේ, හත්ථිශබ්දයාගේ එකාරසථ ඉකාරයාහට "-ඉවණ්ණො යං නවා" යී යකාර දෙශ වේ, යකාර ඊකාර යෙහි සංහිත වේ, යක රණු අකාරයාහට "සරා සරෙ ලොපං" යී ලොප්ව පැමිණ නම්වත්ව අං විභක්තිව හත්ථි ච අස්සො ච යන වාක්‍යයෙහි හත්ථස්සං යනු වේ.

අසි ච චම්මං ච අසිචම්මං, ඩංසා ච මකසා ච ඩංසමකසං, කාකො ච උලූකා ච කාකොලූකං, නාමං ච රූපං ච නාමරූපං යන මේ ආදිපද මෙසේ මැයි.

ඉත්ථිපුමං යන තන්හි ඉත්ථිශබ්දයා කෙරෙන් සිව ලොප්වේ, පුමශබ්දයා කෙරෙන් පරවූ යොහට "සබ්බයොනී" යනාදින් ආවේ, ච යන වාක්‍යය වේ, ඉත්ථී ච පුමා ච යන තන්හි එකවිභත්තිකවූ—පෙ—ඉත්ථිශබ්දයාගේ ඊකාරයහට "යදනුපපන්නා" යනාදින් හ්‍රස්වවේ, දිගුසමාසයෙහි මෙන් ගිත්‍යලිඞ්ගයන්ගේ අර්ථයෙහිද "තථා ද්වන්දෙ" යනාදී සූත්‍රයෙහි ආදිග්‍රහණයෙන් එකත්ව නපුංසකත්වය වේ, නම්වත්ව සිව අංවේ, ඉත්ථී ච පුමා ච යන වාක්‍යයෙහි ඉත්ථිපුමං යනු වේ—දාසී ච දාසො ච දාසිදාසං යනුද මෙසේ මැයි-දාසීශබ්දයාගේ ඊකාරයහට "යදා" දීන් හ්‍රස්වවේ, පත්තො ච චීවරං ච පත්තචීවරං, ගඞ්ගා ච සොණො ච ගඞ්ගාසොණං, තිකං ච චතුක්කං ච තිකචතුක්කං, වෙණො ච රථකාරො ච වෙණරථකාරං, සාකුණිකො ච මාගවිකො ච සාකුණිකමාගවිකං, ආරා ච යට්ඨි ච ආරයට්ඨි, කණ්ඩා ච කලාපො ච කණ්ඩකලාපං - යන මේ හැම පදයන්ටම "තථා ද්වන්දෙ" යනාදී සූත්‍රයෙහි ආදිග්‍රහණයෙන් එකත්ව නපුංසකත්වය කරණු.

ධවඛදිරං ධවඛදිරා යන තන්හි ධවශබ්ද ඛදිරශබ්දයන්කෙරෙන්ද පරවූ සිගට ඔවේ, ච යන වාක්‍යය වේ, ධවො ච ඛදිරො ච යන තන්හි එකවිභත්තිකවූ-පෙ-ප්‍රකෘතිවත්වේ, දිගුසමාසයෙහිමෙන් වෘක්ෂාදීන්ගේ අර්ථයෙහි "විභාසා රුක්ඛතිණපසුධනධඤ්ඤජනපදාදීනං ච" යන සූත්‍රයෙන් විකල්පයෙන් එකත්ව නපුංසකත්වය වේ, නම්වත්වේ, ධවඛදිරං ධවඛදිරා යනු වේ—මුඤ්ජො ච බබ්බජො ච මුඤ්ජබබ්බජං, මුඤ්ජබබ්බජා-අජා ච එළකො ච අජෙළකං අජෙළකා—මෙහි උත්තරපදයා සම්බන්ධවූ පූර්වඑකාරයා පරකල්හි ජකාරයෙහි අකාරයහට "සරලොපො" දීන් ලොප්කරණු—හිරඤ්ඤං ච සුවණ්ණං ච හිරඤ්ඤසුවණ්ණං, හිරඤ්ඤසුවණ්ණානි—සාලි ච යවො ච සාලියවං, සාලියවා—කාසි ච කොසලො ච කාසිකොසලං, කාසිකොසලා - යන මේ හැම පදම ධවඛදිරං යන පදය මෙනි.

කුසලාකුසලං, කුසලාකුසලානි යන තන්හි කුසලඅකුසලශබ්දයන්කෙරෙන් පරව සිව අංවේ, ච යන වාක්‍යය වේ, කුසලං ච අකුසලං ච යන තන්හි එකවිභත්තිකවූ-පෙ-ප්‍රකෘතිවත්වේ, දිගුසමාසයෙහිමෙන් ද්වන්ද්වසමාසයෙහිවූ නිත්‍යවිරෝධීවූ අද්‍රව්‍යවාචීශබ්දයන්ගේ අර්ථයෙහි "විභාසා" දී සූත්‍රයෙහි ආදිග්‍රහණයෙන් විකල්පයෙන් එකත්ව නපුංසකත්වය වේ, නම්වත්ව කුසලං ච අකුසලං ච යන වාක්‍යයෙහි කුසලාකුසලං, කුසලාකුසලානි යනු වේ—බකො ච බලාකා ච බකබලාකං, බකබලාකා—දධි ච ඝතං ච දධිඝතං, දධිඝතානි—පුබ්බං ච අපරං ච පුබ්බාපරං, පුබ්බාපරානි—යන මේ පදත්‍රයම "විභාසා" දී සූත්‍රයෙහි ආදිග්‍රහණයෙන් විකල්පයෙන් එකත්ව නපුංසකත්වය කරණු.

ද්වන්ද්වසමාසයි.

—— ** ——

අධිත්ථි යන තන්හි අධි යන උපසර්ගයාකෙරෙන් සිං විභක්ති වේ, ඕහට "සබ්බාසමාවුසො" යනාදී සූත්‍රයෙන් ලොප් වේ, ඉත්ථිශබ්දයාකෙරෙන්ද සිං වේ, පසංඥයාකෙරෙන් පරවූ සිං විභක්තිහට "සපතො සිං යං වා" යි යං යනාදෙශ වේ, ආධාරභූතායමිත්ථියං යන වාක්‍යය වේ, අධිඉත්ථියං යන තන්හි උපසර්ගනිපාතයන් පූර්වකොටඇති ශබ්දයතෙම විභත්‍යර්ථාදියෙහි යම්කලෙක්හි සමාසකරණලැබේද්ද එකල්හි ඒ සමාසයතෙම "නාමානං සමාසො යුත්තත්ථො" යනු වැටෙන්නෙහි "උපසග්ගනිපාතපුබ්බකො අබ්‍යයීභාවො" යන සූත්‍රයෙන් අබ්‍යයීභාවසමාස වේ, ඕහට එම සූත්‍රයෙන්ම අබ්‍යයීභාවසමාස සංඥද වේ, උක්තාර්ථවූ වාක්‍යයහට "වුත්තත්ථානමප්පයොගො" යනු න්‍යායහෙයින් අප්‍රයෝගවේ, විභක්තිහට "තෙසං විභත්තියො" යනාදින් ලොප්වේ, අව්‍යයීභාවසමාසයතෙම "සො නපුංසකලිඞ්ගො" යි නපුංසකලිඞ්ගවේ, "යදනුපපන්නා" යනාදීන් එකවචනද වේ, "සරෙ රස්සො නපුංසකෙ" යි හ්‍රස්වවේ, සමාසාන්තයා තමා අලිඞ්ගහෙයින් "තද්ධිතා" දී සූත්‍රයෙන් නාමවත්ව ඔහුකෙරෙන් පරව සි විභක්ති වේ, අකාරාන්තනොවන්නාවූ අව්‍යයීභාවසමාසයාකෙරෙන් පරවූ සි විභක්තිආදීන්ට "අඤ්ඤස්මා ලොපො ච" යි ලොප් වේ, අධිඉත්ථියං යන වාක්‍යයෙහි අධිත්ථි යනු වේ.

උපනගරං යන තන්හි උප යන උපසර්ග උපක්‍රියාවේ, ඔහුකෙරෙන් පරව සි විභක්ති වේ, ඕහට "සබ්බාසමාවුසො" යනාදින් ලොප්වේ, නගරශබ්දයාකෙරෙන් ස විභක්තිව "සාගමො සෙ" යි සකාරාගමවේ සමීපං යන වාක්‍යයවේ, උපපූර්වකොටඇති නගරස්ස සමීපං යන තන්හි—පෙ—නපුංසකලිඞ්ගවේ, "තද්ධිතා" දින් නාමවත්වේ, ඔහුකෙරෙන් පරව සි විභක්තිවේ, අකාරාන්තවූ අබ්‍යයීභාවසමාසයාකෙරෙන් පරවූ සිහට "අං විභත්තීනමකාරන්තාබ්‍යයීභාවා" යි කිසිතැනෙක්හි අං යනාදෙශවේ, නගරස්ස සමීපං යන වාක්‍යයෙහි උපනගරං යනු වේ.

නිම්මක්ඛිකං යන තන්හි නි යන උපසර්ගයා පූර්වකොටඇති මක්ඛිකාශබ්ද මක්ඛිකා කියාවේ, ඔහුකෙරෙන් නං විභක්තිවේ, අභාවො යන වාක්‍යය වේ, අභාවො මක්ඛිකානං යන තන්හි උපසර්ගනිපාතයන් පූර්වකොටඇතිශබ්දය විභත්‍යර්ථාදියෙහි යම්කලෙක්හි—පෙ—අකාරන්තනොවන්නාවූ අබ්‍යයීභාවසමාසයාකෙරෙන් පරවූ සි හට "අං විභත්තීනමකාරන්තාබ්‍යයීභාවා" යි කිසිතැනෙක්හි අංවේ, මක්ඛිකාශබ්දයාගේ ආකාරයහට "සරෙ රස්සො නපුංසකෙ" යි හ්‍රස්වවේ, අභාවො මක්ඛිකානං යන වාක්‍යයෙහි නිම්මක්ඛිකං යනු වේ—මෙහි මක්ඛිකශබ්දයාගේ මකාරයහට "අනුපදිට්ඨානං" යනාදී සූත්‍රයෙන් මකාරයෙක් විකාරණි.

අනුථෙරං යන තන්හි අනු යන උපසර්ග පූර්වකොටඇති ථෙරශබ්ද ථෙර කියාවේ, ඔහුකෙරෙන් පරව නං විභක්ති වේ, නං විභක්ති පරකල්හි "සුනංහිසු ච" යි දීර්ඝවේ, අනුපුබ්බො යන වාක්‍යයවේ, අනුපුබ්බො ථෙරානං යන

තන්හි උපසර්ගනිපාතයන් පූර්වකොටඇති ශබ්දය විභක්ත්‍යර්ථාදියෙහි යම් කලෙක්හි-පෙ-“අං විභත්තීනමකාරන්තාබ්‍යයීභාවා” යී කිසිතැනෙක්හි අංවේ, අනුපුබ්බා ජෙට්ඨානං යන වාක්‍යයෙහි අනුජෙට්ඨං යනු වේ.

යථාසත්ති යන තන්හි යථා යන නිපාතය පූර්වකොටඇති සත්තිශබ්දසත්ති කියාවේ, බහුකෙරෙන් පරව අං විභත්ති වේ, පසංඥයාකෙරෙන් පරවූ අං විභත්තිහට “අමෙම්මා” යනාදී සූත්‍රයෙන් නිග්ගහීතවේ, අනතික්කම්ම යන වාක්‍යයවේ, අනතික්කම්ම සත්තිං යන තන්හි උපසර්ගනිපාතයන්—පෙ— නම්වන්හි සි විභත්ති වේ, අකාරාන්තනොවන්නාවූ අව්‍යයීභාවසමාසයාකෙරෙන් පරවූ සිහට “අඤ්ඤස්මා ලොපො ච” යන සූත්‍රයෙන් ලොප් වේ, අනතික්කම්ම සත්තිං යන වාක්‍යයෙහි යථාසත්ති යනු වේ.

යථාබුද්ධං යන තන්හි යථා යන නිපාතය පූර්වකොටඇති බුද්ධශබ්ද බුද්ධ කියා වේ, බහුකෙරෙන් පරව ප්‍රථමා යො විභක්තිව ආකාරාදේශවේ, යෙ යෙ යන වාක්‍යයවේ, යෙ යෙ බුද්ධා යන තන්හි උපසර්ගනිපාතයන්—පෙ— නම්වන්හි බහුකෙරෙන් පරව සි විභක්තිවේ, අකාරාන්තවූ අව්‍යයීභාවසමාසයාකෙරෙන් පරවූ සිහට “අං විභත්තීනමකාරන්තාබ්‍යයීභාවා” යී කිසිතැනෙක්හි අංවේ, යෙ යෙ බුද්ධා යන වාක්‍යයෙහි යථාබුද්ධං යනු වේ.

යාවජීවං යන තන්හි යාව යන නිපාතය පූර්වකොටඇති ජීවශබ්ද ජීව කියාවේ, බහුකෙරෙන් පරව සවිභක්තිවේ, ස පරකල්හි “සාගමො සෙ” යී සකාරාගමවේ, යත්තකො පරිච්ඡෙදෙ යන වාක්‍යයවේ, යත්තකො පරිච්ඡෙදෙ ජීවස්ස යන තන්හි උපසර්ගනිපාතයන් පූර්වකොටඇති ශබ්දය තෙම විභක්ත්‍යර්ථාදියෙහි—පෙ—නම්වන්හි බහුකෙරෙන් පරව සි වේ, අකාරාන්තවූ අව්‍යයීභාවසමාසයාකෙරෙන් පරවූ සිහට “අං විභත්තීනං” යනාදීන් අං වේ, යත්තකො පරිච්ඡෙදෙ, ජීවස්ස යන වාක්‍යයෙහි යාවජීවං යනුවේ.

ආපබ්බතං යන තන්හි ආ යන උපසර්ගය පූර්වකොටඇති පබ්බතශබ්ද පබ්බතකියාවේ, බහුකෙරෙන් පරව ස්මා විභක්තිවේ, ස්මා විභක්තිහට “ස්මාස්මිනං වා” යී ආව ආපබ්බතා යන තන්හි උපසර්ගනිපාතයන් පූර්වකොට ඇති ශබ්දයතෙම—පෙ—නම්වන්හි සිව සිහට “අං විභත්තීනං” යනාදීන් අංව ආපබ්බතා යන වාක්‍යයෙහි ආපබ්බතං යනු වේ—පර්වතය අක්වා හෙවත් පර්වතය සිම්කොට පර්වතය හැර ක්ෂෙත්‍රයයි කීනියාය.

ආජලන්තං යන තන්හි ආයන උපසර්ගය පූර්වකොටඇති ජලන්තශබ්ද ජලන්තකියාවේ, බහුකෙරෙන් පරවූ ස්මාහට ආව ආජලන්තා යන තන්හි උපසර්ගනිපාතයන් පූර්වකොටඇති ශබ්දයතෙම-පෙ-අංයනාදේශවේ, ආජලන්තා යන වාක්‍යයෙහි ආජලන්තං යනු වේ—දියකෙළවර සමග සීතල යයි කීනියාය.

පවීරෙ යන තන්හි පයන උපසර්ග පූර්වකොටඇති වීරශබ්ද වීරකියාවේ, බහුකෙරෙන් සිව ඔවේ, උත්තමො යන වාක්‍යයවේ, පවීරො යන තන්හි පයන පූර්වපදයාගේ ප්‍රධානත්වයක් මෙහි නැතිහෙයින් අව්‍යයීභාවසමාස නොවෙයි “විපදෙ” යනාදීන් කර්මධාරය සමාසවේ, පවීරො යනු වේ.

අභිධම්මො යන තන්හි අභි යන උපසර්ගයා පූර්වකොටඇති ධම්මශබ්දයා කෙරෙන් සිව ඔවේ, ධම්මො යන වාක්‍යයවේ, අභිධම්මො යන තැන අභි යන පූර්වපදාර්ථය අප්‍රධානහෙයින් අව්‍යයීභාවසමාසනොවේ, මේද කර්මධාරය සමාසමැයි.

කදන්නං යන තන්හි කු යන නිපාත කු කියාවේ, ඔහුකෙරෙන් පරවූ සිහට "සබ්බාසම්‍ාවුසො" යනාදින් ලොප්වේ, කුච්ඡිතං යන වාක්‍යයවේ, අන්න ශබ්දයාකෙරෙන් සිව අංව කුච්ඡිතං අන්නං යන තන්හි—පෙ—ස්වරයා පර කල්හි කුශබ්දයහට "කදං කු ස්සෙ" සී කදයනාදෙශවේ, සමාසාන්තත්‍යානමා අලිඟුහෙයින් "තද්ධිතා" දි සූත්‍රයෙන් නම්වූ සිව අංව කුච්ඡිතං අන්නං යන වාක්‍යයෙහි කදන්නං යනු වේ.

කාලවණ්ණං යන තන්හි කු යන නිපාතයාකෙරෙන් සිව ලොප්වේ, අප්පකං යන වාක්‍යයවේ, ලවණශබ්දයාකෙරෙන් සිව අංව අප්පකං ලවණං යන තන්හි-පෙ-කුශබ්දයහට "කාප්පත්ථෙසු ච" සී කානාදෙශවේ, නම්වත් වේ, සිව අංව අප්පකං ලවණං යන වාක්‍යයෙහි කාලවණං යනු වේ.

කාපුරිසො කුපුරිසො යන තන්හි කුශබ්ද කු කියා දෙතැනෙක වේ, ඔහු කෙරෙන් පරව සිව ලොප්වේ, කුච්ඡිතො යන වාක්‍යයවේ, පුරිසශබ්දයාකෙරෙන් සිව ඔවේ, කුච්ඡිතො පුරිසො යන තන්හි උපසර්ගනිපාතයන් පෙ— "කාප්පත්ථෙසු" යන බහුවචනග්‍රහණයෙන් විකල්පයෙන් කායනාදෙශවේ, නම්වූ කුච්ඡිතො පුරිසො යන වාක්‍යයෙහි කාපුරිසො කුපුරිසො යනු වේ.

සමාසයනිමි.

——**——

වාසිඨො යන තන්හි වසිඨශබ්ද වසිඨ කියා වේ, ඔහුකෙරෙන් පරව සවිභක්තිවේ, ස විභක්ති පරකල්හි "සාගමො සෙ" යි සකාරාගමවේ, අපච්චං පොසො යන වාක්‍යයවේ, වසිඨස්ස අපච්චං පොසො යන තන්හි ෂෂ්ඨ්‍යන්ත නාමයාකෙරෙන් පරව ඔහුගේ දරුය යන අර්ථයෙහි "වා ණපච්චෙ" යන සූත්‍රයෙන් ණප්‍රත්‍යයවේ, ප්‍රත්‍යයාවිසින්ම අපත්‍යාර්ථයා කමා හැඟෙන හෙයින් වාක්‍යයහට "වුත්තත්ථානමප්පයොගො" යනු න්‍යායහෙයින් අප්‍රයොගවේ, විභක්තිහට "තෙසං විභත්තියො ලොපා ච" යන සූත්‍රයෙහි තෙසං ග්‍රහණයෙන් ලොප්වේ, ප්‍රත්‍යයා සම්බන්ධිවූ ණකාරයහට "තෙසං ණො ලොපං" යන සූත්‍රයෙන් ලොප්ව අකාරශෙෂවේ, සණකාර ප්‍රත්‍යයා පරකල්හි අසංයොගාන්තවූ නාමයාගේ ආදිස්වරයහට "වුද්ධාදිස්සරස්සවා සංයොගන්තස්ස සණෙ ච" යන සූත්‍රයෙන් වෘද්ධිවේ, වන්ගෙහිදු "අයුවණ්ණානං චායො වුද්ධි" යි වෘද්ධිනියමකළ හෙයින් වසිඨශබ්දයාගේ වකාරස්ථ අකාරයහට ආකාරයෙක් වෘද්ධිවේ, තද්ධිතාන්තයා නමා අලිඟුහෙයින් "තද්ධිතසමාසකිතකා නාමංවාතවෙතුනාදිසු ච" යන සූත්‍රයෙන් නම්වත්ව ඔහුකෙරෙන් පරව සිව ඔව වසිඨස්ස අපච්චං පොසො යන වාක්‍යයෙහි වාසිඨො යනු වේ.— වසිඨස්ස අපච්චං ඉත්ථී වාසිඨී යනුද,

වසිඨස්ස අපච්චං නප්පුංසකං වාසිඨං යනුද මෙසේමැයි—විකල්පවිධානකළ හෙයින් සමාසයාගේ බාධාවක් නැත්නුයි වසිඨාපච්චං කියාද වේ.

කච්චායනො කච්චානො යන තන්හි කච්චශබ්ද කච්චකියා දෙතැනෙක වේ, ඔහුකෙරෙන් පරව ස විභක්තිවේ, ස පරකල්හි "සාගමො සෙ" යි සකාරාගමවේ, අපච්චං පොසො යන වාක්‍යයවේ. ෂෂ්ඨ්‍යන්තනාමයාකෙරෙන් පරව ඔහුගේ දරුය යන අර්ථයෙහි වච්ඡාදීන් කෙරෙන් පරව "ණායන ණාන වච්ඡාදිතො" යි ණායනප්‍රත්‍යයත් ණාන ප්‍රත්‍යය වේ, ප්‍රත්‍යය සම්බන්ධිවූ ණකාරයහට "තෙසං ණො ලොපං" යන සූත්‍රයෙන් ලොප්ව ආයන ආන ශෙෂවේ, ප්‍රත්‍යයාවිසින්ම වාක්‍යාර්ථය හැඟෙනහෙයින් වාක්‍යයහට "වුත්තත්ථානමප්පයොගො" යනු න්‍යායහෙයින් අප්‍රයොගවේ, විභක්තිහට "තෙසං විභත්තියො" යනාදී සූත්‍රයෙහි තෙසං ග්‍රහණයෙන් ලොප්වේ, ස්වරාන්තප්‍රකෘතිහට "පකති චස්ස සරන්තස්ස" යන සූත්‍රයෙන් ප්‍රකෘතිවත්වේ, තද්ධිතාන්තයාත් නාමලිඞ්ගහෙයින් "තද්ධිතා" දී සූත්‍රයෙන් නම්වනු ඔහුකෙරෙන් පරව සිව ඔව කච්චස්ස අපච්චං පොසො යන වාක්‍යයෙහි කච්චායනො කච්චානො යනු වේ—තද්ධිතප්‍රත්‍යයෝ වාච්‍යලිඞ්ගහෙයින් කච්චායනී කච්චානී කියාද, කච්චායනං කච්චානං කියාද වේ—ණානුබන්ධප්‍රත්‍යයා පරවූවද සංයොගාන්තබැවින් වෘද්ධිනොවේල.

වේණතෙය්‍යො විණතෙය්‍යො යන තන්හි විනතාශබ්ද විනතා කියා දෙතැනෙක වේ, ඔහුකෙරෙන් පරව ෂෂ්ඨ්‍යෙකවචන ස විභක්තිවේ, ඝසංඥයාකෙරෙන් පරවූ සහට "ඝතො නාදීනං" යන සූත්‍රයෙන් ආයයනාදෙශවේ, අපච්චං යන වාක්‍යයවේ, ෂෂ්ඨ්‍යන්තනාමයාකෙරෙන් පරව ඇගේ දරුය යන අර්ථයෙහි "ණෙය්‍ය කත්තිකාදීහි" යි ණෙය්‍යප්‍රත්‍යයවේ, ණකාරප්‍රත්‍යයා පරකල්හි අසංයොගාන්තවූ නාමයාගේ ආදිස්වරයහට "වුද්ධාදිසරස්ස වා" යනාදිසූත්‍රයෙන් වෘද්ධිවේ, වන්තෙහිදු "අයුවණ්ණානඤ්චායො වුද්ධි" යි නියමකළහෙයින් වකාරයාගේ ඉකාරයහට විකල්පයෙන් එකාරයෙක් වෘද්ධිවේ, ප්‍රත්‍යය සම්බන්ධිවූ ණකාරයහට "තෙසං ණො ලොපං" යි ලොප්ව එය්‍යශෙෂවේ, වාක්‍යයහට-පෙ-ප්‍රකෘතිවත්වේ, නම්වනු සිව ඔව විනතාය අපච්චං යන වාක්‍යයෙහි වේනතෙය්‍යො විනතෙය්‍යො යනු වේ–මත්තෙහිදු මෙසේම වාක්‍යයෙදියයුතු.

දක්ඛිණෙය්‍යො යන තන්හි දක්ඛිණශබ්දයාකෙරෙන් පරව සිව ලොප්වේ, දීයතෙ යස්ස සො යන වාක්‍යයවේ, දක්ෂිණාතොමෝ දෙනුලැබෙයි යන අර්ථයෙහි "ණෙය්‍ය කත්තිකාදීහි" යන සූත්‍රයෙහි "ණෙය්‍යො" යන සූත්‍රවිධාකරණයෙන් ණෙය්‍යප්‍රත්‍යයවේ, ණානුබන්ධප්‍රත්‍යයහට "තෙසං ණො ලොපං" යි ලොප්ව එය්‍යශෙෂව වාක්‍යඅප්‍රයොගාදිය වේ, දක්ඛිණ දීයතෙ යස්ස සො යන වාක්‍යයෙහි දක්ඛිණෙය්‍යො යනු වේ.

දක්ඛි යන තන්හි දක්ඛශබ්දයාකෙරෙන් සවේ, "සාගමො සෙ" යි සකාරාගමවේ, අපච්චං යන වාක්‍යය වේ. දක්ඛස්ස අපච්චං යන තන්හි අකාරාන්තවූ ෂෂ්ඨ්‍යන්තනාමයාකෙරෙන් පරව ඔහුගේ දරුය යන අර්ථයෙහි

“අතො ණි වා” යි ණිප්‍රත්‍යයවේ, ණිප්‍රත්‍යයා සම්බන්ධිවූ ණකාරයහට—පෙ—දක්ඛස්ස අපච්චං යන වාක්‍යයෙහි දක්ඛි යනු වේ.— මේ දෙතැන්හිම සංයොගාන්තබැවින් වෘද්ධිනොවේ.

සක්‍යපුත්තිකො යන තන්හි සක්‍යපුත්තශබ්දයාකෙරෙන් පරව ස විභක්ති වේ, ස විභක්තිහට “සාගමො සෙ” යි සකාරාගමවේ, අපච්චං යන වාක්‍යය වේ, සක්‍යපුත්තස්ස අපච්චං යන තන්හි අකාරාන්තවූ ෂෂ්ඨ්‍යන්තනාමයාකෙරෙන් පරව ඔහුගේ දරුය යන අර්ථයෙහි “අතො ණි වා” යන සූත්‍රයෙහි වාශබ්දග්‍රහණයෙන් ණිකප්‍රත්‍යයවේ, ප්‍රත්‍යයා සම්බන්ධිවූ ණකාරයහට “මත සං” යනාදින් ලොප්ව ඉකශෙෂවේ, වාක්‍යඅප්‍රයොගාදිය වේ, සක්‍යපුත්තස්ස අපච්චං යන වාක්‍යයෙහි සක්‍යපුත්තිකො යනු වේ.

මණ්ඩබ්බො භාතුබ්බො යන තන්හි මණ්ඩශබ්දයාකෙරෙන් සව “සාගමො සෙ” යි සකාරාගමවේ, භාතුශබ්දයාකෙරෙන් පරවූ සහට “ඣලතො සස්ස නො වා” යි නොයනාදෙශ වේ, අපච්චං යන වාක්‍යයවේ, මණ්ඩස්ස අපච්චං භාතුනො අපච්චං යන තන්හි අකාරාන්ත අනකාරාන්ත ශබ්දයන්කෙරෙන්ද “අතො ණි වා” යන සූත්‍රයෙහි වාග්‍රහණයෙන් බ ප්‍රත්‍යයවේ, “පරවෙභාවො” යනාදීන් බකාර ද්විත්වවේ, වාක්‍යඅප්‍රයොගාදිය වේ, මණ්ඩස්ස අපච්චං භාතුනො අපච්චං යන වාක්‍යයෙහි මණ්ඩබ්බො භාතුබ්බො යනු වේ,

මානවො යන තන්හි මනුශබ්දයාකෙරෙන් පරවූ සහට “ඣලතො” යනාදීන් නොයනාදෙශ වේ, අපච්චං යන වාක්‍යයවේ, මනුනො අපච්චං යන තන්හි ෂෂ්ඨ්‍යන්තනාමයාකෙරෙන් පරව ඔහුගේ දරුය යන අර්ථයෙහි “ණවොපගවාදීහි” යි ණවප්‍රත්‍යයවේ, ප්‍රත්‍යයා සම්බන්ධිවූ ණකාරයහට—පෙ—මනුනො අපච්චං යන වාක්‍යයෙහි මානවො යනු වේ.

සාමණෙරො යන තන්හි සමණශබ්දයාකෙරෙන් සව සාගමවේ, අපච්චං යන වාක්‍යයවේ, සමණස්ස අපච්චං යන තන්හි ෂෂ්ඨ්‍යන්තනාමයාකෙරෙන් පරව ඔහුගේ දරුය යන අර්ථයෙහි විධවාදිශබ්දයන්කෙරෙන් පරව “ණෙර විධවාදිතො” යි ණෙරප්‍රත්‍යයවේ, ණානුබන්ධප්‍රත්‍යයා පරකල්හි අසංයොගාන්ත—පෙ—සමණස්ස අපච්චං යන වාක්‍යයෙහි සාමණෙරො යනු වේ.

මේ අපච්චතද්ධිතයි.

ඝාතිකො යන තන්හි ඝතශබ්දයාකෙරෙන් පරව නා විභක්තිවේ, ඊහට “අතො නෙන” යි එනාදෙශවේ, සංසට්ඨො යන වාක්‍යයවේ, ඝතෙන සංසට්ඨො යන තන්හි ඝතයෙන් මිශ්‍රකරණලද යන අර්ථයෙහි “තෙන වා සංසට්ඨං තරති චරති වහති ණිකො” යි ණිකප්‍රත්‍යයවේ, ණකාර ප්‍රත්‍යයා පරකල්හි අසංයොගාන්ත-පෙ-ඝතෙන සංසට්ඨො යන වාක්‍යයෙහි ඝාතිකො යනු වේ.— ගිතෙලින් හැනූ බතට නම්.

ඕළුම්පිකො උළුම්පිකො යන තන්හි උළුම්පශබ්ද උළුම්පකීයා දෙතැනෙක වේ, ඔහුකෙරෙන් පරවූ නාහට එනවේ, තරති යන වාක්‍යය වේ, උළුම්පෙන

තරති යන තන්හි පසුරෙන් එතරවෙයි යන අර්ථයෙහි "යෙන වා" යනාදින් ණිකප්‍රත්‍යය වේ, ණානුබන්ධප්‍රත්‍යයා පරකල්හි අසංයොගාන්ත-පෙ—උළුම්පෙන තරති යන වාක්‍යයෙහි විකල්පයෙන් වෘද්ධි ඕළුම්පිකො කියාද උළුම්පිකො කියාද වේ.

සාකටිකො යන තන්හි සකටශබ්දයාකෙරෙන් පරවූ නාමයට එනවේ, චරති යන වාක්‍යයවේ, සකටෙන චරති යන තන්හි ගැලින් ඇවිදියි යන අර්ථයෙහි "යෙන වා" යනාදින් ණිකප්‍රත්‍යය වේ, ණකාරප්‍රත්‍යයා පරකල්හි අසංයොගාන්තවූ—පෙ—සකටෙන චරති යන වාක්‍යයෙහි සාකටිකො යනු වේ.

සීසිකො යන තන්හි සීස ශබ්දයාකෙරෙන් නාම එනයනාදෙශවේ, වහති යන වාක්‍යයවේ, සීසෙන වහති යන තන්හි හිසින් උසුලයි යන අර්ථයෙහි "යෙන වා" යනාදින් ණිකප්‍රත්‍යයවේ, ප්‍රත්‍යයා සම්බන්ධිවූ ණකාර—පෙ—සීසෙන වහති යන වාක්‍යයෙහි සීසිකො යනු වේ—මෙහි වෘද්ධිනැති.

චම්පෙය්‍යකො යන තන්හි චම්පා ශබ්දයාකෙරෙන් පරවූ සිංහට "ඝපතො සිං යං වා" සී යං යනාදෙශවේ, ජාතො යන වාක්‍යය වේ, චම්පායං ජාතො යන තන්හි එහි උපන්නේය යන අර්ථයෙහි සප්තමීවාචකශබ්දයාකෙරෙන් පරව "යෙන වා" යනාදී සූත්‍රයෙහි වාග්‍රහණයෙන් එය්‍යකප්‍රත්‍යය වේ, වාක්‍යඅප්‍රයොගාදිය වේ, චම්පායං ජාතො යන වාක්‍යයෙහි චම්පෙය්‍යකො යනු වේ—බාරාණසියං ජාතො බාරාණසෙය්‍යකො යනුද මෙසේමැයි.

කොසිණාරකො යන තන්හි කුසිණාරාශබ්දයාකෙරෙන් පරවූ සිංහට යං වේ, වසති යන වාක්‍යයවේ, කුසිණාරායං වසති යන තන්හි එහි වෙසෙයි යන අර්ථයෙහි සප්තමීනාමයාකෙරෙන් පරව "යෙන වා" යනාදී සූත්‍රයෙහි වාග්‍රහණයෙන් ණිකප්‍රත්‍යයවේ, ණානුබන්ධප්‍රත්‍යයා පරකල්හි-පෙ-කුසිණාරායං වසති යන වාක්‍යයෙහි කොසිණාරකො යනු වේ.

මාගධකො යන තන්හි මගධශබ්දයාකෙරෙන් පරව සු විභක්තිවේ, සු විභක්ති පරකල්හි අකාරයනට "සුහිස්වකාරො එ" සී එකාරාදෙශවේ, වසති කියාද තස්සිස්සරො වා කියාද වාක්‍යයවේ, මගධෙසු වසති තස්සිස්සරො වා යන තන්හි එහි වෙසෙයිහෝ එයට නායක වෙයිහෝ යන අර්ථයෙහි ජනපදවාචීශබ්දයාකෙරෙන් පරව "යෙන වා" යනාදියෙහි වාග්‍රහණයෙන් ණිකප්‍රත්‍යයවේ, ණානුබන්ධප්‍රත්‍යයා පරකල්හි-පෙ—මගධෙසු වසති තස්සිස්සරො වා යන වාක්‍යයෙහි මාගධකො යනු වේ.

අස්සාජානීයො යන තන්හි අස්සශබ්ද අස්සකියාවේ, ඔහුකෙරෙන් පරව ජාතියා විසිට්ඨො යන වාක්‍යයවේ, අස්ස ජාතියා විසිට්ඨො යන තන්හි ඒ ජාතියෙන් වැඩිතරම් යන අර්ථයෙහි "යෙන වා" යනාදියෙහි වාග්‍රහණයෙන් ආජානීයප්‍රත්‍යයවේ, වාක්‍යඅප්‍රයොගාදියවේ, අස්ස ජාතියා විසිට්ඨො යන වාක්‍යයෙහි අස්සාජානීයො යනුවේ.

අග්ගඤ්ඤං යන තන්හි අග්ගශබ්දයාකෙරෙන් පරව සිව අංව පැමිණේ, ඉති ජානිතබ්බං යන වාක්‍යයවේ, අග්ගන්ති ජානිතබ්බං යන තන්හි අග්‍රයයි දතයුතුයේ යන අර්ථයෙහි "යෙන වා" යනාදියෙහි වාග්‍රහණයෙන්

ණ්‍යප්‍රත්‍යයවේ, "පරළොපො වා ඨානෙ" යි ණකාරව්‍යයවේ, වාක්‍යඅප්‍රයොගයදීයවේ, තද්ධිතප්‍රත්‍යයෝ වාච ලිඟුගෙයින් නම්වනව සිව අංව අගයෙයි ජනිතබ්බං යන වාක්‍යයෙහි අනගාකුජ්ඣං යනුවේ.

ආභිධම්මිකො අභිධම්මිකො යන තන්හි අභිධම්මශබ්ද අභිධම්ම කියා දෙතැනෙකවේ, ඔහුකෙරෙන් පරව සිව අංවේ, අධීතෙ යන වාක්‍යයවේ, අභිධම්මං අධීතෙ යන තන්හි අභිධම්මය හදාරයි යන අර්ථයෙහි "තමධීතෙ තංජානාතිකණිකාදි සනානිධානානිගයාගයිපපහබන්ධවිතාතෙස්සු ච" යි ණිකප්‍රත්‍යයවේ, සණිකාරප්‍රත්‍යයා පරකල්හි-පෙ-අභිධම්මං අධීතෙ යන වාක්‍යයෙහි ආභිධම්මිකො කියාද අභිධම්මිකො කියාද වේ-එක්පක්ෂයෙක්හි වෘද්ධි නුවූනියායි.

වාචසිකං යන තන්හි වචශබ්දයාකෙරෙන් පරවූ නාහට "මනොගණාදිතො" යනාදින් ආවේ, විභක්ත්‍යදෙශස්වරයා පරකල්හි වචශබ්දයාකෙරෙන් පරව "ස සරෙ වාගමො" යන සූත්‍රයෙන් සකාරාගම වේ, කතං කම්මං යන වාක්‍යයවේ, වචසා කතං කම්මං යන තන්හි වචනයෙන් කරණලදය යන අර්ථයෙහි "තමධීතෙ" යනාදින් ණිකප්‍රත්‍යය වේ, ණානුබන්ධප්‍රත්‍යයා පරකල්හි—පෙ—වචසා කතං කම්මං යන වාක්‍යයෙහි වාචසිකං යනුවේ—මෙහි ණිකප්‍රත්‍යයා පරකල්හි "ස සරෙ වාගමො" යන සූත්‍රයෙහි අනුවෘත්තිතආදිශබ්දග්‍රහණයෙන් සකාරාගමවේ, මනසා කතං කම්මං මානසිකං යනුද මෙසේමැයි.

සාරීරිකා යන තන්හි සරීරශබ්දයාකෙරෙන් පරවූ ස්‍යංහට එකාරාදෙශවේ, සන්නිධානා වෙදනා යන වාක්‍යයවේ, සරීරෙ සන්නිධානා වෙදනා යන තන්හි ශරීරයවූ වෙදනාය යන අර්ථයෙන් "තමධීතෙ" යනාදින් ණිකප්‍රත්‍යයවේ, ණානුබන්ධප්‍රත්‍යයා පරකල්හි—පෙ-සරීරෙ සන්නිධානා වෙදනා යන වාක්‍යයෙහි සාරීරිකා යනුවේ.

දෞවාරිකො යන තන්හි ද්‍වාරශබ්ද ද්‍වාර කියා එක්තැනෙක වේ, දකාර සඵ උකාරපහවේ, උහට වකාරවේ, වකාර දකාරයෙහි බඩව පැමිණේ, ඔහුකෙරෙන් ස්‍යංව එකාරවේ, නියුත්තො යන වාක්‍යයවේ, ද්වාරෙ නියුත්තො යන තන්හි එහි නියුක්තය යන අර්ථයෙහි "තමධීතෙ" යනාදින් ණිකප්‍රත්‍යය වේ, විභක්ති ලොප් ප්‍රකෘතිආදියවේ, "මා යූනමාගමො ඨානෙ" යි වකාරයාකෙරෙන් පූර්වයෙහි ඔකාරයෙන් වෘද්ධ්‍යාගමවේ, ණානුබන්ධප්‍රත්‍යයා පරකල්හි-පෙ-ද්වාරෙ නියුත්තො යන වාක්‍යයෙහි දෞවාරිකො යනුවේ. *

වෙණිකො යන තන්හි වීණාශබ්ද වීණාකියාවේ, ඔහුකෙරෙන් සිව ලොප්වේ, අස්ස සිප්පං යන වාක්‍යයවේ, වීණා අස්ස සිප්පං යන තන්හි වීණා ගායනා කිරීම මොහට ශිල්පනුයි යන අර්ථයෙහි "තමධීතෙ" යනාදින් ණිකප්‍රත්‍යයවේ, සණිකාර ප්‍රත්‍යයා පරකල්හි-පෙ-වීණා අස්ස සිප්පං යන වාක්‍යයෙහි වෙණිකො යනුවේ.

---

මෙහි වාරශබ්දයාගේ දකාරවාකාරවිශ්ලෙෂණයෙන් විශ්ලෙෂණකොට හල් දකාරයෙන් පරව වෘද්ධිඔකාරගමකටයුතුයි.

ගන්ධිකො යන තන්හි ගන්ධශබ්දයාකෙරෙන් සිව ඔවෙ, අස්ස භණ්ඩං යන වාක්‍යය වේ, ගන්ධො අස්ස භණ්ඩං යන තන්හි සුගන්ධය මොහුගේ භාණ්ඩනුයි යන අර්ථයෙහි "තම්ගීතෙ" යනාදින් ණිකප්‍රත්‍යයවේ, ප්‍රත්‍යයා සම්බන්ධිවූ ණිකාරයහට ලොප්ව ඉකශෙෂවේ, වාක්‍යඅප්‍රයොගාදිය වේ, ගන්ධො අස්ස භණ්ඩං යන වාක්‍යයෙහි ගන්ධිකො යනුවේ.

මාගවිකො යන තන්හි මගශබ්දයාකෙරෙන් පරවූ විභියා යොහට "සබ්බයොහි" යනාදින් එවෙ, ගන්ධො ජීවති යන වාක්‍යයවේ, මගෙ හනන්ධා ජීවති යන තන්හි මුවන් මරා ජීවත්වෙයි යන අර්ථයෙහි "තම්ගීතෙ" යනාදින් ණිකප්‍රත්‍යය වේ, ණානුබන්ධප්‍රත්‍යයා පරකල්හි—පෙ— මගශබ්දයාකෙරෙන් පවර "ඇවම්දනා" දින් වකාරාගම වේ, මගෙ හනන්ධා ජීවති යන වාක්‍යයෙහි මාගවිකො යනුවේ.

ජාලිකො යන තන්හි ජාලශබ්දයාකෙරෙන් නාව නාහට එනයනාදෙශ වේ, හනො යන වාක්‍යයවේ, ජාලෙන හනො යන තන්හි දැලින් සතුන් නසයි යන අර්ථයෙහි "තම්ගීතෙ" යනාදි සූත්‍රයෙහි ආදිශබ්දග්‍රහණයෙන් ණිකප්‍රත්‍යයව ඉකශෙෂවේ, ජාලෙන හනො යන වාක්‍යයෙහි ජාලිකො යනුවේ—ණානුබන්ධප්‍රත්‍යයා පරවුවද මෙහි වෘද්ධිනැති.

සුත්තිකො යන තන්හි සුත්තශබ්දයාකෙරෙන් නාව එනවේ, බද්ධො යන වාක්‍යයවේ, හුයින් බඳනාලද්දේය යන අර්ථයෙහි "තම්ගීතෙ" යනාදි සූත්‍රයෙහි ආදිග්‍රහණයෙන් ණිකව ඉකශෙෂවේ, සුත්තෙන බද්ධො යන වාක්‍යයෙහි සුත්තිකො යනුවේ.

චාපිකො යන තන්හි චාපශබ්දයාකෙරෙන් සිව ඔවේ, අස්ස ආයුධො යන වාක්‍යයවේ, චාපො අස්ස ආයුධො යන තන්හි දුන්න මෝහට ආයුධය යන අර්ථයෙහි "තම්ගීතෙ" යනාදි සූත්‍රයෙහි ආදිග්‍රහණයෙන් ණිකප්‍රත්‍යයව ඉකශෙෂවේ, චාපො අස්ස ආයුධො යන වාක්‍යයෙහි චාපිකො යනුවේ.

වාතිකො යන තන්හි වාතශබ්දයාකෙරෙන් සිව ඔවේ, අස්ස ආබාධො අත්ථි යන වාක්‍යයවේ, වාතො අස්ස ආබාධො අත්ථි යන තන්හි වාතය මෝහට ආබාධනුයි නොහොත් වාතාබාධය මෝහට ඇත්නුයි යන අර්ථයෙහි "තම්ගීතෙ" යනාදි සූත්‍රයෙහි ආදිග්‍රහණයෙන් ණිකව ඉකශෙෂවේ, වාතො අස්ස ආබාධො අත්ථි යන වාක්‍යයෙහි වාතිකො යනුවේ. *

බුද්ධිකො යන තන්හි බුද්ධශබ්දයාකෙරෙන් සම්ංවේ, සම්ංහට එවේ, පසන්නො යන වාක්‍යයවේ, බුද්ධෙ පසන්නො යන තන්හි බුදුන්කෙරෙහි ප්‍රසන්නය යන අර්ථයෙහි "තම්ගීතෙ" යනාදි සූත්‍රයෙහි ආදිග්‍රහණයෙන් ණිකව ඉකශෙෂවේ, බුද්ධෙ පසන්නො යන වාක්‍යයෙහි බුද්ධිකො යනුවේ.

---

* වාතො අස්ස ආබාධො සි එකෙකි-වාතො අස්ස අත්ථි යනු අනිකෙකි- වාතය මොහුට ලෙඩනුයි-වාතය මොහුට අධිකනුයිහෝයි.

වත්ථිකං යන තන්හි වත්ථශබ්දයාකෙරෙන් නාවේ, නාහට එනවේ, කීතං භණ්ඩං යන වාක්‍යයවේ, වත්ථෙන කීතං භණ්ඩං යන තන්හි වස්ත්‍රයෙන් විකිණිබඩුය * යන අර්ථයෙහි "තමධීතෙ" යනාදි සූත්‍රයෙහි ආදිග්‍රහණයෙන් ණිකව ඉකශෙෂවේ, වත්ථෙන කීතං භණ්ඩං යන වාක්‍යයෙහි වත්ථිකං යනුවේ.

කුම්භිකො යන තන්හි කුම්භශබ්දයාකෙරෙන් සිව ඔවේ, අස්ස පරිමාණං කියාහෝ තං අරහති කියාහෝ තෙසං රාසි කියා හෝ වාක්‍යයවේ, කුම්භො අස්ස පරිමාණං යනාදි තන්හි "ඝටෙ කුම්භො දසම්මණො" යනු අනෙකාර්ථයෙයින් එයින් දසමුනක් මෝහට ප්‍රමාණයිහෝ දසමුනක් මොහුට සුදුසුයයිහෝ ඝටයන්ගේ රාසියයිහෝ යන අර්ථයෙහි "තමධීතෙ" යනාදි සූත්‍රයෙහි ආදිග්‍රහණයෙන් ණිකව ඉකශෙෂවේ, කුම්භො අස්ස පරිමාණං යනාදි වාක්‍යයෙහි කුම්භිකො යනුවේ.

අක්ඛිකො යන තන්හි අක්ඛශබ්දයාකෙරෙන් නාව නාහට එනවේ, දිබ්බති යන වාක්‍යයවේ, අක්ඛෙන දිබ්බති යන තන්හි පස ඇටින් කෙළිනුයි යන අර්ථයෙහි "තමධීතෙ" යනාදි සූත්‍රයෙහි ආදිග්‍රහණයෙන් ණිකව ඉකශෙෂවේ, අක්ඛෙන දිබ්බති යන වාක්‍යයෙහි අක්ඛිකො යනුවේ.

මාගධිකො යන තන්හි මගධශබ්දයාකෙරෙන් ස්මිංව ස්මිංහට එවේ, වසති කියාහෝ ජාතො කියාහෝ වාක්‍යයවේ, මගධෙ වසති ජාතො යන තන්හි මගධදෙශයෙහි වෙසෙයිහෝ එහි උපන්නේහෝ යන අර්ථයෙහි "තමධීතෙ" යනාදි සූත්‍රයෙහි ආදිග්‍රහණයෙන් ණිකප්‍රත්‍යයව ණානුබන්ධප්‍රත්‍යයා පරකල්හි "අසංයොගන්තස්ස"—පෙ—යෙයින් අකාරයහට ආකාරයෙක් වෘද්ධිවේ, ණකාරයහට ලොප්ව ඉකශෙෂවේ, වාක්‍යඅප්‍රයොගාදියවේ, මගධෙ † වසති ජාතො යන වාක්‍යයෙහි මාගධිකො යනුවේ.

කාසාවං යන තන්හි කසාවශබ්දයාකෙරෙන් පරවූ නාහට එනවේ, රත්තං යන වාක්‍යයවේ, කසාවෙන රත්තං යන තන්හි එයින් රඳනලදය යන අර්ථයෙහි "ණ රාගා තෙන රත්තං තස්සෙදමඤ්ඤත්ථෙසු ච" යි ණප්‍රත්‍යයවේ, සණකාර—පෙ—වෘද්ධිවේ, ණප්‍රත්‍යයහට "ඉතසං" යනාදින් ලොප්ව අකාරශෙෂව වාක්‍යඅප්‍රයොගාදියවේ, කසාවෙන රත්තං යන වාක්‍යයෙහි කාසාවං යනුවේ—නීලෙන රත්තං නීලං යනුද, පීතෙන රත්තං පීතං යනුද මෙසේමැයි, දෙතැන්හිම වෘද්ධි නොවේ.

මාහිසං යන තන්හි මහිසශබ්දයාකෙරෙන් ෂෂ්ඨීඑකවචන සව සකාරාගමවේ, ඉදං යනු වාක්‍යයවේ, මහිසස්ස ඉදං යන තන්හි මීහුහුගේ මේ යන අර්ථ

* වස්ත්‍රයෙන් විකිණියේය -පොත්.

† මගධාදි ජනපදවාචීශබ්දයෝ මාගධසංස්කෘතදෙක්හි පුල්ලිඞ්ගබහුවචනාන්තමැයි—මේ අනවධානපාඨ යයි හැඟේ.

යෙහි "ණ රාගාදීන්" ණප්‍රත්‍යයවේ, ණානු-පෙ-මහිසස්ස ඉදං යන වාක්‍ය යෙහි මාහිසං යනුවේ—අභයි-‡

රාජපොරිසං යන තන්හි රාජපුරිසශබ්දයාකෙරෙන් පරව සව සාගමවේ, ඉදං යන වාක්‍යයවේ, රාජපුරිසස්ස ඉදං යන තන්හි මේ රාජපුරුෂයාගේය යන අර්ථයෙහි "ණරාගා" දීන් ණප්‍රත්‍යයවේ, සණිකාරප්‍රත්‍යයා පරකල්හි "වුඩ්ඪාදිස ර-සු වා" යනාදීන් වෘඩිවේ, වන්නෙහිදු "අ යුව ණණො" දියෙහි ප්‍රතවෘඩිග්‍රහණයෙන් උත්තරපදයාගේ ආදිස්වරයහට නොවත් පකාරයාගේ උකාරයහට ඔකාරයෙක් වෘඩිවේ, ණානුබන්ධලොපාදියවේ, රාජපුරිසස්ස ඉදං යන වාක්‍යයෙහි රාජපොරිසං යනුවේ.

මාගධො යන තන්හි මගධශබ්දයාකෙරෙන් වූ සමාහට ආවේ, ආගතො කියාහෝ තත්‍ර ජාතො කියාහෝ තස්සිස්සරො කියාහෝ සො අස්ස නිවාසො කියාහෝ වාක්‍යයවේ, මගධාගතො, එයින් ආයේයයිහෝ, මගධෙ ජාතො, එහි උපන්නේ යයි හෝ, තස්සිස්සරො, එයට නායකයයිහෝ, මගධො අස්ස නිවාසො, මගධදේශයතෙමේ මොහට නිවාසයයිහෝ යන මෙසින් එක් අර්ථයක් කිවමනානන්හි "ණරාගා" දීන් ණප්‍රත්‍යයවේ "ණානු—පෙ—මගධාගතො § යනාදි වාක්‍යයෙහි මාගධො යනු වේ.

කාත්තිකො යන තන්හි කත්තිකාශබ්දයාකෙරෙන් හි විභක්තිවේ, ආදීහි යුත්තො යන වාක්‍යයවේ, කත්තිකාදීහි යුත්තො යන තන්හි කැතිනැකතින් හා සඳරැසින් × යෙදුනේය යන අර්ථයෙහි 'ණ රාගා' දීන් ණප්‍රත්‍යයවේ, ණානුබන්ධලොපාදිය වේ, කත්තිකාහි ආදීහි යුත්තො යන වාක්‍යයෙහි කාත්තිකො යනු වේ—හිල්මසයි.

බුද්ධො යන තන්හි බුද්ධශබ්දයාකෙරෙන් සිව ඔවේ, අස්ස දෙවතා යන වාක්‍යයවේ, බුද්ධො අස්ස දෙවතා යන තන්හි බුදුරජ දෙවිවූයේ මොහටනුයි යන අර්ථයෙහි "ණ රාගා" යනාදීන් ණප්‍රත්‍යයවේ, ණානුබන්ධලොපාදිය වේ, බුද්ධො අස්ස දෙවතා යන වාක්‍යයෙහි බුද්ධො යනු වේ.

වෙය්‍යාකරණො යන තන්හි ව්‍යාකරණශබ්දයාකෙරෙන් සිව අංවේ, අවෙච්ච අධීතෙ යන වාක්‍යයවේ, ව්‍යාකරණං අවෙච්ච අධීතෙ යන තන්හි ශබ්දශාස්ත්‍රය දැන හදාරයි යන අර්ථයෙහි "ණ රාගා" යනාදීන් ණප්‍රත්‍යය වේ, ස්වරයා පරකල්හි වකාරසථ ඉකාරයහට "ඉවණ්ණො" යනාදීන් යවේ, "මායූනා" යනාදීන් යකාරයාකෙරෙන් පූර්වයෙහි එකාරයෙක් වෘද්ධ්‍යාගමවේ, "පරවෙහාවෙ ඨානෙ" යී යකාර ද්විත්වවේ, ණානුබන්ධාදිය ලොප්වේ, ව්‍යාකරණං අවෙච්ච අධීතෙ යන වාක්‍යයෙහි වෙය්‍යාකරණො යනුවේ, මේ දෙතැන්හිම වෘඩි නොවේ.

---

‡ මෙතෙක්ම නොවෙයි—මහිංසාන ඉදං—යී වාක්‍යයෙන් මාහිෂං යී සිඛ කොට ක්ෂීර දධි නවනීතාදිය සංඝාතයෙහි ව්‍යවහාරයි—සුඥතාදියෙහි.

§ මෙද අනවධානමැයි.

× මෙයවරදයි—කත්තිකාය පුණ්ණචන්දයුත්තාය යුත්තො මාසො කාත්තිකො—රූපසිද්ධි.

සාගරො යන තන්හි සගරශබ්දයාගෙන් පරව ණවේ, රකාරස්ථඅකාර යාට එවේ, නිබ්බත්තො යන වාක්‍යයවේ. සගරෙහි නිබ්බත්තො යන තන්හි සගරයන් විසින් නිපදවනලද්දේය යන අර්ථයෙහි "ණරාගා" දින් ණ ප්‍රත්‍යයවේ, සණ්කාරප්‍රත්‍යයා පරකල්හි "අසං-පෙ-සගරෙහි නිබ්බත්තො යන වාක්‍යයෙහි සාගරො යනුවේ.

පච්ඡිමො යන තන්හි පච්ඡාශබ්දයාගෙන් සිව ලොප්වේ, ජාතො යන වාක්‍යයවේ, පච්ඡා ජාතො යන තන්හි පසුව උපන්නේය යන අර්ථයෙහි "ජාතාදීනමිමියාච" යි ඉමප්‍රත්‍යයවේ වාක්‍යඅප්‍රයොගාදියවේ, පච්ඡා ජාතො යන වාක්‍යයෙහි පච්ඡිමො යනු වේ.

මනුස්සජාතියො යන තන්හි මනුස්සජාතිශබ්දයාගෙන් ස්ත්‍රීංව කිරීංහට "පකතො යා" යි යාවේ, ජාතො යන වාක්‍යයවේ, මනුස්සජාතියා ජාතො යන තන්හි මනුෂ්‍යජාතියෙහි උපන්නේය යන අර්ථයෙහි "ජාතාදීනමිමියා ච" යි ඉයප්‍රත්‍යයවේ. වාක්‍යඅප්‍රයොගාදියවේ, මනුස්සජාතියා ජාතො යන වාක්‍යයෙහි මනුස්සජාතියො යනුවේ.

අන්තිමො අන්තියො යන තන්හි අන්තශබ්දයාගෙන් ස්‍යාංව එකාරාදෙශවේ, නියුත්තො යන වාක්‍යයවේ, අන්තෙ නියුත්තො යන තන්හි කෙළවර යෙදුනේය යන අර්ථයෙහි "ජාතාදීනමිමියා ච" යන සූත්‍රයෙන් ඉම ප්‍රත්‍යයත් ඉයප්‍රත්‍යයවේ, වාක්‍යඅප්‍රයොගාදියවේ, අන්තෙ නියුත්තො යන වාක්‍යයෙහි අන්තිමො අන්තියො යනු වේ.

අන්ධකියො යන තන්හි අන්ධශබ්දයාගෙන්වූ ස්‍යාංහට එවේ, නියුත්තො යන වාක්‍යයවේ, අන්ධෙ නියුත්තො යන තන්හි අන්ධයාකෙරෙහි යොදන ලද්දේය යන අර්ථයෙහි "ජාතා" දි සූත්‍රයෙහි චශබ්ද ග්‍රහණයෙන් කිය ප්‍රත්‍යයවේ, වාක්‍යඅප්‍රයොගාදියවේ, අන්ධෙ නියුත්තො යන වාක්‍යයෙහි අන්ධකියො යනු වේ.

පුත්තිමො පුත්තියො යන තන්හි පුත්තශබ්දයාගෙන් සිව ඔවේ, අස්ස අත්ථි යන වාක්‍යයවේ, පුත්තො අස්ස අත්ථි යන තන්හි පුත්‍රතෙම මොහට ඇතැයි යන අර්ථයෙහි "ජාතා" දින් ඉම ඉය ප්‍රත්‍යයෝ දෙදෙන වෙත්, වාක්‍ය අප්‍රයොගාදියවේ, පුත්තො අස්ස අත්ථි යන වාක්‍යයෙහි පුත්තිමො පුත්තියො යනු වේ—කප්පියො යන තන්හි කප්පශබ්දයාගෙන් සිව ඔවේ, කප්පො අස්ස අත්ථි යන වාක්‍යයෙහි කප්පියො යනු වේ.

බන්ධනීයං යන තන්හි බන්ධනශබ්දයාගෙන් සව සාගමවේ. ඨානං යන වාක්‍යයවේ, බන්ධනස්ස ඨානං යන තන්හි බැඳුමට කාරණාවූයේය යන අර්ථයෙහි "තස්ස ඨානමීයො ච" යි ඊයප්‍රත්‍යයවේ, බන්ධනස්ස ඨානං යන වාක්‍යයෙහි බන්ධනීයං යනු වේ.

චඞ්කමනීයං යන තන්හි චඞ්කමනශබ්දයාගෙන් සව්භක්තිව ආගම වේ, හිතං යන වාක්‍යයවේ, චඞ්කමනස්ස හිතං යන තන්හි සක්මන්කිරීමට හිතවූයේය යන අර්ථයෙහි "තස්සඨානා" යනාදියෙහි චග්‍රහණයෙන් ඊය ප්‍රත්‍යයවූ වාක්‍යඅප්‍රයොගාදියවූ චඞ්කමනීයං යනු වේ.

අභිජ්ඣාලු යන තන්හි අභිජ්ඣාශබ්දයාකෙරෙන් සිව ලොප්වේ, බහුලො යන වාක්‍යයවේ, අභිජ්ඣා බහුලො යන තන්හි ලොභය බලවතැයි යන අර්ථයෙහි "ආලු තබ්බහුලෙ" යි ආලුප්‍රත්‍යයවේ, වාක්‍යඅප්‍රයොගාදියවේ, අභිජ්ඣාබහුලො යන වාක්‍යයෙහි අභිජ්ඣාලු යනුවේ.

පාපතරො පාපතමො පාපිස්සිකො පාපියො පාපිට්ඨො යන තන්හි පාපශබ්ද පාප කියා පස්තැනෙක වේ, බහුකෙරෙන් සිව ඔවේ, අයමෙතෙසං අතිසයෙන පාපො යන වාක්‍යයවේ, අයමෙතෙසං අතිසයෙන පාපො යන තන්හි මොවුන්ගෙන් මොහු අතිශයින් පාපයා යන අර්ථයෙහි "විසෙසෙ තරතමිස්සිකියිට්ඨා" යි තරය තමය ඉස්සිකය ඉයය ඉට්ඨය යන ප්‍රත්‍යයෝ යථාක්‍රමයෙන් වෙත්, වාක්‍යඅප්‍රයොගාදියවේ, අයමෙතෙසං—පෙ—පාපො යන වාක්‍යයෙහි පාපතරො යනාදියවේ.

ජෙය්‍යො ජෙට්ඨො යන තන්හි වුඩ්ඪශබ්දයාකෙරෙන් සිව ඔවේ, අයමෙතෙසං අතිසයෙන යන වාක්‍යයවේ, අයමෙතෙසං අතිසයෙන වුඩ්ඪො යන වාක්‍යයෙහි මොවුන් ගෙන් මොහු අතිශයින් වෘද්ධය යන අර්ථයෙහි "විසෙසෙ" යනාදීන් ඉයඉට්ඨප්‍රත්‍යයෝ වෙත්, ඉයඉට්ඨප්‍රත්‍යයන් පරකල්හි වුඩ්ඪශබ්දයහට "වුඩ්ඪස්ස ජො ඉයිට්ඨෙසු" යි ජකාරාදෙශවෙ, "සරලොපො" යනාදියෙහි පකතිග්ගහණයෙන් ප්‍රකෘති ප්‍රතිෂේධව පූර්වස්වරයහට "සරාසරෙ ලොපං" යි ලොප්කළකල්හි පරස්වරයහට "ක්වචාසවණ්ණං ලුත්තෙ" යි අසමාන වර්ණවේ, වන්නේස්ථානාසන්නහෙයින් ඉහට එවේ, "පරද්වෙ" යනාදීන් යකාර ද්විත්වවේ, වාක්‍යඅප්‍රයොගාදියවේ, අයමෙතෙසං අතිසයෙන වුඩ්ඪො යන වාක්‍යයෙහි ජෙය්‍යො ජෙට්ඨො යනුවේ.

සෙය්‍යො සෙට්ඨො යන තන්හිද පසත්ථශබ්දයහට මෙසේමකොට "පසත්ථස්ස සො ච" යි සකාරාදෙශ කළකල්හි මොවුන්ගෙන් මෙතෙම අතිසයින් ප්‍රශස්තය යන අර්ථයෙහි සෙය්‍යො සෙට්ඨො යනුවේ.

මෙධාවී යන තන්හි මෙධාශබ්දයාකෙරෙන් සිව ලොප්වේ, අස්ස අත්ථි යන වාක්‍යයවේ, මෙධා අස්ස අත්ථි යනවාක්‍යයෙහි "තදස්සත්ථීති වී ච" යි වීප්‍රත්‍යයවේ, වාක්‍යඅප්‍රයොගාදියවේ, මෙධා අස්ස අත්ථි යන වාක්‍යයෙහි මෙධාවී යනුවේ.

තපස්සී යන තන්හි තපශබ්දයාකෙරෙන් සිව අංවේ, අස්ස අත්ථි යන වාක්‍යයවේ, තපං අස්ස අත්ථි යන තන්හි තපස් මොහට ඇතැයි යන අර්ථයෙහි "තපාදිතො සී" යි සීප්‍රත්‍යයවේ, සකාරද්විත්වවේ, තපං අස්ස අත්ථි යන වාක්‍යයෙහි තපස්සී යනුවේ.

දණ්ඩිකො දණ්ඩී යන තන්හි දණ්ඩශබ්ද දණ්ඩ කියා දෙතැනෙකවේ, බහුකෙරෙන් සිව ඔවේ, අස්ස අත්ථි යන වාක්‍යයවේ, දණ්ඩො අස්ස අත්ථි යන තන්හි දඬු මොහට ඇතැයි යන අර්ථයෙහි "දණ්ඩාදිතො ඉකඊ" යි ඉක ඊ යන ප්‍රත්‍යයෝ වෙත්, දණ්ඩො අස්ස අත්ථි යන වාක්‍යයෙහි දණ්ඩිකො දණ්ඩී යනුවේ.

ගුණවා පඤ්ඤවා යන තන්හි ගුණශබ්දයාකෙරෙන් සිව ඉවේ, පඤ්ඤාශබ්දයාකෙරෙන් සිව ලොප්වේ, අස්ස අත්ථි යන වාක්‍යයවේ, ගුණො අස්ස අත්ථි පඤ්ඤා අස්ස අත්ථි යන වාක්‍යයෙහි ගුණ නුවන මොහට ඇතැයි යන අර්ථයෙහි "ගුණාදිතොවන්තු" යි වන්තුප්‍රත්‍යයවේ, වාක්‍යඅප්‍රයොගාදිය වේ, පඤ්ඤාශබ්දයාගේ ආකාරයහට "යදනුපපන්නා" යනාදින් හ්‍රස්ව වේ, ඒශබ්ද යන්කෙරෙන් පරව සිවේ, සිහා සමග වන්තුහුට "ආ සිම්හි" යි ආවේ—ගුණො අස්ස අත්ථි පඤ්ඤා, අස්ස අත්ථි යන වාක්‍යයෙහිගුණවා පඤ්ඤවා යනුවේ.

සතිමා භානුමා යන තන්හි සතිභානුශබ්දයන්කෙරෙන් පරව සිව ලොප් වේ, අස්ස අත්ථි යන වාක්‍යයවේ, සති අස්ස අත්ථි භානු අස්ස අත්ථි යන තන්හි සිහිය රශ්මිය මොහට ඇතැයි යන අර්ථයෙහි "සත්‍යාදීහි මන්තු" යි මන්තුප්‍රත්‍යයවේ, වාක්‍ය—පෙ—සතිමා භානුමා යනුවේ.

ආයස්මා යන තන්හි ආයුශබ්දයාකෙරෙන් සිව ලොප්වේ, අස්ස අත්ථි යන වාක්‍යයවේ, ආයු අස්ස අත්ථි යන තන්හි ආයුෂය මොහට ඇතැයි යන අර්ථයෙහි "සත්‍යාදීහි මන්තු" යි මන්තුප්‍රත්‍යයවේ, මන්තුප්‍රත්‍යයා පරකල්හි ආයුශබ්දයාගේ උකාරයට "ආයුස්සුකාරස්මන්තුම්හි" යි අස් වේ, මකාර සකාරයෙහි බඩවේ, න්තුහුකෙරෙන් සිව සිහා සමග "ආ සිම්හි" යි ආවේ, ආයු අස්ස අත්ථි යන වාක්‍යයෙහි ආයස්මා යනුවේ.

සද්ධො යන තන්හි සද්ධාශබ්දයාකෙරෙන් සිව ලොප්වේ, අස්ස අත්ථි යන වාක්‍යයවේ, සද්ධා අස්ස අත්ථි යන තන්හි ශ්‍රද්ධාතොමෝ මොහට ඇතැයි යන අර්ථයෙහි "සද්ධාදිතො ණ" යි ණප්‍රත්‍යයවේ, ණානුබන්ධ ලොප්ව අකාර ශෙෂවේ, වාක්‍යඅප්‍රයොගාදියවේ, සද්ධා අස්ස අත්ථි යන වාක්‍යයෙහි සද්ධො යනුවේ.

සොවණ්ණමයං සුවණ්ණමයං යන තන්හි සුවණ්ණශබ්ද සුවණ්ණ කියා දෙතැනෙකවේ, ඕහුකෙරෙන් නාවේ, නාහට එනවේ, පකතං යන වාක්‍යය වේ, සුවණ්ණෙන පකතං යන තන්හි රනින් කරණලදැයි යන අර්ථයෙහි "තප්පකතිවචනෙ මයො" යි මයප්‍රත්‍යයවේ, එක්පක්ෂයෙක්හි සකාරස්ථ උකාරයාහට "යදනුපපන්නා" යනාදින් වෘද්ධිවේ, වන්තෙහිදු "අයූවණ්ණානං චාමො වුද්ධි" යි නියමකළහෙයින් උකාරයහට ඕකාරයෙක් වෘද්ධිව සුවණ්ණෙන පකතං යන වාක්‍යයෙහි සොවණ්ණමයං සුවණ්ණමයං යනුවේ.

මනොමයං යන තන්හි මනශබ්දයාකෙරෙන්වූ නාහට "මනොගණා" දින් ආවේ, විභක්ත්‍යාදෙශස්වරයා පරකල්හි මනශබ්දදීන්කෙරෙන් පරව "ස සරෙ" යනාදින් සාගමවේ, පකතං යන වාක්‍යයවේ, මනසා පකතං යන තන්හි සිතින් කරණලද්දේය යන අර්ථයෙහි "තප්පකති" යනාදින් මය ප්‍රත්‍යයවේ, වාක්‍ය අප්‍රයොගාදියවේ, විභක්තිලොප්කළකල්හි මනශබ්දදීන්ගේ අන්තයට "එතෙසමො ලොපෙ" යි ඔවේ, මනසා පකතං යන වාක්‍යයෙහි මනොමයං යනුවේ.

දුතියො තතියො යන තන්හි ද්විශබ්ද ත්‍රිශබ්දයන්ගෙ කෙරෙන් පරව නං වේ, නං පරකල්හි "ගණා ච වාදිතො නාමහි" යි නකාරාගමවේ, පූරණෙ යන වාක්‍යයවේ, ද්විනං පූරණෙ තිණ්ණං පූරණෙ යන තන්හි දෙදෙනෙක්හුගේ තුන්දෙනෙක්හුගේ පිරීමය යන අර්ථයෙහි "ද්විතීහි තියො" යි තිය ප්‍රත්‍යයවේ, ප්‍රත්‍යයා පරකල්හි ද්විතිශබ්දයන්ට "තියෙ දුතාපි ච" යි දුය තය යන දෙදෙනවෙත්, ද්විනංපූරණෙ තිණ්ණං පූරණෙ යන වාක්‍යයෙහි දුතියො තතියො යනුවේ.

චතුත්ථො ඡට්ඨො යන තන්හි චතුශබ්ද ඡශබ්දයන්ගෙ කෙරෙන් පරවූ නං පරකල්හි "ගණා ච වාදිතො නාමහි" යි නකාරාගමවේ, පූරණෙ යන වාක්‍යයවේ, චතුන්නං ඡන්නං පූරණෙ යන තන්හි සතර දෙනෙක්හුගේ සදෙනෙක්හුගේ පිරීමය යන අර්ථයෙහි "චතුච්ඡෙහි ථට්ඨා" යි ථ ඨ යන ප්‍රත්‍යයෝ පතනීන් වෙත්, වර්ගයෙහිවූ ද්විතීයාක්ෂරයන්ට "වග්ගෙ ඝොසාඝොසා" දීන් ප්‍රථමාක්ෂරයෝ දෙදෙනෙක් විකිවෙත්, චතුන්නං ඡන්නං පූරණෙ යන වාක්‍යයෙහි චතුත්ථො ඡට්ඨො යනුවේ.

අඩ්ඪුඩ්ඪො දිවඩ්ඪො දියඩ්ඪො අඩ්ඪතියො යන තන්හි අඩ්ඪශබ්දයෙ අඩ්ඪ කියා සතරතැනෙක වේ, ඔහුගෙකෙරෙන් පරවූ නාමට එනවේ, චතුත්ථදුතියතතියශබ්දයෝ චතුත්ථදුතියතතිය කියා වෙත්, ඔවුන්කෙරෙන් සිව ඔවේ, අඩ්ඪෙන චතුත්ථො අඩ්ඪෙන දුතියො අඩ්ඪෙන තතියො යන තන්හි විත්‍යා නානාදිහු උත්තරපදනාමයන්හා සමග යම්කලෙක්හි සමාසකරණුලැබෙද්ද එකල්හි ඒසමාසය "නාමානං සමාසො යුත්තත්ථො" යි—පෙ—අඩ්ඪ චතුත්ථ අඩ්ඪ දුතිය අඩ්ඪ තතිය කියා තිබෙ අර්ථයකින් සතරවෙයි අර්ථයක් ඇත්කල දෙකවෙයි අර්ථයකින් තුණ්පිරෙයි යන අර්ථයෙහි අඩ්ඪ යන උප පදයාහා සමග චතුත්ථශබ්දාදීන්ට "තෙසමඩ්ඪූපපදෙනාඩ්ඪුඩ්ඪදිවඩ්ඪදිය ඩ්ඪාඩ්ඪතියා" යි චතුත්ථශබ්දයහට අඩ්ඪුඩ්ඪ යනාදෙසහා දුතියශබ්දයහට දිව ඩ්ඪ දියඩ්ඪ යනාදෙශයා තතියශබ්දයහට අඩ්ඪතියවේ—අඩ්ඪුඩ්ඪො යනු තුණ්හමාරටනම්—දිවඩ්ඪො යනුද දියඩ්ඪො යනුද එකහමාරට නම්—අඩ්ඪ තියො යනු දෙකහමාරට නම්.

පඤ්චමො යන තන්හි පඤ්චශබ්දයාකෙරෙන් නංව නංහට "ගණාච වාදිතො" යනාදීන් නකාරාගමවේ, පූරණෙ යන වාක්‍යයවේ, පඤ්චන්නං පූරණෙ යන තන්හි පස්දෙනෙකුන්ගේ පිරීමය යන අර්ථයෙහි "සංඛ්‍යාපූරණෙ මො" යි මප්‍රත්‍යයවේ, පඤ්චන්නං පූරණෙ යන වාක්‍යයෙහි පඤ්චමො යනුවේ- පඤ්චන්නං පූරණී පඤ්චමී යනුද මෙසේමැයි.

එකාදස යන තන්හි එකශබ්දයාකෙරෙන් සිව ඔවේ, ච යන නිපාතවේ දසශබ්දයාකෙරෙන් යොව "පඤ්චාදීනමකාරො" යි යොහා සමග පඤ්චශබ්ද න්තයහට අවේ, ච යන නිපාතවේ, එකො ච දස ච යන තන්හි "නාමානං—පෙ—චත්වසමාස වේ, වාක්‍ය අප්‍රයොගාදියවේ—සඞ්ඛ්‍යාවාචී උත්තර පදයා පරකල්හි එකශබ්ද න්තයහට "එකට්ඨානමාකාරො" යි ආව එකාදස යනුවේ—පඤ්චශබ්දයාමෙන් වරනැගියයුතු.

ද්වාදස යන තන්හි ද්විශබ්දයාකෙරෙන් වූ යොහා සමග ද්විශබ්දයහට "යොසු ද්වින්නං ද්වෙ ච" යී ද්වෙ වේ, ච යන නිපාතයවේ; දසශබ්දයාකෙරෙන් වූ යොහට "පඤ්චාදීනමකාරො" යී අකාරාදෙශව ද්වෙ ච දස ච යන වාක්‍යයෙහි "නාමානං—පෙ—ආව ද්වාදස යනුවේ

තෙරස යන තන්හි ති ච දස ච යී ද්වන්ද්වසමාසවේ තිශබ්දයහට "තෙදු" දීන් තෙවේ, දසශබ්දයාගේ දහට "ඒකාදිතො" යනාදීන් රවේ, තෙරස යනුවේ;

චුද්දස යන තන්හි චතුශබ්දයාගේ තුහට "චතූපපදස්ස ලොපො තු-ත්තරපදාදි චස්ස චුචොපි නවා" යී ලොප්කා චහට චුවේ, දකාර ද්විත්වවේ, චුද්දස යනුවේ.

සොළස යන තන්හි ඡච දසච යී ද්වන්ද්වසමාසවේ, ඡහට "දසෙ සො නිච්චඤ්ච" යී සොවේ, දසශබ්දයාගේ දහට "ළ දරානං" යී ළවේ, සොළස යනුවේ.

අට්ඨාදස අට්ඨාරස යන තන්හි අට්ඨ ච දස ච යී ම නමට අට්ඨශබ්දාන්තයහට "ද්වෙකට්ඨානමාකාරො වා" යී ආවේ, "ඒකාදිතො" යනාදීන් දහට රව අට්ඨාදස අට්ඨාරස යනුවේ.

බාවීසති යන තන්හි ද්විශබ්ද විකියා වේ, ඔහුකෙරෙන්වූ වීසති පරකල්හි ද්විහට "වීසතිදසෙසු බා ද්විස්ස තු" යී බාව බාවීසති යනුවේ.

ඒකාදසමො යන තන්හි ඒකාදසශබ්දයාකෙරෙන් නංව නකාරාගමවේ, පූරණො යන වාක්‍යයවේ, ඒකාදසන්නං පූරණො යන තන්හි "සංඛ්‍යාපූරණෙ මො" යී මප්‍රත්‍යයව ඒකාදසමො යනුවේ—ස්ත්‍රීලිඞ්ගයෙහි ඒකාදසන්නං පූරණී යන වාක්‍යයෙහි "ඒකාදිතො දසස්සී" යී ඊව ඒකාදසී යනුවේ.

ද්විකං යන තන්හි ද්විශබ්දයාකෙරෙන් යොව යොහා සමග ද්විහට "යොසු" යනාදීන් ද්වෙවේ, පරිමාණානි අස්ස යන වාක්‍යයවේ, දෙකක් මෝහට ප්‍රමාණය යන අර්ථයෙහි "ද්වාදිතො කො ණෙකත්ථෙ ච" යී කප්‍රත්‍යයවේ, ද්වෙපරිමාණානි අස්ස යන වාක්‍යයෙහි ද්විකං යනුවේ—තීණි පරිමාණානි අස්ස යන වාක්‍යයෙහි තිකං කීසාද මෙම සූත්‍රයෙන් සිඩයි—චත්තාරි පරිමාණානි පඤ්ච පරිමාණානි ඡ පරිමාණානි අස්ස යනාදියෙහි "ද්වාදිතො" යනාදිසූත්‍රයෙහි ආදිග්‍රහණයෙන් කප්‍රත්‍යයවේ—චතුක්කං යන තන්හි "පර ද්වෙ" යනාදීන් ද්විත්වවේ.

මානුස්සකො මානුස්සා යන තන්හි මනුස්සශබ්දයාකෙරෙන් නංවේ, සමූහො යන වාක්‍යයවේ, මනුස්සානංසමූහො යන තන්හි මනුෂ්‍යයන්ගේ සමූහය යන අර්ථයෙහි "සමූහත්ථෙ කණ්ණා ච" යී කණ්ප්‍රත්‍යයහා ණප්‍රත්‍යයවේ, විකල්පයෙන් වෘද්ධිවේ, මනුස්සානං සමූහො යන වාක්‍යයෙහි මානුස්සකො මානුස්සා යනුවේ.

ද්වයං තයං යන තන්හි ද්වි ති ශබ්දයන්කෙරෙන් නංව නකාරාගමවේ, සමූහො යන වාක්‍යයවේ, "සමූහත්ථෙ" යනාදිසූත්‍රයෙන් ණප්‍රත්‍යයවේ, ද්විති ශබ්දයන්ගේ ඉකාරයන්ට "ඩිලානම්සුචා සරෙ වා" යී වාග්‍රහණයෙන් අය යනාදෙශවේ, ද්වින්නං සමූහො තීණ්ණං සමූහො යන වාක්‍යයෙහි ද්වයං තයං යනුවේ.

ගාමතා නාගරතා යන තන්හි ගාමශබ්ද නාගරශබ්දයන් කෙරෙන් නංවේ, සමූහො යන වාක්‍යයවේ, "සමූහත්ථෙ" යනාදීන් ණප්‍රත්‍යයවේ, ණානුබන්ධ—පෙ—ගාමශබ්දාදීන්කෙරෙන් පරව "ගාමජනබන්ධුසහායාදීහි තා" යි තාප්‍රත්‍යයවේ, ගාමානං සමූහො නාගරානං සමූහො යන වාක්‍යයෙහි ගාමතා නාගරතා යනුවේ-මෙහි ණප්‍රත්‍යයාකෙරෙන් පරකොට තාප්‍රත්‍යය ලියයුතු.

චන්දත්තං යන තන්හි චන්දශබ්දයාකෙරෙන් සව සාගමවේ, භාවො යන වාක්‍යයවේ, චන්දස්ස භාවො යන තන්හි චන්ද්‍රයාගේ ස්වභාවය යන අර්ථයෙහි "ණ්‍යත්තතා භාවෙ තු" යි භාවාර්ථයෙහි ත්තප්‍රත්‍යයව වාක්‍යඅප්‍රයොගාදිය වේ, චන්දස්සභාවො යන වාක්‍යයෙහි චන්දත්තං යනුවේ—මනුස්සස්ස භාවො මනුස්සත්තං යනුද මෙසේමැයි.

දණ්ඩිත්තං යන තන්හි දණ්ඩිශබ්දයාකෙරෙන්වූ සහට "සබ්ලතො" යනාදීන් නොයනාදෙශවේ, ඊකාරයහට "අඝො රස්සං" දීන්හ්‍රස්වවේ භාවො යන වාක්‍යයවේ, දණ්ඩිනො භාවො යන තන්හි "ණ්‍යත්තතා" යනාදීන් ත්තප්‍රත්‍යයවේ, වාක්‍යඅප්‍රයොග විභක්තිලොප ප්‍රකෘතිදවේ, දණ්ඩිශබ්දයාගේ ඊකාරයහට "යදූ" දීන් හ්‍රස්වවේ, දණ්ඩිනො භාවො යන වාක්‍යයෙහි දණ්ඩිත්තං යනුවේ.

පාවකත්තං යන තන්හි පාවකශබ්දයාකෙරෙන් සව සාගමවේ, භාවො යන වාක්‍යයවේ, පාවකස්ස භාවො යන තන්හි "ණ්‍යත්තතා" දීන් ත්තප්‍රත්‍යය වේ, වාක්‍යඅප්‍රයොගාදියවූවි, පාවකස්ස භාවො යන වාක්‍යයෙහි පාවකත්තං යනුවේ—නීලස්ස භාවො නීලත්තං යනුද මෙසේමැයි.

පණ්ඩිච්චං කොසල්ලං සාමඤ්ඤං සොහජ්ජං පොරිස්සං නෙපක්කං සාරුප්පං ඔසභිං ඔපම්මං යන තන්හි පණ්ඩිත කුසල සමණ සුහද පුරිස නිපක සරූප උසභ උපමා යන මේ ශබ්දයන්කෙරෙන් සව සකාරාගමවේ, භාවො යන වාක්‍යයවේ, පණ්ඩිතස්ස භාවො යනාදිතන්හි "ණ්‍යත්තතා" යනාදීන් ණ්‍යප්‍රත්‍යයවේ, සණ්කාරප්‍රත්‍යයා පරකල්හි අසංයොගාන්තවූ නාමයාගේ ආදිස්වරයහට වුද්ධාදි—පෙ-වෘද්ධිවේ, ණානුබන්ධ ප්‍රත්‍යයහට ලොප්ව යශෙෂවේ, ය පරකල්හි අහට "අවණ්ණාය ලොපො" යි ලොප්වේ, "ප්‍රචව ගාදන්ඩා" දීන් යකාර තලනද යන සතර අක්ෂරයෙහි බඩවේ, යවත්වූතකාරාදීන්ට "යවතං තලනාදකාරානං බ්‍යඤ්ජනානි චලඤජකාරත්තං" යි චකාරාදි සතරදෙන යථාසංඛ්‍යාක්‍රමයෙන් වෙත්, එන්නේ තකාරයහට චකාරයෙක්ද ලකාරයහට ලකාරයෙක්ද නකාරයහට ඤකාරයෙක්ද දකාරයහට ජකාරයෙක්ද වේ, "පරවෙ යනාදීන් චකාරාදීහු ද්විත්වවෙත්, "යවතං" යනාදීයෙහි කාරග්‍රහණයෙන් සකාපහම යන ප්‍රත්‍යයන් පස්දෙනාසමග යකාරයහට සකාපහම යන පූර්වරූපයො යථාක්‍රමයෙන් වෙත්, චතුර්ථාක්ෂර වූ භකාරයහට "වග්ගෙ ඝොසා" දීන් තෘතීයාක්ෂරවූ බකාරයෙක් ද්විත්වවේ, පණ්ඩිතස්ස භාවො යනාදි වාක්‍යයෙහි පණ්ඩිච්චං කොසල්ලං යනාදිය වේ.

ආරිස්සං යන තන්හි ඉසිශබ්දයාකෙරෙන් සව සහට නොයනාදෙශව භාවො යන වාක්‍යයවේ, ඉසිනො භාවො යන වාක්‍යයෙහි "ණ්‍ය තත්තා" යනාදින් ණ්‍යප්‍රත්‍යයවේ, ණ්‍යහට ලොප්ව යශෙෂවේ, ඉසිශබ්දයාගේ ඉහට "ආ තත ච"සී ආකාරාදෙශද යුක්තස්ථානයෙහි ඊකාරාගමද වේ, සකාරයත් ඉකාරයහට "සරලොපා" දින් ලොප්වේ, "වූවතං" යනාදී සූත්‍රයෙහි කාරග්‍රහණයෙන් පූර්වසකාරයා සමග යකාරයහට පූර්වරූපවූ සකාරයෙක්ම වේ, එබැවිව ඉසිනො භාවො යන වාක්‍යයෙහි ආරිස්සං යනුවේ,

මුදුතා අරහතා යන තන්හි මුදුශබ්දයාකෙරෙන් සහට නොයනාදෙශවේ, අරහන්තශබ්දයාකෙරෙන් සව සාගමවේ, භාවො යන වාක්‍යයවේ "ණ්‍ය තත්තා" යනාදින් තාප්‍රත්‍යයවේ, අරහන්තශබ්ද න්තයහට "යද" දින් ලොප්වේ, මුදුනො භාවො අරහන්තස්ස භාවො යන වාක්‍යයෙහි මුදුතා අරහතා යනුවේ.

පුථුජ්ජනත්තනං යන තන්හි පුථුජ්ජනශබ්දයාකෙරෙන් සව යාගමවේ, භාවො යන වාක්‍යයවේ. පුථුජ්ජනස්ස භාවො යන තන්හි "ණ්‍ය තත්තා" යනාදී සූත්‍රයෙහි තුග්‍රහණයෙන් ත්තනප්‍රත්‍යයවේ, පුථුජ්ජනස්ස භාවො යන වාක්‍යයෙහි පුථුජ්ජනත්තනං යනුවේ.

ආකිඤ්චඤ්ඤං යන තන්හි අකිඤ්චනශබ්දයාකෙරෙන් සිව අංව එව යන වාක්‍යයවේ, "ණ්‍ය තත්තා" යනාදී සූත්‍රයෙහි තුග්‍රහණයෙන් ණ්‍යප්‍රත්‍යය වේ, සණ්කාරප්‍රත්‍යයා පරකල්හි "අසංයොගා න්තා"-ලප-වෘද්ධිවේ, ණකාර ලොප්ව යකාරශෙෂවේ, යපරකල්හි අහට "අවණ්ණෙ" යනාදී සූත්‍රයෙන් ලොප්වේ, "පවයාදනිඨා" යනාදින් යකාරනකාරයෙහි බඹවේ, යවත්වූ නහට "යවතං" යනාදී සූත්‍රයෙන් ඤවේ, එබැවිව අකිඤ්චනං එව යන වාක්‍යයෙහි ආකිඤ්චඤ්ඤං යනුවේ-මේ භාවතද්ධිතනොවනහෙයින් "ණ්‍ය තත්තා" යනාදී සූත්‍රයෙහි තුග්‍රහණයෙන් ණ්‍යප්‍රත්‍යය කළහයිදන්න.

කොණ්ඩඤ්ඤ යන තන්හි කුණ්ඩනීශබ්දයාකෙරෙන් සව සහට "සනො" සී යාවේ, අපච්චං යන වාක්‍යයවේ, "ණ්‍ය තත්තා" යනාදියෙහි තුග්‍රහණයෙන් ණ්‍යප්‍රත්‍යයවේ, සංයොගාන්තබැවින් "වුද්ධා" දියෙහි වාග්‍රහණයෙන් වෘද්ධිවේ, නකාරයත් ඉහට "අවණ්ණෙ" යනාදී සූත්‍රයෙහි චග්‍රහණයෙන් ලොප්වේ, යකාරනකාරයෙහි බඹවේ, "යවතං" යනාදී සූත්‍රයෙන් ඤවේ, එබැවිව කුණ්ඩනියා අපච්චං යන වාක්‍යයෙහි කොණ්ඩඤ්ඤ යනුවේ.

පාජ්ජං යන තන්හි පදශබ්දයාකෙරෙන් සව "ආය චතුත්ථෙකවචනස්ස තු" සී සහට ආයවේ, හිතං යන වාක්‍යයවේ, "ණ්‍ය තත්තා" යනාදියෙහි තුග්‍රහණයෙන් ණ්‍යප්‍රත්‍යයවේ, වෘද්ධිව යශෙෂවේ, "අවණ්ණෙ" යනාදින් අහට ලොප්වේ, "පවයාදනිඨා" යනාදින් යකාර දකාරයෙහි බඹවේ, යවත්වූ දහට "යවතං" යනාදින් ජවේ, එබැවිව පදය හිතං යන වාක්‍යයෙහි පාජ්ජං යනුවේ.

ධඤ්ඤං යන තන්හි ධනශබ්දයාකෙරෙන් සව "ආය චතුත්ථෙකාදසන්නං තු" යි ආයවේ, සංවත්තනිකං යන වාක්‍යයවේ, "ණ්‍යත්‍යතා" යනාදී සූත්‍රයෙහි තුග්‍රහණයෙන් ණ්‍යප්‍රත්‍යයව යශෂවේ, යපරකල්හි අහට "අවණ්ණේ" යනාදින් ලොප්වේ, යකාරනකාරයෙහි "පවග්ගාදනිස්සා" යනාදින් ඤ්ඤවේ, ධනාය සංවත්තනිකං යන වාක්‍යයෙහි ධඤ්ඤං යනුවේ.

සච්චං යන තන්හි සතිශබ්දයාකෙරෙන්වූ සමාහට "භාවි තො" යනාදින් පචම්‍යර්ථයෙහි තොප්‍රත්‍යයවේ, සම්භූතං යන වාක්‍යයවේ, තුග්‍රහණයෙන්ම ණ්‍යප්‍රත්‍යයවේ, ණහට ලොප්ව යශෂවේ, යපරකල්හි "අවණ්ණෙ" යනාදින් අහට ලොප්වේ, චග්‍රහණයෙන් පූර්ව ඉහට ලොප්වේ, යකාරනකාරයෙහි "පවග්ගාදනිස්සා" යනාදින් ච්චවේ, යවත්වූ තකාරයහට "යවතං තලනා" දී සූත්‍රයෙන් චකාරව සිද්ධවේ, සතිතො සම්භූතං යන වාක්‍යයෙහි සච්චං යනුවේ—මේ දෙතැන්හි වෘද්ධිනැති.

දෙවතා යන තන්හි දෙවශබ්දයාකෙරෙන් සිව ඔවේ, එව යන වාක්‍යයවේ, "ණ්‍යත්‍යතා" යනාදී සූත්‍රයෙහි තුග්‍රහණයෙන් තාප්‍රත්‍යයවේ, වාක්‍යඅප්‍රයොගාදිය වේ, දෙවො එව යන වාක්‍යයෙහි දෙවතා යනුවේ.

වෙසමං යන තන්හි විසමශබ්දයාකෙරෙන් සව සාගමවේ, භාවො යන වාක්‍යයවේ, "ණ විසමාදීහි" යි ණප්‍රත්‍යයවේ, වෘද්ධිවේ, ණකාරලොප්ව අකාරශෙෂවේ, විසමස්ස භාවො යන වාක්‍යයෙහි වෙසමං යනුවේ.

ආජ්ජවං යන තන්හි උජුශබ්දයාකෙරෙන්වූ සහට නොයනාදෙශවේ, භාවො යන් වාක්‍යයවේ, "ණ විසමාදීහි" යි ණප්‍රත්‍යයවේ, උජුශබ්දයාගේ පූර්වඋහට "ආත්තාච" යි ආවේ, ජකාරස්ථ උහට "යදූ" දින් අවවේ, ණානුබන්ධප්‍රත්‍යයා පරකල්හි "අසංයොගන්තස්ස"-පෙ—වෘද්ධිවේ, ණකාර ලොප්ව අකාරශෙෂවේ, වාක්‍යඅප්‍රයොගාදියවේ, ජකාර ද්විත්ව උජුනො භාවො යන වාක්‍යයෙහි ආජ්ජවං යනුවේ. *

මානුස්සකං යන තන්හි මනුස්සශබ්දයාකෙරෙන් සව සාගමවේ, භාවො යන වාක්‍යයවේ, "රමණීයාදිතො කණ්" යි කණ්ප්‍රත්‍යයවේ, වෘද්ධිව ණ්ලොප්වේ, කකාරශෙෂවේ, මනුස්සස්ස භාවො යන වාක්‍යයෙහි මානුස්සකං යනුවේ.

ඒකධා යන තන්හි එකශබ්දයාකෙරෙන් නාහට එනයනාදෙශවේ, විභාගෙන යන වාක්‍යයවේ, "විභාගෙ ධා ච" යි ධාප්‍රත්‍යයවේ, වාක්‍යඅප්‍රයොගාදියවේ, විභක්තිලොප්වේ, නම්වතුව සිව "සබ්බාසමාවුසො" යනාදින් ලොප්වේ, ඒකෙන විභාගෙන යන වාක්‍යයෙහි එකධා යනුවේ—මත්තෙහිදු මෙසේමැයි.

පදසො යන තන්හි පදශබ්ද පදකියාවේ "විභාගෙ ධා ච" යි චග්‍රහණයෙන් සොප්‍රත්‍යයවේ, පදවිභාගෙන යන වාක්‍යයෙහි පදසො යනුවේ.

---

* මෙහි මෙසේ කීනමුත් රූපසිද්ධියෙහි භ්‍රාන්තිබැව් කියනලදී.

සබ්බථා යන තන්හි සබ්බශබ්දයාකෙරෙන් පරව සියෝ නායෝ වේ, පකාරෙ ක්‍රියායෝ පකාරෙන ක්‍රියායෝ වාක්‍යයවේ, "සබ්බනාමෙහි පකාරවචනෙ තු ථා" යි ථාප්‍රත්‍යයවේ, සබ්බො පකාරෙ සබ්බෙන පකාරෙන වා යන වාක්‍යයෙහි සබ්බථා යනුවේ.

අඤ්ඤථත්තා යන තන්හි "සබ්බනාමෙහි" යනාදී සූත්‍රයෙහි තුග්‍රහණයෙන් ථත්තාප්‍රත්‍යයවේ, අඤ්ඤො පකාරෙ අඤ්ඤෙන පකාරෙන වා යන වාක්‍යයෙහි අඤ්ඤථත්තා යනුවේ.

කථං යන තන්හි කිංශබ්දයහට "කිස්ස ක වෙ ච" යි චග්‍රහණයෙන් කකාරාදෙශවේ, කො පකාරෙ කෙන පකාරෙන යන තන්හි "කිමිමෙහි ථං" යි ථං ප්‍රත්‍යයව කථං යනුවේ.

ඉත්ථං යන තන්හි ඉමශබ්දයාකෙරෙන් සියෝ නායෝවේ, අයං පකාරෙ ක්‍රියායෝ ඉමිනා පකාරෙන ක්‍රියායෝ වාක්‍යයවේ, "කිමිමෙහි ථං" යි ථං ප්‍රත්‍යයවේ, ථං පරකල්හි ඉමශබ්දයහට "ඉමස්සිත්ථං" යනාදීන් ඉවේ, "වග්ගලසෙහි තෙ" යනාදීන් තකාරද්විත්වවේ, අයං පකාරෙ යන වාක්‍යයෙහි ඉත්ථං යනුවේ—ඉමිනා පකාරෙන යන්නෙහිද ඉත්ථං ක්‍රියාම වේ.

බහුත්ථං යන තන්හි බහුශබ්දයාකෙරෙන් හිවේ, පූර්වස්වරදීර්ඝවේ, බහූහි පකාරෙහි යන වාක්‍යයවේ, "කිමිමෙහි ථං" යි යොගවිභාගයෙන් ථංප්‍රත්‍යයවේ, "වග්ගලසෙහි තෙ" යනාදීන් ද්විත්වව බහූහි පකාරෙහි යන වාක්‍යයෙහි බහුත්ථං යනුවේ.

මලිනීකරොති යන තන්හි මලිනශබ්දයාකෙරෙන් සිව අංවේ, කර යන ධාතුවේ, ඔහුකෙරෙන් වර්තමානපරස්මෛපදප්‍රථමපුරුෂඑකවචන ති විභක්ති වෙයි, ති විභක්ති පරකල්හි තනාදි ධාතූන්කෙරෙන් "තනාදිතො ඔයිරා" යි ඔප්‍රත්‍යයවේ, අමලිනං යන වාක්‍යය පූර්වයෙන් වේ, අමලිනං මලිනං කරොති යන තන්හි අභූතතද්භාවයක් හැඟෙනකල්හිහා කර යන ධාතුහුගේ යෙදීමක් ඇතිකල්හි නාමයාකෙරෙන් පරව "යදා" දීන් ඊප්‍රත්‍යය වේ, අමලිනං මලිනං කරොති යන වාක්‍යයෙහි මලිනීකරොති යනුවේ-සුද්ධයි.

භස්මීකරණං යන තන්හි භස්මශබ්දයාකෙරෙන් සුව "සංසෙ නො" යි නොයනාදෙශවේ, කර යන ධාතු කර ක්‍රියා තිබෙයි, ඔහුකෙරෙන් "සාසනු කරණප්පදෙසෙසු ච" යි යුප්‍රත්‍යයවේ, * අභස්මනො යන වාක්‍යය පූර්වයෙන්වේ, අභස්මනො භස්මනො කරණං යන-පෙ-නාමයාකෙරෙන් පරව "යදා" දීන් ඊප්‍රත්‍යයවේ, අභස්මනො භස්මනො කරණං යන වාක්‍යයෙහි භස්මීකරණං යනුවේ-දරටයි-මේ දෙකැන්හිද සිහට "සබ්බාසමාවුසො" යනාදී සූත්‍රයෙන් ලොප්වේ-අභූතතද්භාවයක්හා භූ සත්තායං යන ධාතුහුගේ යෙදීමකුදු ඇතිකල්හි නාමයාකෙරෙන් පරව එසේම ඊප්‍රත්‍යයවේ, අමලිනො මලිනො භවති යන වාක්‍යයෙහි මලිනී භවති යනුවේ-අභූතතද්භාවය නැතිකල්හි කර කරණෙය භූ සත්තායංය යන ධාතූන්ගේ යෙදීමක් ඇත්නමුත් නාමයාකෙරෙන් පරව ඊප්‍රත්‍යය නොවීම සඳහා දක්වනුපිණිස ඝටං කරොති ඝටො භවති යන උදාහරණ දක්වූහ—කර කරණෙය භූ සත්තායං යන

---

* "යදා" දීන් ණීප්‍රත්‍යයවේ-පොත්හි.

ධාතූන්ගේ භේදිමක් නැතිකල්හි අභූතතද්භාවය ඇද්ද නාමයාකෙරෙන් පරව ඊප්‍රත්‍යය නොවනබව හඟවනුපිණිස අමලිනො මලිනො ජායතෙ යන උදාහරණය දක්වනලදී.

## තද්ධිතනිමි.

---**---

සො පචති තෙ පචන්ති යන තන්හි පච පාකෙ යන ධාතු පච කියා දෙතැනෙකවේ, ඊහට "භූවාදයො ධාතවො" යන සූත්‍රයෙන් ධාතුසංඥාවේ, චකාරස්ථ අකාරපහවේ, ඉකාරහල්වේ, අනෙකස්වරවූ ධාතූන්ගේ අන්ත්‍යය හට "ධාතුස්සන්තො ලොපො නෙකස්සරස්ස" යන සූත්‍රයෙන් කිසිතැනෙක්හි ලොප්වේ, ධාතූන්කෙරෙන් පරව "ධාතුලිඞ්ගෙහි පරාප්පච්චයා" යන සූත්‍රයෙන් අනෙකප්‍රත්‍යයන්ගේ ප්‍රාප්තියක් ඇතිකල්හි වක්‍ෂ්‍යමාණවශයෙන් "වත්තමානා ති අන්ති සි ථ මි ම තෙ අන්තෙ සෙ ව්හෙ එ මහෙ" යන සූත්‍රයෙන් වර්ත්තමානසංඥාකරණලද තිආදී විභක්තීහු "වත්තමානා පච්චුප්පන්නෙ" යන සූත්‍රයෙන් වර්ත්තමානකාලයෙහි වෙති, ඔවුන්ගේද පූර්වෂට්ක අපරෂට්කවශයෙන් අනියමින් ප්‍රාප්තියක් ඇතිකල්හි "අථ පුබ්බානි විභත්තීනං ඡ පරස්සපදානි" යන සූත්‍රයෙන් පරස්මෛපද සංඥාකරණලද ති ආදිසදෙන "කත්තරි පරස්සපදං" යන සූත්‍රයෙන් කර්තෘකාරකයෙහි වෙති, ඔවුන්ගේද ප්‍රථමපුරුෂාදිවශයෙන් අනියමින් ප්‍රාප්තියක් ඇතිකල්හි "ද්වෙ ද්වෙ පඨමමජ්ඣිමුත්තමපුරිසා" යන සූත්‍රයෙන් ප්‍රථම මධ්‍යමඋත්තමපුරුෂසංඥාකරණලද ති ආදිසදෙන ප්‍රථමපුරුෂාදි පුරුෂත්‍රයෙහි වෙති, වන්ශනහිදු තුල්‍යාධිකරණවූ නාමයක්හු ප්‍රයොගකරණ ලබතුදු නොලබතුදු "නාමම්හි පයුජ්ජමානෙපි තුල්‍යාධිකරණෙ පඨමො" යන සූත්‍රයෙන් ප්‍රථමපුරුෂසංඥාකරණලද තිය අන්තිය යන දෙදෙන ප්‍රථම පුරුෂයෙහි වෙති, ඔවුන්ගේද එකවචන බහුවචන වශයෙන් අනියමින් ප්‍රාප්තියක් ඇතිකල්හි "එකම්හි වත්තබ්බෙ එකවචනං" යනු න්‍යාය හෙයින් වක්තෘහු එකාර්ත්ථමාත්‍රයක් කියනුකැමතිකල්හි ප්‍රථමපුරුෂඑකවචන සංඥාකරණලද ති විභක්ති එක්තැනෙකවේ, "බහුම්හි වත්තබ්බෙ බහුවචනං" යනු න්‍යායහෙයින් වක්තෘහු බහ්වර්ත්ථමාත්‍රයක් කියනුකැමතිකල්හි ප්‍රථමපුරුෂ බහුවචනසංඥාකරණලද අන්ති විභක්ති එක්තැනෙකවේ, ධාතූන් කෙරෙන් පරව කර්තෘකාරකයෙහි "භූවාදිතො අ" යන සූත්‍රයෙන් අප්‍රත්‍යයවේ, යටසිටි ස්වරරහිතවූ ව්‍යඤ්ජනතෙම "නයෙ පරං යුත්තෙ" යන පරිභාෂාසූත්‍රයෙන් පරාක්ෂරයාකරා පැමිණි ආඛ්‍යාතප්‍රත්‍යයහට "පර සමඤ්ඤා පයොගෙ" යන පරිභාෂාසූත්‍රයෙන් පදසංඥාව සො පචති තෙ පචන්ති යනුවේ — පචති යනු පච යන ධාතුහට කර්තෘකාරකයෙහි සිද්ධවූ වර්ත්තමානපරස්මෛපද ප්‍රථමපුරුෂ එකවචනාන්තආඛ්‍යාතපදය—පචන්ති යනු පච යන ධාතුහට කර්තෘකාරකයෙහි සිද්ධවූ වර්ත්තමානපරස්මෛපද ප්‍රථමපුරුෂ බහුවචනාන්තආඛ්‍යාතපදයි—සො පචති, හෙතෙම දූන්පිසේ; තෙ පචන්ති, ඔහු දූන්පිසෙත්.

ත්වං පචසි තුම්හෙ පචථ යන තන්හි පච පාකෙ යන ධාතු පච සී දෙතැනෙක වේ, ඊහට "භූවාදයො"-පෙ-"තුම්හෙ මජ්ඣිමො" * යන සූත්‍රයෙන් මධ්‍යමපුරුෂ සංඥාකරණලද සි ථ යන දෙදෙන මධ්‍යමපුරුෂයෙහි වෙති, ඔවුන්ගේදු—පෙ—පදසංඥාව ත්වං පචසි තුම්හෙ පචථ යනුවේ— පචසි යනු පච යන ධාතුහට කර්තෘකාරකයෙහි සිද්ධවූ වර්තමානපරස්මෛපද මධ්‍යමපුරුෂ එකවචනාන්ත ආඛ්‍යාතපදය-පචථ යනු පච යන ධාතුහට කර්තෘකාරකයෙහි සිද්ධවූ වර්තමානපරස්මෛපද මධ්‍යමපුරුෂ බහුවචනාන්ත ආඛ්‍යාතපදයි—ත්වං පචසි, තෝ දූන්පිස; තුම්හෙ පචථ, තෙපිදූන්පිසවු.

අහං පචාමි මයං පචාම යන තන්හි පච පාකෙ යන ධාතු පච සී දෙතැනෙකවේ, ඊහට "භූවාදයො"—පෙ-"අම්හෙ උත්තමො" † යන සූත්‍රයෙන් උත්තමපුරුෂසංඥාකරණලද මි ම යන දෙදෙන උත්තමපුරුෂයෙහි වෙති, ඔවුන්ගේදු-පෙ-මිමවිභක්ති පරකල්හි අකාරයහට "අකාරො දීඝං හිමිමෙසු" යන සූත්‍රයෙන් දීඝීව "නයෙ පරං යුත්තෙ" යන පරිභාෂා සූත්‍රයෙන් පරාක්ෂරයාකරා පැමිණි අහං පචාමි මයං පචාම යනුවේ— පචාමි යනු පච යන ධාතුහට කර්තෘකාරකයෙහි සිද්ධවූ වර්තමානපරස්මෛපද උත්තමපුරුෂ එකවචනාන්ත ආඛ්‍යාතපදය—පචාම යනු පච යන ධාතුහට එම කාරයෙහි සිද්ධවූ වර්තමානපරස්මෛපද උත්තමපුරුෂ බහුවචනාන්ත ආඛ්‍යාතපදයි-අහං පචාමි, මම දූන්පිසැමි; මයං පචාම, අපි දූන්පිසමු— පාලිවචනානුකූලවූ මේ වාක්‍යය අණුවිභක්තියෙහිද ගෞණවෘත්තියෙහිද යෙදෙක යෙදෙනපරිද්දෙන් යොදාගතයුතු—ඒ ග්‍රන්ථබාහුල්‍යබැවින් කුසීතබව එලවත්මුත් නොහොත් කිසිකෙනෙක්හට දුරවබොධහෙයින් මේ මතුකියන ක්‍රමදවපි.

සො පචතෙ-තෙ පචන්තෙ-ත්වං පචසෙ-තුම්හෙ පචව්හෙ-අහං පචෙ-මයං පචාමහෙ-යන තන්හි පච පාකෙ යන ධාතු පච සී සතැනෙක වේ-ඊහට "භූවාදයො"-පෙ-ඇතිකල්හි වක්තෘවිවක්ෂාවසයෙන් "පරාණ්‍යත්තනොපදානි" යන සූත්‍රයෙන් ආත්මනෙපද සංඥාකරණලද තෙ ආදිසදෙන "කත්තරි ච" යන සූත්‍රයෙන් කර්තෘකාරකයෙහි වෙති, ඔවුන්ගේදු ප්‍රථමපුරුෂාදිවසයෙන් අනියමින් ප්‍රාප්තියක් ඇතිකල්හි "ද්වෙ ද්වෙ පඨමමජ්ඣිමුත්තමපුරිසා" යන සූත්‍රයෙන් ප්‍රථම මධ්‍යම උත්තම පුරුෂසංඥාකරණලද තෙය අන්තෙය සෙය ව්හෙය එය මහෙය යන සදෙන යථාක්‍රමයෙන් වෙත්-ධාතුහු කෙරෙන් පරව කර්තෘකාරකයෙහි "භූවාදිතො අ" යන සූත්‍රයෙන් අප්‍රත්‍යය වේ, මෙහි විභක්ති පරකල්හි අකාරයහට "අකාරො දීඝං හිමිමෙසු" යන සූත්‍රයෙන් දීඝීව සො පචතෙ යනාදිය වේ.

---

* සෑමපොත්හිම "නාමම්හි පයුජ්ජමානෙපි තුල්‍යාධිකරණෙ මජ්ඣිමො" කියායිබේ.

† මෙහිදසූත්‍රය "නාමම්හි පයුජ්ජමානෙපි තුල්‍යාධිකාරණෙ උත්තමො" කියායි. ඒ ඉදතන්හිම වරදෙයි.

කම්මණි-තෙන තයා මයා වා-පච්චතෙ-පච්චන්තෙ-පච්චසෙ-පච්චව්හෙ-පච්චෙ—පච්චාමේහ-යන තන්හි පච පාකෙ යන ධාතු පච යී සතැනෙකවේ-ඕහට "භූවාදයො"—පෙ—වසයෙන් "පරාණ්‍යත්තනොපදානි" යන සූත්‍රයෙන් ආත්මනෙපදසංඥකරණලද තෙ ආදිසදෙන "අත්තනොපදානි භාවෙ ච කම්මනි" යන සූත්‍රයෙන් කර්‍මකාරකයෙහි වෙති, ඔවුන්ගේද ප්‍රථමපුරුෂාදි වසයෙන්—පෙ—ප්‍රථම මධ්‍යම උත්තම පුරුෂසංඥකරණලද තෙ ආදි විභක්තීහු වෙත්, ධාතූන්කෙරෙන් පරව කර්‍මකාරකයෙහි "භාවකම්මෙසු යො" යන සූත්‍රයෙන් ය විකරණවේ—ධාත්වන්තයා සමග ය ප්‍රත්‍යය හට "තස්ස චවග්ගයකාරවකාරත්තං සධාත්වන්තස්ස" යන සූත්‍රයෙන් චකාරාදෙශවේ, "පරද්වෙභාවො ඨානෙ" යි චකාරද්විත්වවේ-පච්චතෙ-පච්චන්තෙ-යනාදිය වේ-ආත්මනෙපදයකෙම—"අත්තනොපදානි ක්වචි පරස්සපදත්තං" යන සූත්‍රයෙන් කිසිතැනෙක්හි පරස්මෛපදබවට පැමිණ පච්චති—පච්චන්ති—පච්චසි—පච්චථ—පච්චාමි—පච්චාම—යනාදිය වේ.

භාවෙ—භූයති-භූයතෙ—යන තන්හි භූ සත්තායං යන ධාතු භූ කියා දෙතැනෙක වේ, ඕහට "භූවාදයො"-පෙ-වසයෙන් ආත්මනෙපදසංඥකරණලද තෙ ආදි විභක්තීහු "අත්තනොපදානි භාවෙ ච කම්මනි" යන සූත්‍රයෙන් භාවකාරකයෙහි වෙති—වන්නේ අකර්‍මකවනබැවින් එකවචනම වේ—හෙද ප්‍රථමපුරුෂෛකවචනවූ තිය තෙය යන විභක්ති වේ-ධාතූන්කෙරෙන් පරව භාවකාරකයෙහි "භාවකම්මෙසු යො" යන සූත්‍රයෙන් ය විකරණවේ—ආත්මනෙපද පරස්මෛපදබවට පැමිණ භූයති—භූයතෙ—යනු වේ.

මේ වර්තමානවිභක්තියි.

---

පඤ්චමියං—සො පචතු-තෙ පචන්තු-ත්වං පච පචාහි—තුම්හෙ පචථ-අහං පචාමි—මයං පචාම-යන තන්හි පච පාකෙ යන ධාතු පච යී සතැනෙක වේ—ඕහට "භූවාදයො"—පෙ—වසයෙන් "පඤ්චමී තු අන්තු හි ථ මි ම තං අන්තං ස්සු ව්හො ඒ ආමසෙ" යි පඤ්චමීසංඥකරණලද තු ආදීහු "ආණත්‍යාසිට්ඨෙනුත්තකාලෙ පඤ්චමී" යි ආණත්‍යාදිඅර්ථයෙහි වෙති-ඔවුන්ගේද ප්‍රථම-පෙ-හිහට "හිලොපං වා" යි විකල්පයෙන් ලොප වේ-කිය මිය යනමොවුන් පරකල්හි අහට "අකාරෙ දීඝං" යනාදීන් දීර්ඝව සො පචතු—තෙ පචන්තු—යනාදිය වේ.

අත්තනොපදෙ-සො පචතං-තෙ පචන්තං-ත්වං පචස්සු-තුම්හෙ පචව්හො-අහං පචෙ—මයං පචාමසෙ—යන තන්හි පච පාකෙ යන ධාතු පච යී සතැනෙක වේ—ඕහට "භූවාදයො"—පෙ—"පරාණ්‍යත්තනොපදානි" යි ආත්මනෙපදසංඥකරණලද තං ආදියදෙන "කත්තරි ච" යි කර්තෘකාරයෙහි වෙති, ඔවුන්ගේද—පෙ—සො පචතං යනාදිය වේ.

කම්මනි-තෙන තයා මයා වා-පච්චතං—පච්චන්තං-පච්චස්සු-පච්චව්හො-පච්චෙ—පච්චාමසෙ-යන තන්හි පච පාකෙ යන ධාතු පච යී සතැනෙකවේ,

ඊහට "භූවාදයො"—පෙ—සඳෙන "අත්තනොපදානි භාවෙ ච කම්මනි" යි කර්මකාරකයෙහි වෙති,-පෙ-"භාවකම්මෙසු යො" යි යවිකරණ වේ, ධාත්වන්තයාහා සමග යප්‍රත්‍යයහට "තස්ස චවග්ගා" දින් ච වේ, විත්ව ච පච්චතං යනාදිය වේ—ආත්මනෙපදයෙහම-"අත්තනොපදානි පරස්ස පදත්තං" යි පරසෙමපදබවට පැමිණි පච්චතු යනාදිය වේ.

භාවෙ—භූයතු-භූයතං-යන තන්හි භූ සත්තායං යන ධාතු භූ කියා දෙතැනෙකවේ, ඊහට "භූවාදයො"—පෙ-ආදීහු "අත්තනොපදානි" යනාදීන් භාවකාරකයෙහි වෙති, අකර්මකධාතු එකවචනබැවින් තුය තංය යන විභක්ති වේ, "භාවකම්මෙසු යො" යි යවිකරණව භූයතු—භූයතං-යනුවේ.

මේ පඤ්චමීවිභක්තියි.

———*———

සත්තමියං-සො පචෙ පචෙය්‍ය—තෙ පචෙය්‍යුං-ත්වං පචෙය්‍යාසි-තුම්හෙ පචෙය්‍යාථ-අහං පචෙය්‍යාමි-මයං පචෙය්‍යාම—යන තන්හි පච පාකෙ යන ධාතු පච යි සත්තැනෙක වේ, ඊහට "භූවාදයො"-පෙ-වසයෙන් "සත්තමී එය්‍ය එය්‍යුං එය්‍යාසි එය්‍යාථ එය්‍යාමි එය්‍යාම එථ එරං එථො එය්‍යව්හො එය්‍යං එය්‍යාමෙහ" යි සත්තමි සංඥාකරණලද එය්‍යාදීහු "අනුමතිපරිකප්පත්ථෙසු සත්තමී" යි අනුමත්‍යාදිඅර්ථයෙහි වෙති; ඔවුන්ගේද—පෙ—සංඥාකරණලද එය්‍ය එය්‍යුං යනාදීහු වෙත්, එය්‍යාහට "යදා" දින් විකල්පයෙන් එවේ, සො පචෙ—පචෙය්‍ය—යනාදිය වේ.

අත්තනොපදෙ-සො පචෙථ-තෙ පචෙරං-ත්වං පචෙථො—තුම්හෙ පචෙය්‍යව්හො-අහං පචෙය්‍යං-මයං පචෙය්‍යාමෙහ-යන තන්හි පච පාකෙ යන ධාතු පච යි සත්තැනෙක වේ, ඊහට "භූවාදයො"-පෙ—"පරාන්‍යත්තනොපදානි" යි ආත්මනෙපදසංඥාකරණලදඑථාදිසඳෙන "කත්තරි ච" යි කර්තෘකාරකයෙහි වෙති, ඔවුන්ගේද—පෙ—පදසංඥාව සො පචෙථ-තෙ පචෙරං-යනාදිය වේ.

කම්මනි—තෙන තය්‍ය මයා වා-පච්චෙථ—පච්චෙරං-පච්චෙථො—පච්චෙය්‍යව්හො-පච්චෙය්‍යං-පච්චෙය්‍යාමෙහ-යන තන්හි පච පාකෙ යන ධාතු පච යි සත්තැනෙක වේ, ඊහට "භූවාදයො"-පෙ—සංඥාකරණලද එථාදි සඳෙන "අත්තනොපදානි" යනාදීන් කර්මකාරකයෙහි වෙති, ඔවුන්ගේද—පෙ-විත්ව පච්චෙථ-පච්චෙරං-යනාදිය වේ—ආත්මනෙපදය පරස්සෙම පදබවට ගියකල්හි—පච්චෙ පච්චෙය්‍ය—යනාදිය වේ.

භාවෙ-භූයෙ භූයෙය්‍ය-භූයෙථ-යන තන්හි භූ සත්තායං යන ධාතු භූ කියා තුන්තැනෙක වේ, ඊහට "භූවාදයො"—පෙ—සංඥාකරණලද එථාදීහු "අත්තනොපදානි" යනාදීන් භාවකාරකයෙහි වෙති, අකර්මකධාතු එකවචනබැවින් එය්‍ය එථ විභක්තිම වේ, යවිකරණව භූයෙ භූයෙය්‍ය-භූයෙථ-යනුවේ.

මේ සත්තමීවිභක්තියි.

———*———

පරොක්ඛායං—සො පපච—තෙ පපචු—ත්වං—පපචෙ—තුම්හෙ පපචිත්ථ—අහං පපච—මයං පපචිම්හ—යන තන්හි පච පාකෙ යන ධාතු පච යී සතැනෙක වේ, ඕහට "භූවාදයො"—පෙ—වසයෙන් "පරොක්ඛා අ උ ඒ ත්ථ අ ම්හ ත්ථ රෙ ත්ථො වෙහ ඉ ම්හෙ" යන සූත්‍රයෙන් පරොක්ඛාසංඥකරණලද අ ආදීහු "අපච්චක්ඛෙ පරොක්ඛාතීතෙ" යි අතීතකාලයෙහි වෙති, ඔවුන්ගේද—පෙ—සංඥකරණලද අය උය එය ත්ථය අය ම්හය ත්ථය රෙය ත්ථොය වෙහය ඉය ම්හෙය යනමොහු යථාක්‍රමයෙන් වෙත්, ධාතුහුකෙරෙන් පූර්වයෙහි "ක්වචාදිවණ්ණානමෙකස්සරානං ද්වෙභාවො" යි ස්වරසහිතවූ එම් අක්ෂරයෙක් ද්විත්වවේ, අසව්ධාතුවිෂයෙහි විභත්තීන්අතුරෙන් ව්‍යඤ්ජනාක්ෂරයෙක් පරව තිබෙන තැනෙක්හි "ඉකාරාගමො අසබ්බධාතුකම්හි" යි ඉකාරාගමවේ, පදසංඥාව සො පපච—තෙ පපචු—යනාදියවේ.

අත්තනොපදෙ—සො පපචිත්ථ—තෙ පපචිරෙ—ත්වං පපචිත්ථො—තුම්හෙ පපචිව්හො—අහං පපචි—මයං පපචිම්හෙ—යන තන්හි පච පාකෙ යන ධාතු පච යී සතැනෙක වේ, ඕහට "භූවාදයො"—පෙ—ඈතිකල්හි "පරානි අත්තනොපදානි" යි ආත්මනෙපද සංඥකරණලද ත්ථාදී සදෙන කර්තෘකාරකයෙහි වෙති, ඔවුන්ගේද—පෙ—පදසංඥාව සො පපචිත්ථ—තෙ පපචිරෙ—යනාදිය වේ.

කම්මනි—තෙන තයා මයා වා—පපච්චිත්ථ—පපච්චිරෙ—පපච්චිත්ථො—පපච්චිව්හො—පපච්චි—පපච්චිම්හෙ—යන තන්හි පච පාකෙ යන ධාතු පච [illegible]තැනෙකවේ, ඕහට "භූවාදයො"—පෙ—පදසංඥාව පපච්චිත්ථ—පපච්චිරෙ—යනාදිය වේ—ආත්මනෙපද පරස්මෛපදබවට පැමිණි පපච්ච—පපච්චු—පපච්චෙ—පපච්චිත්ථ—පපච්ච—පපච්චිම්හ—කියාද වේ.

භාවෙ—බභූව—බභූවිත්ථ—යන තන්හි භූ සත්තායං යන ධාතු භූ කියා දෙතැනෙක වේ, ඕහට "භූවාදයො"—පෙ—ආත්මනෙපද සංඥකරණලද ත්ථාදීහු "අත්තනොපදානි" යනාදීන් භාවයෙහි වෙති, ව[illegible] අකර්මකධාතු එකවචනවතබැවින් එකවචනම වේ, හෙද ප්‍රථමපුරුෂඑකවචනවූ ත්ථ යන විභක්ති පමණක්ම වේ, යවිකරණ වේ, ධාතුහුගේ ආදිවර්ණයහට "ක්වචා" දීන් ස්වරසහිත එම අක්ෂරයෙක් ද්විත්වවේ, ඕහට "පුබ්බොබ්භාසො" යි අබ්භාසසංඥවේ, වර්ගාක්ෂරයන් සම්බන්ධවූ සතරවැනිවූ අබ්භාස සංඥ කරණලද භකාරයහට "දුතියචතුත්ථානං පඨමතතියා" යි එම වර්ගයෙහිවූ තෘතීයාක්ෂරවූ බකාරයෙක් ආදෙශවේ—බභූව—බභූවිත්ථ—යනු වේ.

මේ පරොක්ඛාවිභත්තියි.

———*———

හිය්‍යත්තනියං—සො අපචා—තෙ අපචූ—ත්වං අපචො—තුම්හෙ අපචත්ථ—අහං අපච—මයං අපචම්හා—යන තන්හි පච පාකෙ යන ධාතු පච යී සතැනෙක වේ, ඕහට "භූවාදයො"—පෙ—වසයෙන් "හිය්‍යත්තනී ආ ඌ ඔ ත්ථ අ ම්හා ත්ථ ත්ථුං සෙ ව්හං ඉං ම්හසෙ" යි හිය්‍යත්තනී සංඥකරණලද ආ ආදි

විභත්තීහු "හීයොප්පභූති පච්චක්ඛෙ හියත්තනී" යි අතීතකාලයෙහි වෙති, ඔවුන්ගේද–පෙ–සංඥාකරණලද ආය ඌය ඔය ත්ථය අය ම්හාය යන මොහු යථාක්‍රමයෙන් වෙත්, ධාතූහුකෙරෙන් පරව කර්තෘකාරකයෙහි "භූවාදිතො අ" යි අ ප්‍රත්‍යය වේ, ධාතූහුකෙරෙන් පූර්වයෙහි "අකාරාගමො හියත්තනජ්ජතනීකාලාතිපත්තීසු" යි කිසියැකෙක්හි අකාරාගම වේ, පදසංඥාව කො අපචා—තෙ අපචූ-යනාදිය වේ.

අත්තනොපදෙ–සො අපචත්ථ—තෙ අපචත්ථුං–ත්වං අපචසෙ–තුම්හෙ අපචව්හං—අහං අපචිං–මයං අපචාමහසෙ—යන තන්හි පච පාකෙ යන ධාතු පච යි සතැනෙක වේ ඕහට "භූවාදයො"–පෙ–සංඥාකරණලද ත්ථ ත්ථුං සෙ ව්හං ඉං මහසෙ යන මොහු යථාක්‍රමයෙන් වෙත්, ධාතූහුකෙරෙන්—පෙ—මහසෙ පරකල්හි "අකාරො දීඝං" යනාදි සූත්‍රයෙන් දීඝ වේ, ධාතූහුකෙරෙන් පූර්වයෙහි "අකාරාගමො" යනාදින් අකාරාගම වේ, සො අපචත්ථ–තෙ අපචත්ථුං-යනාදිය වේ.

කම්මනි–තෙන තයා මයා වා-සො (ඔදනො) අපච්චත්ථ—අපච්චත්ථුං–අපච්චසෙ–අපච්චව්හං–අපච්චිං—අපච්චාමහසෙ—යන තන්හි පච පාකෙ යන ධාතු පච යි සතැනෙක වේ, ඕහට "භූවාදයො"—පෙ—වශයෙන් "පරාණ්‍යත්තනොපදානි" යන සූත්‍රයෙන් ආත්මනෙපදසංඥාකරණලද ත්ථාදිය ලදන "අත්තනොපදානි" යනාදින් කර්මකාරකයෙහි වෙති, ඔවුන්ගේද–පෙ–පදසංඥාව අපච්චත්ථ–අපච්චත්ථුං–යනාදිය වේ—ආත්මනෙපද පරභෙසම පදබවට ගියතැන–අපච්චා–අපච්චූ–අපච්චො—අපච්චත්ථ–අපච්ච–අපච්චම්හා–කියාද වේ.

භාවෙ—අභූයා—අභූයත්ථ—යන තන්හි භූ සත්තායං යන ධාතු භූ කියා දෙතැනෙක වේ, ඕහට "භූවාදයො"—පෙ—ඇතිකල්හි "පරාණ්‍යත්තනොපදානි" යි ආත්මනෙපදසංඥාකරණලද ත්ථාදීහු "අත්තනොපදානි" යනාදින් භාවයෙහි වෙති, වන්නේ අකර්මකධාතු එකවචනබැවින් එකවචනම වේ, හෙද ප්‍රථමපුරුෂඑකවචනවූ ආ-ත්ථ-විභක්ති ම වේ, යකාරණ වේ, අකාරාගම වේ, අභූයා–අභූයත්ථ—යනුවේ.

මේ හියත්තනී විභක්තියි.

අජ්ජතනිම්හි—සො අපචි–පචි–අපචී—පචී-තෙ අපචිංසු—පචිංසු—අපචුං—පචුං—ත්වං අපචො–පචො—තුම්හෙ—අපචිත්ථ—පචිත්ථ–අහං අපචිං—පචිං—මයං අපචිම්හා—පචිම්හා–යන තන්හි පච පාකෙ යන ධාතු පච යි දොළොස් තැනෙක වේ, ඕහට "භූවාදයො"–පෙ–වශයෙන් "අජ්ජතනී ඊ උං ඔ ත්ථ ඉං ම්හා ආ ඌ සෙ ව්හං අ ම්හෙ" යි අජ්ජතනීසංඥාකරණලද ඊ ආදි විභක්තීහු "සමීපෙජ්ජතනී" යන සූත්‍රයෙන් අද පටන් සමීපවූ අතීතකාලයෙහි වෙති, ඔවුන්ගේද පූර්ව-පෙ-සංඥාකරණලද ඊ ආදි විභක්තීහු වෙත්, වන්නේ ඊ විභක්ති සතරතැනෙක වේ, උං විභක්ති සතරතැනෙක වේ, සෙසු විභක්ති දෙතැන්හි දෙතැන්හි වෙත්, ඊහට "යදා" දින් පනතින් විකල්ප

යෙන් දෙතැනෙක්හි හ්‍රස්ව වේ, සියලුධාතූන්කෙරෙන් * පරවූ උං විභක්ති හට "සබ්බතො උං ඉංසු" යි පනතින් විකල්පයෙන් දෙතැනෙක ඉංසු යනාදෙශවේ, ව්‍යඤ්ජනයක්හු ආදිකොටඇතිතන්හි අසාර්වධාතුකවිභක්තීන් පරකල්හි, "ඉකාරාගමො අසබ්බධාතුකම්හි" යන සූත්‍රයෙන් ඉකාරාගම වේ, ධාතූහුකෙරෙන් පූර්වයෙහි "අකාරාගමො" යනාදීන් කිසිතැනෙක්හි අකාරාගමවේ, පදසංඥව සො අපචි-පචි—අපචී-පචී-යනාදියවේ.

අත්තනොපදෙ-සො අපචා—පචා—තෙ අපචූ—පචූ—ත්වං අපචිසෙ-පචිසෙ—තුම්හෙ අපචිව්හං—පචිව්හං—අහං අපචිං—පචිං—මයං අපචිම්හෙ—පචිම්හෙ—යන තන්හි පච පාකෙ යන ධාතු පච යී දොළොස්තැනෙකවේ, ඊහට "භූවාදයො"—පෙ—සංඥකරණලද ආය ඌය සෙය ව්හංය අය මෙහය යනමොහු ක්‍රමයෙන් වෙත්, පදසංඥව සො අපචා පචා-තෙ අපචූ-පචූ-යනාදියවේ.

කම්මනි—තෙන තයා මයා වා-අපච්චා-පච්චා අපච්චූ—පච්චූ-අපච්චිසෙ-පච්චිසෙ—අපච්චිව්හං—පච්චිව්හං—අපච්ච—පච්ච—අපච්චිම්හෙ—පච්චිම්හෙ යන තන්හි පච පාකෙ යන ධාතු පච යී දොළොස්තැනෙක වේ, ඊහට "භූවාදයො"—පෙ-ආත්මනෙපදසංඥකරණලද ආ ආදීහු "අත්තනොපදානි" යනාදීන් කර්මකාරකයෙහි වෙති, ඔවුන්ගේදු—පෙ—පදසංඥව අපච්චා-පච්චා-අපච්චූ-පච්චූ—යනාදියවේ-ආත්මනෙපද පරස්සෙපදබවට ගියකල්හි අපච්චි-පච්චි—අපච්චිංසු-පච්චිංසු—අපච්චුං—පච්චුං—අපච්චො-පච්චො-අපච්චිත්ථ-පච්චිත්ථ-අපච්චිං—පච්චිං-අපච්චිම්හා-පච්චිම්හා-කියාදවේ.

භාවෙ-අභූයි-භූයි-අභූයා-භූයා-යන තන්හි භූ සත්තායං යන ධාතු භූ කියා සතරතැනෙක වේ, ඊහට "භූවාදයො"—පෙ—ආත්මනෙපදසංඥකරණලද ඊ ආදීහු "අත්තනොපදානි" යනාදීන් භාවයෙහි වෙති, වන් නේ අකර්මකධාතු එකවචනබැවින් එකවචනම වේ, සෙද ප්‍රථමපුරුෂඑකවචනවූ ඊ ආදි විභක්ති පමණක්ම වේ, භාවසෙහි යථිකරණව පූර්වයෙහි අකාරාගමව අභූයි-භූයි-යනාදියවේ.

මේ අජ්ජතනීවිභක්තියි.

අනාගතෙ—සො පචිස්සති—තෙ පචිස්සන්ති—ත්වං පචිස්සසි—තුම්හෙ පචිස්සථ—අහං පචිස්සාමි-මයං පචිස්සාම—යන තන්හි පච පාකෙ යන ධාතු පච යී සතැනෙක වේ, ඊහට "භූවාදයො"-පෙ-වසයෙන් "භවිස්සන්ති ස්සති ස්සන්ති ස්සසි ස්සථ ස්සාමි ස්සාම ස්සතෙ ස්සන්තෙ ස්සසෙ ස්සව්හෙ ස්සං ස්සාම්හෙ" යි භවිස්සන්ති සංඥකරණලද ස්සත්‍යාදීහු "අනාගතෙ භවිස්සන්ති" යි අනාගතකාලයෙහි වෙති, ඔවුන්ගේදු පූර්ව-පෙ-සංඥකරණලද ස්සති ස්සන්ති යනාදීහු යථාක්‍රමයෙන් වෙත්, ව්‍යඤ්ජනයක්හු ආදිකොටඇතිතන්හි අසාර්වධාතුකවිභක්තීන් පරකල්හි ඉකාරාගමව පදසංඥව සො පචිස්සති-තෙ පචිස්සන්ති-යනාදියවේ.

---

* සාර්වධාතුක විභක්තීන්කෙරෙන්-පොත්හි.

අත්තනොපදෙ—සො පචිස්සතෙ—තෙ පචිස්සන්තෙ—ත්වං පචිස්සසෙ—තුම්හෙ පචිස්සව්හෙ-අහං පචිස්සං-මයං පචිස්සාමහෙ-යන තන්හි පච පාකෙ යන ධාතු පච යී සතැනෙක වේ, ඕහට "භූවාදයො"—පෙ-සංඥකරණ ලද ස්සතෙය ස්සන්තෙය ස්සසෙය ස්සව්හෙය ස්සංය ස්සාමහෙය යනමොහු ක්‍රමයෙන් වෙත්, ව්‍යඤ්ජනයක්හු ආදිකොටඇති. තන්හි අසාර්වධාතුකවිභක්තීන් පරකල්හි ඉකාරාගමව පදසංඥව සො පචිස්සතෙ යනාදියවේ.

කම්මනි-තෙන තයා මයා වා-පච්චිස්සතෙ-පච්චිස්සන්තෙ-පච්චිස්සසෙ-පච්චිස්සව්හෙ—පච්චිස්සං පච්චිස්සාමහෙ—යන තන්හි පච පාකෙ යන ධාතු පච යී සතැනෙක වේ, ඕහට "භූවාදයො"-පෙ-ආත්මනෙපදසංඥකරණ ලද ස්සතෙ යනාදීහු "අත්තනොපදානි" යනාදීන් කර්මකාරකයෙහි වෙති, ඔවුන්ගේද-පෙ—සංඥකරණලද ස්සතෙයනාදීහු වෙත්, යවිකරණ වේ, ධාත්වන්තය සමග යහට චකාර වේ, විත්වව ඉකාරාගමව පච්චිස්සතෙ—යනාදිය වේ.

ආත්මනෙපදසංඥකරණලද ස්සතෙ ආදීහු "අත්තනොපදානි" යනාදීන් භාවයෙහි වෙති, "භාවකම්මෙසු යො" යී යවිකරණ වේ, ඉකාරාගමව භූයිස්සති-භූයිස්සතෙ-යනුවේ.

මේ භවිෂ්‍යත්විභක්තියි.

කාලාතිපත්තියං-සො අපචිස්සා-තෙ අපචිස්සංසු-ත්වං අපචිස්සෙ-තුම්හෙ අපචිස්සථ-අහං අපචිස්සං-මයං අපචිස්සම්හා-යන තන්හි පච පාකෙ යන ධාතු පච යී සතැනෙක වේ, ඕහට "භූවාදයො"-පෙ-වසයෙන් "කාලාතිපත්ති ස්සා ස්සංසු ස්සෙ ස්සථ ස්සං ස්සම්හා ස්සථ ස්සිංසු ස්සසෙ ස්සව්හෙ ස්සං ස්සාම්හසෙ" යී කාලාතිපත්තිසංඥකරණලද ස්සාදීහු "ක්‍රියාතිපන්නෙතීතෙ කාලාතිපත්ති" යී අතීතකාලයෙහි වෙති, ඔවුන්ගේද පූර්ව-පෙ-සංඥකරණලද ස්සාය ස්සංසුය ස්සෙය ස්සථය ස්සංය ස්සම්හාය යනමොහු යථාක්‍රමයෙන් වෙත්, ධාතූන්කෙරෙන් පූර්වයෙහි "අකාරාගමො" යනාදීන් අකාරාගම වේ, අසාර්වධාතුකවිභක්තීන් පරකල්හි ඉකාරාගමව පදසංඥව අපචිස්සා—අපචිස්සංසු—යනාදියවේ.

අත්තනොපදෙ-සො අපචිස්සථ—තෙ අපචිස්සිංසු-ත්වං අපචිස්සසෙ-තුම්හෙ අපචිස්සව්හෙ-අහං අපචිස්සං-මයං අපචිස්සාම්හසෙ-යන තන්හි පච පාකෙ යන ධාතු පච යී සතැනෙක වේ, ඕහට "භූවාදයො"—පෙ—සංඥකරණ ලද ස්සථය ස්සිංසුය ස්සසෙය ස්සව්හෙය ස්සංය ස්සාම්හසෙය යනමොහු යථාක්‍රමයෙන් වෙත්, පදසංඥව සො අපචිස්සථ් යනාදියවේ.

කම්මනි-තෙන තයා මයා වා—අපච්චිස්සථ—අපච්චිස්සිංසු-අපච්චිස්සසෙ-අපච්චිස්සව්හෙ-අපච්චිස්සං—අපච්චිස්සාම්හසෙ—යන තන්හි පච පාකෙ යන ධාතු පච යී සතැනෙක වේ, ඕහට "භූවාදයො"-පෙ-අපච්චිස්සථ අපච්චිස්සිංසු-යනාදිය වේ-ආත්මනෙපද පරස්මෛපදබවට ගියකල්හි අපච්චිස්සා-අපච්චිස්සංසු—අපච්චිස්සව්හෙ-අපච්චිස්සථ—අපච්චිස්සං-අපච්චිස්සම්හා—කියාද වේ.

භාවෙ-භවන තයා මයා වා-අභූයිස්සා-අභූයිස්සථ-යන තන්හි භූ සත්තායං යන ධාතු භූ ක්‍රියා ඉදතැනෙක වේ, ඕහට "භූවාදයො"-පෙ-ප්‍රථමපුරුෂඑකවචනවූ ස්සා ස්සථ විභක්ති පමණක්මවේ, භාවයෙහි යවිකරණව ධාතුහට පූර්වයෙහි අකාරාගමහා ඉකාරාගමව අභූයිස්සා—අභූයිස්සථ යනුවේ.

මේ කාලාතිපත්තිවිභක්තියි.

පිසන්නනු ප්‍රයොගකරණලදය යන අර්ථයෙහි පදසිද්ධිය කියනුලැබේ—සො පාචෙති-තෙ පාචෙන්ති-ත්වං පාචෙසි-තුම්හෙ පාචෙථ-අහං පාචෙමි—මයං පාචෙම—යන තන්හි පච පාකෙ යන ධාතු පච යී සතැනෙකවේ, ඕහට "භූවාදයො—පෙ—වක්ඛ්‍යවිචක්ෂාවසයෙන් "ධාතූහි ණෙ ණය ණෙ පෙණාපයා කාරිතානි හෙතුවත්ථෙ" යන සූත්‍රයෙන් ණෙප්‍රත්‍යයවේ, ඕහට එම සූත්‍රයෙන්ම කාරිතසංඥාදඉවේ, කාරිතප්‍රත්‍යයා සම්බන්ධවූ ණකාරයහට "කාරිතානං ණො ලොපං" යී ලොප්ව එකාරශෙෂවේ, කාරිතප්‍රත්‍යය පරකල්හි අසංයොගාන්තවූ ධාතූහුගේ ආදිස්වරයහට මෙතැන්හි පකාරස්ථ අකාරයහට "අසංයොගන්තස්ස වුද්ධි කාරිතෙ" යී වෑඩිවේ, වන්තෙහිදු "අයුවණ්ණානං චායො වුද්ධී" යන සූත්‍රයෙන් වෑඩිනියමකලහෙයින් අකාරයහට ආකාරයෙන් වෑඩිවේ, අනති විභක්තිහුගේ අකාරයහට "සර ලොපා" දී සූත්‍රයෙන් ලොප්ව පැමිණි ධාත්වර්ථයෙහි දක්වනලද කාරිත ප්‍රත්‍යයාන්තයාකෙරෙන් පරව "ධාතුප්පච්චයෙහි විභත්තියො" යී විභක්තිවේ, වන්ඉන් වර්තමානපරස්මෛපදප්‍රථමපුරුෂ ති ආදිවිභක්තීහු ක්‍රමයෙන් වෙත්, ආඛ්‍යාත-පෙ-පදසංඥාව සො පාචෙති තෙ පාචෙන්ති යනාදිය වේ—මත්තෙහිදු වාක්‍යය මෙසේම යෙදියයුතුයි-මේ ණෙප්‍රත්‍යයවූතැනි.

පාචයති පාචයන්ති යනාදි තන්හි පච පාකෙ යන ධාතු—පෙ—වසයෙන් "ධාතූහි ණෙ ණය ණාපෙ" යනාදි සූත්‍රයෙන් ණයප්‍රත්‍යයවේ, කාරිත සංඥාව ණහට ලොප්ව අයශෙෂව වෑඩිව පැමිණි "ධාතුප්පච්චයෙහි විභත්තියො" යී ත්‍යාදි විභක්තිව පාචයති පාචයන්ති යනාදිය වේ—මේ ණය ප්‍රත්‍යයවූ තැනි.

පාචාපෙති පාචාපෙන්ති යනාදි තන්හි පච පාකෙ යන ධාතු—පෙ—වසයෙන් "ධාතූහි ණෙ ණය" යනාදින් ණාපෙප්‍රත්‍යයවේ, කාරිතසංඥාව ණහට ලොප්ව ආපෙශෙෂව වෑඩිව පැමිණි "ධාතුප්පච්චයෙහි" යනාදින් ත්‍යාදිව පාචාපෙති පාචාපෙන්ති යනාදියවේ-මේ ණාපෙ ප්‍රත්‍යයවූතැනි.

පාචාපයති පාචාපයන්ති යනාදි තන්හි පච පාකෙ යන ධාතු—පෙ—වසයෙන් "ධාතූහි ණෙ ණය" යනාදි සූත්‍රයෙන් ණාපයප්‍රත්‍යයවේ, කාරිත සංඥාව ණහට ලොප්ව ආපයශෙෂවේ, වෑඩිව පැමිණි ත්‍යාදි විභක්තිව පාචාපයති පාචාපයන්ති යනුවේ—මේ ණාපයප්‍රත්‍යයවූතැනි—මේ කාරිතප්‍රත්‍යයෝ වර්තමානපඤ්චම්‍යාදිවූ අෂ්ටවිභක්තියෙහිම යෙදියයුතුයි.

වත්තමානපරස්සපදෙ—සො පචති—තෙ පචන්ති-ත්වං පචසි—තුම්හෙ පචථ—අහං පචාමි—මයං පචාම—අත්තනොපදෙ—සො පචතෙ—තෙ පචන්තෙ-ත්වං පචසෙ-තුම්හෙ පචව්හෙ—අහං පචෙ-මයං පචාමහෙ—කම්මනි-

තෙන තයා මයා වා - පච්චතෙ - පච්චන්තෙ - පච්චසෙ - පච්චව්හෙ — පච්චෙ - පච්චාමෙහ — අත්තනොපදානි පරස්සපදත්තං ගතෙ — තෙන තයා මයා වා - පච්චති — පච්චන්ති - පච්චසි - පච්චථ - පච්චාමි - පච්චාම — භාවෙ - තෙන තයා මයා වා - භූයති - භූයතෙ.

පඤ්චමියං පරස්සපදෙ - සො පචතු — තෙ පචන්තු - ත්වං පච පචාහි — තුම්හෙ පචථ — අහං පචාමි — මයං පචාම — අත්තනොපදෙ - සො පචතං — තෙ පචන්තං — ත්වං පචස්සු — තුම්හෙ පචව්හො — අහං පචෙ — මයං පචාමසෙ — කම්මනි - තෙන තයා මයා වා - පච්චතං - පච්චන්තං - පච්චස්සු - පච්චව්හො - පච්චෙ - පච්චාමසෙ - පරස්සපදත්තං ගතෙ - පච්චතු පච්චන්තු - පච්ච පච්චාහි - පච්චථ - පච්චාමි - පච්චාම — භාවෙ — තෙන තයා මයා වා — භූයතු - භූයතං.

සත්තමියං පරස්සපදෙ - සො පචෙ පචෙය්‍ය — තෙ පචෙය්‍යුං - ත්වං පචෙය්‍යාසි - තුම්හෙ පචෙය්‍යාථ - අහං පචෙය්‍යාමි - මයං පචෙය්‍යාම - අත්තනොපදෙ - සො පචෙථ - තෙ පචෙරං - ත්වං පචෙථො - තුම්හෙ පචෙය්‍යව්හො - අහං පචෙය්‍යං — මයං පචෙය්‍යාමෙහ — කම්මනි — තෙන තයා මයා වා — පච්චෙථ — පච්චෙරං - පච්චෙථො — පච්චෙය්‍යව්හො - පච්චෙය්‍යං — පච්චෙය්‍යාමෙහ — පරස්සපදත්තං ගතෙ - පච්චෙ පච්චෙය්‍ය - පච්චෙය්‍යුං - පච්චෙය්‍යාසි - පච්චෙය්‍යාථ - පච්චෙය්‍යාමි — පච්චෙය්‍යාම — භාවෙ — තෙන තයා මයා වා — භූයෙ භූයෙය්‍ය - භූයෙථ.

පරොක්ඛායං පරස්සපදෙ - සො පපච — තෙ පපචු — ත්වං පපචෙ — තුම්හෙ පපචිත්ථ — අහං පපච — මයං පපචිම්හ — අත්තනොපදෙ — සො පපචිත්ථ — තෙ පපචිරෙ — ත්වං පපචිත්ථො — තුම්හෙ පපචිව්හො — අහං පපචි — මයං පපචිම්හෙ — කම්මනි — තෙන තයා මයා වා - පපච්චිත්ථ - පපච්චිරෙ — පපච්චිත්ථො — පපච්චිව්හො — පපච්චි - පපච්චිම්හෙ — පරස්සපදත්තං ගතෙ — තෙන තයා මයා වා - පපච්ච — පපච්චු - පපච්චෙ — පපච්චිත්ථ — පපච්ච — පපච්චිම්හ - භාවෙ - තෙන තයා මයා වා - බභූව බභූවිත්ථ.

හිය්‍යත්තනියං පරස්සපදෙ — සො අපචා — තෙ අපචූ - ත්වං අපචො - තුම්හෙ අපචත්ථ — අහං අපච — මයං අපචම්හා - අත්තනොපදෙ — සො අපචත්ථ — තෙ අපචත්ථුං — ත්වං අපචසෙ — තුම්හෙ අපචව්හං — අහං අපචිං — මයං අපචාම්හසෙ - කම්මනි — තෙන තයා මයා වා — අපච්චත්ථ අපච්චත්ථුං - අපච්චසෙ - අපච්චව්හං - අපච්චිං — අපච්චාම්හසෙ - පරස්සපදත්තං ගතෙ — තෙන තයා මයා වා — අපච්චා — අපච්චූ — අපච්චො — අපච්චත්ථ - අපච්ච - අපච්චම්හා - භාවෙ - තෙන තයා මයා වා - අභූයා - අභූයත්ථ.

අජ්ජතනිම්හි පරස්සපදෙ — සො අපචි පචි අපචී පචී — තෙ අපචිංසු පචිංසු අපචුං පචුං - ත්වං අපචො පචො — තුම්හෙ අපචිත්ථ පචිත්ථ - අහං අපචිං පචිං — මයං අපචිම්හා පචිම්හා — අත්තනොපදෙ - සො අපචා පචා — තෙ අපචූ පචූ — ත්වං අපචිසෙ පචිසෙ — තුම්හෙ අපචිව්හං පචිව්හං — අහං අපච පච — මයං අපචිම්හෙ පචිම්හෙ — කම්මනි — තෙන තයා මයා වා - අපච්චා පච්චා — අපච්චූ පච්චූ — අපච්චිසෙ පච්චිසෙ — අපච්චිව්හං පච්චිව්හං — අපච්ච පච්ච —

අපචිම්හෙ පචිම්හෙ-පරස්සපදත්තං ගතෙ—තෙන තයා මයා වා—අපචී පචී අපචි පචි-අපචිංසු පචිංසු—අපචුං පචුං-අපචෙවා පචෙවා—අපචිත්ථ පචිත්ථ—අපචිං පචිං-අපචිම්හා පචිම්හා—භාවෙ—තෙන තයා මයා වා—අභූයි භූයි අභූයී භූයී-අභූය භූය අභූයා භූයා.

භවිස්සති පරස්සපදෙ-සො පචිස්සති—තෙ පචිස්සන්ති-ත්වං පචිස්සසි—තුම්හෙ පචිස්සථ-අහං පචිස්සාමි-මයං පචිස්සාම-අත්තනොපදෙ-සො පචිස්සතෙ-තෙ පචිස්සන්තෙ-ත්වං පචිස්සසෙ-තුම්හෙ පචිස්සව්හෙ—අහං පචිස්සං-මයං පචිස්සාමෙහ—කම්මනි-තෙන තයා මයා වා-පච්චිස්සතෙ—පච්චිස්සන්තෙ-පච්චිස්සසෙ-පච්චිස්සව්හෙ-පච්චිස්සං-පච්චිස්සාමෙහ-පරස්සපදත්තං ගතෙ—පච්චිස්සති-පච්චිස්සන්ති—පච්චිස්සසි-පච්චිස්සථ—පච්චිස්සාමි-පච්චිස්සාම—භාවෙ-තෙන තයා මයා වා-භූයිස්සති—භූයිස්සතෙ.

කාලාතිපත්තියං පරස්සපදෙ-සො අපචිස්සා-තෙ අපචිස්සංසු-ත්වං අපචිස්සෙ—තුම්හෙ අපචිස්සථ—අහං අපචිස්සං—මයං අපචිස්සම්හා—අත්තනොපදෙ-සො අපචිස්සථ—තෙ අපචිස්සිංසු-ත්වං අපචිස්සසෙ—තුම්හෙ අපචිස්සව්හෙ-අහං අපචිස්සං-මයං අපචිස්සාම්හසෙ—කම්මනි-තෙන තයා මයා වා-අපච්චිස්සථ—අපච්චිස්සිංසු-අපච්චිස්සසෙ—අපච්චිස්සව්හෙ—අපච්චිස්සං-අපච්චිස්සාම්හසෙ-පරස්සපදත්තං ගතෙ-තෙන තයා මයා වා-අපච්චිස්සා-අපච්චිස්සංසු-අපච්චිස්සෙ—අපච්චිස්සථ-අපච්චිස්සං-අපච්චිස්සම්හා—භාවෙ—තෙන තයා මයා වා-අභූයිස්සා-අභූයිස්සථ.

අෂ්ටවිභක්තිනිමි.

———*———

කාරිතප්‍රත්‍යය කළකල්හි-සො පාචෙති—තෙ පාචෙන්ති-ත්වං පාචෙසි-තුම්හෙ පාචෙථ-අහං පාචෙමි-මයං පාචෙම-අත්තනොපදෙ-සො පාචෙතෙ-තෙ පාචෙන්තෙ—ත්වං පාචෙසෙ—තුම්හෙ පාචෙව්හෙ-අහං පාචෙ-මයං පාචෙම්හෙ—කම්මනි-තෙන තයා මයා වා—පචෙච්චතෙ-පචෙච්චන්තෙ-පචෙච්චසෙ-පචෙච්චව්හෙ-පචෙච්ච-පචෙච්චම්හෙ—භාවෙ-භූයෙතෙ—මේ ණෙප්‍රත්‍යය වූතැනි.

සො පාචයති-තෙ පාචයන්ති-ත්වං පාචයසි-තුම්හෙ පාචයථ—අහං පාචයාමි-මයං පාචයාම-අත්තනොපදෙ ච කම්ම භාවෙ ච යොජ්‍යං—මේ ණය ප්‍රත්‍යයවූතැනි.

සො පාචාපෙති-තෙ පාචාපෙන්ති-ත්වං පාචාපෙසි-තුම්හෙ පාචාපෙථ-අහං පාචාපෙමි-මයං පාචාපෙම-මේ ණාපෙප්‍රත්‍යයවූතැනි.

සො පාචාපයති—තෙ පාචාපයන්ති—ත්වං පාචාපයසි-තුම්හෙ පාචාපයථ-අහං පාචාපයාමි-මයං පාචාපයාම-මේ ණාපයප්‍රත්‍යයවූතැනි-මේතැම කාරිත ප්‍රත්‍යයෝම අෂ්ටවිභක්තියෙහිම යෙදියයුතුයි.

භූවාදිගණයි.

රුන්ධති රුන්ධන්ති යනාදී තන්හි රුධි ආවරණේ යන ධාතු රුධි කියා දෙතැනෙකවේ, ධාත්වන්තයහට “ධාතුස්සන්තෝ ලෝපෝ'නේකසරස්ස” යන සූත්‍රයෙන් ලොප්වේ, ධාතූහුකෙරෙන් පරව වර්තමානපරස්මෛපද ප්‍රථමපුරුෂ ති අන්ති විභක්තිවේ, රුධාදිධාතූන්කෙරෙන් පරව කර්තෘකාරකයෙහි “රුධාදිතො නිග්ගහීතපුබ්බඤ්ච” යන සූත්‍රයෙන් අප්‍රත්‍යයවේ, ධාත්වන්තයාකෙරෙන් පූර්වයෙහි නිග්ගහීතයෙක්ද ආගමවේ, වර්ගව්‍යඤ්ජනයා පරකල්හි නිග්ගහීතයහට “වග්ගන්තං වා වග්ගෙ” යන සූත්‍රයෙන් තද්වර්ගාන්තාදෙශවේ, පූර්වව්‍යඤ්ජනපරව්‍යඤ්ජනයෙහි බන්ධව රුන්ධති රුන්ධන්ති යනාදියවේ, පඤ්චමීසත්තමීකාදි අන්‍යවිභක්තියෙහිද - පාවෙති - පාවෙන්ති යනාදී හෙවත් ඊයෙහිද යෙදියයුතුයි—මතුහිදු මෙසේමැයි.

රුධාදිගණයි.

දිබ්බති දිබ්බන්ති යනාදී තන්හි දිවු කීළාදිමහි යන ධාතු දිවු කියා දෙතැනෙකවේ, ධාත්වන්තයහට “ධාතුස්සන්තෝ” යනාදින් ලොප්වේ, ධාතූහුකෙරෙන් පරව ති අන්ති විභක්තිවේ, දිවාදිධාතූන්කෙරෙන් පරව කර්තෘකාරකයෙහි “දිවාදිතො යො” යී යප්‍රත්‍යයවේ, ධාත්වන්තයහා යප්‍රත්‍යයහට “යථා කත්තරි ච” යී පූර්වරූපවූ වකාරයෙක්වේ, වකාරද්විත්වවේ, “දො ධස්ස ච” යී වග්ගහණයෙන් වකාරවයහට බකාරවයෙක්වේ, දිබ්බති දිබ්බන්ති යනාදියවේ.

දිවාදිගණයි.

සුණොති සුණන්ති යනාදී තන්හි සු සවණෙ යන ධාතු සු කියා දෙතැනෙකවේ, ඔහුකෙරෙන් පරව ති අන්ති විභක්තිවේ, ස්වාදිධාතූන්කෙරෙන් පරව කර්තෘකාරකයෙහි “ස්වාදිතො ණුණාඋණා ච” යී ණුප්‍රත්‍යයවේ, ණුප්‍රත්‍යයාගේ උකාරයහට “අඤ්ඤෙසු ච” යී චග්ගහණයෙන් වෘද්ධිවේ, එන්තෙහිදු “අඤ්ඤුවිණණානං”-පෙ-අන්ති විභක්ති පරකල්හි ණකාරස්ථ උකාරයහට “සරලොපො” දින් ලොප්ව සුණොති සුණන්ති යනාදියවේ.

ස්වාදිගණයි.

කිණාති කිණන්ති යනාදී තන්හි කී දබ්බවිනිමයෙ යන ධාතු කී කියා දෙතැනෙකවේ, ඔහුකෙරෙන් පරව ති අන්ති විභක්තිවේ, කියාදිධාතූන් කෙරෙන් පරව කර්තෘකාරකයෙහි “කියාදිතො නා” යී නාප්‍රත්‍යයවේ, කකාරස්ථ ඊහට “යදා” දින් හ්‍රස්වවේ, අන්ති විභක්ති පරකල්හි පූර්වස්වරයහට “සරලොපො” යනාදින් ලොප්වේ, කිණාති කිණන්ති යනාදියවේ.

කියාදිගණයි.

ඝෙප්පති ගණ්හාති ගණ්හන්ති යනාදී තන්හි ගහ උපාදානෙ යන ධාතු ගහ කියා තුන්තැනෙකවේ, ඔහුකෙරෙන් පරව ති විභක්ති දෙතැනෙකවේ, අන්ති විභක්ති එක්තැනෙකවේ, ගහාදිධාතූන්කෙරෙන් පරව කර්තෘකාරකයෙහි “ගහාදිතො ප්පණ්හා” යී ප්පප්‍රත්‍යය එක්තැනෙකහා ණ්හාප්‍රත්‍යය දෙතැනෙකවේ, ප්පප්‍රත්‍යයා පරකල්හි ගහ යන ධාතුහට “ගහස්ස ඝෙ ප්පෙ” යී ඝෙයනාදෙශවේ, ණ්හාප්‍රත්‍යයා පරකල්හි ගහ යන ධාතූහුගේ

හකාරයහට "හලොපො ණාම්හි" යී ලොප්වේ, අන්ති විභක්ති පරකල්හි පූර්වස්වරයහට "සරලොපො" දීන් ලොප්වේ, ගෙණ්හාති ගණ්හන්ති යනාදියවේ.

ගහාදිගණයි.

කරොති කයිරති කුබ්බන්ති කරොන්ති යනාදී තන්හි කර කරණෙ යන ධාතු කර කියා සතරතැනෙකවේ, ඔහුකෙරෙන් ති අන්ති විභක්තිවේ, තනාදී ධාතූන්කෙරෙන් පරව කර්තෘකාරකයෙහි "තනාදිතො ඔයිරා" යී යෙදෙනයෙදෙකපර්දෙදුන් ඔප්‍රත්‍යය තුන්තැනෙකවේ, යිරප්‍රත්‍යය එක්තැනෙකවේ, ඔය යිරය යන ප්‍රත්‍යයන් පරකල්හි දෙතැනෙක්හි ජනතින් කර යන රකාරවයහට "යදා" දීන් ලොප්වේ, ඔකාරයහට "උත්තමො කාරො ච" යී විකල්පයෙන් උකාරවේ, එම පක්ෂයෙහි කකාරයහි අහට "කරස්ස කාරො ච" යී උකාරවේ, පර උකාරයහට "වමොදුදන්තානං" යී වකාරවේ, වකාරද්විත්වවේ, "දෙ ධස්ස ච" යී චග්‍රහණයෙන් වකාරවයහට බකාරවයෙක් වේ, කරොති - කයිරති - කුබ්බන්ති යනුවේ— කරොන්ති යන තැන "ව්‍යා පරො අසරූපා" යී අකාර ලොප්කරණු—ආත්මනෙපදයෙහි කුරුතෙ කුබ්බන්තෙ යන තන්හි කර කරණෙ යන ධාතු කර යී දෙතැනෙකවේ, ඔහුකෙරෙන් පරව තෙ අන්තෙ යන විභක්තිවේ, තනාදී ධාතූන්කෙරෙන් පරව "තනාදිතො ඔයිරා" යී ඔප්‍රත්‍යයවේ, ඔකාරයන්ට "උත්තමො කාරො" යී උකාරවේ, කකාරයන්ගේ අකාරයන්ට "කරස්ස කාරො ච" යී උකාරවේ, එක්පක්ෂයෙක්හි රහට "යදා" දීන් ලොප්වේ, උකාරයහට "වමොදුදන්තානං" යී වකාරව ද්විත්වවේ, "දෙ ධස්ස ච" යී චයින් වකාරවයහට බකාරවයෙක්වේ, කුරුතෙ කුබ්බන්තෙ යනුවේ— කර්මකාරකයෙහි—කරීයතෙ කරීයන්තෙ කය්‍යතෙ කිච්චමාන තන්හි කර කරණෙ යන ධාතු කර යී තුන්තැනෙකවේ, ධාතූහුකෙරෙන් පරව කර්මකාරකයෙහි "භාවකම්මෙසු යො" යී යවිකරණවේ, යප්‍රත්‍යය පරකල්හි ධාතූහුකෙරෙන් පරව "ඉවණ්ණාගමො වා" යී දෙතැනෙක ඊකාරාගමවේ, එක් පක්ෂයෙක්හි රකාරයහට "යදා" දීන් ලොප්වේ, යප්‍රත්‍යයහට විකල්පයෙන් දෙතැනෙක්හි ද්විත්වවේ, කරීයතෙ කරීයන්තෙ කය්‍යතෙ යනුවේ— අකාසි අකරී අකාසුං අකරුං කිච්චමානතන්හි කර කරණෙ යන ධාතුකර යී සතරතැනෙකවේ, ඔහුකෙරෙන් පරව අජ්ජතනීපරස්සෙපද ප්‍රථමපුරුෂඑකවචන ඊ විභක්ති දෙතැනෙකවේ, බහුවචන උං විභක්ති දෙතැනෙකවේ, අජ්ජතනී විභක්ති පරකල්හි කර යන ධාතුහට "කරස්ස කාසත්තමජ්ජතනිම්හි" යී විකල්පයෙන් කාසයනාදෙශවේ, ඊහට "යදා" දීන් හ්‍රස්වවේ, ධාතූහුකෙරෙන් පූර්වයෙහි "අ කාරාගමො" යනාදීන් අකාරාගමවේ, අකාසි අකරී අකාසුං අකරුං යනුවේ— කාහති කරිස්සති කිච්චමානතන්හි කර කරණෙ යන ධාතු කර යී දෙතැනෙකවේ, ඔහුකෙරෙන් පරව භවිෂ්‍යත්කාලප්‍රථමපුරුෂඑකවචන ස්සති විභක්තිවේ, භවිෂ්‍යත් පරකල්හි කර යන ධාතුහට "කරස්ස සප්පච්චයස්ස කාහො" යී විකල්පයෙන් කාහයනාදෙශහා ස්සහට ලොප්දවේ, අසාර්වධාතුකවිභක්තීන් පරකල්හිද ව්‍යඤ්ජනයක්හු ආදිකොටඇති "ඉකාරාගමො" යනාදීන් ඉකාරාගමව කාහති කරිස්සති යනුවේ.

තනාදිගණයි.

චොරෙති චොරෙන්ති යනාදී තන්හි චුර ථෙය්‍යෙ යන ධාතු චුර කියාවේ, ඔහුකෙරෙන් පරව ති අන්ති විභක්තිවේ, චුරාදිධාතූන්කෙරෙන් පරව "චුරාදිතො ණෙණයා" යි ණෙප්‍රත්‍යය වේ, ඕහට එයින්ම කාරිතසංඥා වේ, ණලොප්ආදියවේ, චොරෙති චොරෙන්ති යනාදිය වේ.

චුරාදිගණයි.

බුභුක්ඛති බුභුක්ඛන්ති යනාදී තන්හි භුජ පාලනබ්‍යවහරණෙසු යන ධාතු භුජ කියා වේ, ඔහුකෙරෙන් පරව "භුජඝසහරසුපාදීහි තුමිච්ඡත්ථෙසු ච" යි ඛප්‍රත්‍යය වේ, භුජ යන්නහුගේ ආදිව ණ්ණයහට "ක්වචාදිවණ්ණානමෙකස්සරානං ද්වෙභාවො" යි කිසිතැනෙක්හි ස්වර ද්විත්වවේ, එසේමවූ අක්ෂරයෙක් පූර්වයෙන් වේ, ඕහට "පුබ්බොබ්භාසො" යි අබ්භාසසංඥා වේ, ව්‍යඤ්ජනාක්ෂරයාගේ සතරවනුවූ අබ්භාසසංඥාකරණලද ආදිභූහට "දුතියචතුත්ථානං පඨමතතියා" යි එම වර්ගයෙහි තුන්වන බුකාරයෙක් වේ, ඛපරකල්හි ධාත්වන්තවූ ජහට "කො ඛෙ ච" යි කවේ, පූර්වව්‍යඤ්ජනයෙහි ඛඛවේ, ධාත්වර්ථයෙහි දක්වනලද කාරිතප්‍රත්‍යයාකෙරෙන් පරව "ධාතුප්පච්චයෙහි" යනාදින් ත්‍යාදීහු වෙත්, බුභුක්ඛති බුභුක්ඛන්ති යනාදිය වේ.

ජිඝච්ඡති යථා තන්හි ඝස අදනෙ යන ධාතු ඝස කියා වේ, ඔහුකෙරෙන් පරව කනුකැමැත්තේය යන අර්ථයෙහි "භුජඝස" යනාදින් ඡප්‍රත්‍යය වේ, ධාතුහුගේ ආදිව ණ්ණයහට එම අක්ෂරයෙක් ද්විත්වවේ, අබ්භාසසංඥාව පූර්ව ඝහට "කවග්ගස්ස චවග්ගො" යි ඣවේ, ඣහට ජවේ, අබ්භාසාන්තවූ ජකාරාන්ත අහට "අන්තස්සිවණ්ණාකාරො වා" යි ඉවේ, ඡපරකල්හි සහට "බ්‍යඤ්ජනන්තස්ස චො ඡප්පච්චයෙසු ච" යි ච[illegible], "ධාතුප්පච්චයෙහි" යනාදින් ත්‍යාදීහු වෙත්, ජිඝච්ඡති යනු වේ.

ජිගිංසති කිවමනාතන්හි හර හරණෙ යන ධාතු හර කියා වේ, ඔහුකෙරෙන් පරව ගනුකැමැත්තේය යන අර්ථයෙහි "භුජඝස" යනාදින් සප්‍රත්‍යය වේ, සපරකල්හි හර යන්නහුගේ රහට "හරස්ස ගිං සෙ" යි ගිං යනාදේශවේ, "හස්ස ජො" යි හහට ජවේ, අබ්භාසාන්තයහට "අන්තස්සිවණ්ණාකාරො වා" යි ඉ වේ "ධාතුප්පච්චයෙහි" යනාදින් ත්‍යාදීහු වෙත්, ජිගිංසති යනු වේ—මේ හැමප්‍රත්‍යයෝ අෂ්ටවිභක්තියෙහිද හෙත්වර්ථ ප්‍රත්‍යයෙහිද යෙදියයුතු.

පබ්බතායති කිවමනාතන්හි පබ්බතශබ්දයාකෙරෙන් පරව අං වේ, ඉව ආචරති යන වාක්‍යයවේ, කර්තෘහට උපමානවූ ද්‍රව්‍යනාමයාකෙරෙන් පරව තමා පර්වතයක්මෙන් කෙරෙයි යන අර්ථයෙහි "ආය නාමතො කත්තූපමානාදාචාරෙ" යි ආය ප්‍රත්‍යය වේ, වාක්‍යඅප්‍රයෝගාදිය වේ, ඔහුකෙරෙන් පරව "ධාතුප්පච්චයෙහි" යනාදින් ත්‍යාදීහු වෙත්, පබ්බතායති යනු වේ.

පුත්තීයති කිවමනාතන්හි පුත්තශබ්දයාකෙරෙන් පරව අං වේ, ඉව ආචරති යන වාක්‍යය වේ, කත්තෘහට උපමානවූ ද්විතීයාන්තයාකෙරෙන් පරව පුත්‍රයෙකුමෙන් හසුරුවයි යන අර්ථයෙහි "ඊයූපමානා ච" සී ඊය ප්‍රත්‍යය වේ, වාක්‍යඅප්‍රයොගාදිය වේ, "ධාතුප්පච්චයෙහි" යනාදීන් ත්‍යාදීහු වෙත්, පුත්තීයති යනුවේ.

පත්තීයති යන තන්හි පත්තශබ්දයාකෙරෙන් අං වේ, අත්තනො පත්තං ඉච්ඡති යන වාක්‍යය වේ, කත්තෘහට උපමානවූ ද්විතීයාන්තයාකෙරෙන් පරව තමහට පාත්‍රයක් කැමතිය යන අර්ථයෙහි "නාමම්හාත්තිච්ඡත්ථෙ" සී ඊය ප්‍රත්‍යය වේ "ධාතුප්පච්චයෙහි" යනාදීන් ත්‍යාදීහු වෙත්, පත්තීයති යනුවේ.

විසුද්ධයති යන තන්හි විසුද්ධශබ්දයාකෙරෙන් සිව ඔවේ, හොති යන වාක්‍යය වේ, ධාතුරූපය ඇතිකල්හි විසුද්ධො යන ප්‍රථමාන්තනාමයාකෙරෙන් පරව "ධාතුරූපෙ නාමස්මා ණයො ච" සී ණයප්‍රත්‍යයවේ, ඕහට "ධාතූහි ණෙණය" යනාදීන් කාරිතසංඥ වේ, ඕහට "කාරිතානං ණො" යනාදීන් ලොප්ව වාක්‍ය අප්‍රයොගාදිය වේ, "ධාතුප්පච්චයෙහි" යනාදීන් ත්‍යාදීහු වෙත්, විසුද්ධො හොති යන අර්ථයෙහි විසුද්ධයති යනුවේ—රාත්‍රියයි.

දළ්හයති යන තන්හි දළ්හශබ්දයාකෙරෙන් අංවේ, කරොති යන වාක්‍යය වේ, ධාතුරූපය ඇතිකල්හි දළ්හං යන ද්විතීයාන්තනාමයාකෙරෙන් පරව "ධාතුරූපෙ" යනාදීන් ණයප්‍රත්‍යයවේ—පෙ—දළ්හං කරොති යන අර්ථයෙහි දළ්හයති යනුවේ.

අතිහත්ථයති කිවමනාතන්හි අතිපූර්වවූ හත්ථිශබ්දයාකෙරෙන් නාවේ, අතික්කමති යන වාක්‍යයවේ, කමති යන ධාතුරූපය ඇතිකල්හි හත්ථිනා යන තෘතීයාන්තනාමයාකෙරෙන් පරව "ධාතුරූපෙ" යනාදීන් ණයප්‍රත්‍යයවේ, කාරිතසංඥදියවේ, හත්ථිනා අතික්කමති යන අර්ථයෙහි අතිහත්ථයති යනුවේ.

ආඛ්‍යාතනිමි.

—— ** ——

පුඤ්ඤකාරො යන තන්හි පුඤ්ඤං යනු උපපදකොටඇති කර කරණෙ යන ධාතු කර ක්‍රියාවේ, ඕහට "භූවාදයො ධාතවො" සී ධාතුසංඥවේ, අනෙකස්වරවූ ධාතූහුගේ අන්තයහට "ධාතුස්සන්තො ලොපොනෙකසරස්ස" සී කිසිතැනෙක්හි ලොප්වේ, ධාතූහුකෙරෙන් පරව "ධාතුලිඞ්ගෙහි පරාපච්චයා" සී අනෙකප්‍රත්‍යයන්ගේ ප්‍රාප්තියක් ඇතිකල්හි වක්‍ෂ්‍යමාණ විවක්‍ෂාවසයෙන් පුඤ්ඤං අකාසි කරොති කරිස්සති යන අර්ථයෙහි කම්මයක්හු ආදිකොටඇති ධාතූහුකෙරෙන් පරව "ධාතුයා කම්මාදිම්හි ණො" සී ණප්‍රත්‍යයවේ, ඕහට "කාරිතං විය ණානුබන්ධො" සී කාරිත සංඥවේ, වන්නේ "ණාදයො තෙකාලිකා" සී කාලත්‍රයෙහි වෙති "අඤ්ඤෙ කිත්" සී කිත්සංඥවේ, "කත්තරි කිත්" සී කර්තෘකාරකයෙහි

වේ, කාරිතප්‍රත්‍යයා සම්බන්ධිවූ ණකාරයහට "කාරිතානං ණො ලොපං" යි ලොප්වේ, අකාරශෙෂවේ, ණානුබන්ධප්‍රත්‍යයා පරකල්හි අසංයොගාන්තවූ ධාතූහුගේ ආදිස්වරයහට "අසංයොගන්තස්ස වුද්ධි කාරිතෙ" යි වෘද්ධි වේ, වන්නේ "අයුවණ්ණානං චායො වුද්ධි" යි වෘද්ධිනියමකළ හෙයින් කකාරස්ථ අකාරයහට ආකාරයෙක් වෘද්ධිවේ, පූර්වපදයා සම්බන්ධිවූ විභක්තිහට "තෙසං විභත්තියො ලොපා ච" යි තෙසං ග්‍රහණයෙන් විභක්ති ලොප්වේ, ස්වරාන්තප්‍රකෘතිහට "පකති චස්ස සරන්තස්ස" යි ප්‍රකෘති වේ, කිතකප්‍රත්‍යයාන්තවූ අලිඟුහෙයින් "තද්ධිතා" දින් නාම්වත්වේ, ඔහුකෙරෙන් සිව ඔවේ, පුඤ්ඤකාරො යනුවේ—"ණ්වුණි ත්‍යා" දීන් ඊ ප්‍රත්‍යයකළ කල්හි පුඤ්ඤකාරී යනුවේ—සිව අංව පුඤ්ඤකාරං යනුවේ.

කිතකප්‍රත්‍යයෝ මෙයින් අර්ථයට බහුලිඟුඇති වෙති, එසේදවුවත් ඉව ණ්‍යන්ත ලව ණ්‍යන්ත ධාතූන්කෙරෙන්ද වරාදිධාතූන්කෙරෙන්වූද අප්‍රත්‍යයද දෙවන ණ්ප්‍රත්‍යයද ඉප්‍රත්‍යයද යන මොහු පුල්ලිඟුයෙහි වෙති-කර්තෘකාරකයෙන් බැහැරවූ යුප්‍රත්‍යයද භාවයෙහිවූ කිච්චප්‍රත්‍යයෝද තප්‍රත්‍යයද යන මොහු නපුංසකලිඟුයෙහි වෙත්-තවෙප්‍රත්‍යයා ආදිකොටඇති තුනත්තුං ප්‍රත්‍යයා අන්තකොටඇති ප්‍රත්‍යයෝද අලිඞ්ගිකයෝය—දෙවන යුප්‍රත්‍යය කෙළවරකොටඇති ණාදි ප්‍රත්‍යයන්ට තිකාලිකසංඥාකළහ-කිච්චප්‍රත්‍යයන් හැර සෙසු හැම ප්‍රත්‍යයන්ටම කිත්සංඥාකළහ—එම කිත්සංඥාලද ප්‍රත්‍යයන්ට බොහෝසෙයින් කර්තෘ සංඥාකටයුතු-

තක්කරෝ කිච්චමනාතන්හි තං යන විතීයාන්තයා උපපදකොටඇති කර කරණෙ යන ධාතු කර කියාවේ, ඕහට "භූවාදයො—පෙ—වත්තානු විධ්‍යාවසයෙන් තං අකාසි කරොති කරිස්සති යන අර්ථයෙහි කර්මයක්හු ආදිකොට ඇතිකල්හිද නැතිකල්හිද "සබ්බතො ණ්වුත්වාවී වා" යි අප්‍රත්‍යයවේ, වන්නේ "ණාදයො තෙකාලිකා" යි කාලත්‍රයෙහි වේ, "අඤ්ඤෙ කිත්" යි කිත්සංඥාව "කත්තරි කිත්" යි කර්තෘකාරකයෙහි වේ, පූර්වපදයාගේ විභක්තිහට තෙසංග්‍රහණයෙන් ලොප්වේ, "පරමෙ" යනාදින් විත්වමෙ, "තද්ධිතා" දින් නාම්වත්වේ, සිව ඔවේ, තක්කරෝ යනුවේ-මත්තෙහිද මෙසේම සුදුසු සුදුසු ලෙසින් වාක්‍යයොදගතයුතු,

දීපඞ්කරෝ යන තන්හි දීපං යන විතීයාන්තයා උපපදකොටඇති කර කරණෙ යන ධාතු කර කියාවේ, ඕහට "භූවාදයො"—පෙ—දීපං අකාසි කරොති කරිස්සති යන අර්ථයෙහි "සබ්බතො" යනාදි සූත්‍රයෙන් අප්‍රත්‍යය වේ, නම්වත්ව සිව ඔව දීපඞ්කරෝ යනුවේ.

විනයො යන තන්හි විපූර්වවූ නී පාපුණනෙ යන ධාතු නී කියා වේ, විනෙසි විනෙති විනෙස්සති යන අර්ථයෙහි අප්‍රත්‍යයවේ, නකාරස්ථ ඉහට "අඤ්ඤෙසු ච" යි එකාරයෙක් වෘද්ධිවේ, එහට "ඒ අය" යි අයාදෙශවේ, නම්වත්ව සිව ඔව විනයො යනුවේ.

භවො යන තන්හි භූ සත්තායං යන ධාතු භූ කියාවේ, අභවි භවති භවිස්සති යන අර්ථයෙහි අප්‍රත්‍යයව උකාරයහට "අඤ්ඤෙසු ච" යි වෘද්ධිවේ, ඔකාරයහට "ඔ අව සරෙ" යි අවයනාදෙශවේ, පැමිණි නාම්වත්ව සිව ඔව භවො යනුවේ—මේ භූ සත්තායං යන ධාතුහුකෙරෙන් කර්තෘ භාව ආධාරයෙහි අප්‍රත්‍යයවූ නියායි.

සංවරො යන තන්හි සං පූර්වවූ වර වරණෙ යන ධාතු වර කියාවේ, ඕහට "භූවාදයො"—පෙ—වසයෙන් සංවරීයති සංවරණං යන අර්ථයෙහි අප්‍රත්‍යයව පැමිණි නාම්වත්ව සිව ඔව සංවරො යනුවේ—මේ කර්මභාවදෙක්හි අප්‍රත්‍යයවූ නියායි.

අනන්දදායකො යන තන්හි අනනං යන ද්විතීයාන්තය උපපදකොටඇති දද දානෙ යන ධාතු දද කියාවේ, අනනං අදසි දදති දදිස්සති යන අර්ථයෙහි "සබ්බතො ණ්වුත්වාවී වා" යි ණ්වුප්‍රත්‍යය වේ, "කාරිතං විය ණානුබන්ධො" යි කාරිතවත්වේ, ණානුබන්ධප්‍රත්‍යයා පරකල්හි ආකාරාන්තධාතුහුගේ අන්තයට "ආකාරන්තානමායො" යි ආයාදෙශවේ, ණ්වු ප්‍රත්‍යයහට "අනකා යුණ්වූනං" යි අකයනාදෙශවේ, දෙතැන්හිම පූර්වස්වර ලොප්වේ, නාම්වත්ව සිව ඔව අනන්දදායකො යනුවේ.

නායකො සාවකො යන තන්හි නී පාපුණනෙ සු සවණෙ යන ධාතු වෙත්, අනයි නයති නයිස්සති අසුණි සුණාති සුණිස්සති යන අර්ථයෙහි ණ්වුප්‍රත්‍යයවේ, ඕහට කාරිතවත්වේ, ඉකාරඋකාරයන්ට "අඤ්ඤෙසු ච" යි එ ඔදෙදෙන වෘද්ධිවෙත්, එඔදෙදෙනහට "තෙ ආයාවා කාරිතෙ" යි ක්‍රමයෙන් ආයආවආදෙශයෝ වෙත්, ණ්වුප්‍රත්‍යයහට "අනකා යුණ්වූනං" යි අකයනාදෙශවේ, නාම්වත්ව සිව ඔව නායකො සාවකො යනුවේ.

කත්තා කියමනාතන්හි කර කරණෙ යන ධාතු කර යි වේ, අකරි කරොති කරිස්සති යන අර්ථයෙහි "සබ්බතො ණ්වුත්වාවී වා" යි තුප්‍රත්‍යයවේ, ධාත්වන්තවූ රකාරයහට "කරස්ස ච තත්තං තුස්මිං" යි තකාරවේ, නාම්වත්ව සිවේ යි පරකල්හි සත්තුශබ්දන්තඋහට "සත්ථුපිතාදීනමා සිස්මිං" යනාදීන් ආව සිහට ලොප්ව කත්තා යනුවේ.

භයදස්සාවී යන තන්හි භයං යනු උපපදකොටඇති දිස පෙක්ඛණෙ යන ධාතු දිස කියාවේ, භයං අපස්සි පස්සති පස්සිස්සති යන අර්ථයෙහි "සබ්බතො" යනාදීන් ආවී ප්‍රත්‍යයවේ, දිස යන ධාතුහුගේ දකාරයෙහි ඉහට "යද" දින් අත්වේ, සකාරද්විත්වවේ, නාම්වත්ව සිව ලොප්ව භයදස්සාවී යනුවේ.

රොගො යන තන්හි රුජ භඞ්ග යන ධාතු රුජ කියා වේ, අරුජි රුජති රුජිස්සති යන අර්ථයෙහි "විසරුජපදාදිතො ණ" යි ණප්‍රත්‍යයවේ, ඕහට "කාරිතං විය ණානුබන්ධො" යි කාරිතවත්වේ, ධාත්වන්තවූ ජහට "කගා චජානං" යි ගකාරාදෙශවේ, "අඤ්ඤෙසු ච" යි වෘද්ධිවේ, ණ ලොප්ව අකාරශෙෂවේ, නාම්වත්ව සිව ඔව රොගො යනුවේ—මේ දෙවන ණප්‍රත්‍යයහෙයින් පුලලිඟුයි.

පාකො කිවමනාතන්හි පච පාකෙ යන ධාතු පච යි වේ, අපචිත්ථ පචතෙ පචිස්සති යන අර්ථයෙහි "භාවෙ ච" යි භාවයෙහි ණප්‍රත්‍යයවේ, කාරිතව ධාත්වන්තවූ චහට "කගා චජානං" යන සූත්‍රයෙන් කකාරාදෙශවේ "අසංයොගන්තස්ස වුද්ධි කාරිතෙ" යි අකාරයහට ආකාරයෙක් වෑඩිවේ, නම්වත්ව සිව ඔච් යොව ආව පාකො පාකා යනුවේ.

සබ්බගො යන තන්හි සබ්බං යනු උපපදකොටඇති ගමු සප්ප ගතිම්හි යන ධාතු ගමු කියාවේ, අගමි ගච්ඡති * ගමිස්සති යන අර්ථයෙහි "ක්වි ච" යි ක්විප්‍රත්‍යයවේ, ක්විප්‍රත්‍යයා පරකල්හි ධාත්වන්තයහට "ධාත්වන්තස්ස ලොපො ක්විම්හි" යි කිසිතැනෙක්හි ලොප්වේ, ක්විහට "ක්වි ලොපො ච" යි ලොප්වේ, විභක්ති ලොප්වේ, සිව ඔව සබ්බගො යනුවේ.

අභිභූ යන තන්හි අභිපූර්වවූ භූ සත්තායං යන ධාතු භූ කියාවේ, අභවි භවති භවිස්සති යන අර්ථයෙහි "ක්වි ච" යි ක්විප්‍රත්‍යයවේ, ක්විප්‍රත්‍යයා පරකල්හි ධාත්වන්තයහට "ධාත්වන්තස්ස ලොපො ක්විම්හි" යි ලොප් පැමිණිකල්හි එම සූත්‍රයෙහි අනුවෘත්තවාග්‍රහණයෙන් ප්‍රතිෂෙධව "ක්වි ලොපො ච" යි ක්විප්‍රත්‍යය ලොප්වේ, නම්වත්ව අභිභූ යනුවේ.

බ්‍රහ්මචාරී යන තන්හි බ්‍රහ්මං යනු උපපදකොටඇති චර ගතිම්හි යන ධාතු චර කියාවේ, තස්සීලාද්‍යර්ථයෙහි "තස්සීලාදීසු ණී ත්වාවී ච" යි ණීප්‍රත්‍යයවේ, ඕහට කාරිතවත්වේ. "අසංයොගන්තස්ස වුද්ධි කාරිතෙ" යි වෑඩිවේ, නම්වත්ව සිව ලොප්ව බ්‍රහ්මචාරී යනුවේ.

ඝොසනො යන තන්හි ඝුස සද්දෙ යි ඝුස කියාවේ, "සද්දකුධචලමණ්ඩත්ථරුචාදීහි යු" යි යුප්‍රත්‍යයවේ, සකාරයෙහි උකාරයහට "අඤ්ඤෙසු ච" යි ඔකාරයෙක් වෑඩිවේ, යුහට "අනකා යුණ්වූනං" යි අනයනාදෙශවේ, නම්වත්ව සිව ඔව ඝොසනො යනුවේ.

වඩ්ඪනො කිවමනාතන්හි වඩ්ඪ වඩ්ඪනෙ යි වඩ්ඪ කියාවේ. සවභාවයෙන් වඩී යන අර්ථයෙහි "සද්දකුධචල" යනාදී සූත්‍රයෙන් යුප්‍රත්‍යයවේ, යුප්‍රත්‍යයහට අනයනාදෙශවේ, නම්වත්ව සිව ඔව වඩ්ඪනො යනුවේ.

පාරගූ කිවමනාතන්හි පාරං යනු උපපදකොටඇති ගමු සප්ප ගතිම්හි යි ගමු කියාවේ, ගමු යන ධාතුහුකෙරෙන් පරව "පාරාදිගමිම්හා රූ" යි රූ ප්‍රත්‍යය වේ, රකාරසථ ඌකාරපහවේ. රෙඵයාහා සමග ධාත්වන්තයහට "රම්හි රන්තො රාදි නො" යි ලොප්වේ, නම්වත්ව සිව ලොප්ව පාරගූ යනුවේ.

භික්ඛු කිවමනාතන්හි භික්ඛ යාචනෙ යි භික්ඛ කියා වේ, "භික්ඛාදිතො ච" යි රූප්‍රත්‍යය වේ, රෙඵයාහා සමග ධාත්වන්තයහට "රම්හි රන්තො රාදි නො" යි ලොප්වේ, ඌකාරයහට "යදූ" දින් හ්‍රස්වවේ, නම්වත්ව සිව ලොප්ව භික්ඛු යනුවේ.

---

* ගමති-යි පොත්හි

විඤ්ඤෙය්‍යං කිච්චමනාතන්හි විපුබ්බවූ ඤා අවබොධනෙ යී ඤා කියාවේ, "ඝ්‍යණාදිතො ච" යී ආදිග්‍රහණයෙන් යප්‍රත්‍යය වේ, රෙඵයාහා සමග ධාත්වන්තයහට "රමහි රන්තො" යනාදීන් ලොප්වේ, ඤාකාර ඒත්වවේ, නම්වත්ව විඤ්ඤෙය්‍යං යනුවේ—මෙතැන්හි ඤවිග්‍රහණයෙන් ඌකාරාගම නොවේ—බ්‍රහ්මචාරී යනාදී හැම්පදයෝම තච්ඡීලාද්‍යර්ථයෙහියයි දන්න.

භවිතබ්බං භවනීයං කිච්චමනාතන්හි භූ සත්තායං යී භූ කියා දෙතැනෙක වේ "භාවකම්මෙසු තබ්බානීයා" යී තබ්බය අනීයය යන ප්‍රත්‍යයෝ වෙත්, භකාරයෙහි ඌහට "අඤ්ඤෙසු ච" යී වෘද්ධිවේ, ඕහට "ඔ අව සරෙ" යී අවයනාදෙශවේ, "ඉකාරාගමො අසබ්බධාතුකම්හි" යී එක්පක්ෂයෙක්හි ඉආගමවේ, කිච්චප්‍රත්‍යයෝ නමා අලිඟුහෙයින් "තද්ධිතා" දී සූත්‍රයෙහි චග්‍රහණයෙන් නම්වත්ව සිව අංව භවිතබ්බං * භවනීයං යනුවේ.

කත්තබ්බො කරණීයො කිච්චමනාතන්හි කර කරණෙ යී දෙතැනෙකවේ, කරීයති යන අර්ථයෙහි "භාවකම්මෙසු" යනාදීන් තබ්බය අනීයය යනාදීහු වෙත්, රකාරයහට "තුංතුනතබ්බෙසු වා" යී විකල්පයෙන් තකාරාදෙශවේ, අනීය යන නිහට "රහාදිතො ණො ණ" යී ණවේ, නම්වත්ව සිව ඔව කත්තබ්බො කරණීයො යනුවේ.

දඨබ්බං කිච්චමනාතන්හි දිස පෙක්ඛණෙ යී දිස කියාවේ, "භාවකම්මෙසු" යනාදීන් තබ්බප්‍රත්‍යයවේ, තබ්බප්‍රත්‍යයාගේ තහට "සාසදිසතො තස්ස රිට්ඨො ච" යී චග්‍රහණයෙන් රඨ යනාදෙශවේ, රෙඵයාහා සමග ධාත්වන්තයහට "රමහි රන්තො" යනාදී සූත්‍රයෙන් ලොප්වේ, "තද්ධිතා" දී සූත්‍රයෙහි චග්‍රහණයෙන් නම්වත්ව සිව අංව දට්ඨබ්බං යනුවේ.

කාරියං කිච්චමනාතන්හි කර කරණෙ යී කර කියාවේ "ණ්‍යොත ච" යී භාවකම්මදෙක්හි ණ්‍යප්‍රත්‍යයවේ, කාරිතවත්වේ, ණ්‍යහට ලොප්ව යශෙෂවේ "අසංයොගන්තස්ස" යනාදීන් වෘද්ධිවේ, "ඉකාරාගමො" යනාදීන් ඉආගමවේ, "තද්ධිතා" දී සූත්‍රයෙහි චග්‍රහණයෙන් නම්වත්ව සිව අංව කරණීයං කත්තබ්බං වා යන වාක්‍යයෙහි කාරියං යනුවේ.

ඤෙය්‍යං යන තන්හි ඤා අවබොධනෙ යී ඤා කියාවේ, "ණ්‍යොත ච" යී චග්‍රහණයෙන් යය්‍යප්‍රත්‍යයවේ "තද්ධිතා" දී සූත්‍රයෙහි චග්‍රහණයෙන් නම්වත්ව සිව අංව ඤෙය්‍යං යනුවේ.

වජ්ජං කිච්චමනාතන්හි වද වචනෙ යී වද කියාවේ, "ණ්‍යොත ච" යී ණ්‍යප්‍රත්‍යයවේ, වදාදීන්කෙරෙන්වූ ණ්‍යහට "වද මද ගමු" යනාදීන් ධාත්වන්ත යහා සමග ජ්ජවේ, චග්‍රහණයෙන් නම්වත්ව සිව අංව වජ්ජං යනුවේ.

ගාරය්හං යන තන්හි ගරහ නින්දායං යී ගරහ කියාවේ "ණ්‍යොත ච" යී ණ්‍යප්‍රත්‍යයවේ, ණ්‍යහට "වදමද" දීන් ධාත්වන්තයහා සමග ය්හවේ, ගරහ යන ධාතුහට ගාරවේ, නම්වත්ව සිව අංව ගාරය්හං යනුවේ.

---

* "යථාගමමිකාරො" යී ඉකාරාගමවේ.

පෙය්‍යං යන තන්හි පා පානෙ යි පා ක්‍රියාවේ, ණ්‍යප්‍රත්‍යයවේ, ආකාරාන්තාකාරෙන් පරවූ ණ්‍යහට ධාත්වන්තයහා සමග "වදමදූ" දීන් එය්‍යවේ, නම්වත්ව සිව අංව පෙය්‍යං යනුවේ.

කිච්චං කියමනාතන්හි කර කරණෙ යි කර ක්‍රියාවේ, කර යන ධාතුහුගෙ රෙන් "කරම්හා රිච්චො" යි රිච්චප්‍රත්‍යයවේ, රෙඑයහා සමග රකාරයහට "රම්හි රන්තො" යනාදීන් ලොප්වේ, නම්වත්ව සිව අංව කිච්චං යනුවේ.

ගහණං ඤාණං කියමනාතන්හි ගහ උපාදානෙය ඤා අවබොධනෙ යන ධාතු ගහක්‍රියාද ඤාක්‍රියාද වෙත්, භාවකර්මදෙක්හි "නාඤදීහි යු" යි යුප්‍රත්‍යයවේ, ඔහට "අනකා යුණ්වූනං" යි අනයනාදෙශවේ, අන්‍යන්තහු ගේ දන්ත්‍යනකාරයහට "රහාදිතො ණො" යි මූර්ධජ ණකාරවේ, නම්වත්ව සිව අංව ගහණං ඤාණං යනුවේ.

රජොහරණං යන තන්හි රජං යන විතීයාන්තයා උපපදකොටඇති හර හරණෙ යි හර ක්‍රියාවේ, "කත්තුකරණප්පදෙසෙසු ච" යි යුප්‍රත්‍යය වේ, ඔහට අනයනාදෙශවේ, ණහට "රහාදිතො ණො" යි ණකාරාදෙශවේ, නම්වත්ව සිව අංවේ, "එතෙසමො" යනාදීන් ඔව රජොහරණං යනුවේ.

පහරණං යන තන්හි පපූර්වවූ හර හරණෙ යි හර ක්‍රියාවේ "කත්තුකරණප්පදෙසෙසු ච" යි යුප්‍රත්‍යයවේ–පෙ–යෙන පහරන්ති යන වාක්‍යයෙහි පහරණං යනුවේ.

ආසනං කියමනාතන්හි ආස උපවෙසනෙ යි ආස ක්‍රියාවේ, "කත්තුකරණප්පදෙසෙසු ච" යි යුප්‍රත්‍යයවේ, ඔහට අනයනාදෙශවේ, නම්වත්ව සිව අංව යස්මිං ආසන්ති යන වාක්‍යයෙහි ආසනං යනුවේ.

සම්පදානං යන තන්හි සංයනුද පයනුද පූර්වවූ දා දානෙ යි දා ක්‍රියාවේ, "කත්තුකරණප්පදෙසෙසු ච" යි යුප්‍රත්‍යයවේ, ඔහට අනයනාදෙශවේ, නම්වත්ව සිව අංව යස්ස සම්මා පදීයතෙ යන වාක්‍යයෙහි සම්පදානං යනුවේ.

අපාදානං කියමනාතන්හි අප යන උපසර්ගයා පූර්වකොටඇති දා දානෙ යි දා ක්‍රියාවේ, "කත්තුකරණප්පදෙසෙසු ච" යි යුප්‍රත්‍යයවේ, ඔහට අනයනාදෙශවේ, පකාරස්ථ අහට "දීඝං" යි දීර්ඝවේ, නම්වත්ව සිව අංව යස්මා අපදදාති අපෙති යන අර්ථයෙහි අපාදානං යනුවේ.

ආදි කියමනාතන්හි ආ පූර්වවූ දා දානෙ යි දා ක්‍රියාවේ, "සඤ්ඤායං දාධාතො ඉ" යි ඉප්‍රත්‍යයවේ, පූර්වස්වරලොප්ව නම්වත්ව සිව ලොප්ව ආදීයති යන අර්ථයෙහි ආදි යනුවේ.

උදධි කියමනාතන්හි උදකං යනු උපපදකොටඇති ධා ධාරණෙ යි ධා ක්‍රියාවේ, "සඤ්ඤායං දාධාතො ඉ" යි ඉප්‍රත්‍යයවේ, පූර්වපදයාගේ විභක්තිහට "තෙසං" ග්‍රහණයෙන් ලොප්වේ, කකාරයහට "යදූ" දීන් ලොප්වේ, නම්වත්ව සිව ලොප්ව උදකං දධාති යන අර්ථයෙහි උදධි යනුවේ.

ජරා කිච්චමනාතන්හි ජර වයොහානිම්හි යී ජර කියාවේ, "ඉත්ථියමතිය ණ්වො වා" යි ස්ත්‍රීලිංගයෙහි අප්‍රත්‍යයවේ, ස්වරලොප්ව පැමිණෙන්, ස්ත්‍රීලිංගයෙහි වූ අකාරාන්තශබ්දයකෙරෙන් "ඉත්ථියමතො ආපච්චයො" යී ආප්‍රත්‍යය වේ, නම්වත්ව සිව ලොප්ව ජීරති යන අර්ථයෙහි ජරා යනුවේ.

මති කිච්චමනාතන්හි මන ඤාණෙ යී මන කියාවේ, "ඉත්ථියමතියණ්වො වා" යී තිප්‍රත්‍යයවේ, තිප්‍රත්‍යයා පරකල්හි ධාත්වන්තයහට "ගමඛනහන රමාදීනමන්තො" යී ලොප්වේ, නම්වත්ව සිව ලොප්ව මති යනුවේ.

චෙතනා කිච්චමනාතන්හි චිති චින්තායං යී චිති කියාවේ, "ඉත්ථියමතිය ණ්වො වා" යී ස්ත්‍රීලිංගයෙහි යුප්‍රත්‍යයවේ, යුපරකල්හි "අඤ්ඤෙසු ච" යී ඉහට එකාරයෙක් වෘද්ධිවේ, යුහට අනයනාදෙශවේ, ස්ත්‍රීලිංගයෙහි අකාරාන්තයාකෙරෙන් "ඉත්ථියමතො ආපච්චයො" යී ආප්‍රත්‍යයවේ, නම්වත්ව චෙතයති යන අර්ථයෙහි චෙතනා යනුවේ.

ඊසක්කරං කිච්චමනාතන්හි ඊසං යන නිපාත පූර්වවූ කර කරණෙ යී වේ, "ඊසදුස්සුහි ඛ" ය් ඛප්‍රත්‍යයවේ, ඛකාරස්ථ අකාරපහවේ, ඛප්‍රත්‍යයහට "යදා" දින් ලොප්වේ, ඊසං යන නිග්ගහීතයහට "වග්ගන්තං" යනාදී සූත්‍රයෙහි වග්ගහණ යෙන් කකාරාදෙශවේ; නම්වත්ව සිව අංව ඊසං කරීයති යන අර්ථයෙහි ඊසක්කරං යනුවේ.

දුක්කරං සුකරං කිච්චමනාතන්හි දුක්ඛන සුඛෙන යනු පූර්වකොටඇති කර කරණෙ යී වේ, ඛප්‍රත්‍යයවේ, අකාරපහව ඛලොප්ව පූර්වපදයන්ගේ විභක්තීන්ට තෙසං ග්‍රහණයෙන් ලොප්වේ, ප්‍රත්‍යයසම්බන්ධවූ ඛප්‍රත්‍යයහටද සුඛදුක්ඛශබ්දයන්ගේ ඛකාරයන්ටද "යදා" දින් ලොප්වේ, නම්වත්ව සිව අංව දුක්ඛෙන සුඛෙන කරීයති යන අර්ථයෙහි දුක්කරං සුකරං යනුවේ.

සම්ථො කිච්චමනාතන්හි සමු උපසමෙ යී සමු කියාවේ, "සමාදීහි ථමා" යී ථප්‍රත්‍යයවේ, මකාරයට උහට "යදා" දින් අභාවවේ, නම්වත්ව සිව ඔව සමෙති යන වාක්‍යයෙහි සම්ථො යනුවේ.

භීමො කිච්චමනාතන්හි භී භයෙ යී භී කියාවේ, "සමාදීහි ථමා" යී මප්‍රත්‍යයවේ, නම්වත්ව සිව ඔව යස්මා භායන්ති යන වාක්‍යයෙහි භීමො යනුවේ.

ඊදිසො කිච්චමනාතන්හි ඉමං යන ඊත්‍යාගනයා උපපදකොටඇති දුස පෙක්ඛණෙ යී දුස කියාවේ, ඉමං යන නාමයාකෙරෙන් ඉව නං පස්සති යන වාක්‍යයවේ, "ක්වි" යි ක්වි ප්‍රත්‍යයවේ, දකාරස්ථ උකාරපහවේ, පූර්වපදයාගේ විභක්තිහට තෙසං ග්‍රහණයෙන් ලොප්ව වාක්‍යඅප්‍රයොගාදියවේ, ක්වි පරකල්හි "ධාත්වන්තස්ස" යනාදින් ලොප්පැමිණිකල්හි "ඉයතමකිඑසානමන්තස්සරො දීඝං ක්වචි දුසස්ස ගුණං දො රං සක්ඛී ච" යී ඉම ශබ්දයහට ඉආදෙශහා එන දීර්ඝද ධාත්වන්ත සහට සකාරාදෙශහා දකාරයෙහි උහට ගුණවූ ඉකාරයෙක්ද වේ, ක්විහට "ක්වි ලොපො ච" යී ලොප්ව සිව ඔව ඉමම්ව නං පස්සති යන අර්ථයෙහි ඊදිසො යනුවේ-යථොක්තවූ හැම කාරියසමග දුස යනධාතුහුගේ දහට මෙයින් රකාරකලකල්හි ඊරිසො යනුවේ-

එසේම සෙසුකාරිය සමග දුස යන ධාතුහුගේ සහට මෙම සූත්‍රයෙන් කබ් පනාදෙශකලකල්හි ඊදික්ඛො යනුවේ—එසේම දුස යන ධාතුහුගේ සහට ඊකාරාදෙශකලකල්හි ඊදී යනුවේ—මේ ඉමශබ්දයහට ප්‍රත්‍යයෝයි-යශබ්ද තශබ්ද අම්හශබ්ද කිංශබ්ද එතශබ්ද සමානශබ්දයන්ටද මෙසේම ප්‍රත්‍යයෝ වෙත්ල—ඒ මෙසේයි—යං ඉව නං පස්සති යන වාක්‍යයෙහි—යාදිසො-යාදික්ඛො-යාරිසො-යාදී-තං ඉව නං පස්සති යන වාක්‍යයෙහි—තාදිසො-තාදික්ඛො-තාරිසො-තාදී-මං ඉව නං පස්සති යන වාක්‍යයෙහි—මාදිසො—මාදික්ඛො—මාරිසො—මාදී-කිං යන නිග්ගහීතයහට "යද" දීන් ලොප්වේ, කිං ඉව නං පස්සති යන වාක්‍යයෙහි—කීදිසො-කීදික්ඛො-කීරිසො-කීදී—එතං ඉව නං පස්සති යන වාක්‍යයෙහි-එදිසො—එදික්ඛො-එරිසො—එදී—සමානා ඉව නං පස්සන්ති යන වාක්‍යයෙහි—සාදිසො—සාදික්ඛො—සාරිසො—සාදී—දීඝීනොවූකල්හි සදිසො යනුවේ—ඉමෙ ඉව නෙ පස්සන්ති—යෙ ඉව නෙ පස්සන්ති—තෙ ඉව නෙ පස්සන්ති—අම්හාකං ඉව නෙ පස්සන්ති—යනාදි බහුවචනයෙහිද මෙම ආදෙශයෝල.

භූතො භූතවා භූතාවී කිවමිනාතන්හි භූ සත්තායං යන ධාතු භූ කියාවේ, "අතීතෙ තතවන්තුතාවී" යි තය තවන්තුය තාවීය යන ප්‍රත්‍යයෝ වෙත්, නාම්වත්ව සිවේ, එක්පක්ෂයෙක්හි සිහට ඔවේ, එක්පක්ෂයෙක්හි සිහාසමග වන්තුහට "ආ සිම්හි" යි ආකාරාදෙශවේ, තුබූ පක්ෂයෙහි සිව ලොප්වේ, භූසක්නහුගේ ඌහට "යද" දීන් භූස්වවේ; අභොසි යන අර්ථයෙහි භූතො භූතවා භූතාවී යනුවේ.

භුත්තො භුත්තවා භුත්තාවී කිවමිනාතන්හි භුජ පාලනබ්‍යවහරණෙසු යි භුජ කියාවේ, "අතීතෙ" යනාදීන් තය තවන්තුය තාවීය යන ප්‍රත්‍යයෝ වෙත්, භුජ්නතයහට "භුජාදීනමන්තො නො ද්වි ච" යි ලොප්වීමහා තාදිත්ව "පරද්වෙභාවො" යනාදීන් ද්විත්වවේ, නාම්වත්ව සිව ඔවේ, එක්පක්ෂයෙක්හි සිහාසමග න්තුහට "ආ සිම්හි" යි ආවේ, තුබූ පක්ෂයෙහි සිහට ලොප්ව භුත්තො භුත්තවා භුත්තාවී යනුවේ.

ජාතො කිවමිනාතන්හි ජන ජනනෙ යි ජන කියාවේ, "අතීතෙ" යනාදීන් තප්‍රත්‍යයවේ, තපරකල්හි ජන යනනාහුගේ නාකාරයහට "ජනාදීනමා තිම්හි ච" යි ආකාරාදෙශවේ, නාම්වත්ව සිව ඔව ජාතො යනුවේ.

ආරූළ්හො කිවමිනාතන්හි ආපූර්වවූ රුහ ජනනෙ යි රුහ කියාවේ, "අතීතෙ" යනාදීන් තප්‍රත්‍යයවේ, තහට "හාදෙනත්ථිහි හො හස්ස ළො ච අදහනාහානං" යි හකාරයා ධාත්වන්තවූ තහට ළකාරාදෙශවේ, රකාරස් උකාරයට "දීඝං" යි දීඝීවේ, නාම්වත්ව සිව ඔව ආරූළ්හො යනුවේ.

ගීතං කිවමිනාතන්හි ගෙ සද්දෙ යි ගෙ කියාවේ "භාවකම්මෙසු ත" යි, තප්‍රත්‍යයවේ, තප්‍රත්‍යයා පරකල්හි ගෙයන ධාතුහට "සබ්බත්ථ ගෙ ගී" යි ගීයනාදෙශවේ, නාම්වත්ව සිව අංව භායතං යන අර්ථයෙහි ගීතං යනුවේ.

කතං කිවමනාතන්හි කර කරණෙ යි කර කියාවේ, "භාවකම්මෙසු ත" යි තප්‍රත්‍යයවේ, ධාත්වන්තවූ රකාරයහට "රකාරො ච" යි ලොප්වේ, නම්වත්ව සිව අංව අකරී යන අර්ථයෙහි කතං යනුවේ.

දුක්කටං කිවමනාතන්හි දුපූර්වවූ කර කරණෙ යි කර කියාවේ, "භාවකම්මෙසු ත" යි තප්‍රත්‍යයවේ, ධාත්වන්තවූ රකාරයහට "රකාරො ච" යි ලොප්වේ, කකාර ද්විත්වවේ, තප්‍රත්‍යයහට "දධන්ත ච" යි චග්‍රහණයෙන් ටකාරවේ, නම්වත්ව සිව අංව දුක්ඛෙන අකරී යන අර්ථයෙහි දුක්කටං යනුවේ.

බද්ධො කිවමනාතන්හි බධ බන්ධනෙ යි බධ කියා වේ, "භාවකම්මෙසු ත" යි තප්‍රත්‍යයවේ, ඕහට "ධඪභහෙහි ධඪා ච" යි ධවේ, ධාත්වන්තය හට "හචතුත්ථානමන්තානං දො ධෙ" යි දකාරවේ, නම්වත්ව සිව ඔව බද්ධො යනුවේ.

ලද්ධො කිවමනාතන්හි ලභ ලාභෙ යි ලභ කියාවේ, "භාවකම්මෙසු ත" යි තප්‍රත්‍යයවේ, ඕහට "ධඪභහෙහි ධඪා ච" යි ධකාරවේ, ධාත්වන්තය හට "හචතුත්ථානං" යනාදීන් දකාරවේ. නම්වත්ව සිව ඔව ලද්ධො යනුවේ.

වුද්ඪො කිවමනාතන්හි වඩ්ඪ වඩ්ඪනෙ යි වඩ්ඪ කියාවේ, "භාවකම්මෙසු ත" යි තප්‍රත්‍යයවේ, ඕහට ඪකාරවේ, ඒහට "ඩො ඪකාරෙ" යි ඩකාරවේ, වකාරස්ථ අකාරයහට "යදු" දීන් උකාරවේ, නම්වත්ව සිව ඔව වුද්ඪො යනුවේ.

දඩ්ඪං කිවමනාතන්හි දහ භස්මීකරණෙ යි දහ කියාවේ, තප්‍රත්‍යයවේ, ඕහට ඪකාරවේ, ධාත්වන්තයහට ඩවේ, නම්වත්ව සිව අංව දඩ්ඪං යනුවේ.

දුට්ඨො කිවමනාතන්හි දුස අප්පීතිම්හි යි දුස කියාවේ, තප්‍රත්‍යයවේ, ධාත්වන්තවූ ආදිව්‍යඤ්ජනයාහා සමග තහට "සාදිසන්තපුච්ඡභඤ්ජහංසාදීහි ට්ඨො" යි ට්ඨ යනාදෙශවේ, නම්වත්ව සිව ඔව දුට්ඨො යනුවේ.

භින්නො යන තන්හි භිද විදාරණෙ යි භිද කියාවේ, තප්‍රත්‍යයවේ, තහට "භිදාදිතො ඉන්නඅන්නඊණා වා" යි ඉන්නයනාදෙශහා ධාත්වන්තය හට ලොප්වේ, නම්වත්ව සිව ඔව භින්නො යනුවේ.

බුද්ධො කිවමනාතන්හි බුධ බොධනෙ යි බුධ කියා වේ, බුධ ගමාදි ධාතූන් කෙරෙන් පරව කර්තෘකාරකයෙහි "බුධගමාදිඅත්ථෙ කත්තරි" යි තප්‍රත්‍යයවේ, වන්නේ "ණ්වාදයො තෙකාලිකා" යි කාලත්‍රයෙහි වේ, "කත්තරි කිත්" යි කර්තෘකාරකයෙහි වේ, "අඤ්ඤෙ කිත්" යි කිත් සංඥාවේ, තප්‍රත්‍යයහට "ධඪභහෙහි" යනාදීන් ධකාරවේ, ධාත්වන්තයහට "හචතුත්ථානං" යනාදීන් දකාරවේ, නාම්වත්ව සිව ඔව අබුජ්ඣි බුජ්ඣති බුජ්ඣිස්සති යන අර්ථයෙහි බුද්ධො යනුවේ.

තිණ්ණො කිවයිනාතන්හි තර තරණෙ යී තර කියාවේ, "අතීතෙ" යනාදින් තප්‍රත්‍යයවේ, ඊහට "තරාදීහි ඉණ්ණො" යී ඉණ්ණාදෙශ වීමහා ධාත්වන්තය ලොප්වේ, නම්වත්ව සිව ඔව අතරි තරති තරිස්සති යන අර්ථයෙහි තිණ්ණො යනුවේ.

සහමානො යන තන්හි සහ ඛමායං යන ධාතු සහ කියාවේ, "වත්තමානෙ මානන්තා" යී වර්තමානකාලයෙහි මානප්‍රත්‍යය වේ, නම්වත්ව සිව ඔව සහමානො යනුවේ.

සය්හමානො කිවමනාතන්හි මෙම සහ යන ධාතුකෙරෙන් පරව කර්මකාරකයෙහි මානප්‍රත්‍යය වේ "භාවකම්මෙසු යො" යී යවිකරණවේ, "හස්ස විපල්ලාසො වා" යී හකාරයකාරයන්ගේ විපර්‍යාසබවවේ, සය්හමානො යනුවේ.

භූයමානො කිවමනාතන්හි භූ සත්තායං යන ධාතුකෙරෙන් පරව භාවකාරකයෙහි මානප්‍රත්‍යයවේ "භාවකම්මෙසු යො" යී යවිකරණව භූයමානො යනුවේ.

ගච්ඡං කිවමනාතන්හි ගමු සප්ප ගතිම්හි යී ගමු කියාවේ, ඔහුකෙරෙන් පරව "වත්තමානෙ" යනාදින් අන්තප්‍රත්‍යයවේ, ගමු යන ධාතුහුගේ මකාර යනට "ගමිස්සන්තො ච්ඡො වා සබ්බාසු ච" යී ඡවේ, නම්වත්ව සිවේ, න්තහට අංව සිව ලොප්ව ගච්ඡං යනුවේ.

කම්මං කරිස්සං කම්මං කරොන්තො කම්මං කුරුමානො කම්මං කරානො කිවමනාතන්හි කම්මං යනු උපපදකොටඇති කර කරණෙ යී කර කියා සතර තැනෙකවේ, ශෙෂාර්ථයක් ප්‍රකාශවූනකල්හි වර්තමානකාලයෙහි "සෙසෙ ස්සං න්තු මානානා" යී ස්සංය න්තුය මානය ආනය යන ප්‍රත්‍යයෝ යථාක්‍රමයෙන් වෙත්, ස්සං යන ප්‍රත්‍යයා පරකල්හි "ඉකාරාගමො අසබ්බධාතුකම්හි" යී ඉ ආගමවේ, "තනාදිතො ඔයිරා" යී දෙතැනෙක්හි ඔවේ, එක්පක්ෂයෙක්හි ඔප්‍රත්‍යයහට "උත්තමොකාරො" යී උවේ, එව පක්ෂයෙහි කකාරයහි අහට "කරස්සකාරො ච" යී උකාරාදෙශවේ, නම්වත්ව සිව ලොප්ව කරිස්සං යනුවේ-සෙසුතැන්හි සිව ඔව කරොන්තො, කුරුමානො කරානො යනුවේ.

අකාරො කිවමනාතන්හි අකාර අ කියාවේ, අක්ෂරවාචීශබ්දයන්කෙරෙන් පරව "අක්ඛරෙහි කාරං" යී ස්වාර්ථයෙහි කාරප්‍රත්‍යයවේ, නම්වත්ව සිව ඔව අ එව යන වාක්‍යයෙහි අකාරො යනුවේ-කකාරො රකාරො යනාදියද මෙසේමැයි.

ගමී කිවමනාතන්හි ගමු සප්ප ගතිම්හි යී ගමු කියාවේ, ඔහුකෙරෙන් පරව ස්වාර්ථයෙහි "යදූ" දීන් ප්‍රත්‍යයවේ, ගමුඉච්චයං ධාතු එව යන අර්ථයෙහි ගමී යනුවේ.

කරොති කිවමනාතන්හි කර කරණෙ යන ධාතු කර යී වේ, ස්වාර්ථයෙහි "යදූ" දීන් තිප්‍රත්‍යයවේ, ධාතුහුකෙරෙන් "තනාදිතො ඔයිරා" යී ඔව කරොති යනුවේ.

කාතවෙ ඉච්ඡති කාතුං ඉච්ඡති කිව්වමනාතත්හි කර කරණෙ යන ධාතු කර කියාවේ, එකකර්තෘකවූ ඊප්සාර්ථයක් හැඟෙනකල්හි කර්තෘකාරක යෙහි “ඉච්ඡත්ථෙසු සමානකත්තුකෙසු තවෙතුං වා” යි තවෙ ප්‍රත්‍යය හා තුංප්‍රත්‍යයවේ, ඉච්ඡති යන වාක්‍යයවේ, කර යන ධාතුහට “තවෙතුනාදීසු කා” යි කායනාදෙශවේ, නම්වත්ව සිව ලොප්ව කාතවෙ ඉච්ඡති කාතුං ඉච්ඡති යනුවේ.

දට්ඨුං කිව්වමනාතත්හි දිස පෙක්ඛණෙ යි දිස කියාවේ, “ඉච්ඡත්ථෙසු” යනාදීන් තුංප්‍රත්‍යයවේ, ඊහට “සාසදිසතො” යනාදි සූත්‍රයෙහි වග්‍රහණ යෙන් රට්ඨුං යනාදෙශවේ, රානුබන්ධප්‍රත්‍යයා පරකල්හි ධාත්වන්තයහා සමග රකාරයහට “රම්හි රන්තො” යනාදීන් ලොප්වේ, නම්වත්ව සිව ලොප්ව දස්සනාය ඉච්ඡති යන අර්ථයෙහි දට්ඨුං යනුවේ.

නින්දිතුමරහති කිව්වමනාතත්හි නින්ද ගරහායං යි නින්ද කියාවේ, ඔහුකෙරෙ න් පරව “අරහසක්කාදීසු ච” යි අරහාද්‍යර්ථයෙහිද තුංප්‍රත්‍යයවේ, ඔහු කෙරෙන් “ඉවණ්ණාගමො වා” යි ඉආගමවේ, නින්දිතුං අරහති යනුවේ.

කාතූන ගච්ඡති කාත්වාන ගච්ඡති කත්වා ගච්ඡති යන තන්හි කර කරණෙ යි තුන් තැනෙකවේ, සමානකර්තෘකවූ ධාතූන්ගේ මධ්‍යයෙහි පූර්වක්‍රියා වාචීවූ ධාතූන්කෙරෙන් පරව “පුබ්බකාලෙකකත්තුකානං තූනත්වාන ත්වා වා” යි තූනය ත්වානය ත්වාය යන ප්‍රත්‍යයෝ පනතින් වෙත්, කරයන්න හට “තවෙතුනාදීසු කා” යි කායනාදෙශවේ, තුබූ දෙතැන්හි ධාත්වන්තවූ රහට “ඍදු” දින් ලොප්ව නම්වත්ව සිව ලොප්ව කාතූන කාත්වාන කත්වා යනුවේ.

ඨිත්වා පීත්වා වජති කිව්වමනාතත්හි ඨා ගතිනිවෘත්තිම්හි ය පා පානෙය යන ධාතුදෙදෙනාකෙරෙන් “පුබ්බකාලෙකකත්තුකානං” යනාදීන් ත්වාප්‍රත්‍යයවේ, මෙම ධාතුදෙදෙනා සම්බන්ධිවූ ආකාරයන්ට “ඨාපානමිඊ ච” යි ඉකාර ඊකාරාදෙශයෝ ක්‍රමයෙන් වෙත්, නම්වත්ව සිව ලොප්ව ඨිත්වා පීත්වා යනුවේ.

සීහං දිස්වා භයං උප්පජ්ජති කිව්වමනාතත්හි සීහං යනු උපපදකොටඇති දිස පෙක්ඛණෙ ය් දිස කියාවේ, භයං උප්පජ්ජති යන වාක්‍යයවේ, ධාතුහු කෙරෙන් භින්නකර්තෘකයන්ට “පුබ්බකාලෙකකත්තුකානං” යනාදි සූත්‍රයෙහි වාග්‍රහණයෙන් තූනප්‍රත්‍යයවේ, දිස පෙක්ඛණෙ යනාදීන් කෙරෙන්වූ තූනප්‍රත්‍යයාදීන්ට “දිසා ස්වානස්වාන්තලොපො ච” යි ස්වා යනාදෙශහා ධාත්වන්තයහට ලොප්දවේ, සීහං දිස්වා භයං උප්පජ්ජති යනුවේ.

සජ්ජිත්වා කිව්වමනාතත්හි සද විසරණාදිම්හි යි සද කියාවේ, ත්වාප්‍රත්‍යයවේ, ධාතුහුකෙරෙන් “දධාන්තතො යො ක්වචි” යි යකාරාගමවේ, “ජචයා දනිට්ඨා” යනාදීන් යකාරදකාරයෙහි බඩවේ, යවත්වූ දහට “ය්වීතං” යනාදීන් ජකාරවේ, ත්වාව ඔහුකෙරෙන් “ඉවණ්ණාගමො වා” යි ඉකාරාගමවේ, නම්වත්ව සිව ලොප්ව සජ්ජිත්වා යනුවේ.

බුභුක්ඛිතො යන තන්හි බුධ බොධනෙ යි බුධ කියාවේ, ඛප්‍රත්‍යයවේ, ප්‍රත්‍යය පරකල්හි "දධාන්තතො යො ක්වචි" යි යාගමවේ, එයහා සම ග ධහට "ගථා කත්තරි ච" යි ඛාවේ, "වග්ගෙ ඝොසා" යනාදින් ව්‍යඤ්ජනවේ, "ඉවණ්ණාගමො වා" යි ඉආගමවේ, නම්වත්ව සිව ලොප්ව බුභුක්ඛිතො යනුවේ.

කරිය කත්තුන කිවමනාතන්හි කර කරණෙ යි කර කියා දෙතැනෙකවේ, "පුබ්බකාලෙකකත්තුකානං" යනාදින් දෙතැන්හිම තුනප්‍රත්‍යයවේ, ඕහට "සබ්බෙස්තුනාදීනං යො" යන සූත්‍රයෙන් විකල්පයෙන් යකාර දෙශවේ, ධාතුනුකෙරෙන් "ඉවණ්ණාගමො වා" යි ඊකාරාගමවේ, තුබූ පක්ෂයෙහි තුනප්‍රත්‍යය පරකල්හි "තුංතූනතබ්බෙසු වා" යි රකාරයහට තකාරවේ, නම්වත්ව සිව ලොප්ව කරිය කත්තුන යනුවේ.

උද්දිස්ස කිවමනාතන්හි උපුවම්වූ දිස උච්චාරණෙ යි දිස කියාවේ, "පුබ්බකාලෙකකත්තුකානං" යනාදින් තූනප්‍රත්‍යයවේ, ඕහට "සබ්බෙස්තූනාදීනං යො" යි යකාරාදෙශවේ, යපරකල්හි ධාත්වන්තයා සමග යහට "පුබ්බරූපච" යන සූත්‍රයෙන් පූර්වරූපවූ සකාරයෙක් වේ, දකාර සකාර ද්විත්වවේ, නම්වත්ව සිව ලොප්ව උද්දිස්ස යනුවේ.

දළ්හගාහං ගණ්හාති කිවමනාතන්හි දළ්හං යනු උපපදකොටඇති ගහ උපාදානෙ යි ගහ කියාවේ, "යද්‍ය" දින් ණංප්‍රත්‍යයවේ, ණානුබන්ධප්‍රත්‍යය පරකල්හි අසංයොගාන්තවූ ධාතුහුගේ ආදිස්වරයාහට "අසංයොගන්තස්ස" යනාදින් ආකාරයෙක් වෘද්ධිවේ, ණංහට "කාරිතානං ණො ලොපං" යි ණලොප්ව අංකාරශෙෂව පූර්වපදයාගේ විභක්තිහට "තෙසං" යනාදි සූත්‍රයෙහි තෙසංග්‍රහණයෙන් ලොප්වේ, "තබ්බිතා" දින් නම්වත්ව සිව ලොප්ව දළ්හගාහං ගණ්හාති යනුවේ.

එකක්ඛත්තුං කිවමනාතන්හි එකශබ්දයාකෙරෙන් ස්මිංවේ, වාරෙ යන වාක්‍යයවේ, එකස්මිං වාරෙ යන අර්ථයෙහි "එකාදිතො සකිස්ස ක්ඛත්තුං" යි ක්ඛත්තුං ප්‍රත්‍යයවේ, වාක්‍ය අප්‍රයොගව විභක්ති ලොප්ව එකස්මිං වාරෙ යන වාක්‍යයෙහි එකක්ඛත්තුං යනුවේ—විසු වාරෙසු විකඛත්තුං යනු ද මෙසේමැයි—චතුක්ඛත්තුං පඤ්චක්ඛත්තුං ඡක්ඛත්තුං සත්තක්ඛත්තුං සත ක්ඛත්තුං සහස්සක්ඛත්තුං කියාදවේ—මේ හැම පදයන් කෙරෙන් සිව "සබ්බාසමාවුසො" යනාදි සූත්‍රයෙන් ලොප් කටයුතු—විභක්ති ලොප් නොකළතන්හි තීණීක්ඛත්තුං කියාද වේ, තුන්වරෙක යන අර්ථයි.

කිතකනිමි.

—*—

බාලාවතාර ලියන සන්නය නිමි.

—**—

# ශුද්ධිපත්‍රය.

---**---

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 2 | 33 | පඵ | පථ |
| 3 | 18 | කායකිත් | කායිකයක් |
| 4 | 14 | ව්‍යනජ්ජනෙම | ව්‍යඤ්ජනනෙම |
| 5 | 5 | යනුවේං | යනුවේ |
| 7 | 8 | අනුව ර්ත | අනුවෘත්ත |
| 12 | 22 | නිග්ගහීතයගට | නිග්ගහීතයන්ට |
| 16 | 22 | එකවවනා නත | එකවචනා නත |
| 17 | 33 | නයසූත්‍රයෙන් | යනසූත්‍රයෙන් |
| 19 | 20 | සුත්කයෝප | සුත්බයෝග |
| ,, | 27 | මාත්නය | මානය |
| 20 | 16 | පරසම්පඤ්ඤ, | පරසමඤ්ඤ, |
| 21 | 34 | බහුවමනවූ | බහුවචනවූ |
| 24 | 27 | ධාතුප්‍රත්‍යගයට | ධාතුප්‍රත්‍යයහට |
| 25 | 3 | ආමන්ත්‍රණයෙහි | ආමන්ත්‍රණයෙහිවූ |
| 26 | 14 | සූත්‍රයෙන් | සූත්‍රයෙන්ද |
| 28 | 28 | ගචෙඡ නොතගි | ගච්ඡ නොතගි |
| 29 | 27 | ජිනවවචන | ජිනවචන |
| 30 | 17 | අංවිභක්තිහට | අංවිභක්ති |
| ,, | 23 | ජිවනවචන | ජිනවචන |
| 32 | 1 | භවගොනා | භව්ගොනා |
| ,, | 31 | අංවිභක්තිහට | අංවිභක්ති |
| 53 | 10 | සූත්‍රයගෙන් | සූත්‍රයෙන් |
| 60 | 22 | අසුනි | ආයූනි |
| 61 | 2 | සංබෙපො | සඛෙබපො |
| 64 | 1 | සබ්බ යනු වැඩියි | ......... |
| ,, | 8 | නැගෙනක | නැගෙනක |
| ,, | 19 | පුබ්බෙබසු යනු අඩුයි | ......... |
| 65 | 1 | යංවේ | සංවේ |
| 70 | 34 | නහට | නංහට |
| 71 | 24 | ඉමශබ්දයා | ඉමාශබ්දයා |
| ,, | 27 | සායනා | සසායනා |
| ,, | 36 | සංයනාමදශයා | සංයනාමදශයන් |

| පිට | පෙල | අශුද්ධ | ශුද්ධ |
| --- | --- | --- | --- |
| 72 | 1 | සපරකල්හි | සංපරකල්හි |
| ,, | 2 | දෙපක්ෂයෙහි | පක්ෂයෙහි |
| 75 | 36 | දෙතැනෙක | එක්තැනෙක |
| 76 | 6 | තුම්හශබ්දයා | තුම්හාඅම්හශබ්දයන් |
| “ | 37 | තුම්හං යනු අඩුයි | ......... |
| £3 | 11 | සබ්බධි | සබ්බති |
| 84 | 7 | ආදුයො | ආවුසො |
| ,, | 27 | සවරනන | සවරනත |
| ,, | 30 | සමාසානන | සමාසානත |
| 85 | 7 | සායන | සායත |
| ,, | 21 | මහනාතීවස | මහනාථ්වසා |
| 87 | 5 | ඔහුන්කෙරෙන් | ඔහුකෙරෙන් |
| ,, | 10 | ඞීපදෙ | ඞිපදෙ |
| ,, | 14 | වක්‍යයහට | වාක්‍යයහට |
| ,, | 21 | ගාතො | ගතො |
| 92 | 10 | සසස | යස්ස |
| 95 | 23 | සමායා නතායා | සමාසා නතායා |
| 100 | 25 | අනුව ණණවායො | අනුව ණණනවායො |
| ,, | 33 | සූත්‍රවිධා | සූත්‍රවිධා |
| 103 | 2 | අප්‍රයොගදිය | අප්‍රයොගාදිය |
| 108 | 5 | පාපිස සිකො | පාපිසසිකො |
| ,, | 8 | පාපයා | පාපය |
| 111 | 19 | එකදස | එකාදස |
| 112 | 11 | දණ්ඩශබ්ද | දණ්ඩීශබ්ද |
| 120 | 9 | අසවණී | අසාවණී |
| 121 | 31 | අපචිමහං | අපචිමහා |
| 123 | 37 | අපචිසසමෙහ | අපචිසෙස |

මෙහි දීර්ඝවියයුතුතන්හි හ්‍රස්වවද හ්‍රස්වවියයුතුතන්හි දීර්ඝවද ඇති, වෙනත් ශුද්ධපත්‍රයට නොවැටුනු සුළුවරදඇතහොත් ඒ පරීක්ෂාකිරීමෙන් සමාධිය භජනය කෙරෙණවා.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු